2023 වාර්ෂික වාර්තාව



පේරාදෙණිය විශ්වවිද්‍යාලය

පේරාදෙණිය, ශ්‍රී ලංකාව

විශිෂ්ටතා සපිරි වසරක අනාවරණයඃ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව

මෙම වාර්තාවෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලය නිර්වචනය කරනු ලබන සුවිශේෂී ජයග්‍රහණ සහ අධ්‍යයන විශිෂ්ටත්වය අත්කර ගැනීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ අචල කැපවීම පිළිබිඹු වේ. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මාර්ගෝපදේශයන්ට අනුකූල ව සකස් කර ඇති මෙම වාර්තාව විවිධ ක්ෂේත්‍ර හරහා අප විසින් සිදු කර ඇති පරිවර්තනීය බලපෑම පිළිබඳ විමසා බලන ලෙස ඔබට ආරාධනා කරයි.

අපගේ පීඨ, අධ්‍යයනාංශ, මධ්‍යස්ථාන සහ ඒකකවල අගනා දායකත්වයෙන් සම්පාදනය කරන ලද මෙම වාර්තාව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සාමූහික ප්‍රයත්නය පිළිබඳ සාක්ෂි දරයි.

අපගේ පර්යේෂණ අනාවරණ, ප්‍රබෝධමත් ශිෂ්‍ය ක්‍රියාකාරකම් සහ සමාජයට දක්වන ලද දායකත්වය පිළිබඳ තොරතුරු මනා සේ අනාවරණය කරගන්න. වරකට එක් පෙරළිකාර ජයග්‍රහණයක් බැගින් ලබමින් අප අනාගතය හැඩගැස්වීමට යත්න දරණ ආකාරය පිළිබඳ දැනුම්වත් වන්න.

ISSN – 2478-1088

ප්‍රතිපෝෂණ සහ විමසීම් :

වාර්ෂික වාර්තාව සම්බන්ධ ඕනෑ ම විමසීමක් සඳහා කරුණාකර අප හා සම්බන්ධ වන්න.

ඊමේල් : statoffice@gs.pdn.ac.lk

දු. අං. : 0812085408

විශ්වවිද්‍යාලයේ මේ වන විට ක්‍රියාත්මක වැඩසටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න. (https://www.pdn.ac.lk)

පටුන

උපකුලපතිතුමාගේ පණිවිඩය		**iv**
1.	**ව්‍යවස්ථාපිත වාර්තාව**	
1.1	හැඳින්වීම	01
1.2	විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර	03
1.3	කළමනාකරණය සහ ව්‍යුහය	05
1.4	සමස්ත කාර්ය සාධනය	16
1.5	ප්‍රධාන බාධක	61
1.6	අනාගත සැලැස්ම	62
2.	**පීඨ, පශ්චාත් උපාධි ආයතන**	64
2.1	කෘෂි විද්‍යා පීඨය	64
2.2	සම සෞඛ්‍ය විද්‍යා පීඨය	65
2.3	ශාස්ත්‍ර පීඨය	66
2.4	දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	67
2.5	ඉංජිනේරු පීඨය	68
2.6	කළමනාකරණ පීඨය	69
2.7	වෛද්‍ය පීඨය	70
2.8	විද්‍යා පීඨය	71
2.9	පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය	72
2.10	කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	73
2.11	මානව ශාස්ත්‍ර සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	74
2.12	වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	75
2.13	විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	76
3.	**මූල්‍ය කාර්ය සාධනය**	77
4.	**විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව**	79
5.	**තිරසාරභාවය පිළිබඳ අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව**	81
6.	**වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය - 2023**	83
7.	**විගණන වාර්තා**	115
7.1	විගණකාධිපති වාර්තාව	115
7.2	විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	122

උපකුලපතිතුමාගේ පණිවිඩය



අපගේ උසස් ආයතනයේ ශාස්ත්‍රීය, පර්යේෂණ, සුභසාධන සහ ප්‍රජා සහභාගීත්ව ප්‍රයත්නවල ජයග්‍රහණ ඇතුළත් කරමින් 2023 වසර සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම සතුටු වෙමි.

කොවිඩ්-19 වසංගතය මඟින් ඇති කළ ප්‍රතිවිපාක, ආර්ථික පෙරළි සහ දේශපාලන අභියෝගවලින් අනතුරු ව 2023 වසර අප රටට පමණක් නොව අපගේ විශ්වවිද්‍යාලයට ද විවිධ කරුණු කාරණා සම්මිශ්‍ර වූ දුෂ්කර කාල පරිච්ඡේදයක් විය. අපගේ විශ්වවිද්‍යාලය මෙම අහිතකර තත්ත්වයන්ට ධනාත්මක ලෙස ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතු ව ඉදිරියට පියනැගුවා පමණක් නොව, කෙටි කාලීන හා දිගු කාලීන අනාගතය සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමේ ප්‍රයත්න ආරම්භ කළ බව ප්‍රකාශ කිරීමට හැකිවීම මට මහත් ආඩම්බරයකි. මෙම ඔරොත්තු දීමේ හැකියාව අප සමඟ මෙම අභියෝගවලට මුහුණ දුන් අපගේ පාර්ශවකරුවන්ගේ කැපවීම පිළිබඳ දරණ සාක්ෂියකි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛත ම අධ්‍යයන ආයතනය ලෙස අපගේ ස්ථාවරය තවදුරටත් තහවුරු කරමින් අධ්‍යයන විශිෂ්ටත්වය ළඟා කර ගැනීම උදෙසා අප විසින් දරනු ලබන අඛණ්ඩ ප්‍රයත්නය හේතුවෙන් අප ජාතික වශයෙන් හා ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමකට ලක් වී ඇත. විශ්වවිද්‍යාල ක්‍රියාකාරීත්වයේ සෑම අංශයක් ම විමර්ශනය කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ආයතනික සමාලෝචනය මඟින් අපගේ විශ්වවිද්‍යාලය ඔවුන්ගේ ආයෝජනය සාධාරණ ලෙස උපයෝගී කරන බවට මහජනතාව තුළ විශ්වාසයක් ඇති කරමින් "ඉතා විශිෂ්ට ඒ-ශ්‍රේණියක්" අපට පිරිනමා ඇත.

විචිත්‍රවත් පර්යේෂණ සංස්කෘතියක් පෝෂණය කිරීමෙහි ලා, විශේෂයෙන් ම අන්තර් විෂයික සැකසුම්-වලින් සහ ජාත්‍යන්තර සහයෝගීතා ගොඩනඟාගැනීමේ කාර්යයේ දී විශ්වවිද්‍යාලය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. අපගේ පාලනයෙන් ඔබ්බට ගිය සාධක හේතුවෙන් විදේශීය හවුල්කරුවන් සමඟ ගිවිසුම් විධිමත් කිරීමේ කාර්යය සම්බන්ධයෙන් වූ මන්දගාමී ප්‍රගතිය ඇතුළු ව මුහුණ දුන් අභියෝග මධ්‍යයේ වුව ද, නව ආයතනික සන්ධාන ගොඩනඟාගැනීමේ සහ ජාත්‍යන්තර සිසුන් බඳවා ගැනීමේ කාර්යයන්හි සැලකිය යුතු ප්‍රගතියක් අපි අත් දුටු වෙමු. අප විශ්වවිද්‍යාලය "The World University Ranking" වැනි ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම්වල 1000-1200 අතර ස්ථානගත වෙමින් මෙම ප්‍රයත්නයන් තුළ අපගේ ගෝලීය ස්ථාවරය තවදුරටත් ඉදිරියට ගෙන ගොස් ඇත. තිරසාර සංවර්ධන ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරමින් ඇගයුම් කරනු ලබන "The Impact Ranking"ශ්‍රේණිගත කිරීම්වල ගෝලීය වශයෙන් 400 සහ 500 අතර ස්ථානගත කිරීම සහ U.S. News and World Report විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම මඟින් ශ්‍රී ලංකාවේ උසස් ම විශ්වවිද්‍යාලය ලෙස අප ව පිළිගැනීම සහ ගෝලීය විශ්වවිද්‍යාල අතර 901 වැනි ස්ථානයට අපව ශ්‍රේණිගත කිරීම අප ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

අපගේ පාර්ශවකරුවන්ගේ සහ සේවා ස්ථාන පරිසරයේ සමස්ත යහපැවැත්ම උදෙසා සිදු කරන ලද සුභසාධන කටයුතු සහ සංවර්ධන ක්‍රියාකාරකම් හි සැලකිය යුතු ප්‍රගතියක් 2023 දී ලබා ඇත. තව ද, අපගේ ගෞරවනීය ආදි ශිෂ්‍යයින්ගේ අඛණ්ඩ සහයෝගය ඇති ව මූල්‍යමය වශයෙන් අපහසුතා සහිත සිසුන්ගේ අවශ්‍යතා සපුරාලමින් අතිරේක ශිෂ්‍යත්ව සහ ශිෂ්‍ය ආධාර යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත. 2023 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ දී අපගේ කාන්තා කැරම් කණ්ඩායම සහ පිරිමි හොකී කණ්ඩායම ජයග්‍රහණය කිරීම වැනි කැපී පෙනෙන විජයග්‍රහණවල කුටප්‍රාප්තිය අප අත්විඳි අතර සංස්කෘතික ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනයට සමගාමී ව ආපනශාලා, නේවාසික ශාලා සහ ක්‍රීඩා පහසුකම් ඇතුළු පහසුකම් වැඩි දියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත.

විශ්වවිද්‍යාලයේ 84 වැනි උපාධි ප්‍රදානෝත්සවය සාර්ථක ව පවත්වන ලද අතර එහි දී උපාධිධාරීන් 3873 දෙනෙකුට උපාධි ප්‍රදානය කිරීම සහ කීර්තිමත් විද්වතුන් සිව් දෙනෙකුට ගෞරව උපාධි පිරිනැමීම සිදු විය. මීට අමතර ව, දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය සඳහා වූ උපාධි ප්‍රදානෝත්සවයේ දී උපාධිධාරීන් 550 දෙනෙකුගෙන් යුත් නව කණ්ඩායමකට උපාධි ප්‍රදානය කිරීම සිදු විය.

බලශක්ති පරිභෝජනය අවම කිරීම, අපද්‍රව්‍ය කළමනාකරණ පිළිවෙත් වැඩි දියුණු කිරීම, පාරිසරික භාරකාරත්වය පෝෂණය කිරීම සහ හන්තාන කලාපය නැවත හරිතකරණය කිරීම අරමුණු කරගත් ක්‍රියාකාරකම් මඟින් තිරසාර සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම තවදුරටත් අවධාරණය කර ඇත. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සමඟ සමපාත වන පරිදි දියත් කරන ලද තිරසාර වෙබ් අඩවිය අපගේ තිරසාර ප්‍රයත්නයන් පාර්ශවකරුවන් වෙත සන්නිවේදනය කිරීම සඳහා වූ වේදිකාවක් ලෙස ක්‍රියා කරයි.

අභියෝගාත්මක කාලවල දී ප්‍රශංසනීය දායකත්වයක් ලබා දුන් ආදි සිසුන් සමඟ අන්තර් ක්‍රියාකාරකම්වල නියැලීම ඇතුළු ප්‍රජා සහභාගීත්ව කටයුතුවල වර්ධනයක් මෙම වසරේදී පෙන්නුම් කර ඇත. අපගේ විශ්වවිද්‍යාලයේ දශක අටක පැවැත්ම සනිටුහන් කරමින් පවත්වන ලද සමාරම්භක විවෘත දිනය වැඩසටහන සඳහා පෙර නොවූ විරූ පරිදි මහජන උනන්දුව ආකර්ෂණය කර ගැනීමට හැකි වූ අතර එහි දී අපගේ දක්ෂතා ප්‍රදර්ශනය කිරීමට වේදිකාවක් නිර්මාණය විණි. මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය කෙටුම්පත් කිරීමේ දී නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පළාත් සභාව සහ මහනුවර මහ නගර සභාව වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන් සමඟ සහයෝගීතාවෙන් ඉටු කරන ලද කර්තව්‍යය මඟින් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා අපගේ දායකත්වය පිළිබිඹු විය.

ආර්ථික අභියෝග මධ්‍යයේ වුව ද, 2023 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වාර්ෂික පිරිවැටුම රු. බිලියන 11.1ක් වූ අතර ඉන් 23%ක් රැස් කරන ලද මුදල්වලින් සහ ප්‍රදානවලින් සමන්විත වී ඇත. රජයේ නියෝග සහ උද්ධමන පීඩනය යන කාරණා හේතු කොට ගෙන ප්‍රාග්ධන වියදම් ඉහළ යෑමෙන් නව ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති ආරම්භ කිරීමේ දී බාධා ඇති වුව ද, ආර්ථික අවහිරතා මධ්‍යයේ සිය මූල්‍ය කැපවීම්වලට ගරු කිරීම පිළිබඳ ව අපි රජයට අපගේ කෘතඥතාව පළ කරමු.

2042 දී අපගේ ශත සංවත්සරය සැමරීම සඳහා 'ශත සංවත්සර සංවර්ධන සැලැස්ම' නමින් වැඩපිළිවෙලක් හඳුන්වා දෙමින් පුළුල් දිගුකාලීන සැලැස්මක් සැකසීමෙන් 2023 වසර අපගේ විශ්වවිද්‍යාල වංශකථාවේ තීරණාත්මක අවස්ථාවක් සනිටුහන් කරන ලද වසරක් ලෙස ඉතිහාස ගත වනු ඇත. විද්වතුන්, ආදි සිසුන් සහ සභා සාමාජිකයින් 80කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ වන සහ විවිධ පාර්ශ්වකරුවන්ගේ ප්‍රතිපෝෂණ මඟින් මෙහෙයවනු ලබන මෙම සහයෝගීතා ප්‍රයත්නය සඳහා රජයෙන් මූලික අනුමැතිය ලැබී ඇති අතර ඒ සඳහා රුපියල් මිලියන 500ක මුදලක් සංවර්ධන කටයුතු ආරම්භ කිරීම සඳහා වෙන් කර දී ඇත. මෙම ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් අපගේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම, අන්තර් විෂයීක පර්යේෂණ ප්‍රවර්ධනය, සිසුන්ගේ පහසුකම් ඉහළ නැංවීම, ජාත්‍යන්තර කුසලතා ආකර්ෂණය කර ගැනීම සහ සූර්ය බලශක්ති විසඳුම් ක්‍රියාත්මක කිරීම යන කාරණා ක්‍රියාත්මක කිරීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු.

අපගේ උපාය මාර්ගික දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා දක්වන අචල කැපවීම සහ මෙම වාර්තාව සම්පාදනය කිරීමෙහි ලා දක්වන අමිල දායකත්වය පිළිබඳ ව විශ්වවිද්‍යාල පාලක සභාව සහ සමස්ත විශ්වවිද්‍යාල ප්‍රජාව වෙත මාගේ හෘදයාංගම ප්‍රශංසාව පිරිනමමි. මෙය සම්පාදනය කිරීමෙහි ලා විශ්වවිද්‍යාලයේ සංඛ්‍යාලේඛන අංශය විසින් දරන ලද අනගි ප්‍රයත්නය මාගේ සුවිශේෂී පිළිගැනීමට පාත්‍ර වන අතර, මේ සම්බන්ධයෙන් නියෝජ්‍ය උපකුලපතිතුමාගේ අගනා මග පෙන්වීම ද ඉමහත් සේ අගය කරමි.

උණුසුම් සුභපැතුම් !

මහාචාර්ය එම්.ඩී. ළමාවංශ
උපකුලපති

තොරතුරු සංක්ෂිප්ත ව

උපාය මාර්ගික සහ මෙහෙයුම් පියවර

අධ්‍යාපන

14181
උපාධි අපේක්ෂක සිසුන්

10140
පශ්චාත් උපාධි සිසුන්

පර්යේෂණ

30	**47.42** රු. මිලි.

ලැබුණු පර්යේෂණ ප්‍රදාන (බාහිර අරමුදල්)

26	**24.35** රු. මිලි.

පිරිනමන ලද පර්යේෂණ ප්‍රදාන

ශ්‍රේණිගත කිරීම්

 # 1
The Impact ශ්‍රේණිගත කිරීම්

 # 1
U.S.News සහ World Report ශ්‍රේණිගත කිරීම්

කාර්යයන්හි නියැලීම සහ හවුල්කාරිත්වය


27
අවබෝධතා ගිවිසුම්

145
ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සංචාර

මූල්‍ය පියවර


ආදායම

10,820.58
රු. මිලි.




ශුද්ධ වත්කම්/හිමිකම්

29,527.94
රු. මිලි.




පුනරාවර්තන වියදම්

11,163.18
රු. මිලි.



ඒක ශිෂ්‍ය පිරිවැය

0.78
රු. මිලි.





1. ව්‍යවස්ථාපිත වාර්තාව

1.1 හැඳින්වීම

දළ විශ්ලේෂණය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය වනාහි අධ්‍යයන විශිෂ්ටත්වය සහ පර්යේෂණ නවෝත්පාදන පෝෂණය කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ කැපවීම පිළිබඳ අගනා සාක්ෂියකි. 1942 වර්ෂයේ දී මෙරට ප්‍රථම විශ්වවිද්‍යාලය ලෙස ස්ථාපිත කරන ලද මෙම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ ඉහළ ම ජාතික විශ්වවිද්‍යාල අතර ශ්‍රේණිගත වෙමින් කීර්තිමත් උසස් අධ්‍යාපන ආයතනයක් බවට පත් වී ඇත.

ඓතිහාසික පසුබිම

1942 වර්ෂයේ දී ශාස්ත්‍ර පීඨය ඇතුළත් ලංකා විශ්වවිද්‍යාලය කොළඹ දී ආරම්භ කිරීමත් සමඟ විශ්වවිද්‍යාල ගමනේ ආරම්භය සනිටුහන් විය. මෙම පීඨය 1952 වර්ෂයේ දී පේරාදෙණියට ගෙන ගොස් ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ විධිමත් ලෙස ආරම්භ කරන ලදී. මහරම් මහනුවර නගරයේ සිට කිලෝමීටර් අටක් දුරින් පිහිටා ඇති මෙම විශ්වවිද්‍යාලය හෙක්ටයාර් 775ක භූමි ප්‍රමාණයක් පුරා පැතිරී ඇති අතර එය ඉගෙනීම් කටයුතුවලට මෙන් ම පර්යේෂණ කටයුතු සඳහා අවැසි සන්සුන් හා ප්‍රබෝධමත් පරිසරයකින් යුක්ත වේ.

ශාස්ත්‍රීය ව්‍යාප්තිය

පසුගිය දශක අට පුරා පේරාදෙණිය විශ්වවිද්‍යාලය ප්‍රමාණාත්මක ව මෙන් ම ගුණාත්මක භාවයෙන් සැලකිය යුතු වර්ධනයක් ලබා ඇත. වර්තමානයේ මෙම විශ්වවිද්‍යාලය විවිධ පීඨ නවයකින්, අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන හතරකින් සහ දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයකින් සමන්විත වේ. මෙම පීඨ කෘෂි විද්‍යා , සම සෞඛ්‍ය විද්‍යාව, ශාස්ත්‍ර, දන්ත වෛද්‍ය විද්‍යාව, ඉංජිනේරු, කළමනාකරණය, වෛද්‍ය, විද්‍යාව සහ පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යාව ඇතුළු පුළුල් විෂය ක්ෂේත්‍ර රැසකින් සමන්විත වේ. පශ්චාත් උපාධි ආයතන, පීඨ, සහ උසස් උපාධි කමිටු හෝ පශ්චාත් උපාධි ඒකක මඟින් පිරිනමනු ලබන SLQF මට්ටම් 7 සිට 12 දක්වා වූ පුළුල් පශ්චාත් උපාධි වැඩසටහන් මාලාවකට අමතර ව විශ්වවිද්‍යාලය විසින් SLQF මට්ටම් 5 සහ 6 දක්වා පරාසයක විහිදෙන පළමු උපාධි පාඨමාලා 62ක් පිරිනමනු ලබයි.

සහාය සේවා

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය අධ්‍යයන මෙහෙවරේ මූලික අවධානය සිය සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පරිපූර්ණ උපකාරක සේවාවන් සැපයීම කෙරෙහි

යොමු කර ඇත. මෙහි දී මධ්‍යම පරිපාලනය යටතේ, හිතකර ඉගෙනුම් සහ කාර්යය පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා මූලික සහාය සේවා පිරිනමනු ලැබේ. මෙම සේවාවන් හරහා ඉගෙනීම, පර්යේෂණ මෙන් ම සමස්ත පුද්ගලික සහ වෘත්තීය වර්ධනයට පහසුකම් සපය යි.

මධ්‍යස්ථාන, ඒකක සහ අංශ

මූලික සහාය සේවාවන්ට අමතර ව, විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල සුභසාධනය වැඩි දියුණු කිරීම, මූලික හා විෂය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සහ ජාතික අධ්‍යාපනික අරමුණු සමඟ පෙළ ගැස්වීම යන අරමුණු සඳහා සැලසුම් කර ඇති විවිධ මධ්‍යස්ථාන, ඒකක සහ අංශ පිහිටුවා ඇත. වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය, ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදනය, සහාය සේවා සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය, තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානය සහ ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය එකී ආයතනවලින් කිහිපයකි.

මානව සම්පත් සංවර්ධන ඒකකය වනාහි විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු අලුතින් පිහිටුවන ලද ඒකකයකි. පුහුණුවීම් සහ සංවර්ධන අවස්ථා පිරිනැමීම මෙන් ම දක්ෂ කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ රඳවා ගැනීමට සහාය වීම මෙහි ප්‍රධාන කාර්යය වේ.

ශාස්ත්‍රීය විශිෂ්ටත්වය සහ කීර්තිය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි ශ්‍රේෂ්ඨ ඉතිහාසය පිළිබඳ ව මෙන් ම, අධ්‍යයන විශිෂ්ටත්වය අරබයා වූ එහි අචල කැපවීම පිළිබඳ ව ආඩම්බර වේ. තත්ත්ව සහතිකකරණය, ජාත්‍යන්තර පිළිගැනීම සහ නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම යන කාරණා සම්බන්ධයෙන් දක්වන ලද කැපවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ තුළ ඉහළ පෙළේ උපාධිධාරීන් බිහි කිරීම සම්බන්ධයෙන් එය ඉමහත් කීර්තියක් අත් කර ගෙන ඇත. මෙම විශ්වවිද්‍යාලය රටේ උසස් අධ්‍යාපන ක්‍රියාවලියේ ඉදිරියෙන් ම සිටින ආයතනයක් වන අතර එය අධ්‍යයන හා පර්යේෂණ වැඩසටහන් මෙන් ම සිය සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ සුබසාධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් කටයුතු කරයි. මෙම කැපවීම හේතුවෙන් මෙම විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගමන් මග අඛණ්ඩ ව හැඩ ගස්වමින් කටයුතු කරන ප්‍රමුඛ ජාතික හා ජාත්‍යන්තර ආයතනයක් ලෙස පිළිගැනීමට ලක් වී ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ ප්‍රමුඛ පෙළේ උසස් අධ්‍යාපන ආයතනයකි. විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව මගින් විශ්වවිද්‍යාලය අධ්‍යයන විශිෂ්ටත්වය, පර්යේෂණ නවෝත්පාදන, ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල සුභසාධනය සහ ජාත්‍යන්තරකරණය යන අංශවල ලබා ඇති බොහෝ ජයග්‍රහණ ඉස්මතු කරයි. විශ්වවිද්‍යාලය තම සිසුන්ට ලෝක මට්ටමේ අධ්‍යාපනයක් ලබා දීමට සහ සමාජයට ධනාත්මක බලපෑමක් ඇති කරන පර්යේෂණ සිදු කිරීමට කැපවී මෙන් කටයුතු කරයි.

1.2 විශ්වවිද්‍යාලයේ දැක්ම සහ මෙහෙවර

දැක්ම

විශ්වවිද්‍යාලයේ ප්‍රාරම්භක වටිනාකම් හා මූලධර්ම මත පදනම් වූ නවෝත්පාදක පර්යේෂණ හා බාහිර ක්‍රියාකාරී වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම මඟින් මහජනතාවට සේවය කරමින් ස්වකීය ශිෂ්‍යයන්ට, කාර්ය මණ්ඩලයට සහ හවුල්කාර පාර්ශ්වවලට අනන්‍ය පරිවර්තනීය අත්දැකීමක් ලබා දීම.

මෙම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය මතු දැක්වෙන ප්‍රයත්න දරයි.

- දක්ෂතාවලින් හෙබි සිසුන්, සමාජීය වගකීම් සහිත, ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ සංවේදී, පරිසරය පිළිබඳ සවිඥානික, පරාර්ථකාමී උපාධිධාරීන් බවට පරිවර්තනය කිරීමට පහසුකම් සැලසෙන පරිදි වෘත්තීය සුරක්ෂිතතාව සහතික කරන බාහිර වැඩසටහන් ද ඇතුළත් ව අසමසම, නව්‍ය හා යෝග්‍ය ඉගෙනුම් හා ඉගැන්වීමේ වැඩසටහන් මාලාවක් සැපයීම.

- විශිෂ්ට උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස සාමාන්‍ය ජනතාව, ජාතිය, කලාපය සහ පුළුල් ගෝලීය ප්‍රජාව සඳහා සුවිශේෂී සේවයක් ඉටු කිරීම.

- ස්වදේශික හා ප්‍රාදේශික ප්‍රජාවන්ගෙන් ලබන ඉගෙනීම ද සමාජයේ අභිලාෂ, සංස්කෘති සහ හර පද්ධති පෝෂණය කිරීමෙහි ලා ඵලදායී ලෙස කටයුතු කරන කාර්ය මණ්ඩලය සහ ආදී ශිෂ්‍යයන් අත් කර ගන්නා ජාත්‍යන්තර කීර්ති නාමය ද සහිත ව සිය පර්යේෂණවල ගුණාත්මකභාවය සහ බලපෑම තීව්‍ර කිරීම.

- විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනික, සංස්කෘතික හා සමාජීය ජීවිතය සඳහා සාර්ථක ව සහභාගී වීම උදෙසා සිසුන් සහ ප්‍රජා සාමාජිකයන් සවිබල ගැන්වීම සහ අඛණ්ඩ ව සහාය ලබා දීම හා එමඟින් තුලිත හා තිරසාර ගෝලීය සංවර්ධනයක් සඳහා දායක වීම පිණිස ගුණාත්මක නවතාවකින් යුක්ත ව ක්‍රියාත්මක වීම.

- ජාතික ඉලක්ක සපුරාලීම සහ ප්‍රධාන හර පද්ධති හා මූලධර්ම පවත්වා ගනු පිණිස අධ්‍යාපනය, පුහුණුව, සහතික කිරීම, පර්යේෂණ, ශිෂ්‍යත්ව සහ දැනුම ව්‍යාප්තිය යන කරුණුවල අදාළත්වය සහ දායකත්වය ඉහළ නැංවීම සඳහා සිදු කරනු ලබන කටයුතුවල දී සියලු ම ප්‍රධාන පාර්ශ්වකරුවන් සමග ගැඹුරින් හා අන්‍යෝන්‍ය සුහදතාවකින් යුතු ව අසමසම ලෙස කටයුතු කිරීම.

- ලෝකයේ හොඳ ම විශ්වවිද්‍යාල හා සැසඳිය හැකි පරිදි පාර්ශ්වකරුවන්ගේ තෘප්තිය සහ ඉගෙනුම් ප්‍රතිඵල විශිෂ්ට ලෙස සාක්ෂාත් කර පවත්වා ගෙන යාම.

මෙහෙවර

අධ්‍යාපනය, අධ්‍යයනය සහ පර්යේෂණ මඟින් ද ජාත්‍යන්තර උසස් විශිෂ්ටතා මට්ටම්වල දැනුම බෙදා හැරීම මඟින් ද ජාතික, කලාපීය සහ විශ්ව සමාජ තලවලට දායක වීම.

අරමුණු

අරමුණ	අභිමතාර්ථ	
1. ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදාළත්වය සහතික කිරීම.	1.1	වඩාත් ම ඉල්ලුමක් ඇති හොඳ ම දක්ෂතා ඇති උසස් පෙළ සුදුසුකම් ලත් සිසුන් (ජාතික සහ ජාත්‍යන්තර) ආකර්ෂණය වන සහ ඇතුළත් කර ගනු ලබන උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාලය බවට පත් වීම.
	1.2	ප්‍රතිඵල මත පදනම් වූ අධ්‍යාපනය තුළින් සේවා යෝජක අපේක්ෂාවන් සහ උපාධි අපේක්ෂක කුසලතා අතර පරතරය පියවීමට අවශ්‍ය ශිෂ්‍ය නිපුණතා වර්ධනය කිරීම.
	1.3	ජාතික හා ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන් වැඩිදියුණු කිරීම.
	1.4	උපාධි අපේක්ෂකයින්ගේ රැකියා නියුක්තභාවය වැඩි කිරීම.
	1.5	පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්වල ගුණාත්මකභාවය සහ අදළබව වැඩි කිරීම.
2. පශ්චාත් උපාධි සහ අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහන් වඩාත් නම්‍යශීලී, ප්‍රවේශ විය හැකි, නව්‍ය සහ විවෘතබව සහතික කිරීම මඟින් අධ්‍යාපනය සඳහා වන අවස්ථා පුළුල් කිරීම.	2.1	පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා දේශීය හා විදේශීය සිසුන්ගේ ඉල්ලුම සහ බඳවා ගැනීම ඉහළ නැංවීම.
	2.2	ජාතික සහ කලාපීය අවශ්‍යතා සපුරාලීම සහ ජාතික සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන සහ පුහුණු වැඩසටහන් සහ සේවාවන්හි විෂය පථය පුළුල් කිරීම සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
3. ගෝලීය වශයෙන් බලපෑමක් සහ දෘශ්‍යතාවක් සහිත දැනුම නිර්මාණය කිරීම සහ සමාජ-ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් නව්‍ය පර්යේෂණ, ශාස්ත්‍රීය කටයුතු සහ හවුල්කාරිත්වයන් සඳහා ධාරිතාව වැඩි දියුණු කිරීම.	3.1	උසස් තත්ත්වයේ පර්යේෂණ, ශාස්ත්‍රීය කටයුතු සහ නවෝත්පාදන සඳහා හිතකර පරිසරයක් ස්ථාපිත කිරීම.
	3.2	පර්යේෂණ, ශිෂ්‍ය පුහුණුව සහ කාර්ය මණ්ඩල හුවමාරුව සඳහා ජාතික සහ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.
	3.3	බහුවිෂයික පර්යේෂණ වැඩසටහන් සඳහා පහසුකම් සැලසීම.
4. තිරසාර යහපාලන කාර්යරාමුවක් තුළ පරිපාලන සහ මූල්‍ය කාර්යක්ෂමතාවය ශක්තිමත් කිරීම.	4.1	පවතින පරිපාලන හා මූල්‍ය රාමුවේ සහ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ සඵලතාව වැඩි දියුණු කිරීම.
	4.2	පරිපාලන හා මූල්‍ය කටයුතුවලට අදාළ අධීක්ෂණ, ඇගයීම් සහ වාර්තාකරණ ක්‍රමවේද වැඩිදියුණු කිරීම.
	4.3	මූල්‍ය පරිපාලනයේ වගවීම සහ විනිවිදභාවය වර්ධනය කිරීම.
	4.4	විවිධ ආයතන මඟින් අරමුදල් උත්පාදනය දිරිමත් කිරීම.
5. උසස් තත්ත්වයේ අධ්‍යයන කටයුතු, ව්‍යාත්තීය සංවර්ධනය සහ ඵලදායිතාව සඳහා හිතකර ඉගෙනුම්, කාර්ය සහ ජීවන පරිසරයක් ඇති කිරීම.	5.1	විශ්වවිද්‍යාල ජීවිතයේ සෑම අංශයක කටයුතුවල නිරත වීමට සිසුන් සහ කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම.
	5.2	කාර්ය මණ්ඩල පැතිකඩ වැඩිදියුණු කිරීම.
	5.3	සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා තේවාසික පහසුකම්, සුබසාධන සේවා සහ වැඩසටහන් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම.
	5.4	විශ්වවිද්‍යාලයෙ තුළ ආරක්ෂිත සහ සුරක්ෂිත සේවා පරිසරයක් ඇතිකිරීම.
	5.5	විශ්වවිද්‍යාල යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා සේවාවන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම.
	5.6	විශ්වවිද්‍යාලයේ ඓතිහාසික හා භූ දර්ශන ලක්ෂණ පවත්වා ගනිමින් "හරිත පරිසරයක්" යන සංකල්පය අනුගමනය කිරීම.
	5.7	ගෝලීය ප්‍රගතිය සහ අභියෝග සමඟ අනුගත වීමට ඩිජිටල් සහ භෞතික ඉගෙනුම් සහ සේවා පරිසරය ප්‍රශස්ත කිරීම.
6. ධාරිතා වර්ධන සහ බාහිර ක්‍රියාකාරිත්වල නියැලීමේ පරාසය පුළුල් කිරීම.	6.1	විශ්වවිද්‍යාලය මඟින් ප්‍රජාවට ලබා දෙන සේවාවන්හි ගුණාත්මකභාවය, තිරසාරභාවය සහ පරාසය වැඩිදියුණු කිරීම.
	6.2	ප්‍රජාව සමඟ පුළුල් අන්තර් ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කිරීම.
	6.3	අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා බාහිර පාර්ශ්වකරුවන් සමඟ විශේෂඥ දැනුම සහ මානව හා භෞතික සම්පත් බෙදා හදා ගැනීම.
	6.4	ජාතික ප්‍රතිපත්ති රාමු සහ ක්‍රියාවන් සමඟ අනුකූල වීම.

1.3 කළමනාකරණය සහ ව්‍යුහය

1.3.1 පේරාදෙණිය විශ්වවිද්‍යාල පාලක සභාව 2023

1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 24 වැනි වගන්තිය මඟින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 44 වැනි වගන්තිය ප්‍රකාර ව විශ්වවිද්‍යාල පාලක සභාව පිහිටුවා ඇති අතර 2023 වර්ෂයේ එය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය.

සභාපති		
උපකුලපති	මහාචාර්ය එම්.ඩී. ළමාවංශ	MBBS (රුහුණ), MS (කොළඹ), Ph.D. (වෙස්ටර්න් ඔස්ට්‍රේලියා විශ්වවිද්‍යාලය), FRCS (එඩින්බරෝ), FCSSL (ශ්‍රී ලංකා), FASI (ඉන්දියා), FRCS (පකිස්තාන්), FAMASI (ඉන්දියා)
නියෝජ්‍ය උපකුලපති	මහාචාර්ය ටෙරන්ස් මධුජිත්	B.Sc. කෘෂි විද්‍යා (පේරාදෙණිය), M.Sc. (කැනඩා), Ph.D. (කැනඩා), M.I.Biol. (ශ්‍රී ලංකා)
පීඨාධිපතිවරුන්		
කෘෂි විද්‍යා පීඨය	මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු	B.Sc. කෘෂි විද්‍යා (පේරාදෙණිය), MBA, Ph.D. (ස්ටර්ලින්), FIMSL
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර	BVSc. (පේරාදෙණිය), Ph.D (කොචි), FSLCVS
ශාස්ත්‍ර පීඨය	ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක	BA, PGDE (පේරාදෙණිය), M.Ed.(සසෙක්ස්), M.Phil.(කොළඹ), Ph.D.(ලෙස්ටර්)
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	මහාචාර්ය ඒ.එම්. ආටිගල	BDS (පේරාදෙණිය), MS (කොළඹ), FDSRCS (ඉංජිනේරු)
ඉංජිනේරු පීඨය	ආචාර්ය ඩී.එම්.යූ.අයි. දිසානායක	B.Sc.ඉංජිනේරු (පේරාදෙණිය), Ph.D.(ෂෙෆීල්ඩ්)
කළමනාකරණ පීඨය	මහාචාර්ය ආර්.එච්. කුරුප්පුගේ	B.Com, PG Dip (පේරාදෙණිය), MA. (කැලණිය), MBA (කොළඹ), Ph.D. (තෝමස් බාටා - චෙක් ජනරජය)
වෛද්‍ය පීඨය	මහාචාර්ය එම්.වී.ජී. පින්ටෝ	MBBS (පේරාදෙණිය), MD (කොළඹ), FRCA (එ.රා.), FCARCSI (අයර්ලන්තය)
විද්‍යා පීඨය	මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ	B.Sc., M.Phil. (පේරාදෙණිය), Ph.D. (හොකයිඩෝ)
පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය	මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර	B.V.Sc. (පේරාදෙණිය), Ph.D. (ලන්ඩන්)
සනාතන සභාවෙන් නම් කරන ලද සාමාජිකයන්		
මහාචාර්ය	මහාචාර්ය බී.එම්.එස්.එච්.කේ බන්නැහැක	BD (පේරාදෙණිය), Ph.D. (නිගතා)
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ	B.A. (පේරාදෙණිය), Ph.D. (හවායි)

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයන්	
සමන්ත රත්වත්ත මහතා	ජනාධිපති නීතිඥ
මහාචාර්ය කේ. ගුණවර්ධන	MBBS, MS (ප්‍රසව හා නාරී), FRCGO
මහාචාර්ය එන්.ඒ. ද එස්. අමරතුංග	BDS, FDSRCS, Ph.D., D.Sc.
ජී.එස්.ජේ. දිසානායක මහතා	GCGI (එක්සත් රාජධානිය)
ආචාර්ය සිරිල් විජේසුන්දර	B.Sc. (පේරාදෙණිය), Ph.D. (සිටි යුනිවසිටි-නිව් යෝර්ක්), F.N.A.S (ශ්‍රී ලංකා)
අතිපූජ්‍ය නියංගොඩ විජිතසිරි හිමි	B.A, B.Ed. (පේරාදෙණිය), සාහිත්‍යය චක්‍රවර්ති, ආචාර්ය

ජේ. සී. වර්ණකුල මහතා	B.Sc. ව්‍යාපාර පරිපාලනය (ජයවර්ධනපුර)
පී.සී. සාලිය ධර්මවර්ධන මහතා	B.Sc.ව්‍යාපාර පරිපාලනය (ජයවර්ධනපුර), MPA (PIM),CPA (අයර්ලන්තය සහ ශ්‍රී ලංකාව), DPFM (ස්ලීඩා), DIPCA(MILODA)
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක	B.Dev.S, PG.Dip. (කොළඹ), MA (බ්‍රසල්ස්), Ph.D. (ඇඩිලේඩ්), FRSA (එක්සත් රාජධානිය)
ආචාර්ය ඩී.එම්.ඩී.වී. ජයම්පති	B.Sc. (ඉංජිනේරු), M.Sc, Ph.D.
මොහාන් වීරකෝන් මහතා	
ආචාර්ය ආර්.එච්.එස්. සමරතුංග	B.A ගෞරව (පේරාදෙණිය), M.Sc. (විස්කොන්සින්-මැඩිසන්), MBA (ජයවර්ධනපුර), Ph.D. (ලා ට්‍රෝබ්)
නිරෝධා එස්. කලංසූරිය මහත්මිය	LL.B, LL.M. (කොළඹ), LLM (එක්සත් රාජධානිය)
ඊ.එම්. ගාමිණී ඒකනායක මහතා	B.A (පේරාදෙණිය), PG.Dip (ශ්‍රී ලංකා විවෘත වි.වි.), MBA (වයඹ)

ලේකම් - ලේඛකාධිකාරී (වැඩ බලන)

ඊ.එම්.ජී.එම්.බී. ඒකනායක මහතා	B.A., M.A. (පේරාදෙණිය), M.A. (රාජ්‍ය කළමනාකරණය) (ස්ලීඩා)


විශ්වවිද්‍යාලය මෙහෙයවීම: 2023 දී පාලක සභා අනුකමිටු විසින් පවත්වන ලද රැස්වීම් පිළිබඳ සාරාංශයක්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව අධ්‍යයන විශිෂ්ටත්වයට සහ පරිපාලන කාර්යක්ෂමතාව සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීමේ කාර්යයේ දී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. 2023 දී, මූල්‍ය කළමනාකරණය සහ යටිතල පහසුකම් සංවර්ධනයේ සිට ශිෂ්‍ය සුභසාධනය සහ සදාචාරාත්මක හැසිරීම යන අංශ ආවරණය වන පරිදි විශ්වවිද්‍යාල ජීවිතයේ විවිධ පැතිකඩ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කැපවීමෙන් කටයුතු කරන එහි අනුකමිටු නිතිපතා රැස් විය.

වර්ෂය තුළ එක් එක් අනුකමිටුව විසින් පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව පිළිබඳ ව මෙම වගුව මඟින් සැකෙවින් දැක්වේ.

පාලක සභා අනුකමිටු		රැස්වීම් සංඛ්‍යාව
සභාව		**15**
1.	විනය මණ්ඩලය	05
2.	මූල්‍ය කමිටුව	14
3.	මූල්‍ය කළමනාකරණ කමිටුව	00
4.	විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව	12
5.	විගණන උපදේශක කමිටුව	00
6.	බැඳුම්කර කමිටුව	03
7.	නිවාඩු සහ සම්මාන කමිටුව	09
8.	උපායමාර්ගික සැලසුම් සහ කළමනාකරණ කමිටුව	10
9.	යටිතල පහසුකම් සංවර්ධන හා කළමනාකරණ කමිටුව	05
10.	ඉඩම්, ගොඩනැගිලි සහ නඩත්තු කමිටුව	08
11.	නඩත්තු කළමනාකරණ කමිටුව	00
12.	උද්‍යාන අලංකරණ උපදේශක කමිටුව	02
13.	මානව සම්පත් කළමනාකරණ සහ සංවර්ධන කමිටුව	02
14.	විගණන සහ කළමනාකරණ කමිටුව	05
15.	කාර්ය මණ්ඩල නේවාසික කමිටුව	04
16.	ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිරිහැර සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුව	05
17.	අවබෝධතා ගිවිසුම් සහ ගිවිසුම් පරීක්ෂා කිරීම සඳහා පාලක සභාව පත් කරන ලද අනුකමිටුව	12
18.	බුද්ධිමය දේපළ උපදේශක කමිටුව	02
19.	දුක්ගැනවිලි පිළිබඳ කමිටුව	09
20.	පාලක සභා සංදේශ පරිශීලනය කිරීම සඳහා වන අනුකමිටුව	07
21.	නවකවදය වැළැක්වීමේ කමිටුව	07

සංවිධාන ව්‍යුහය - පේරාදෙණිය විශ්වවිද්‍යාලය



ද.නා අ.අ.ම - දරුස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනය
කෘ.ප.උ.ආ - කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය
වි.ප.උ.ආ - විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
මා.ශා හා ස.වි.ප.උ.ආ- මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
වෛ.වි.ප.උ.ආ - වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

නි.ලේ. - නියෝජ්‍ය ලේඛකාධිකාරී
නි.මූ - නියෝජ්‍ය මූලාධිකාරී
නි.අ.වි - නියෝජ්‍ය අභ්‍යන්තර විගණක
ජේ.ස.ලේ- ජේෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ජේ.ස.මූ - ජේෂ්ඨ සහකාර මූලාධිකාරී
ජේ.ස.අ.වි - ජේෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක

ස.ලේ- සහකාර ලේඛකාධිකාරී
ස.මූ - සහකාර මූලාධිකාරී
ස.අ.වි - සහකාර අභ්‍යන්තර විගණක

1.3.2 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව 2023

1985 අංක 7 දරණ පනත මඟින් සංශෝධිත 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 46 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සනාතන සභාව විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බලධාරියා වේ.

සනාතන සභාවේ සාමාජිකයින් පහත පරිදි වේ.

සභාපති

උපකුලපති	මහාචාර්ය එම්.ඩී. ළමාවංශ	**නියෝජ්‍ය උපකුලපති**	මහාචාර්ය ටෙරන්ස් මධුජිත්

පශ්චාත් උපාධි ආයතනවල අධ්‍යක්ෂවරු

කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ පිටවල
මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය එස්.ජේ.එස්. ද මෙල්
වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	මහාචාර්ය එස්.බී. ධර්මරත්න

පීඨාධිපතිවරුන්

කෘෂි විද්‍යා පීඨය	මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර
ශාස්ත්‍ර පීඨය	ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	මහාචාර්ය ඒ.එම්. ආටිගල
ඉංජිනේරු පීඨය	ආචාර්ය ඩී.එම්.යූ.අයි. දිසානායක
කළමනාකරණ පීඨය	මහාචාර්ය ආර්.එච්. කුරුප්පුගේ
වෛද්‍ය පීඨය	මහාචාර්ය එම්.වී.ජී. පින්ටෝ
විද්‍යා පීඨය	මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ
පශු වෛද්‍ය විද්‍යා සහ සත්ත්ව විද්‍යා පීඨය	මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර

පුස්තකාලයාධිපති	ආර්. මහේෂ්වරන් මහතා

අධ්‍යයනාංශ ප්‍රධානීන්

කෘෂි විද්‍යා පීඨය

කෘෂි ජීව විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එස්.ඒ.සී.එන්. පෙරේරා
කෘෂි ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එස්. කුමාර්
කෘෂි ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එන්.ඩී.කේ. දයාවංශ
කෘෂි ව්‍යාප්ති විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ඩී.එම්.යූ.අයි. දිසානායක
සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය බී.සී. ජයවර්ධන
බෝග විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය සී.කේ. බෙනරගම
ආහාර විද්‍යා සහ තාක්ෂණ අධ්‍යයනාංශය	මහාචාර්ය ආර්.පී.එන්.පී. රාජපක්ෂ
පාංශු විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ඩබ්ලිව්.ඒ.යූ. විතාරණ

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

වෛද්‍ය රසායනාගාර විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය බී.සී.ජී. මෙන්ඩිස්
හෙදවේද අධ්‍යයනාංශය	මහාචාර්ය එච්.ඩී.ඩබ්ලිව්.ටී. දමයන්ති
භෞත චිකිත්සා අධ්‍යයනාංශය	ආචාර්ය ආර්.ආර්.ඩබ්ලිව්.එම්.එස්.අයි.ඩබ්ලිව්. වඩුගොඩපිටිය
විකිරණවේදය / විකිරණ චිකිත්සා අධ්‍යයනාංශය	ආචාර්ය යූ.ජේ.එම්.ඒ.එල්. ජයසිංහ
ඖෂධවේද අධ්‍යයනාංශය	ආචාර්ය එන්.ආර්. අමරසිංහ
මූලික විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ටී.පී. ගමගෙදර

ශාස්ත්‍ර පීඨය

අරාබි සහ ඉස්ලාමීය ශිෂ්ටාචාර අධ්‍යයනාංශය	එම්.ඒ.එම්. යසීර් මහතා
පුරා විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ජේ.එම්.ඒ. ජයවික්‍රම
සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශය	ආචාර්ය කේ.එම්.ආර්.එන්. කුලතුංග
ආර්ථික විද්‍යා සහ සංඛ්‍යාන අධ්‍යයනාංශය	මහාචාර්ය ජේ.ජී. ශ්‍රී රංජිත්
ඉංග්‍රීසි අධ්‍යයනාංශය	ආචාර්ය එන්.එම්. කළුගම්පිටිය
ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම් අධ්‍යයනාංශය	ආචාර්ය පී.ආර්.කේ.ඒ. විතාරණ
ලලිත කලා අධ්‍යයනාංශය	මහාචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්. බණ්ඩාර
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ටී.ඩබ්ලිව්.එම්.ටී. ඩබ්ලිව්. බණ්ඩාර
ඉතිහාසය අධ්‍යයනාංශය	මහාචාර්ය කේ.එම්.ආර්. දසනායක
අධ්‍යාපන අධ්‍යයනාංශය	මහාචාර්ය කේ.එස්.එච්.එම්.වී.ඩබ්ලිව්.ඩබ්ලිව්. සෙනෙවිරත්න
තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය	මහාචාර්ය ටී.එම්.එස්.එස්.කේ.වයි. ඒකනායක
නීති අධ්‍යයනාංශය	ආචාර්ය එම්.එල්.කේ.සී.කේ. සේනාරත්න
දර්ශනය අධ්‍යයනාංශය	මහාචාර්ය එච්.ආර්.එන්.පී.කේ. හඳගම
මනෝවිද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය අසංක බුලත්වත්ත
දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ජී.ඩී.ආර්.යූ.යූ. අබේරත්න
පාලි සහ බෞද්ධ අධ්‍යයන අධ්‍යයනාංශය	මහාචාර්ය එච්.එම්.එම්. හේරත්
සිංහල අධ්‍යයනාංශය	ආචාර්ය එස්.කේ.එම්.ඩී.ඩී. ගුණතිලක
සමාජ විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ඩබ්ලිව්.එම්.එස්.එම්.කේ. තෝරදෙණිය
දෙමළ අධ්‍යයනාංශය	මහාචාර්ය එස්. පිරශාන්තන්

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

මූලික විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක
ප්‍රජා දන්ත සෞඛ්‍ය අධ්‍යයනාංශය	ආචාර්ය එච්.එස්.කේ. රත්නතිලක
විස්තීර්ණ මුඛ සෞඛ්‍ය සත්කාර අධ්‍යයනාංශය	මහාචාර්ය කේ.එම්. විජේරත්න
මුඛ වෛද්‍ය විද්‍යා සහ පරිදන්ත විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ඩී. ලෙව්කේබණ්ඩාර
මුඛ ව්‍යාධිවේද අධ්‍යයනාංශය	මහාචාර්ය බී.එස්.එම්.එස්. සිරිවර්ධන
කෘතිම දන්ත වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය අයි.පී. තිලකුමාර්
ප්‍රතිස්ථාපන දන්ත වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ජී.කේ. එදිරිසිංහ
මුඛ සහ මැක්සිලෝෆේසියල් සැත්කම් අධ්‍යයනාංශය	මහාචාර්ය එන්.එස්.එස්. ජයසූරිය

ඉංජිනේරු පීඨය

රසායනික සහ ක්‍රියාවලි ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ඩී.ජී.ජී.පී. කරුණාරත්න
සිවිල් ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ජේ.ජේ. විජේතුංග
පරිගණක ඉංජිනේරු අධ්‍යයනාංශය	මහාචාර්ය ආර්.ඩී. රගෙල්
විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශය	මහාචාර්ය බී.ජී.එල්.ටී. සමරනායක
ඉංජිනේරු කළමනාකරණ අධ්‍යයනාංශය	කේ.කේ.කේ. සිල්වා මහත්මිය
ඉංජිනේරු ගණිත අධ්‍යයනාංශය	ආචාර්ය එස්.පී.සී. පෙරේරා
යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ඩී.ඒ.ඒ.සී. රත්නවීර
නිෂ්පාදන සහ කාර්මික ඉංජිනේරු අධ්‍යයනාංශය	ආචාර්ය පී. ගමගේ

කළමනාකරණ පීඨය

ව්‍යාපාර මූල්‍ය අධ්‍යයනාංශය	මහාචාර්ය එස්. කොඩිතුවක්කු
මානව සම්පත් කළමනාකරණ අධ්‍යයනාංශය	යූ.ඩබ්ලිව්.ජී.වයි.ඊ. ජයවික්‍රම මහත්මිය
කළමනාකරණ අධ්‍යයන අධ්‍යයනාංශය	ටී.එස්.එස්. ප්‍රනාන්දු මහතා
අලෙවි කළමනාකරණ අධ්‍යයනාංශය	ආර්.එම්.යූ.ආර්.කේ. රත්නායක මහත්මිය
මෙහෙයුම් කළමනාකරණ අධ්‍යයනාංශය	ආචාර්ය එස්. මහේෂ්වරන්

වෛද්‍ය පීඨය

ව්‍යූහ විද්‍යාව අධ්‍යයනාංශය	ආචාර්ය ඩී.ආර්.කේ.සී. දිසානායක
නිර්වින්දන සහ දැඩි සත්කාර අධ්‍යයනාංශය	මහාචාර්ය පී.එස්.කේ. නානායක්කාර
ජෛව රසායන අධ්‍යයනාංශය	මහාචාර්ය සී.එන්.ආර්.ඒ. අලස්
ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ටී.එම්.යූ.එස්.බී. තෙන්නකෝන්
පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එල්.පී.එම්.එම්.කේ. පතිරගේ

අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ඩී.එම්.ජී. ප්‍රනාන්දු
වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයනාංශය	මහාචාර්ය කේ.එන්. මාරඹේ
ඖෂධ අධ්‍යයනාංශය	මහාචාර්ය ඩී.එම්.පී.යූ.කේ. රලපනාව
ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය වී. ලියනපතිරණ
ප්‍රසව හා නාරීවේද අධ්‍යයනාංශය	ආචාර්ය එම්. සී. ගිහාන්
ළමා රෝග අධ්‍යයනාංශය	මහාචාර්ය පී.වී. දිසානායක
පරපෝෂිත විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ඩී.එන්. අතපත්තු
ව්‍යාධවේද අධ්‍යයනාංශය	මහාචාර්ය එස්. විජේතුංග
ඖෂධවේද අධ්‍යයනාංශය	ආචාර්ය එච්.එම්.ටී.ඩබ්ලිව්. සෙනවිරත්න
කායික විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ඩී.ඩබ්ලිව්.පී. දහනායක
මනෝචිකිත්සා අධ්‍යයනාංශය	ආචාර්ය එච්.ජී.වී.ඩබ්ලිව්. විජේසිරි
විකිරණවේද අධ්‍යයනාංශය	මහාචාර්ය පී.බී. හේවාවිතාන
ශල්‍යකර්ම අධ්‍යයනාංශය	මහාචාර්ය ඒ.කේ.බී.බී.ටී.බී. සමරසිංහ

විද්‍යා පීඨය

උද්භිද විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එස්.සී.කේ. රුබසිංහ
රසායන විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එම්.වයි.යූ. ගනේහේනගේ
ගණිතය අධ්‍යයනාංශය	ආචාර්ය ඩබ්ලිව්.එම්.පී. රුද්‍රිගෝ
පාරිසරික සහ කාර්මික විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය ඩබ්ලිව්.එම්.සී.එස්. විජේසුන්දර
භූ විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය බී.එම්.එන්.ඩබ්ලිව්.බී. බාලසූරිය
අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ අධ්‍යයනාංශය	ආචාර්ය එම්.පී.සී.එස්. ධනපාල
භෞතික විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය වී. සිවකුමාර්
සංඛ්‍යාන සහ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය එස්.පී. අබේසුන්දර
සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය එස්.එච්. බෝයගොඩ

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය

මූලික පශු වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශය	ආචාර්ය එල්.ජී.එස්. ලොකුගලප්පත්ති
ගොවිපළ සත්ත්ව නිෂ්පාදනය සහ සෞඛ්‍ය අධ්‍යයනාංශය	ආචාර්ය එම්.එන්.එම්. ෆවුසි
පශු වෛද්‍ය සායනික විද්‍යා අධ්‍යයනාංශය	මහාචාර්ය ඒ. දංගොල්ල
පශු වෛද්‍ය ව්‍යාධිවේද අධ්‍යයනාංශය	ආචාර්ය ඒ. ඩබ්ලිව්. කළුපහන
පශු වෛද්‍ය මහජන සෞඛ්‍ය	මහාචාර්ය බී.ආර්. ප්‍රනාන්දු

අංශ ප්‍රධානීන් නොවන මහාචාර්යවරු

කෘෂි විද්‍යා පීඨය

මහාචාර්ය ඒ.ආර්.එස්.බී. අතාවුද	මහාචාර්ය එම්.අයි.එම්. මවුජූඩ්
මහාචාර්ය කේ.එස්.පී. අමරතුංග	මහාචාර්ය එන්.ඒ.ඒ.එස්.පී. නිශ්ශංක
මහාචාර්ය පී.සී.ජී. බණ්ඩාරනායක	මහාචාර්ය පී.එච්.පී. ප්‍රසන්න
මහාචාර්ය ඩී.එම්. ද කොස්තා	මහාචාර්ය ඩී.වී.පී. ප්‍රසාද්
මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ජේ.එම්. ද කොස්තා	මහාචාර්ය බී.ඩී.ආර්. ප්‍රසන්ත
මහාචාර්ය ඩබ්ලිව්.එස්. දන්දෙණිය	මහාචාර්ය ඩී.කේ.එන්.ජී. පුෂ්පකුමාර
මහාචාර්ය ආර්.එම්.සී. දේශප්‍රිය	මහාචාර්ය ආර්.එම්.සී.පී. රාජපක්ෂ
මහාචාර්ය ආර්.එස්. ධර්මකීර්ති	මහාචාර්ය එස්. සමිත
මහාචාර්ය ඩී.ඒ.එන්. ධර්මසේන	මහාචාර්ය කේ.එම්.එස්. විමලසිරි
මහාචාර්ය ජේ.පී. ඊශ්වර	මහාචාර්ය ජී.එල්.එල්.පී. සිල්වා
මහාචාර්ය කේ.එස්. හේමචද්‍ර	මහාචාර්ය ඩබ්.පී.ආර්.පී. ද සිල්වා
මහාචාර්ය එච්.එම්.වී.ජී. හේරත්	මහාචාර්ය ටී. සිවනන්තවර්ල්
මහාචාර්ය එච්.එම්.ජී.එස්.බී. හිටිනායක	මහාචාර්ය බී.එම්.එල්.ඩී.බී. සූරියගොඩ
මහාචාර්ය එස්.එම්.සී. හිමාලි	මහාචාර්ය ජේ.කේ. විද්‍යානආරච්චි
මහාචාර්ය කේ.කේ.එස්.පී. කොඩිතුවක්කු	මහාචාර්ය එච්.එල්.ජේ. වීරහේවා
මහාචාර්ය පී.ඩබ්ලිව්.එම්.බී.බී. මාරඹේ	මහාචාර්ය ඩබ්.ඒ.පී. වීරක්කොඩි
මහාචාර්ය බී.ඊ.පී. මෙන්ඩිස්	මහාචාර්ය කේ.ඩබ්ලිව්.එල්.කේ. වීරසිංහ
මහාචාර්ය ඒ.ජේ. මොහොට්ටි	මහාචාර්ය එම්.පී.බී. විජේගුණවර්ධන

සම සෞඛ්‍ය විද්‍යා පීඨය

මහාචාර්ය එච්.එම්.ටී.යූ. හේරත්
මහාචාර්ය එම්.එච්.එෆ්. සකීනා
මහාචාර්ය ඩී.බී.එම්. වික්‍රමරත්න

ශාස්ත්‍ර පීඨය

මහාචාර්ය ඒ.එස්.පී. අභයරත්න
මහාචාර්ය පී.පී.ඒ.ඩබ්ලිව්. අතුකෝරල
මහාචාර්ය ආර්.එම්.එම්. චන්ද්‍රරත්න
මහාචාර්ය ඕ.ජී. දයාරත්න බණ්ඩා
මහාචාර්ය ඩී.එම්.එල්. දිසානායක
මහාචාර්ය පූජ්‍ය එම්. ඤාණානන්ද
මහාචාර්ය ඩී.එන්.බී. ගුණවර්ධන
මහාචාර්ය එච්.ඒ.එන්.එම්. හෙන්නායක
මහාචාර්ය එච්.එම්.ඩබ්ලිව්.එච්.ඒ. හේරත්
මහාචාර්ය ආර්.එම්.ඩී.බී.හේරත්
මහාචාර්ය ආර්. හෙට්ටිආරච්චි
මහාචාර්ය ඒ.එල්.ටී. හේවාවසම්
මහාචාර්ය පී.එම්. ජමාහිර්
මහාචාර්ය ඩී.ඩී.කේ.එස්. කරුණානායක
මහාචාර්ය කේ.එම්.ආර්. කරුණාරත්න
මහාචාර්ය ජී.ජී.එස්. කුලරත්න
මහාචාර්ය ඩබ්ලිව්.ඒ. ලියනගේ
මහාචාර්ය කේ.ඩබ්ලිව්.ජී. රේඛා නියන්ති
මහාචාර්ය එම්.එම්.පී. පෙරේරා
මහාචාර්ය ඩබ්ලිව්.එල්.පී. පෙරේරා
මහාචාර්ය එම්.ඩබ්ලිව්.සී.එන්.කේ. රඹුක්වැල්ල
මහාචාර්ය එම්.බී. රණතිලක
මහාචාර්ය ආර්.එම්. අබේරත්න
මහාචාර්ය එම්.එස්.එම්. සලීම්
මහාචාර්ය ඒ. සර්ජුන්
මහාචාර්ය ඒ.ජී.එල්. සෙනෙහෙවීර
මහාචාර්ය ආර්.පී. සෙනෙවිරත්න
මහාචාර්ය එස්.එම්.පී. ඩබ්ලිව්.කේ. සේතුංග
මහාචාර්ය එස්. සිවමෝහන්
මහාචාර්ය එම්. සෝමතිලක
මහාචාර්ය එන්.ඩී. උඩගම
මහාචාර්ය එස්. විජේසන්දිරන්
මහාචාර්ය පී.ආර්.කේ.ඒ. විතාරණ
මහාචාර්ය සී.එස්. වික්‍රමගමගේ
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩබ්.ජී.සී.එස්.එම්. වික්‍රමසිංහ
මහාචාර්ය එස්.එන්. විජේසිංහ
මහාචාර්ය එන්.ඒ. විමලසේන
මහාචාර්ය එම්.ආර්. පින්නවල
මහාචාර්ය පූජ්‍ය කේ. රාහුල හිමි

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

මහාචාර්ය ඒ.කේ.එස්. අරඹවත්ත
මහාචාර්ය කේ.එස්.එන්. ආරියසිංහ
මහාචාර්ය එම්.ඩී.කේ. ද සිල්වා
මහාචාර්ය යූ.බී. දිසානායක
මහාචාර්ය එම්.සී.එන්. ෆොන්සේකා
මහාචාර්ය ඩබ්ලිව්.එම්.පී.එස්.කේ. විජේකෝන්
මහාචාර්ය ඊ.එම්.යූ.සී.කේ. හේරත්
මහාචාර්ය ආර්.ඩී. ජයසිංහ
මහාචාර්ය ආර්.එම්. ජයසිංහ
මහාචාර්ය පී.ආර්. ජයසූරිය
මහාචාර්ය ජේ.ඒ.එම්.එස්. ජයතිලක
මහාචාර්ය ජේ.ඒ.සී.කේ. ජයවර්ධන
මහාචාර්ය බී.ජී.ටී.එල්. නන්දසේන
මහාචාර්ය ආර්.ඩබ්ලිව්. පල්ලේගම
මහාචාර්ය ජී.ජේ. පනාගොඩ
මහාචාර්ය එම්.පී. පරණගම
මහාචාර්ය එච්.ආර්.ඩී. පීරිස්
මහාචාර්ය එච්.එන්.එස්. සොයිසා
මහාචාර්ය ඒ. තිලකරත්න
මහාචාර්ය වී.එස්.එන්. විතානආරච්චි
මහාචාර්ය කේ.ඒ. වෙත්තසිංහ

ඉංජිනේරු පීඨය

මහාචාර්ය එස්.ජී. අබේරත්න
මහාචාර්ය ඒ.එම්.ඒ.සී.එස්. බණ්ඩාර
මහාචාර්ය එම්. දන්තුරේ බණ්ඩාර
මහාචාර්ය එම්.බී. දිසානායක
මහාචාර්ය පී.බී.ආර්. දිසානායක
මහාචාර්ය ජේ.බී. ඒකනායක
මහාචාර්ය එම්.පී.බී. ඒකනායක
මහාචාර්ය එම්.ඒ.ආර්.එම්. ප්‍රනාන්දු
මහාචාර්ය ඩබ්ලිව්.පී.ඩී. ප්‍රනාන්දු
මහාචාර්ය ජී.එම්.ආර්.අයි. ගොඩලියද්ද
මහාචාර්ය එස්.ඩී.ජී.එස්.පී. ගුණවර්ධන
මහාචාර්ය ඒ.යූ.ඒ.ඩබ්ලිව්. ගුණවර්ධන
මහාචාර්ය කේ.බී.එස්.එන්. ජිනදාස
මහාචාර්ය සී.එස්. කල්පගේ
මහාචාර්ය ඩී.එස්.කේ. කරුණාසිංහ
මහාචාර්ය කේ.එම්. ලියනගේ
මහාචාර්ය ඒ.එන්. මධුශංක
මහාචාර්ය කේ.ජී.එන්. නානායක්කාර
මහාචාර්ය එල්. රාජපක්ෂ
මහාචාර්ය පී.එම්.ටී.බී. සන්දිරිගම
මහාචාර්ය කේ.ඒ.එස්. සුසන්ත
මහාචාර්ය ඩී.එන්. උඩුවාවල
මහාචාර්ය සී.කේ. වල්ගම්පාය
මහාචාර්ය ඩබ්ලිව්.එම්.එස්.බී. වීරකෝන්
මහාචාර්ය කේ.කේ. විජේසුන්දර

මහාචාර්ය ජී.බී.බී. හේරත්
මහාචාර්ය එච්.එම්.වී.ආර්. හේරත්
මහාචාර්ය එච්.ඩී. යාපා

කළමනාකරණ පීඨය

මහාචාර්ය ඊ.එම්.ඒ.එස්.බී. ඒකනායක
මහාචාර්ය ඊ.පී.එම්. රාජරත්න
මහාචාර්ය ඩබ්ලිව්.පී.ආර්. වික්‍රමරත්න

වෛද්‍ය පීඨය

මහාචාර්ය ඒ.එස්. අබේගුණවර්ධන
මහාචාර්ය එස්. අබේගුණවර්ධන
මහාචාර්ය එස්.බී. අදිකාරි
මහාචාර්ය ඒ.එස්. ආරියසිංහ
මහාචාර්ය ජී.එම්.ඩී.අයි. ආරියසිංහ
මහාචාර්ය ඩී.ඒ.සී.එල්. දළුගම
මහාචාර්ය ඩබ්ලිව්.ඩී.එම්.ටී.එල්. දසනායක
මහාචාර්ය කේ.අයි.සී. ද සිල්වා
මහාචාර්ය ඒ.ඩී. ධර්මපාල
මහාචාර්ය එස්.ඩී. ධර්මරත්න
මහාචාර්ය එන්.එස්. කළුපහන
මහාචාර්ය ඒ.එම්.එස්.ඩී.එම්. දිසානායක
මහාචාර්ය බී.එන්. දිසානායක
මහාචාර්ය ඩී.එච්. එදුස්සූරිය
මහාචාර්ය එච්.එස්.එෆ්. ෆොන්සේකා
මහාචාර්ය කේ.බී. ගල්කැටිය
මහාචාර්ය සී.ඩී. ගමගේ
මහාචාර්ය අයි.බී. ගවරම්මාන්න
මහාචාර්ය පී. ගිනිගේ
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩී.ආර්. ඉද්දවෙල
මහාචාර්ය ඩබ්ලිව්.ඒ.ටී.ඒ. ජයලත්
මහාචාර්ය එම්.ඩබ්ලිව්.සී.කේ. ජයසිංහ
මහාචාර්ය ඒ.එච්.එච්.එම්. ජයවීර
මහාචාර්ය කේ.පී.ඒ.පී. කාරියවසම්
මහාචාර්ය කේ.ඒ.එස්. කොඩිකාර
මහාචාර්ය එස්.ටී. කුඩගම්මන
මහාචාර්ය එස්.ඒ.එම්. කුලරත්න
මහාචාර්ය එල්.වී.සී. ලියනපතිරණ
මහාචාර්ය යූ.ඒ.බී. මැදගම
මහාචාර්ය ආර්.එම්. මුදියන්සේ
මහාචාර්ය එස්.ඩී.අයි. නානායක්කාර
මහාචාර්ය එෆ්. නූර්දීන්
මහාචාර්ය එච්.කේ.අයි. පෙරේරා
මහාචාර්ය ඒ.යූ.බී. පෙතියාගොඩ
මහාචාර්ය ටී.එන්. රාජපක්ෂ
මහාචාර්ය කේ.ජී.එස්. රණසිංහ
මහාචාර්ය සී.එන්. රත්නතුංග
මහාචාර්ය ආර්.එම්.සී.කේ. රත්නායක
මහාචාර්ය එස්. රොසයිරෝ
මහාචාර්ය ආර්.එස්. තල්ගහගොඩ
මහාචාර්ය ඒ.එන්. වඩිසිංහ
මහාචාර්ය ආර්. වඩුගේ
මහාචාර්ය වී.එස්. වීරසිංහ
මහාචාර්ය ඩබ්ලිව්.ඩී.එස්.ඩී. වික්‍රමසිංහ
මහාචාර්ය බී.එම්.ජී.ඩී. යසරත්න

විද්‍යා පීඨය

මහාචාර්ය එල්.ආර්.ඒ.කේ. බණ්ඩාර
මහාචාර්ය ටී.එම්.ඩබ්ලිව්.කේ. බණ්ඩාර
මහාචාර්ය ආර්.එල්.ආර්. චන්ද්‍රජිත්
මහාචාර්ය කේ.ඩබ්ලිව්. දමුණුපොල
මහාචාර්ය ඩබ්.ඒ.එම්. දවුන්ඩසේකර
මහාචාර්ය ඩබ්ලිව්.බී. දවුන්ඩසේකර
මහාචාර්ය ඒ.එම්.ටී.ඒ. ගුණරත්න
මහාචාර්ය සී.වී. හෙට්ටිආරච්චි
මහාචාර්ය කේ.එම්.ජී.ජී. ජයසූරිය
මහාචාර්ය එස්.එච්.පී.පී. කරුණාරත්න
මහාචාර්ය ඩබ්.ඒ.අයි.පී. කරුණාරත්න
මහාචාර්ය එස්.ආර්. කොඩිතුවක්කු
මහාචාර්ය එච්.එම්.එස්.පී. මඩවල
මහාචාර්ය එම්.එම්.ඒ.එන්. නවරත්න
මහාචාර්ය ඒ.ඒ.අයි. පෙරේරා
මහාචාර්ය ජී.ඒ.ඩී. පෙරේරා
මහාචාර්ය යූ.ඒ.කේ. පිනිදියආරච්චි
මහාචාර්ය එච්.එම්.ඩී.එන්. ප්‍රියන්ත
මහාචාර්ය ආර්.එස්. රාජකරුණා
මහාචාර්ය ඩබ්ලිව්.ඒ.පී.පී. ද සිල්වා
මහාචාර්ය ඩී.එම්.ඩී. යකන්දාවල
මහාචාර්ය වයි.පී.ආර්.ඩී. යාපා
මහාචාර්ය එම්.ඩබ්ලිව්.එස්.කේ. යටිගම්මන
මහාචාර්ය පී. සමරසේකර
මහාචාර්ය එම්.ඒ.එස්.පී.කේ. මලවිආරච්චි

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය

මහාචාර්ය පී.ඒ.බී.ඩී. ඇලෙක්සැන්ඩර්
මහාචාර්ය ඩී.ආර්.ඒ. දිසානායක
මහාචාර්ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය
මහාචාර්ය එච්.ආර්.එන්. ජිනදාස
මහාචාර්ය ආර්.එස්. කළුපහන
මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඒ.පී. වනිගසේකර
මහාචාර්ය එන්. විජයවර්ධන

සනාතන සභාවේ පීඨ නියෝජිතයන්

කෘෂි විද්‍යා පීඨය
ආචාර්ය ඩබ්ලිව්.ඊ.එම්.එල්.ජේ. ඒකනායක
ආචාර්ය ඩී.එන්. විදාන ගමගේ

සම සෞඛ්‍ය විද්‍යා පීඨය
ආචාර්ය එස්. කුලතුංග
ආචාර්ය එම්.එච්.එෆ්. සකීනා

ශාස්ත්‍ර පීඨය
ආචාර්ය රමේෂ් රාමසාමි
ආචාර්ය ඩබ්.එම්.එස්.කේ. විජේසුන්දර

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය
ආචාර්ය එච්.එම්.ටී.ඩී.කේ. හේරත්
ආචාර්ය එච්.එස්.කේ. රත්නතිලක

ඉංජිනේරු පීඨය
ආචාර්ය පී.ජේ. බිංදුහේවා
ආචාර්ය පී.බී.ජී. දිසානායක

කළමනාකරණ පීඨය
ආචාර්ය බී.ඒ.එන්. එරන්ද
ආචාර්ය එස්. මහේෂ්වරන්
ආචාර්ය පී.එල්.ඩබ්ලිව්. ප්‍රියදර්ශනී

වෛද්‍ය පීඨය
ආචාර්ය ඩී.ආර්.කේ.සී. දිසානායක
ආචාර්ය එම්.ජී.ඩී.වී.කේ. කිරිදාන

විද්‍යා පීඨය
ආචාර්ය වී.එන්. සෙනෙවිරත්න
ආචාර්ය ජේ.ඒ.සී.පී. ජයලත්

පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨය
ආචාර්ය ආර්.එම්.එස්.බී.කේ. රණසිංහ
ආචාර්ය එල්.ජී.එස්. ලොකුගලප්පත්ති
ආචාර්ය ආර්.ආර්.එම්.කේ.කේ. විජේසුන්දර

සනාතන සභාවේ ලේකම්

වැඩබලන ලේඛකාධිකාරී ඊ.එම්.ජී.එම්.බී. ඒකනායක මහතා

විශ්වවිද්‍යාලයට මඟපෙන්වීම: සනාතන සභා අනුකමිටු විසින් පවත්වන ලද රැස්වීම් පිළිබඳ සාරාංශයක්

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සහ එහි කැපවීමෙන් කටයුතු කරන අනුකමිටු අධ්‍යයන ජීවිතයේ විවිධ තීරණාත්මක අංශවලට මඟ පෙන්වීම සහ අධීක්ෂණය කිරීම සඳහා නිතිපතා රැස් විය. විවෘත සාකච්ඡා, සහයෝගී තීරණ ගැනීම සහ උපාය මාර්ගික සැලසුම් සඳහා ඔවුන්ගේ කැපවීම විශ්වවිද්‍යාලයේ ප්‍රගතියට අතිශය වැදගත් විය.

සනාතන සභාවේ අනුකමිටු		රැස්වීම් පවත්වන ලද වාර ගණන
සනාතන සභාව		11
1	අධ්‍යයන සංවර්ධන සහ සැලසුම් කමිටුව	09
2	ඇතුළත් කිරීමේ කමිටුව	06
3	ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ කමිටුව	04
4	සනාතන සභා පුස්තකාල කමිටුව	03
5	සනාතන සභා ප්‍රකාශන කමිටුව	02
6	සනාතන සභා පර්යේෂණ කමිටුව	04
7	ශිෂ්‍යත්ව කමිටුව	06
8	වෙබ්, විදුලි සංදේශ, සහ ජාලකරණ කමිටුව	07
9	තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුව	10
10	ව්‍යවස්ථාපිත ගෞරව උපාධි කමිටුව	01

1.3.3 2023 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ විධායක නිලධාරීන්

සාමාන්‍ය පරිපාලනය	
ඊ.එම්.ජී.එම්.බී. ඒකනායක මහතා	වැඩබලන ලේඛකාධිකාරී (නියෝජ්‍ය ලේඛකාධිකාරී)
එච්.ඒ.ටී.එන්. අමරසේන මහත්මිය	නියෝජ්‍ය ලේඛකාධිකාරී
එම්.ජී.ජේ. ධර්මසිරි මහත්මිය	නියෝජ්‍ය ලේඛකාධිකාරී
පී.කේ. හේරත් මහත්මිය	නියෝජ්‍ය ලේඛකාධිකාරී
එස්.සී. හේරත් මහත්මිය	නියෝජ්‍ය ලේඛකාධිකාරී
එම්.එස්.ඩී. මාරසිංහ මහත්මිය	නියෝජ්‍ය ලේඛකාධිකාරී
එම්.එස්. රණසිංහ මහත්මිය	නියෝජ්‍ය ලේඛකාධිකාරී
එස්.එච්.පී.ඊ.එස්. ඒකනායක මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
එම්.එල්.ඩබ්ලිව්.ඕ.එම්. කරුණාරත්න මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ඩී.කේ.කේ. නාරම්පනාවේ මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එම්.ඒ.ඒ.එන්.එන්. පාදෙණිය මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
පී.අයි.අයි. පතිරණ මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එම්.එම්.එස්. විජේසුන්දර මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
ඩී.එම්.අයි.එන්.ජේ. දිසානායක මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
ඩබ්.එම්.ඩී.කේ. ඇතුල්ගම මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
එච්.එම්.ඩී.වයි. හේරත් මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
අයි.එම්.බී.ඩබ්ලිව්. ඉලංගසිංහ මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
බී.එන්. ජීවන්ද්‍රා-ආරියරත්න මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
ඩබ්ලිව්.වී.එල්. කුමාර මහතා	සහකාර ලේඛකාධිකාරී
බී.එම්.එස්.එස්. පණ්ඩිතරත්න මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
ආර්.ඩී.එස්.එන්. රාජපක්ෂ මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
එස්.ජී. රාජපුර මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
කේ.එස්.ජී. රණසිංහ මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
සී.කේ.කේ. රත්නායක මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
ජේ.පී. වෙස්ලි මහතා	සහකාර ලේඛකාධිකාරී
ඩබ්ලිව්.එම්.එස්.එන්. විජේරත්න මෙනවිය	සහකාර ලේඛකාධිකාරී
මූල්‍ය	
ඒ.එම්.එන්.බී. අරම්පත් මහතා	මූල්‍යාධිකාරී
ඩබ්ලිව්.එච්.ඒ.ඩී. දිල්රුක්ෂි මහත්මිය	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
එම්. ජයරත්න මහත්මිය	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
බී.ජී.එස්.පී. ජයකොඩි මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
පී.ඒ.ඩී.සී.ජේ. පොන්නම්පෙරුම මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
යූ.ඩබ්ලිව්. රාජ්මාල් මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
ඒ.අයි. සමරහේවා මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
ඩබ්ලිව්.ඒ.ජී.ටී.එල්.බී. වීරසේකර මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
ඩබ්ලිව්.ඒ.එන්.සී. විජේසිංහ මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
ඒ.එම්.ආර්.ඒ. ප්‍රියශාන්ත මහතා	නියෝජ්‍ය මූල්‍යාධිකාරී
බී.එම්.අයි.ඒ.කේ. බස්නායක මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
ඩී.එස්.සී.පී. කුමාරි මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
එස්.එන්. කුමුදුනී මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
එම්.ඩී.එස්.එම්. රුද්‍රිගෝ මහතා	ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී
එස්.ඒ.ඩබ්ලිව්. චතුරානී මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී
එස්.එන්.කේ. කරුණාරත්න මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී
එම්.ජී.ඩී.සී. මුහන්දිරම් මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී
පී.ජී.වයි.බී. පහලගේ මහතා	සහකාර මූල්‍යාධිකාරී
එම්.එච්.එම්. රියාස් මහතා	සහකාර මූල්‍යාධිකාරී
ආර්.ඒ.අයි. උමයංගනී මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී

ඩබ්ලිව්.එම්.එච්.එස්.බී. වික්‍රමනායක මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී
ඒ.එන්. විජේනායක මහත්මිය	සහකාර මූල්‍යාධිකාරී
විගණනය	
එස්.ඩබ්ලිව්. කොඩිතුවක්කු මහතා	නියෝජ්‍ය අභ්‍යන්තර විගණක
ඒ.ජී.එෆ්. ෆස්නා මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක
ඉංජිනේරු සේවය	
ඒ.පී.ඩී.එල්. අතපත්තු මහතා	වැඩමුළු ඉංජිනේරු
එම්.ඒ. ගුණරත්න මහතා	ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු
ජේ.ඒ.සී.එන්. ජයසූරිය මහතා	වැඩ ඉංජිනේරු (සිවිල්)
පී.එස්. පණ්ඩිතරත්න මහතා	වැඩ ඉංජිනේරු (සිවිල්)
නීති සහ ප්‍රලේඛන	
එම්.කේ.එෆ්. ෆවාසා මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
ඩබ්ලිව්.ඒ.ආර්.සී. වික්‍රමසිංහ මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
වෛද්‍ය නිලධාරීන්	
ආචාර්ය එච්.එම්.සී.එල්. හේරත්	ප්‍රධාන වෛද්‍ය නිලධාරී
ආචාර්ය එච්.ඒ.ඩී. රුවන්ජිත්	වෛද්‍ය නිලධාරී
පුස්තකාල සේවා	
ඒ.එම්.ඒ.සී. සේනාරත්න මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
එල්.පී. විතානගේ මහත්මිය	සහකාර ලේඛකාධිකාරී
අනෙකුත් කාර්ය මණ්ඩල ශ්‍රේණි	
කේ.ජී.එස්.එන්. අමරසිරි මහතා	ගොවිපළ කළමනාකරු
ඩබ්ලිව්.එන්. ආනන්ද මහතා	උද්‍යාන පාලක
ඒ.ඒ.කේ.යූ. අතපත්තු මහත්මිය	සංඛ්‍යාලේඛන නිලධාරී
ආර්. ගජවීර මහතා	නියෝජ්‍ය ප්‍රධාන විනය පාලක
එන්.කේ. සූරියබණ්ඩාර මහතා	ප්‍රධාන ආරක්ෂක නිලධාරී
ඩබ්ලිව්.ඒ.ඒ. වේරහැර මහතා	ප්‍රධාන විනය පාලක
ඩබ්ලිව්.ඩබ්ලිව්.එම්.පී.ඩබ්ලිව්.එල්. ආර්.බී. වීරසේකර මහතා	ගොවිපළ කළමනාකරු
ආචාර්ය කේ.ඒ.එස්.ජී.එස්. කරුණානායක	ව්‍යාපෘති කළමනාකරු

1.4 2023 වසරේ සමස්ත කාර්ය සාධනය

1.4.1 අධ්‍යයන ජයග්‍රහණ

පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2023 වර්ෂයේ දී සිය අධ්‍යයන විශිෂ්ටත්වය අඛණ්ඩ ව පවත්වාගෙන යාම සඳහා එහි ගෝලීය ස්ථාවරත්වය ඉහළ නැංවීම, අභ්‍යන්තර තත්ත්ව සහතිකය ශක්තිමත් කිරීම සහ නව්‍ය විෂයමාලා සංවර්ධනය කිරීම ආදී විවිධ කාර්යය රැසක් ඉටු කළේ ය.

Clarivate Analytics සහ QS තිරසාර ශ්‍රේණිගත කිරීම මගින් පිළිගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය ගෝලීය ශ්‍රේණිගත කිරීම් ඉහළ නැංවීම සඳහා සිය කටයුතු ආරම්භ කළේ ය.

- **ලෝක ශ්‍රේණිගතකිරීම්**

ශ්‍රේණිගත කිරීමේ මාදිලිය	දිවයින තුළ ශ්‍රේණිගත කිරීම	ආසියා ශ්‍රේණිගත කිරීම්	ලෝක ශ්‍රේණිගත කිරීම්
ටයිම්ස් උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් - 2023	01	119	501-600
ටයිම්ස් උසස් අධ්‍යාපන බලපෑම් ශ්‍රේණිගත කිරීම් -2023	01	NA	301-400
එක්සත් ජනපද News and World Report විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් - 2023	01	240	901
QS විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් - 2023	01	90	1001-1200
ලෝක විශ්වවිද්‍යාල Webometrics ශ්‍රේණිගත කිරීම - 2023	02	580	1978
UI ග්‍රීන් මෙට්‍රික් ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් - 2023	03	145	279

ගෝලීය ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාකාරකම්

QS ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් සහ ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් ඇතුළු ව ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රියාපටිපාටි තුළ විශ්වවිද්‍යාලය ක්‍රියාකාරී ව පිළිගැනීමකට ලක් විය.

ශ්‍රේණිගත කිරීම්හි විශ්වවිද්‍යාලය ඉහළ තලයකට ගෙන ඒම සඳහා ගන්නා ලද ප්‍රධාන ක්‍රියාමාර්ගවලට:

- **නවීකරණය කරන ලද වෙබ් අඩවියක් දියත් කිරීම**: සමාජ මාධ්‍ය අවකාශ සහ වැඩිදියුණු කළ ප්‍රවේශ්‍යතා සහිත නව වෙබ් අඩවිය මගින් විශ්වවිද්‍යාලය මාර්ගගත අවකාශයේ තුළ පැවැතීම සහ දෘශ්‍යතාව වැඩි දියුණු කිරීම.
- **ඩිජිටල් යටිතල පහසුකම් පුළුල් කිරීම**: අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා GSuite ගිණුම් පහසුකම් සැපයීම සහ පහසුවෙන් තොරතුරු හුවමාරු කර ගැනීමට සහ සන්නිවේදනයට පහසුකම් සැපයීම පිණිස පීඨ වෙබ් පිටු සහ ශිෂ්‍ය සමාජ වෙබ් අඩවි දිරිමත් කිරීම.
- **පීඨ පැතිකඩ ශක්තිමත් කිරීම**: අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ගූගල් ශිෂ්‍ය පැතිකඩ පවත්වාගෙන යාමට සහ යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම සහ අනාවරණ හැකියාව සහ ප්‍රවීණතා හඳුනාගැනීම වැඩි දියුණු කිරීම සඳහා තම පැතිකඩ නඩත්තු කිරීම පිණිස පේරාදෙණිය ආදී ශිෂ්‍යයන් සම්බන්ධ කර ගැනීම යන කාරණා ඇතුළත් විය.

- **ආයතනික සමාලෝචනය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පවත්වන ලද 2023 ආයතනික සමාලෝචනයේ දී 81.9% ක ලකුණු ලබා ගනිමින් විශ්වවිද්‍යාලය විශිෂ්ට අන්දමින් A ශ්‍රේණියක් ලබා ගත්තේ ය. මෙ මගින් ගුණාත්මක අධ්‍යාපනය සහ අඛණ්ඩ සංවර්ධනය සඳහා වන විශ්වවිද්‍යාලයේ අචල කැපවීම පිළිබිඹු විය. මෙම සමාලෝචනය මගින් පර්යේෂණ ප්‍රතිදානය, පීඨවල සුදුසුකම් සහ යටිතල පහසුකම් සංවර්ධනය සම්බන්ධයෙන් පවතින ප්‍රධාන ශක්තීන් හඳුනා ගන්නා ලදි. වැඩිදියුණු කිරීම සඳහා වූ ක්ෂේත්‍රයන්ට තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාවලීන්හි ශිෂ්‍ය සහභාගීත්වය ඉහළ නැංවීම සහ ජාත්‍යන්තර සහයෝගිතා ශක්තිමත් කිරීම ආදී කරුණු ඇතුළත් විය.

වැඩසටහන් සමාලෝචන

2023 වර්ෂයේ දී පවත්වන ලද විද්‍යාවේදී (ගෞරව) උපාධි පාඨමාලා සඳහා වූ වැඩසටහන් සමාලෝචනයේ දී අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ ප්‍රමිති සඳහා වන ඉහළ මට්ටමේ සම්මාන අත් කර ගෙන ඇත. වැඩසටහන් සමාලෝචන පහත සඳහන් ශ්‍රේණිගත කිරීම් ලැබීමට හේතු වී ඇත.

- විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන්වල 1 වන පර්ෂදය (රසායන විද්‍යාව, භූ විද්‍යාව සහ භෞතික විද්‍යාව) සඳහා "ඉතා හොඳ" (85.6%) සමස්ත ශ්‍රේණියක් සමගින් "ඒ" ශ්‍රේණියක් ලැබී ඇත.
- විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන්වල 2 වන පර්ෂදය (පරිගණක විද්‍යාව, ගණිතය සහ සංඛ්‍යාන) සඳහා "ඉතා හොඳ" (87.7%) සමස්ත ශ්‍රේණියක් සමගින් "ඒ" ශ්‍රේණියක් ලැබී ඇත.
- විද්‍යාවේදී (ගෞරව) උපාධි වැඩසටහන්වල 3 වන පර්ෂදය (උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව සහ අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය) සඳහා "ඉතා හොඳ" (83.7%) සමස්ත ශ්‍රේණියක් සමගින් "ඒ" ශ්‍රේණියක් ලබා ඇත.

- **තත්ත්ව සහතිකකරණ වැඩසටහන්**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතිකකරණ අත්පොත

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ තත්ත්ව සහතික අත්පොත විශ්වවිද්‍යාල වෙබ් අඩවියට අනුකූල ව පාලක සභාව විසින් අනුමත කරන ලද අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණය හා සම්බන්ධ සියලු ම ප්‍රතිපත්ති, ආකෘති/මාර්ගෝපදේශ/අයදුම්පත්‍ර සහ අනෙකුත් ලේඛන අන්තර්ගත වන පරිදි තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයේ (CQA) වෙබ් අඩවියේ මාර්ගගත අත්පොතක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි. කාර්යක්ෂම සහ ඵලදායී මෙහෙයුම් ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා තත්ත්ව සහතික ක්‍රියාකාරකම්වල නව වර්ධනයන් ඇතුළත් කරමින් එය නිතිපතා යාවත්කාලීන කරනු ලැබේ.

උපාධි අපේක්ෂක විභාග පැවැත්වීම සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොත

ඇගයීම් ක්‍රමවේදයන්ට අදාළ විශ්වවිද්‍යාල ප්‍රතිපත්ති, පුළුල් විස්තීරණ ඇගයීම් ක්‍රියා පටිපාටියක්, විභාග වැරදි සහ දඬුවම්වලට අදාළ රෙගුලාසි, විභාග පරීක්ෂකවරුන්ගේ රාජකාරි සහ වගකීම්, පරිපාලන උපදෙස්, මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ සියලුම උපාධි අපේක්ෂක අධ්‍යයන වැඩසටහන්වල ඇගයුම් ක්‍රමවේදවල ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා අදාළ ආකෘති ඇතුළත් කර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක විභාග පැවැත්වීම සඳහා වූ ක්‍රියා පටිපාටි අත්පොත ප්‍රකාශයට පත් කර ඇත.

2023 වර්ෂය තුළ අනුමත ප්‍රතිපත්ති/මාර්ගෝපදේශ

වෙනස්කම් / සංවර්ධන / ජයග්‍රහණ	විස්තර	පාලක සභාව විසින් අනුමත කළ දිනය
තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානය (CQA) සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරක් ස්ථාපිත කිරීම.	නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර තත්ත්ව සහතික කිරීමේ මධ්‍යස්ථානයෙහි කාර්යය වැඩිදියුණු කරන අතර විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වේ.	2023.02.10 දින පැවැති 524 වන රැස්වීමේ දී
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධතියට අදාළ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික පද්ධතියට අදාළ දැනට පවතින අතුරු ව්‍යවස්ථා සභාව සහ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ (MC-CQA) හි කළමනාකරණ කමිටුව විසින් ගනු ලැබූ තීරණ මත සංශෝධනය කරන ලදි. එම සංශෝධනවලට පහත සඳහන් දෑ ඇතුළත් විය, • තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවෙහි සංයුතියට අධ්‍යයන කටයුතු අංශයේ අධ්‍යක්ෂ සහ තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඇතුළත් කිරීම. • තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවෙහි රැස්වීමක් එහි සාමාජිකත්වයෙන් තුනෙන් එකක සහභාගීත්වයෙන් පැවැත්වීමට අවශ්‍ය වන පරිදි එහි අවශ්‍ය ගණපූර්ණය සංශෝධනය කිරීම.	2023.06.24 දින පැවති 530 වන රැස්වීමේ දී
විශ්වවිද්‍යාල මට්ටමේ ප්‍රතිපත්ති සකස් කිරීම.	තත්ත්ව සහතික ක්‍රියාවලියේ දී තුළ ශිෂ්‍ය සහභාගීත්වය පිළිබඳ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම.	2023.02.25 දින පැවති 525 වන රැස්වීමේ දී
	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පෞද්ගලික ප්‍රතිපත්තිය සකස් කිරීම.	
	ශිෂ්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රතිපත්තිය සකස් කිරීම.	2023.10.29 දින පැවති 535 වන රැස්වීමේ දී
විශ්වවිද්‍යාල මට්ටමේ ප්‍රතිපත්ති යටතේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සකස් කිරීම.	සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියෙහි සංශෝධිත අනුවාදය: විෂයමාලා සංවර්ධනය කිරීම / සංශෝධනය කිරීම සහ අනුමැතිය ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය සකස් කිරීම.	2023.02.25 දින පැවති 525 වන රැස්වීමේ දී

2023 වර්ෂය තුළ අනුමත ප්‍රතිපත්ති/මාර්ගෝපදේශ වගුව හා සම්බන්ධ වේ.

වෙනස්කම් / සංවර්ධන / ජයග්‍රහණ	විස්තර	පාලක සභාව විසින් අනුමත කළ දිනය
	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක විභාග පැවැත්වීම සඳහා වූ "ක්‍රියා පටිපාටි අත්පොත" යටතේ පහත සඳහන් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි සභාව විසින් අනුමත කරන ලදි. • අපේක්ෂකයන් විසින් සිදු කරනු ලබන විභාග වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි • ආබාධ සහිත සිසුන් සඳහා සාධාරණ ඇගයීම් ගැළපීම් පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි • ප්‍රතිඵල සත්‍යාපනය පිළිබඳ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි	2023.10.29 දින පැවති 535 වන රැස්වීමේ දී
ආකෘති සකස් කිරීම	පාලක සභාව විසින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිවල සංශෝධිත අනුවාදය යටතේ සකස් කරන ලද පහත ආකෘති අනුමත කරන ලදි. විෂයමාලා සංවර්ධනය කිරීම / සංශෝධනය කිරීම සහ අනුමැතිය ලබා ගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය: • වැඩසටහන් පිරිවිතර ආකෘතිය • ADPC නියෝජිත සඳහා පිරික්සුම් ලැයිස්තුව • සනාතන සභා සහ/හෝ වි.වි.ප්‍ර.කො. අනුමැතිය අවශ්‍ය වන සංශෝධන හඳුනා ගැනීම.	2023.02.25 දින පැවති 525 වන රැස්වීමේ දී
	උපාධි පාඨමාලා අඛණ්ඩ ව ඇගයීම සඳහා සහ පීඨ සහ අධ්‍යයනාංශ විසින් ඔවුන්ගේ උපාධි වැඩසටහන්වල වලංගුභාවය සහ සඵලතාවය ඉහළ නැංවීම පිණිස සුදුසු පියවර ගැනීමට සහාය ලබා ගැනීම සඳහා "සමාසික ඇගයුම් වාර්තාව" සකස් කරන ලදි.	2023.02.10 දින පැවැති 524 වන රැස්වීමේ දී
	• "පූර්ණ කාලීන සහ අර්ධ කාලීන පශ්චාත් උපාධි වැඩසටහනේ නිර්වචනය" • "ළබැඳියාවන් අතර ගැටුම ප්‍රකාශ කිරීමේ ආකෘතියේ සරල අනුවාදය"	2023.02.25 දින පැවති 525 වන රැස්වීමේ දී
	තත්ත්ව සහතික මධ්‍යස්ථානයේ කළමනාකරණ කමිටුවෙහි රැස්වීමක් එහි සාමාජිකත්වයෙන් තුනෙන් එකක සහභාගීත්වයෙන් පැවැත්වීමට හැකි වන වන පරිදි එහි අවශ්‍ය ගණපූර්ණය සංශෝධනය කිරීම.	2023.06.24 දින පැවති 530 වන රැස්වීමේ දී

විෂයමාලා සහ වැඩසටහන් සංවර්ධනය

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල ව විවිධ හා අදාළ විෂයමාලා සංවර්ධනය කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලය විසින් අවධානය යොමු කරන ලදි.

සමාලෝචනයට භාජනය වූ කාල සීමාවේ දී තුළ සිදු කරන ලද විෂය නිර්දේශ/විෂයමාලා සංශෝධන පහත දැක්වේ.

පීඨය/ ප.උ. ආයතනය	වැඩසටහන	රැස්වීම් අංකය සහ සභාවේ අනුමත දිනය	රැස්වීම් අංකය සහ සභාවේ අනුමත දිනය
කෘෂි විද්‍යා	ATM Iහි සංශෝධිත පාඨමාලා - ඉංග්‍රීසි පාඨමාලාව සහ ICP ස.තා	480-08.03.2023	527(a)-27.05.2023
	ATM 06හි සංශෝධිත පාඨමාලාව - ඉංග්‍රීසි වැඩසටහන (ESL 1001)	487-8.10.2023	536 - 25.11.2023
ඉංජිනේරු	ප. උ. වැඩසටහන් ඔස්සේ සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ පර්යේෂණ ධාරිතාව, නිමැවුම සහ සංස්කෘතිය තවදුරටත් වැඩිදියුණු කිරීම.	480-08.03.2023	527(a)-27.05.2023
	EE 552හි සංශෝධිත විෂය මාලාව - VLSI නිර්මාණය.	483-28.06.2023	533-26.08.2023
	රාජකීය මෙල්බර්න් තාක්ෂණ ආයතනය (RMIT) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය (UoP) අතර ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහනක් යටතේ උපාධි සහතිකය පිරිනැමීම.	486-26.09.2023	535-29.10.2023
	ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධියට අදාළ නීති සහ රෙගුලාසි	488-15.11.2023	537 - 23.12.2023
	විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අධ්‍යයනාංශයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති, ඉංජිනේරු විද්‍යාපති, විද්‍යාපති සහ ඉංජිනේරු වැඩසටහන් පිළිබඳ විද්‍යාපති යන වැඩසටහන් සඳහා නව පර්යේෂණ පාඨමාලා හඳුන්වාදීම.	488-15.11.2023	537- 23.12.2023
	විෂයමාලා සංශෝධනය - ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය වැඩසටහන.	488-15.11.2023	537- 23.12.2023
	රාජකීය මෙල්බර්න් තාක්ෂණ ආයතනය (RMIT) සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය (UoP) අතර ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහනක් යටතේ උපාධි සහතිකය පිරිනැමීම.	489-13.12.2023	

පීඨය/ ප.උ. ආයතනය	වැඩසටහන	රැස්වීම් අංකය සහ සභාවේ අනුමත දිනය	රැස්වීම් අංකය සහ සභාවේ අනුමත දිනය
කළමනාකරණ	ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහනේ 4000 වැනි මට්ටමේ පළමු සහ දෙවන අධ්‍යයන වාර අතර පාඨමාලා පැවැත්වීම සම්බන්ධයෙන් වෙනස් කිරීම් සිදු කිරීම.	485-16.08.2023	534-30.09.2023
	ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහනේ දෙවන අධ්‍යයන වාරයේ සිට පළමු අධ්‍යයන වාරය දක්වා තෝරාගත් 4000 මට්ටමේ පාඨමාලා සඳහා යෝජිත මාරු කිරීම පිළිබඳ සංශෝධිත යෝජනාව.	486 –26.09.2023	535-29.10.2023
	චීනයේ ටුමාරෝ තාක්ෂණ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය (TTESC) ඔස්සේ චීන සිසුන්ට ගැළපෙන පරිදි පිරිනැමීමට නියමිත ව්‍යාපාර පරිපාලනපති වැඩසටහනක් සඳහා වූ යෝජනාව.	487-18.10.2023	536-25.11.2023
	පශ්චාත් උපාධි වැඩසටහන් පාලනය කරන රීති සහ රෙගුලාසිවලට සංශෝධන සහ එකතු කිරීම් සිදුකිරීම.	487-18.10.2023	536- 25.11.2023
	කළමනාකරණ පීඨයට යෝජිත දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය	487-18.10.2023	536- 25.11.2023
	ශිෂ්‍ය සංචලතා වැඩසටහන (SMP) සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.	488 – 15.11.2023	537 - 23.12.2023
වෛද්‍ය	දැනට පවතින උපාධි අපේක්ෂක වැඩසටහනක් සඳහා විකල්ප සුදුසුකම් අනුමත කිරීම සඳහා සංශෝධිත යෝජනාව සහ සැලසුම සකස් කිරීම (වි.වි.ප්‍ර.කොා. චක්‍රලේඛය 01/ YOU අනුව)	483-28.06.2023	533-26.08.2023
	අවසන් පත්වීම් තක්සේරුව සංශෝධනය කිරීම.	486 –26.09.2023	535-29.10.2023
පශු වෛද්‍ය විද්‍යා	නවීකරණය කරන ලද අධ්‍යයන පිටපත නැවත ඉදිරිපත් කිරීම.	480-08.03.2023	527(a)-27.05.2023
	පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධියේ 2020 විෂය මාලාවේ පළමු වසර (පළමු සමාසිකය හා දෙවන සමාසිකය) පාඨමාලා සඳහා සංශෝධන සිදු කිරීම.	480-08.03.2023	527(a)-27.05.2023
කෘ.පී.උ.ආ.	උපාධිය: පාරිසරික වන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය; නව පාඨමාලාව - CS 5242 Ethnoforestry	481-19.04.2023	527(a)- 27.05.2023
	නව විද්‍යාපති උපාධිය. ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ 10 මට්ටමේ විෂය මාලාව CDAE Erasmus කෘෂි පරිසර විද්‍යා ව්‍යාපෘතිය (2022 දී සංවර්ධනය කරන ලද නව විෂය මාලාව) ඔස්සේ කෘෂි පරිසර විද්‍යා පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා සංවර්ධනය කිරීම.	481-19.04.2023	527(a)- 27.05.2023
මා.ශා.ස.වි. ප.උ.ආ.	භූ දර්ශන පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති සහ භූ දර්ශන පුරාවිද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා යෝජනාව ඉදිරිපත් කිරීම.	486-26.09.2023	535-29.10.2023
වි.ප.උ.ආ.	විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIS) පශ්චාත් ආචාර්ය උපාධි ශිෂ්‍යත්ව/බාහිර ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය.	481-19.04.2023	527(a)- 27.05.2023
කා.සං.ම.	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ePortfolio පිළිවෙත ස්ථාපිත කිරීම.	481-19.04.2023	527(a)- 27.05.2023
පාලක හා අධ්‍යයන අංශය	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පර්යේෂණ අධි ශිෂ්‍යත්වය පාලනය කරන අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම.	489 – 13.12.2023	537 - 23.12.2023

- **අධ්‍යයන කටයුතු අංශය (AAD)**

2022.06.15 දින ආරම්භ කරන ලද විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු අංශය (AAD) අධ්‍යයන සංවර්ධන හා සැලසුම් කමිටුවේ (ADPC) ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන නව ආයතනයක් ලෙස විශ්වවිද්‍යාලයේ දී කටයුතු කරයි. අංශ කිහිපයක් අතර සම්බන්ධීකරණයට පහසුකම් සැලසීමේ දී අධ්‍යයන කටයුතු අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරන අතර එහි අවධානය අධ්‍යයන වර්ධනයට අදාළ කරුණු කෙරෙහි යොමු කරයි.

2023 වර්ෂයේ ලද ප්‍රධාන ජයග්‍රහණ

- සංශෝධිත ADPCහි නිර්ණේය විෂයන් ස්ථාපිත කිරීම.
- අධ්‍යයන සංවර්ධන හා සැලසුම් සම්බන්ධ ප්‍රධාන රැස්වීම් සහ තීරණ ගැනීමේ ක්‍රියාවලි සඳහා ක්‍රියාකාරී සහභාගීත්වය.
- විෂයමාලා මූලික කණ්ඩායම් පිහිටුවීම සම්පූර්ණ කිරීම.
- කළමනාකරණ පීඨයේ අධ්‍යයන සැලසුම් සහ කළමනාකරණයේ හොඳ ම භාවිත සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම.
- විවිධ වැඩසටහන් සඳහා සංකල්ප සටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- **දූරස්ථ ඉගෙනුම් ජයග්‍රහණ**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE) 2023 වර්ෂයේ දී ප්‍රශංසනීය ප්‍රගතියක් අත්කර ගත්තේ ය.

- **නව අධ්‍යයන පාඨමාලා** : රසායනාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කර ඇති අතර විවිධ ඉගෙනුම් අවශ්‍යතා සපුරාලමින් ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන ප්‍රතිව්‍යුහගත කරමින් සිටී.

- **ඉදිරියට පැවැත්වීමට නියමිත විද්‍යාවේදී වැඩසටහන** : දූරස්ථ ඉගෙනුම් අවස්ථා පුළුල් කිරීම පිණිස නව විද්‍යාවේදී උපාධි වැඩසටහනක් සඳහා වි.වි.ප්‍ර.කොං. වෙතින් අවසාන අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

- **බඳවා ගැනීම් ඉහළ යාම** : නම්‍යශීලී ඉගෙනුම් විකල්ප සඳහා වැඩිවන ඉල්ලුම පෙන්නුම් කරමින් නව ඩිප්ලෝමා පාඨමාලාවට ධනාත්මක ශිෂ්‍ය ප්‍රතිචාරයක් ලැබිණි.

1.4.2 පර්යේෂණ සහ නවෝත්පාදන

1.4.2.1 ලැබූ පර්යේෂණ ප්‍රදාන

	පර්යේෂණ ප්‍රදාන ප්‍රමාණය	අගය (රු. මිලි.)
ලැබුණු ප්‍රදාන (බාහිර අරමුදල්)	30	47.42
පිරිනමන ලද විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රදාන	26	24.35

1.4.2.2 පර්යේෂණ සහ සංවර්ධන නිමැවුම් දත්ත

ප්‍රකාශන කාණ්ඩය		දේශීය ප්‍රකාශන	විදේශීය ප්‍රකාශන
තීරක සුචිගත සඟරාවල පළ කරන ලද ප්‍රකාශන ගණන		116	264
සුචිගත නොවූ සඟරාවල පළ කරන ලද ප්‍රකාශන ගණන		68	27
සමුළු ක්‍රියාදාමයන් ගණන	3.1 ඉදිරිපත් කරන ලද පූර්ණ පත්‍රිකා ගණන	65	27
	3.2 ඉදිරිපත් කරන ලද උපුටන ප්‍රකාශන ගණන	529	116
ප්‍රකාශිත පොත් පරිච්ඡේද ගණන		7	64
ප්‍රවීණතා ක්ෂේත්‍රයන් පිළිබඳ ප්‍රකාශිත පොත්/පෙළ පොත් ගණන	5.1 ප්‍රකාශකයෙකු විසින්	4	7
	5.2 කතුවරයකු විසින්	1	0
එකතුව		**790**	**505**

1.4.2.3 විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව

විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව (URC) විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පර්යේෂණ සඳහා පහසුකම් සැලසීමට කටයුතු කරයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දෙවන පර්යේෂණ විශිෂ්ටතා දැක්ම

2023 අගෝස්තු 29 වන දින, ජල තාක්ෂණය සඳහා වූ ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානයේ දී පවත්වන ලද මෙම වැඩසටහන මගින් විවිධ විෂයයන් ඔස්සේ සිදු කරන ලද නව පර්යේෂණ සහ දේශීය ව සංවර්ධනය කරන ලද විසඳුම් ප්‍රදර්ශනය කරන ලදි. මහාචාර්ය ලක්ෂ්මන් සමරනායක සම්මානය සහ Tier 4* පර්යේෂක සම්මාන ද ඇතුළු සුවිශේෂී සම්මාන මෙම වැඩසටහනේ දී ප්‍රදානය කෙරිණි. විශ්වවිද්‍යාල පර්යේෂණ සභාවේ නිල වෙබ් අඩවිය විවෘත කිරීම ද මෙහි දී සිදු විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය 2023

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසි (iPURSE) 2023, "නව මානයන් තුළ සැරිසැරීම: අවස්ථා සොයා යාම" යන තේමාව යටතේ සැප්තැම්බර් 20 සහ 21 යන දිනවල පැවැත්විණි. පුළුල් පරාසයක පර්යේෂණ මාතෘකා ආවරණය වන පරිදි උප තේමා හයක් පිළිබඳ ඉදිරිපත් කිරීම් සහ සාකච්ඡා ඇතුළත් ව පවත්වන ලද මෙම සැසිය විද්වතුන්, පර්යේෂකයන් සහ ශාස්ත්‍රඥයින් ආකර්ෂණය කර ගැනීමට සමත් විය.

මෙම උප තේමා හය යටතේ අපට හරවත් සාරසංකල්ප 400ක් පමණ ලැබුණි. මෙහි දී දැඩි සමාලෝචන ක්‍රියාවලියකින් පසු ව, දින දෙකක් පුරා ඉදිරිපත් කිරීම සඳහා සාරසංකල්ප 300ක් තෝරා ගන්නා ලදි.

බහුවිෂයීක පර්යේෂණ ප්‍රදාන

විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව විසින් මාස 18ක් පුරා ප්‍රදාන 12ක් සඳහා අරමුදල් සපයමින් බහුවිෂයීක පර්යේෂණ ප්‍රදාන පිරිනැමීමේ යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදි. 2023 දී මෙම ප්‍රදානවල මධ්‍ය කාලීන ඇගයීම සිදු කරන ලද අතර එහි ප්‍රගතිය සහ බලපෑම තක්සේරු කිරීම එමඟින් අරමුණු කර තිබුණි.

වැඩමුළු සහ සම්මන්ත්‍රණ

විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සහ සදාචාරාත්මක පර්යේෂණ භාවිතය ප්‍රවර්ධනය කිරීම පිණිස විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව විසින් වසර පුරා වැඩමුළු, සම්මන්ත්‍රණ සහ පුහුණු සැසි කිහිපයක් සංවිධානය කරන ලදි.

විද්‍යුත් පුවත් හසුන - Research@ UoP

අරමුදල් අවස්ථා, පර්යේෂණ සම්පත්, ඉදිරි වැඩසටහන්, පර්යේෂණ හඳුනාගැනීම්, ප්‍රවෘත්ති පලකිරීම මෙන් ම පර්යේෂකයන්ට තම අදහස් ප්‍රකාශ කිරීම පිණිස විශ්ලේෂණ සඳහා කැප වූ අංශයක් පැවතීම පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීම සඳහා Research@UoP නැමැති විද්‍යුත් පුවත් හසුන මාසික ව නිකුත් කරන ලදි. 2023 වර්ෂයේ එහි නිකුතු එකොළහක් (11) බෙදා හරින ලදි.

වාර්ෂික පීඨ පර්යේෂණ සමුළුව සහ සම්මාන උළෙල 2022

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ පීඨ පර්යේෂණ කමිටුව විසින් සංවිධානය කරන ලද වාර්ෂික පීඨ පර්යේෂණ සමුළුව සහ සම්මාන උළෙල 2022හි දී පර්යේෂණ කටයුතු සහ පිළිගත් අධ්‍යයන ජයග්‍රහණ ප්‍රදර්ශනය කරන ලදි. මෙම අවස්ථාවේ ඉතා හරවත් දේශන සහ පර්යේෂණ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

1.4.2.4 තාක්ෂණ වාණිජකරණය සහ කර්මාන්ත සම්බන්ධය

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය කටයුතු හා කර්මාන්ත අතර සමීපතාවක් ඇති කිරීම සඳහා ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදන, සහාය සේවා සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය (BLII-TTO) තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. 2023 දී ව්‍යාපාර සම්බන්ධතා, නවෝත්පාදන, සහායසේවා සහ තාක්ෂණ හුවමාරු කාර්යාලය විශ්වවිද්‍යාලයේ සමස්ත පර්යේෂණ සහ නවෝත්පාදන ප්‍රයත්න සඳහා දායක වෙමින් තාක්ෂණික වාණිජකරණය සහ කර්මාන්තයන්හි නියැලීම ප්‍රවර්ධනය කිරීමෙහි ලා සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත.

වාණිජකරණයේ සාර්ථකත්වය

තාක්ෂණික බලපත්‍ර ගිවිසුම් දෙකකට අත්සන් කර කර්තෘභාග සහ බලපත්‍ර ගාස්තු ඔස්සේ විශ්වවිද්‍යාලයට රුපියල් මිලියන 11 ක ආදායමක් උපයා දෙන ලදි. ඒ සඳහා සුවිශේෂී උදාහරණ ලෙස,

- RESPIRON NANO AV 99 මුව ආවරණ: මේ සඳහා සරසවි ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම වෙත බලපත්‍ර ලබා දී මෙම නව්‍ය මුව ආවරණ වෙළඳපොළට ගෙන ඒමට පහසුකම් සැලසූ අතර එමගින් මහජන සෞඛ්‍යයට හිතකර ප්‍රතිලාභ සැලසුණි.

- Smart Inverter and Solar Harnesser: මේ සඳහා ලක්දනවි (පුද්) සමාගම වෙත බලපත්‍ර ලබා දී එමගින් තිරසාර බලශක්ති විසඳුම් භාවිතා කිරීම වේගවත් කිරීමට කටයුතු කරන ලදි.

2023 දී ක්‍රියාත්මක වෙමින් පැවති/සම්පූර්ණ කරන ලද ව්‍යාපාර හවුල්කාරිත්වයන්

හවුල්කාරිත්වය	සමාගම් නාමය	ප්‍රධාන ක්‍රියාකාරකම්
ඔසු කැඳ වර්ගයක් සහ ඔසු කැඳ නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය වාණිජකරණය කිරීම	AARA HERBS & SPICES සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අනාවරණ නො වන ගිවිසුම	ඔසු කැඳ වාණිජකරණය කිරීම පිළිබඳ සාකච්ඡාව සඳහා මූලික කටයුතු කිරීම, සාකච්ඡා ආරම්භ කිරීම, අඛණ්ඩ ව පවත්වාගෙන යාම සහ අවසන් කිරීම
විදුලි උත්පාදනය කළමනාකරණය කිරීම සඳහා ඉන්වර්ටරයක් සහ පාලන පද්ධතියක් සකස් කිරීම සහ විදුලිය විසන්ධි කිරීම් අවස්ථාවල දී ප්‍රයෝජනය සඳහා සූර්ය කෝෂ යන්ත්‍රයක් සකස් කිරීම	ලක්දනවි පෞද්ගලික සමාගම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර බලපත්‍ර ගිවිසුම	විදුලි උත්පාදනය කළමනාකරණය කිරීම සඳහා ඉන්වර්ටරයක් සහ පාලන පද්ධතියක් සකස් කිරීම සහ විදුලිය විසන්ධි කිරීම් අවස්ථාවල දී ප්‍රයෝජනය සඳහා සූර්ය කෝෂ යන්ත්‍රයක් සකස් කිරීම
RESPIRON NANO AV99 මුහුණු ආවරණය වාණිජකරණය කිරීම	සරසවි ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර බලපත්‍ර ගිවිසුම	RESPIRON NANO AV99 මුහුණු ආවරණය වාණිජකරණය කිරීම
ජෙව පොහොර වර්ග දෙකක් වාණිජකරණය කිරීම	ඩීසල් සහ මෝටර් ඉංජිනේරු පොදු සමාගම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	එම ජෙව පොහොර වර්ග දෙක තවදුරටත් වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය කිරීම
තෝරාගත් තේ අස්වනු නෙලන යන්ත්‍රයක් වාණිජකරණය කිරීම	භූමි ටෙක් (පුද්) සමාගම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුම	නිෂ්පාදනය තවදුරටත් වැඩිදියුණු කිරීම සහ වාණිජකරණය කිරීම

2023 වර්ෂයේ දී අත්සන් කරන ලද බලපත්‍ර ගිවිසුම්

ගිවිසුමේ නාමය	තාක්ෂණික නම	බලපත්‍රලාභියාගේ නම	ප්‍රධාන ප්‍රතිපාදන
ලක්දනවි (පෞද්ගලික) සමාගම සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර බලපත්‍ර ගිවිසුම	විදුලි උත්පාදනය කළමනාකරණය කිරීම සඳහා ඉන්වර්ටරයක් සහ පාලන පද්ධතියක් සකස් කිරීම සහ විදුලිය විසන්ධි කිරීම් අවස්ථාවල දී ප්‍රයෝජනය සඳහා සූර්ය කෝෂ යන්ත්‍රයක් සකස් කිරීම	ලක්දනවි (පෞද්ගලික) සමාගම	ආපසු නො ගෙවන රු. 50000 බලපත්‍ර ගාස්තුවක් - බලපත්‍රලාභියාගේ ශුද්ධ ආදායමෙන් 2.5% ක කතෘභාගයක් - 2.5% ක කර්තෘභාගය ගෙවීමේ අනුපාතය පළමු වාණිජ අලෙවියෙන් වසර 2 කට පසුව නැවත සාකච්ඡා කරනු ලැබිය යුතු ය.

2023 වර්ෂයේ දී පේටන්ට් බලපත්‍ර පිළිබඳ විස්තර

පීඨය	අධ්‍යයනාංශය	නව නිපැයුම්කරු/ සංවර්ධක	පේටන්ට් බලපත්‍රයේ නම	පේටන්ට් අයදුම් අංකය
ඉංජිනේරු	විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා	මහාචාර්ය අරුණ ගුණවර්ධන	අනුනාදිත චුම්බක සම්බන්ධ කිරීම භාවිතයෙන් කදිහ මාධ්‍ය ඔස්සේ සන්නිවේදනය හෝ සංවේදනය සඳහා උපකරණයක් සහ ක්‍රමයක්	22800
	සිවිල් ඉංජිනේරු විද්‍යා	ආචාර්ය එස්.කේ. නවරත්නරාජා	දුම්රිය යෙදුම් සඳහා ස්ලීපර් පෑඩ් (TUSP) යටතේ ජාලකය	22792
	විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යා	එස්.වී.පී. අශාන් මහතා	දුව සහ සන නිදර්ශකවල සම්ප්‍රේෂණ සහ පරාවර්තන මිනුම් දෙක ම සඳහා බහු වර්ණාවලි රූපකරණ පද්ධතියක්	22796
		එල්.බී.අයි.පී. තිලකසිරි මහතා	බහු සංවේදී හුෑණ වලන විශ්ලේෂණ උපකරණයක්	22798
විද්‍යා	උද්භිද විද්‍යා	ආචාර්ය ඒ.ඩී.එස්.එන්.පී. අතුකෝරල	මතුපිට කැන්ඩිඩල් ආසාදනවලට එරෙහි ව ශාකසාර නිෂ්පාදනයක් සැකසීම	22794
	රසායන විද්‍යා	මහාචාර්ය ඒ.ඩී.එල්.සී පෙරේරා	K-Carrageenan නැනෝ සංයෝග රෙස්වෙටරෝල් සහ කර්කුමින් ඇතුළත් ක්‍රියාකාරී ආහාර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියක්	22793
		ආචාර්ය ඩබ්ලිව්.එස්.එස් ගුණතිලක	කහ, කෝපි, කරපිංචා කොළ හෝ විෂ ගෙඩි සාරය සමඟ සංයෝජනය කිරීම සහ එහි පවතින තුවාල සුව කිරීමේ ගුණාංග	22799
	භූ විද්‍යා	මහාචාර්ය එන්.ඩබ්ලිව්.බී බාලසූරිය	නැනෝ-ෆ්ලෝරපටයිට් සහ එහි ව්‍යුත්පන්න සංශ්ලේෂණය	22795
	රසායන විද්‍යා	ආචාර්ය ජේ.එම්. සුසන්ති ජයසිංහ	ඩෙංගු වාහක මදුරුවන් වන Aedes Aegypti iy Ades Albopictus ගේ මදුරු කීටයන් පාලනය කිරීම සඳහා ඒකාබද්ධ ශාක සාරවලින් සංයෝග Chitosan නැනෝ අංශුවලින් නව කීට නාශක කාරකයක් සකස් කිරීම	22797
		මහාචාර්ය නාමල් ප්‍රියන්ත	අයන-තෝරාගත් ඉලෙක්ට්‍රෝඩ භාවිතයෙන් ජලීය ද්‍රාවණයක තඹ (II) අයන හඳුනා ගැනීමට සංවේදක උපාංගයක්	22955

කර්මාන්ත සහයෝගීතාව

- උපාධි අපේක්ෂකයන් අතර ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කරමින් විශ්වද්‍යාලය සහ කර්මාන්ත කටයුතු පිළිබඳ SECRA වැඩමුළුව සම-සංවිධානය කිරීම.
- ආයෝජන මණ්ඩලයේ නිලධාරීන්, කර්මාන්ත නියෝජිතයන් සහ පාරිසරික බලධාරීන් වැනි ප්‍රධාන පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගනිමින් ශාස්ත්‍රඥයින් සහ කර්මාන්තකරුවන් අතර සහයෝගීතාව වර්ධනය කිරීම අරමුණු කර ගත් විවෘත දින සාකච්ඡා සැසියක් සංවිධානය කිරීම.
- ජාතික මෙහෙවර රූපවාහිනී වැඩසටහන්වල දී සහ 2023 කර්මාන්ත ප්‍රදර්ශනයේ දී විශ්වවිද්‍යාල නවෝත්පාදන ඉදිරිපත් කර මහජනතාව දැනුවත් කිරීම සහ එමගින් විභව හවුල්කාරිත්ව ගොඩනගා ගැනීම.
- තක්සේරු කිරීම, සාකච්ඡා කිරීම, බුද්ධිමය දේපළ ආරක්ෂණය සහ ඉදිරිපත් කිරීම වැනි තාක්ෂණික වාණිජකරණ අංශ සම්බන්ධයෙන් නව නිපැයුම්කරුවන් සඳහා වැඩමුළු පැවැත්වීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව සහ ජාතික නියෝජිතායතන සමඟ සහයෝගීතා ගොඩනගා ගැනීම.
- සාර්ථක ව්‍යවසායකයින්ට ආරාධනා කිරීම මගින් උපාධි අපේක්ෂකයන් ව්‍යවසායකත්වය සඳහා පෙලඹවීම පිණිස "කොෆි චැට්" වැඩසටහන් සංවිධානය කිරීම.

බාහිර පිළිගැනීම්

- සාර්ථක IV අදියරේ ප්‍රගති ඇගයීම වෙනුවෙන් AHEAD/OMST සහ ලෝක බැංකුවෙන් මිලියන 10ක මුදලක් ලැබිණි.

- RESPIRON NANO AV 99 මුව ආවරණ, ඕපන් සෝර්ස් ස්මාර්ට් ඉන්වෙන්ටර්, සහ තේ දළු නෙළීම සඳහා රොබෝ අත් යන ප්‍රධාන නවෝත්පාදන තුනක් "විශ්වවිද්‍යාල පර්යේෂණ සඳහා සාර්ථක වාණිජකරණය හඳුනා ගැනීම" නමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවැති උත්සවයේ දී ගෞරව සම්මානයට පාත්‍ර විය.

- AHEAD/විශ්වවිද්‍යාල ව්‍යාපාර සබඳතා ප්‍රදානවලට අදාළ කාර්යයන් සම්පූර්ණ කිරීම වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සහ ලෝක බැංකුවෙන් සහතිකයක් හිමි වුණි.

1.4.2.5 AHEAD ව්‍යාපෘතිය

AHEAD ව්‍යාපෘතිය යටතේ නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම (ICE), ඉගෙනීම් කටයුතු, ඉගැන්වීම සහ තක්සේරු කිරීම (ELTA) සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩිදියුණු කිරීම (ELSE), සංවර්ධනාභිමුඛ පර්යේෂණ (DOR) සහ පර්යේෂණ නවෝත්පාදන වාණිජකරණය (RIC) ආදී වශයෙන් වූ ප්‍රදාන රාශියක් පිරිනමන ලදි. මෙම ප්‍රදාන විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ සහ අධ්‍යයනාංශ ඉලක්ක කර පිරි නමා ඇත.

වියදම් පිළිබඳ සුවිශේෂිත කරුණු

විවිධ කාණ්ඩ සඳහා සිදු කරන ලද සුවිශේෂී ප්‍රතිපාදන වෙන්කිරීම් සහ උපයෝගිතා ප්‍රතිශත අනුව AHEAD ප්‍රදානවල සමස්ත වියදම 89.80%ක ප්‍රමාණයක් දක්වා ළඟා විය.

සියලු ප්‍රදානවල ඉතිරි අරමුදල් ප්‍රශස්තකරණය කිරීමට ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන් දැරූ ප්‍රයත්නය සමඟ 2023 වර්ෂයේ දී එම සියලු ප්‍රදානවල නිමාව සනිටුහන් විය. ආර්ථික අභියෝග මධ්‍යයේ වුව ද, ප්‍රසම්පාදන සහ සිවිල් වැඩකටයුතු 2023 ජූනි 30 වන විට අවසන් කරන ලදි. ඉහළ යන මිල ගණන් මධ්‍යයේ අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා ප්‍රමුඛත්වය ලබා දීම පිණිස ව්‍යාපෘති ක්‍රියාකාරකම් වූහ නැවත නිරීක්ෂණය කරන ලදි. කාලය දීර්ඝකිරීම් ලබා දී ඇතත් කාලය පිළිබඳ ව පැවැති සීමාවන් අරමුදල් ප්‍රශස්ත අයුරින් භාවිත කිරීම කෙරෙහි බලපෑවෝ ය.

මානව සම්පත් සංවර්ධන ප්‍රදාන සහ ප්‍රදානලාභීන්

ප්‍රදානලාභීන් හය දෙනෙකු ඉල්ලා අස්වීම නිසා තාක්ෂණික සේවා කාර්යාලය විසින් කළමනාකරණය කරන ලද මානව සම්පත් සංවර්ධන ප්‍රදාන නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ගවලට යොමුවීමට සිදු වූ අතර ඒ හේතුවෙන් අභියෝග රැසකට මුහුණ දීමට සිදු විය. එක් ප්‍රදානලාභියෙකු පමණක් අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර තිබෙන අතර ප්‍රදානලාභීන් නව දෙනෙක් තවමත් අධ්‍යයන කටයුතුවල නියැලෙමින් සිටිති. මූල්‍ය ආධාරවල 7%ක සහ 5%ක වැඩිවීමක් අවශ්‍ය කර තිබියදීත් එම ප්‍රදාන පිරිනමන ඇතම් ප්‍රදානීන් එම වැඩි කළ මුදල ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි.

ජයග්‍රහණ

පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා පීඨයේ සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමත් සමඟ සිවිල් කාර්යයන් සහ උපකරණ ප්‍රදානයන් බොහෝ දුරට සාර්ථක විය. ELTA-ELSE ප්‍රදානයන් විවිධ ප්‍රමාණවලින් භාවිත කර තිබූ අතර ඇතැම් ප්‍රදාන භාවිතය 90% ද ඉක්මවා තිබුණි. ඇගයීම් කටයුතු සහ ප්‍රගති සමාලෝචන මගින් ව්‍යාපෘති සම්බන්ධීකාරකවරුන් මුහුණ දෙන ලද අභියෝග සහ අත් කර ගන්නා ලද ජයග්‍රහණ හඳුනා ගන්නා ලදි.

2023.12.31 දිනට AHEAD ව්‍යාපෘති ප්‍රදානවල මුළු වියදම් පිළිබඳ විස්තර

ප්‍රදානය	ප්‍රදාන වෙන් කිරීම	සමුච්චිත වියදම්	මුළු වියදම	එකතුව	අරමුදල් භාවිතා කිරීම ٪
නවෝත්පාදන වාණිජකරණය වැඩිදියුණු කිරීම (ICE)	120,000,000.00	102,339,222.12	11,039,855.11	113,379,077.23	94.48
සංවර්ධනාභිමුඛ පර්යේෂණ (DoR)	208,000,000.00	177,531,866.35	22,397,118.63	199,928,984.98	96.12
පර්යේෂණ නවෝත්පාදන වාණිජකරණය (RIC)	85,000,000.00	78,551,696.71	4,966,865.93	83,518,562.64	98.26
මානව සම්පත් සංවර්ධන	154,185,915.57	117,950,672.07	19,479,745.80	137,430,417.87	89.13
විශ්වවිද්‍යාල ව්‍යාපාර සම්බන්ධතා	20,000,000.00	5,723,365.39	9,711,769.96	15,435,135.35	77.18
ඉගෙනීම, ඉගැන්වීම සහ ඇගයීම වර්ධනය කිරීම සහ ඉංග්‍රීසි භාෂා කුසලතා වැඩි දියුණු කිරීම (ELTA ELSE - පීඨ තුළ)	480,000,000.00	325,566,030.64	134,818,127.92	460,384,158.56	95.91
ELTA ELSE - අධ්‍යයනාංශ තුළ	72,000,000.00	51,566,381.19	17,690,045.45	69,256,426.64	96.19
ශාස්ත්‍රීය වැඩසටහන් සඳහා තොරතුරු තාක්ෂණය භාවිත කිරීම, ශාස්ත්‍ර පීඨය- (ELTA ELSE යටතේ)	36,500,000.00	26,375,486.25	7,301,705.35	33,677,191.60	92.27
සිවිල් කටයුතු	280,740,000.00	150,766,196.17	31,774,228.38	182,540,424.55	65.02
උපකරණ ප්‍රදාන	155,389,299.32	125,363,136.09	26,456,633.00	151,819,769.09	97.70
එකතුව	1,611,815,214.89	1,161,734,052.98	285,636,095.53	1,447,370,148.51	89.80

1.4.2.6 විශ්වවිද්‍යාල බහුවිෂයික පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාලයේ බහුවිෂයික පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය (MuNIC) නවෝත්පාදනයන් වැඩිදියුණු කිරීම සහ පර්යේෂණ සහ කර්මාන්ත අතර පරතරය අවම කිරීමට කටයුතු කිරීම මගින් ශ්‍රී ලංකාවේ දැනුම් පාදක ආර්ථිකයක් බිහිකිරීමට දායක වීම අරමුණු කරයි. 2023 දී විශ්වවිද්‍යාලයේ බහුවිෂයික පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් නම්‍යශීලී මූල්‍ය ආකෘතියක් හඳුන්වාදීම පිණිස එහි ව්‍යවස්ථාව සහ අතුරු ව්‍යවස්ථා වෙනස් කිරීම කෙරෙහි අවධානය යොමු කළ අතර විශ්වවිද්‍යාලයේ භූ දර්ශනයට සැලකිය යුතු ලෙස බලපෑ හැකි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා උද්‍යානය (UPSP) සඳහා සැලසුම් ආරම්භ කරන ලදි.

2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාල බහුවිෂයික පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානය විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ලැබූ ප්‍රධාන ජයග්‍රහණ

- විශ්වවිද්‍යාල බහුවිෂයික පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානයේ අතුරු ව්‍යවස්ථා සහ ප්‍රධාන ව්‍යවස්ථාව කෙටුම්පත් කිරීම අවසන් කිරීම
- ස්වයං ආදායම් ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා වගකීමෙන් සීමිත සමාගමක් පිහිටුවීමට නිර්දේශ කරමින් ඊට අදාළ කැබිනට් පත්‍රිකාවක් සකස් කර වාර්තාවක් පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම
- යෝජිත ආයතනය සඳහා සාංගමික සංස්ථාවලි සකස් කිරීම සඳහා සමාගම් ලේකම් තනතුර පිළිබඳ ප්‍රචාරණය කිරීම
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා උද්‍යානය පිළිබඳ සංකල්පය පාලක සභාවට ඉදිරිපත් කර, එය විශ්වවිද්‍යාලයේ 2042 ශත සංවත්සර දින දර්ශනයට ඇතුළත් කර, ජයිකා සහ ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව වෙතින් අරමුදල් ලබා ගැනීමට කටයුතු කිරීම.
- කෘෂිකාර්මික ජෛව තාක්ෂණ ඒකකය අසල විද්‍යා උද්‍යානය සඳහා අවශ්‍ය ඉඩමක් හඳුනාගෙන ඒ සම්බන්ධ මූලික සාකච්ඡා සිදු කිරීම.

1.4.3 ජාත්‍යන්තර සහයෝගීතා

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය (InRO) ජාත්‍යන්තරය සමඟ කටයුතු කිරීම සහ ශාස්ත්‍රීය හුවමාරු වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රධාන පහසුකම් සපයන්නෙකු ලෙස සේවය කරයි.

2023 වර්ෂයේ දී ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය ජයිකා දැනුම සම-නිර්මාණය කිරීමේ වැඩසටහන, ජයිකා ශාස්ත්‍රපති වැඩසටහන සහ ජාත්‍යන්තර ආයතනවල ආචාර්ය උපාධි සඳහා ප්‍රවේශය වැනි වැඩසටහන් ඇතුළු ව විශ්වවිද්‍යාල සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා විවිධ උසස් අධ්‍යාපන අවස්ථා සඳහා පහසුකම් සලසා ඇත.

සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ අධ්‍යයන අරමුණු විදේශයන්හි දී සපුරා ගැනීමට හැකියාව ඇතිකරමින් ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය විසින් විවිධ රටවල් සහ සංවිධාන විසින් පිරිනමනු ලබන ශිෂ්‍යත්ව රාශියක් ලබාගැනීමට ද සහාය ලබා දෙන ලදි.

ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය Erasmus¬ වැනි යුරෝපීය සංගමයේ වැඩසටහන් සමඟ සක්‍රීය ව සහයෝගීතා පවත්වාගෙන යමින් ආයතනික ධාරිතා ගොඩනැංවීම සහ විශ්වවිද්‍යාල ප්‍රජාවට අධ්‍යයනය, සංස්කෘතික හුවමාරුව, අරමුදල් සැපයීම සහ සහයෝගීතා අවස්ථා හඳුන්වාදීම සඳහා වැඩමුළු, වැඩසටහන් සහ දැනුම්වත් කිරීමේ සැසි සංවිධානය කළේ ය.

ජාත්‍යන්තර සහයෝගීතා පුළුල් කිරීම සහ සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා ගෝලීය අධ්‍යාපන අවස්ථා උදාකර දීම අරමුණු කර ගෙන ජාත්‍යන්තර සතිය, අධ්‍යාපන ප්‍රදර්ශනය, ෆ්‍රැන්කෝෆෝන් සහ ව්‍යාධිජනක ජාන විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සංවිධානය කිරීම 2023 වර්ෂයේ දී ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය විසින් සිදු කරන ලද සුවිශේෂී කාර්යය විය.

ජාත්‍යන්තර සතිය

ශ්‍රී ලංකාවේ ජයිකා කාර්යාලය, ජපාන තානාපති කාර්යාලය, ඉන්දියාවේ සහකාර මහ කොමසාරිස් කාර්යාලය සහ අනෙකුත් සුවිශේෂී හවුල්කරුවන් සමඟ සහයෝගයෙන් යුතු ව අඛණ්ඩ ව දෙවන වරටත් ජාත්‍යන්තර සතිය සාර්ථක ව සංවිධානය කිරීම 2023 වර්ෂයේ දී ජාත්‍යන්තර සම්බන්ධතා කාර්යාලය විසින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයකි.

මෙම ජාත්‍යන්තර සතිය පැවැත්වීම මගින් ජාත්‍යන්තර සහයෝගීතාව පුළුල් කිරීම, ගෝලීය අධ්‍යාපන අවස්ථා සඳහා සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට අවස්ථා උදා කරදීම සහ විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පැවැත්ම ශක්තිමත් කිරීම සහ විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර මට්ටමේ දැනුම හුවමාරු කර ගැනීමේ සහ ශාස්ත්‍රීය විශිෂ්ටත්වයේ ප්‍රමුඛ මධ්‍යස්ථානයක් බවට පත්කිරීම අරමුණු කර ඇත.

2023 දී ජාත්‍යන්තර හවුල්කාරිත්ව/සබඳතා සහ සහයෝගීතා

හවුල්කරුගේ නම	රට	හවුල්කාරිත්වයේ ස්වභාවය	ආරම්භක දිනය	ප්‍රධාන ක්‍රියාකාරකම්	ප්‍රතිඵල
ජයිකා සහ ශ්‍රී ලංකා ජපන් අධ්‍යයන මධ්‍යස්ථානය (SLJSC)	ජපානය	කෙටි පාඨමාලා වැඩසටහන	13-01-2023	මහජන සෞඛ්‍යය, විද්‍යාව සහ තාක්ෂණය, කෘෂිකර්මය, පරිපාලන ක්‍රමවේද, විදේශ ප්‍රතිපත්ති සහ ජාත්‍යන්තර සබඳතා ඇතුළු ජපානයේ සංවර්ධනය	අධ්‍යාපනික වැඩසටහන් අටක් පවත්වන ලදි.
ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය	ජපානය	ද්විත්ව උපාධි වැඩසටහන	10-01-2023	විද්‍යාව පිළිබඳ ද්විත්ව උපාධි වැඩසටහන, පීඨ හුවමාරුව	ද්විත්ව උපාධි සහිත උපාධිධාරීන්, පීඨ සහයෝගීතාව වැඩි දියුණු කිරීම
පාකිස්තානයේ උසස් අධ්‍යාපන කොමිෂන් සභාව	පාකිස්තානය	ආසියානු ශිෂ්ටාචාර හා සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීම	07-02-2023	මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා රැස්වීම් පැවැත්වීම	ආසියානු ශිෂ්ටාචාර සහ සංස්කෘතික මධ්‍යස්ථානය පිහිටුවීම
බෙලාරුස්හි ගොමෙල් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය	බෙලාරුස්	අභිප්‍රාය ලිපිය	17-02-2023	විශ්වවිද්‍යාල දෙක අතර ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරු කිරීම් සහ සායනික පුහුණුව සඳහා ඇති හැකියාව ඇතුළු ගොඩ නගා ගත හැකි අධ්‍යයන සහයෝගීතා	ශිෂ්‍ය හුවමාරු, පැවැත්විය හැකි සායනික පුහුණුව

2023 දී ජාත්‍යන්තර හවුල්කාරිත්ව/සබඳතා සහ සහයෝගීතා වගුව හා සම්බන්ධ වේ.

හවුල්කරුගේ නම	රට	හවුල්කාරිත්වයේ ස්වභාවය	ආරම්භක දිනය	ප්‍රධාන ක්‍රියාකාරකම්	ප්‍රතිඵල
පලක්කාඩ් ඉන්දියානු තාක්ෂණ ආයතනය (IITP)	ඉන්දියාව	අවබෝධතා ගිවිසුම	07-03-2023	ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරු ඇතුළු ගොඩ නගා ගත හැකි අධ්‍යයන සහයෝගීතා	ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු සහ ඇති විය හැකි අනෙකුත් සහයෝගීතා
ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලය (QUT)	ඕස්ට්‍රේලියාව	ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන	25-04-2023	ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම	ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන්
ඉන්දෝර් ඉන්දියානු තාක්ෂණ ආයතනය,	ඉන්දියාව	අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සැලසුම් කිරීම	23-05-2023	ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරු ඇතුළු ගොඩ නගා ගත හැකි අධ්‍යයන සහයෝගීතා	ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු සහ ඇති විය හැකි අනෙකුත් සහයෝගීතා
චීනයේ ටුමාරෝ තාක්ෂණ අධ්‍යාපන සේවා මධ්‍යස්ථානය (TTESC)	චීනය	ගිවිසුමක් අත්සන් කිරීමට සැලසුම් කිරීම	25-05-2023	ඒකාබද්ධ ආචාර්ය උපාධි සහ ශාස්ත්‍රපති වැඩසටහන් ආරම්භ කිරීම	ඒකාබද්ධ ආචාර්ය උපාධි සහ ශාස්ත්‍රපති
රුසියානු මන්දිරය, කොළඹ	රුසියාව	රුසියානු භාෂා ඒකකයක් පිහිටුවීම	27-06-2023	කන්නන්ගර ගොඩනැගිල්ලේ නව පරිශ්‍රයේ නවීන භාෂා අධ්‍යයනය සම්බන්ධීකරණ ඒකකය (CSML) පිහිටුවීම	නවීන භාෂා අධ්‍යයන ඒකකය (CSML)
රුසියානු මන්දිරය, කොළඹ	රුසියාව	රුසියානු භාෂා පාඨමාලාව ආරම්භ කිරීම	27-06-2023	රුසියානු භාෂා පාඨමාලාව ආරම්භ කිරීම	රුසියානු භාෂා පාඨමාලාව
රුසියාවේ නිශ්නි නොව්ගොරොඩ් හි ලොබචෙව්ස්කි රාජ්‍ය විශ්වවිද්‍යාලය	රුසියාව	ගිවිසුමක් අත්සන් කිරීමට සැලසුම් කිරීම	19-09-2023	ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරු ඇතුළු ගොඩනැගිය හැකි අධ්‍යයන සහයෝගීතා	රුසියාවේ නිශ්නි නොව්ගොරොඩ්හි ලොබචෙව්ස්කි රාජ්‍ය විශ්වවිද්‍යාලය විසින් එවන ලද අවබෝධතා ගිවිසුම හා සම්බන්ධ කටයුතු ඉතිහාස අධ්‍යයනාංශය යටතේ සිදු වෙමින් පවතී.
ස්වීඩන් පර්යේෂණ සහයෝගීතාව	ස්වීඩනය, නයිජීරියාව, ඉන්දියාව	පර්යේෂණ සහයෝගීතාව	04-10-2023	"අඩු වියදම් සූර්ය කෝෂවල කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා නව නැනෝ වියුහයන්" පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය	ස්වීඩන් පර්යේෂණ සහයෝගීතාව
මහනුවර සහකාර මහ කොමසාරිස් කාර්යාලය	ඉන්දියාව	හින්දි භාෂා පාඨමාලාව ආරම්භ කිරීම	23-10-2023	හින්දි භාෂා පාඨමාලාව ආරම්භ කිරීම	පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හින්දි භාෂා වැඩසටහනක් සකස් කිරීම
යූ-ක්‍රියේටිව් එඩියුකේෂන්	චීනය	ගිවිසුමක් අත්සන් කිරීමට සැලසුම් කිරීම	23-12-2023	ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සංවිධානය කිරීම	ශිෂ්‍ය හුවමාරු සහ ඇති විය හැකි අනෙකුත් සහයෝගීතා

ජාත්‍යන්තර ශිෂ්‍ය සංචලතා වැඩසටහන්

වැඩසටහනේ නම	වැඩසටහනේ ස්වභාවය	ඉලක්කගත කණ්ඩායම	සහභාගිවන්නන් සංඛ්‍යාව	හවුල්කාර ආයතන
හුවමාරු වැඩසටහන	ශිෂ්‍ය හුවමාරු	උපාධි අපේක්ෂක සිසුන්	සිසුන් දෙදෙනෙක්	ජපානයේ ෆුකුඕකා කාන්තා විශ්වවිද්‍යාලය
හුවමාරු වැඩසටහන				ජපානයේ සයිටාමා විශ්වවිද්‍යාලය
HUSTEP වැඩසටහන				ජපානයේ හොකයිඩෝ විශ්වවිද්‍යාලය
හුවමාරු වැඩසටහන				දකුණු කොරියාවේ ඩොන්ගුක් විශ්වවිද්‍යාලය
හුවමාරු වැඩසටහන				ජර්මනියේ වර්ස්බර්ග් විශ්වවිද්‍යාලය

2023 වර්ෂයේ දී අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම්

විශ්වවිද්‍යාලය/ පීඨය	කටයුත්තේ කාර්යභාරය	සහයෝගිතා නියෝජිතායතනය	රට
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ද්විත්ව උපාධි වැඩසටහන මගින් ශිෂ්‍ය හුවමාරු වැඩපිළිවෙළ වැඩිදියුණු කිරීම අරමුණු කිරීම	නිගාටා විශ්වවිද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණ උපාධි විද්‍යායතනය	ජපානය
	සහයෝගිතා හුවමාරු වැඩසටහනක් ස්ථාපිත කිරීම	ඉලිනොයිස් විශ්වවිද්‍යාලය	ඇමරිකා එක්සත් ජනපදය
	දැනුම හුවමාරුව සහ සහයෝගිතාවය ප්‍රවර්ධනය කිරීම	ජයිකා ශ්‍රී ලංකා කාර්යාලය	ජපානය
	අනාගත අධ්‍යයන සහයෝගිතාව ශක්තිමත් කිරීම	ගොමෙල් රාජ්‍ය වෛද්‍ය විශ්වවිද්‍යාලය	බෙලාරුස්
කෘෂි විද්‍යා	අධ්‍යයන සහයෝගිතාව	එස්ලින්ගන් ව්‍යවහාරික විද්‍යා විශ්වවිද්‍යාලය	ජර්මනිය
	අධ්‍යයන සහයෝගිතාව	ඉලිනොයිස් විශ්වවිද්‍යාලය	ඇමරිකා එක්සත් ජනපදය
	අන්‍යෝන්‍ය සහයෝගිතාව	චුංග්-ඇං විශ්වවිද්‍යාලය	කොරියානු ජනරජය
	අන්‍යෝන්‍ය සහයෝගිතාව	කුක්මින් විශ්වවිද්‍යාලය	
සම සෞඛ්‍ය විද්‍යා	අභිප්‍රාය ලිපිය	චුංග්-ඇං විශ්වවිද්‍යාලය	ජපානය
	අවබෝධතා ගිවිසුම (MOU)	ටෝකියෝ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලය	ජපානය
දන්ත වෛද්‍ය විද්‍යා	ශිෂ්‍ය කාර්ය මණ්ඩල හුවමාරුව, ශාස්ත්‍රීය හුවමාරුව	GSL ආයතනය	ඉන්දියාව
	අධ්‍යයන සහයෝගිතාව	අයි.පී.එස්. ඇකඩමිය, ඉංජිනේරු සහ විද්‍යා ආයතනය, ඉන්දෝර්	ඉන්දියාව
	අධ්‍යයන සහයෝගිතාව	සුබං ජය පිළිකා පර්යේෂණ ආයතනය	මැලේසියාව
	හෙළිදරව් නො කිරීමේ ගිවිසුම සහ බලපත්‍ර ගිවිසුම	සුබං ජය පිළිකා පර්යේෂණ ආයතනය	මැලේසියාව
ඉංජිනේරු	ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහන	රාජකීය මෙල්බර්න් තාක්ෂණ ආයතනය	ඕස්ට්‍රේලියාව
	අන්තර් ආයතනික ගිවිසුම	ඔරේඩියා විශ්වවිද්‍යාලය	රුමේනියාව
	අන්තර් ආයතනික ගිවිසුම් ඉගෙනුම් සංචලනය	වයිටාවාස් මැග්නස් විශ්වවිද්‍යාලය	ලිතුවේනියාව
	ශිෂ්‍ය කාර්ය මණ්ඩල හුවමාරුව	GSL විශ්වවිද්‍යාලය	ඉන්දියාව
	සහයෝගිතා පර්යේෂණ	ඉන්දියානු තාක්ෂණ ආයතනය පලක්කාඩ් (IITPKD)	ඉන්දියාව
	ජපානයේ නවීකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	ජයිකා ශ්‍රී ලංකා කාර්යාලය	ජපානය
වෛද්‍ය	පර්යේෂණ සහයෝගිතා ගිවිසුම	හොංකොං චීන විශ්වවිද්‍යාලය	හොංකොං
	රේස්පයර් 2 ජාත්‍යන්තර සම්මුති ගිවිසුම	එඩින්බරෝ විශ්වවිද්‍යාලයේ විශ්වවිද්‍යාල අධිකරණය සහ තවත් විශ්වවිද්‍යාල 22 ක්	එක්සත් රාජධානිය
පශු වෛද්‍ය සහ සත්ත්ව විද්‍යා		ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සිය (IAEA)	ඕස්ට්‍රේලියාව
	II සමුද්‍රීය රාජ්‍ය සහයෝගිතා වැඩසටහන (OCPP) ශිෂ්‍යත්ව අවබෝධතා ගිවිසුම	පොදුරාජ්‍ය මණ්ඩලීය විශ්වවිද්‍යාල සංගමය	එක්සත් රාජධානිය
	III ප්‍රදාන ලබන්නන් සහ හවුල්කාර ආයතන සඳහා ආරක්ෂක ප්‍රතිපත්තිය		
	IIII ජාත්‍යන්තර දත්ත හුවමාරු ගිවිසුම - ICO		
	ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරුව	පාදුවා විශ්වවිද්‍යාලය	ඉතාලිය

2023 වර්ෂයේ දී සංවිධානය කරන ලද/ සත්කාරකත්වය දරන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ


සම්මන්ත්‍රණ/වැඩසටහන	සංවිධානය කරන ලද ආයතනය	පැවති දිනය
දකුණු ආසියානු නයිට්‍රජන් හබ් වාර්ෂික සමුළුව	කෘෂි විද්‍යා පීඨය	ඔක්තෝබර් 2 සිට 6 දක්වා
පේරාදෙණිය ජාත්‍යන්තර ආර්ථික පර්යේෂණ සම්මන්ත්‍රණය (PIER)	ශාස්ත්‍ර පීඨය	සැප්තැම්බර් 1
7 වැනි ජාත්‍යන්තර දෙමළ විද්‍යා පර්යේෂණ සමුළුව	ශාස්ත්‍ර පීඨය	මැයි 30 සහ 31
විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු ආයතනයේ 17 වැනි කාර්මික සහ තොරතුරු පද්ධති පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (ICII)	ඉංජිනේරු පීඨය	අගෝස්තු 25 සහ 26
ගණිතය සහ ගණිත අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය (ICMME) - 2023	විද්‍යා පීඨය	ජූලි 14 සහ 15
ජපානය නවීකරණ අධ්‍යයනය පිළිබඳ ජයිකා වැඩසටහන	ශ්‍රී ලංකා-ජපාන අධ්‍යයන මධ්‍යස්ථානය	ඔක්තෝබර් 17

2023 වර්ෂයේ දී සංවිධානය කරන ලද/ සත්කාරකත්වය දරන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ වගුව හා සම්බන්ධ වේ.

සම්මන්ත්‍රණ/වැඩසටහන	සංවිධානය කරන ලද ආයතනය	පැවති දිනය
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සැසිය (iPURSE) 2023	සියලුම පීඨ 9 සමඟ සහයෝගයෙන් වි.වි.ප. සභාව	සැප්තැම්බර් 20 සහ 21
කෘ.ප.ඵ. ආයතනයේ 35 වන වාර්ෂික සම්මේලනය	කෘ.ප.ඵ. ආයතනය	නොවැම්බර් 17
මා.ශා. හා ස.වි. ආයතනයේ පර්යේෂණ සම්මේලනය	මා.ශා. හා ස.වි. ආයතනය	දෙසැම්බර් 15
ආපදා අවදානම අවම කිරීම සහ දේශගුණික විපර්යාස පිළිබඳ ජාත්‍යන්තර සමුළුව (DRRCC-2023)	මා.ශා. හා ස.වි. ආයතනය	ඔක්තෝබර් 7
RESCON (පර්යේෂණ සමුළුව) - 2023	වි.ප.ඵ. ආයතනය	නොවැම්බර් 3 සහ 4
පාරිසරික තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානයේ 3 වැනි ජාත්‍යන්තර සමුළුව	පාරිසරික තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය	අගෝස්තු 25

ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සංචාර පිළිබඳ තොරතුරු

වර්ෂය	ජාත්‍යන්තර කාර්ය මණ්ඩල සංචාර ගණන
2023	145
2022	31
2021	12



රුසියානු දිනය සැමරීම

ජාත්‍යන්තර සබඳතා කාර්යාලය (InRO) විසින් කොළඹ රුසියානු මන්දිරය සමඟ එක්ව සංවිධානය කරන ලද රුසියානු දිනය රුසියානු සංස්කෘතිය සහ භාෂාව පිළිබඳ සැමරුමක් සනිටුහන් කරමින් 2023 ජූලි 27 වන දින පැවැත්විණි. මෙම අවස්ථාවට කොළඹ රුසියානු තානාපති කාර්යාලයේ පළමු ලේකම් සහ කොළඹ රුසියානු මන්දිරයේ අධ්‍යක්ෂවරිය වන මරියා පොපෝවා මැතිනිය ඇතුළු ගෞරවනීය අමුත්තන් සහ විශ්වවිද්‍යාල නිලධාරීන් සහ සිසුන් සහභාගී විය. විශ්වවිද්‍යාල ප්‍රධානීන් සහ සම්භාවනීය අමුත්තන්ගේ සහභාගීත්වයෙන් පැවැති සමාරම්භක උත්සවය මෙන් ම රුසියානු සංස්කෘතිය ප්‍රදර්ශනය කරන විවිධ ක්‍රියාකාරකම් ද මෙම දවසේ පැවැති සුවිශේෂී කටයුතු විය. මෙහි දී සුවිශේෂී අවස්ථාවක් වූයේ, නූතන භාෂා අධ්‍යයනයේ සම්බන්ධීකරණ ඒකකය (CSML) විවෘත කිරීම සඳහා ශාස්ත්‍ර පීඨයේ සම්භාව්‍ය භාෂා අධ්‍යයනාංශයට මාරියා පොපෝවා මැතිනියගේ පැමිණීම යි. මීට අමතර ව, වෛද්‍ය පීඨයේ දී "Moscow Does Not Believe in Tears" නැමැති සම්මානලාභී චිත්‍රපටය ප්‍රදර්ශනය කරමින් රුසියානු සිනමාවේ අත්දැකීම් ලබාගැනීමට සිසුන්ට අවස්ථාව උදාවුණි.

- **ශ්‍රී ලංකා-ජපාන අධ්‍යයන මධ්‍යස්ථානය**

ශ්‍රී ලංකා-ජපාන අධ්‍යයන මධ්‍යස්ථානය 2023 වසරේ පර්යේෂණ සහයෝගීතාව සහ අධ්‍යයනය හුවමාරු වැඩසටහන් සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන්නේ ය.


- ශ්‍රී ලංකාව සහ ජපානය අතර ශාස්ත්‍රීය සහයෝගීතාව තවදුරටත් වර්ධනය කරමින් 2022 නොවැම්බර් සිට 2023 පෙබරවාරි දක්වා දෙවන ජයිකා චෙයා වැඩසටහන සාර්ථක ව පවත්වන ලදි.
- ද්විපාර්ශ්වික පර්යේෂණ හවුල්කාරිත්වයන් වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩ ව කැපවී කටයුතු කරන බව පිළිබිඹු කරමින් 2023 ඔක්තෝම්බර් මාසයේ දී තුන්වන ජයිකා චෙයා වැඩසටහන ආරම්භ කරන ලදි.
- කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් වසර තුනක විරාමයකින් පසු අටවන ශ්‍රී ලංකා-ජපාන සහයෝගීතා පර්යේෂණ සමුළුව (SLJCR-2023) 2023 ඔක්තෝම්බර් 21 වැනි දින මාර්ගගත ව පවත්වන ලදි.
- ආසන්න වශයෙන් පුද්ගලයින් 400කගේ පමණ ක්‍රියාකාරී සහභාගීත්වයක් සහිත ව අධ්‍යයන සහයෝගීතාව සහ දැනුම හුවමාරු කිරීම තවදුරටත් වර්ධනය කරමින් 2023 වර්ෂයේ දී ජයිකා චෙයා වැඩසටහන් අටක් පවත්වන ලදි.
- පුළුල් සහභාගීත්වයකට සහ කාර්යයන්හි නියැලීමට පහසුකම් සලසමින් දෙමුහුන් වැඩසටහන් ලෙස සැසි කිහිපයක් පවත්වමින් තුන්වන ජයිකා චෙයා වැඩසටහන 2023 ඔක්තෝබර් මාසයේ දී ආරම්භ කරන ලදි.

1.4.4 ශිෂ්‍ය ජනවිකාස සහ බඳවා ගැනීම

1.4.4.1 සිසුන් (නවකයන්)


2022/2023 අධ්‍යයන වර්ෂය සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාව බෙදා හැරීම

විශ්වවිද්‍යාලය	යෝජිත මුළු ස්ථාන සංඛ්‍යාව	%
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (SJP)	4713	13
රුහුණු විශ්වවිද්‍යාලය (RUH)	4209	12
කැලණිය විශ්වවිද්‍යාලය (KLN)	4150	12
කොළඹ විශ්වවිද්‍යාලය (CBO)	3504	10
යාපනය විශ්වවිද්‍යාලය (UJA)	3501	10
පේරාදෙණිය විශ්වවිද්‍යාලය (PDN)	3290	9
ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය (SUSL)	2563	7
මොරටුව විශ්වවිද්‍යාලය (MRT)	2357	7
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය (RUSL)	2302	6
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය (WUSL)	1917	5
ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය (UWU)	1689	5
දෘශ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්වවිද්‍යාලය (VPA)	794	2
ගම්පහ වික්‍රමාරච්චි විශ්වවිද්‍යාලය (GWU)	666	2
එකතුව	35655	100



2023 (2021/22) කණ්ඩායමේ ප්‍රථම උපාධි පාඨමාලා සඳහා නවකයන් බඳවා ගැනීම

පීඨය	ඇතුළත් වීමේ දිනය	බඳවා ගැනීමට එකඟ වූ ප්‍රමාණය	ඇතුළත් කළ සිසුන් සංඛ්‍යාව		
			දේශීය	විදේශීය	එකතුව
කෘෂි විද්‍යා පීඨය	ජූනි 8	355	256	-	256
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	ජූලි 4	238	181	-	181
ශාස්ත්‍ර පීඨය	මැයි 29	1002	1130	-	1130
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	මැයි 4	123	119	-	119
ඉංජිනේරු පීඨය	මාර්තු 12	455	446	-	446
කළමනාකරණ පීඨය	ජූනි 2	190	185	-	185
වෛද්‍ය පීඨය	ජනවාරි 30	235	237	08	246
විද්‍යා පීඨය	ජූනි 9	574	482	-	482
පශු වෛද්‍ය විද්‍යා පීඨය	ජූලි 11	130	87	-	87
එකතුව		3302	3123	08	3131




සිසුන් බඳවා ගැනීම

ඇතුළත්වීමේ වර්ෂය අනුව උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම සිසුන් බඳවා ගැනීම

පීඨය	2021/2022	2020/2021	2019/2020	2018/2019	2017/2018	2016/2017	එකතුව	%
කෘෂි විද්‍යා පීඨය	313	325	307	280	240	0	1465	10
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	198	234	185	181	45	0	843	6
ශාස්ත්‍ර පීඨය	1170	1184	1235	968	0	0	4557	32
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	118	117	116	77	74	0	502	4
ඉංජිනේරු පීඨය	447	455	480	414	0	0	1796	13
කළමනාකරණ පීඨය	184	165	170	162	0	0	681	5
වෛද්‍ය පීඨය	247	253	244	210	205	213	1372	10
විද්‍යා පීඨය	508	547	555	500	403	0	2513	18
පශු වෛද්‍ය විද්‍යා පීඨය	107	105	80	89	71	0	452	3
එකතුව	3292	3385	3372	2881	1038	213	14181	100

ස්ත්‍රී පුරුෂ භාවය අනුව උපාධි අපේක්ෂකයන් බඳවා ගැනීම

පීඨය	උපාධි අපේක්ෂක සිසුන්		
	ස්ත්‍රී	පුරුෂ	එකතුව
කෘෂි විද්‍යා පීඨය	485	980	1465
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	240	603	843
ශාස්ත්‍ර පීඨය	723	3834	4557
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	148	354	502
ඉංජිනේරු පීඨය	1317	479	1796
කළමනාකරණ පීඨය	230	451	681
වෛද්‍ය පීඨය	580	792	1372
විද්‍යා පීඨය	1148	1365	2513
පශු වෛද්‍ය විද්‍යා පීඨය	123	329	452
එකතුව	**4994**	**9187**	**14181**



විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය සඳහා බඳවාගෙන ඇති උපාධි අපේක්ෂකයන් සංඛ්‍යාව වගුවේ දැක්වෙයි.

දෙසැම්බර් 31 වන විට, උපාධි අපේක්ෂකයන් 14181ක් බඳවාගෙන ඇති අතර ඉන් 9187 (64.67%)ක් ශිෂ්‍යාවන් වන අතර සහ 4994 (35.22%)ක් ශිෂ්‍යයන් වේ. වැඩිම සිසුන් සංඛ්‍යාවක් ශාස්ත්‍ර පීඨයේ සිටින අතර එම ගණන 4557ක් වේ. අනතුරු ව පිළිවෙළින් විද්‍යා පීඨයේ සිසුන් 2513ක් සහ ඉංජිනේරු පීඨයේ සිසුන් 1796ක් ඇත. පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයේ අවම සිසුන් සංඛ්‍යාවක් සිටින අතර එම ගණන 452කි. ශිෂ්‍යාවන්ගේ වැඩි ම ප්‍රතිශතය (84.13%) ශාස්ත්‍ර පීඨයේ වන අතර ශිෂ්‍යාවන්ගේ අඩුම ප්‍රතිශතය ඉංජිනේරු පීඨයේ (26.67%) වේ. එමෙන් ම පිරිමි ශිෂ්‍ය ප්‍රතිශතය වැඩි ම ඉංජිනේරු පීඨයේ (73.33%) වන අතර සහ අඩු ම ප්‍රතිශතය ශාස්ත්‍ර පීඨයේ (15.87%) වේ.

විදේශීය සිසුන් බඳවා ගැනීම - උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන

පීඨය	පාඨමාලාව	වි.වි.ප්‍ර.කො බඳවා ගැනීමේ වර්ෂය						එකතුව
		2021/22	2020/21	2019/20	2018/19	2017/18	2016/17	
වෛද්‍ය	MBBS	8	15	9	5	0	8	**45**
එකතුව		**8**	**15**	**9**	**5**	**0**	**8**	**45**

බාහිර සිසුන් බඳවා ගැනීම - දූරස්ථ හා අබණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය

වැඩසටහන	2023			2022			2021			2020		
	පි	ගැ	එ	පි	ගැ	එ	පි	ගැ	එ	පි	ගැ	එ
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) - පැරණි යෝජනා ක්‍රමය	340	1000	1340	526	1086	1612	600	1335	1935	600	1335	1935
ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) - නව යෝජනා ක්‍රමය	1057	4069	5126	1116	4346	5462	1116	1024	1276	864	3322	4186
ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය	545	635	1180	437	508	945	450	532	982	534	481	1015
කළමනාකරණය සහ සංවර්ධනය පිළිබඳ ඩිප්ලෝමාව	-	-	-	-	-	-	-	-	-	-	-	-
එකතුව	**1942**	**5704**	**7646**	**2079**	**5940**	**8019**	**2166**	**2891**	**4193**	**1998**	**5138**	**7136**

පි- පිරිමි ගැ- ගැහැණු එ- එකතුව

පශ්චාත් උපාධි සිසුන් බඳවා ගැනීම

පීඨය	එකතුව						%
	නවකයන්			සිසුන් බඳවා ගැනීම			
	පි	ගැ	එ	පි	ගැ	එ	
සම සෞඛ්‍ය විද්‍යා	4	17	21	17	47	64	0.6
දන්ත වෛද්‍ය විද්‍යා	0	0	0	2	5	7	0.1
ඉංජිනේරු	63	29	92	1605	498	2103	20.7
කළමනාකරණ	10	23	33	49	100	149	1.5
වෛද්‍ය	2	2	4	12	30	42	0.4
පශු වෛද්‍ය විද්‍යා	1	6	7	52	133	185	1.8
කෘ.ප.උ. ආයතනය	77	181	258	720	1459	2179	21.5
මා.ශා. හා ස.වි.ප.උ. ආයතනය	193	349	542	990	2361	3351	33.0
වි.ප.උ. ආයතනය	77	141	218	874	1128	2002	19.7
වෛ.ප.උ. ආයතනය	27	31	58	27	31	58	0.6
එකතුව	**454**	**779**	**1233**	**4348**	**5792**	**10140**	**100**

පි- පිරිමි ගැ- ගැහැණු එ- එකතුව

උපාධි ප්‍රධානෝත්සවය - 2022

පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි පීඨ නවයක සහ පශ්චාත් උපාධි ආයතන තුනක උපාධිධාරීන් 3873 දෙනෙකුට උපාධි පිරිනමමින් සිය 84 වැනි උපාධි ප්‍රදානෝත්සවය 2023 මැයි මස 24 සහ 25 යන දිනයන්හි දී ඉතා අභිමානවත් ලෙස පැවැත්වීය. විශ්වවිද්‍යාලයේ කුලපති මහාචාර්ය ජී.එච්. පීරිස් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම උත්සවයේ දී ප්‍රථම උපාධි 2724ක් සහ පශ්චාත් උපාධි 1149ක් ප්‍රදානය කෙරිණි.

සැසි තුනකට බෙදා පවත්වන ලද මෙම උපාධි ප්‍රදානෝත්සවයේ දී විවිධ පීඨ සහ ආයතනවල උපාධිධාරීන් හට උපාධි පිරිනමනු ලැබීය. මෙහි දී මහාචාර්ය පී.සී.ඒ. රත්නතුංග සහ මහාචාර්ය සී.බී. දිසානායක යන කීර්තිමත් විද්වත්තු වෛද්‍ය විද්‍යාව සහ විද්‍යාව යන ක්ෂේත්‍රයන් සඳහා දක්වන ලද දායකත්වය වෙනුවෙන් ගෞරව ආචාර්ය උපාධියෙන් පිදුම් ලැබූහ. ජාත්‍යන්තර සබඳතා සම්බන්ධයෙන් කළ සේවය වෙනුවෙන් ආචාර්ය පාලිත ටී.බී. කොහොන මහතා සම්මානයට පාත්‍ර විය.

නියෝජ්‍ය උපකුලපති මහාචාර්ය ටෙරන්ස් මධුජීත් මහතාගේ ප්‍රධානත්වයෙන් උපාධි ප්‍රදානෝත්සව සංවිධායක කමිටුව විසින් සංවිධානය කරන ලද මෙම උත්සවය මගින් විශ්වවිද්‍යාලයේ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම පිළිබිඹු කෙරිණි. ගෝලීය ප්‍රේක්ෂකයින් සඳහා සජීවී ව විකාශය කෙරුණු මෙම වැඩසටහනේ දී ශාස්ත්‍රීය ජයග්‍රහණ සහ සුවිශේෂී දායකත්වයන් අගයනු ලැබීය.

උපාධි අපේක්ෂක ශිෂ්‍යයින්ගේ කාර්ය සාධනය

පීඨය	2023	2022	2021	2020	2019
කෘෂිවිද්‍යා පීඨය	305	252	186	212	197
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	170	167	156	148	128
ශාස්ත්‍ර පීඨය	900	903	836	967	932
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	72	72	0	87	86
ඉංජිනේරු පීඨය	428	-	367	380	380
කළමනාකරණ පීඨය	159	159	152	119	148
වෛද්‍ය පීඨය	209	206	213	202	205
විද්‍යා පීඨය	417	371	340	418	421
පශු වෛද්‍ය විද්‍යා පීඨය	64	64	0	64	54
එකතුව	**2724**	**2194**	**2250**	**2597**	**2551**

පශ්චාත් උපාධි සිසුන්ගේ කාර්ය සාධනය

පීඨය/ආයතනය	2023	2022	2021	2020	2019
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	1	1	-	-	-
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	1	-	-	32	-
ඉංජිනේරු පීඨය	126	71	40	112	57
කළමනාකරණ පීඨය	20	16	-	-	-
වෛද්‍ය පීඨය	14	10	5	8	9
පශු වෛද්‍ය විද්‍යා පීඨය	39	58	7	5	28
කෘෂිවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය	198	117	80	151	305
විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	314	228	192	270	263
මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය	433	288	235	199	459
එකතුව	**1148**	**789**	**559**	**777**	**1121**

බාහිර සිසුන්ගේ කාර්ය සාධනය

වැඩසටහන	2023	2022	2021	2020	2019
ශාස්ත්‍රවේදී (පැරණි නිර්දේශය)	272	161	663	275	432
ශාස්ත්‍රවේදී (නව විෂය නිර්දේශය)	339	-	-	-	-
ව්‍යාපාර පරිපාලන උපාධිය (මාර්ගගත)	20	37	-	31	28
එකතුව	**631**	**198**	**663**	**306**	**460**

2023 දී වෘත්තීය මාර්ගෝපදේශනය: සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා සිසුන් සවිබල ගැන්වීම

2001 වර්ෂයේ ස්ථාපිත කරන ලද විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය සිසුන්ට තම ශක්තීන් හඳුනා ගැනීමට, වෘත්තීය අවස්ථා ගවේෂණය කිරීමට සහ රැකියා නිපුණතා වර්ධනය කිරීමට උපකාර කිරීම ඔස්සේ ඔවුන් සවිබල ගැන්වීමට කටයුතු කරයි. සෑම සිසුවෙකුට ම සිය සම්පූර්ණ හැකියාවන් කරා ළඟා වීමට සහ සමාජයට

අර්ථවත් අයුරින් දායක වීමට හැකියාව ඇති කිරීමේ දැක්මක් පෙරදැරිව, වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය විසින් සේවා සහ ක්‍රියාකාරකම් මාලාවක් පවත්වාගෙන යනු ලබයි.

පාඨමාලා සහ වැඩමුළු ඔස්සේ සවිබල ගැන්වීම

- වෘත්තීය සංවර්ධනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව: ස්වයං තක්සේරුව, වෘත්තීය ගවේෂණය සහ පෞද්ගලික සන්නාමකරණය වැනි තීරණාත්මක කුසලතාවලින් පළමු සහ දෙවන වසර සිසුන් සන්නද්ධ කිරීම.
- තොරතුරු තාක්ෂණය පිළිබඳ කෙටි පාඨමාලාව: උපාධි අපේක්ෂකයන්, පශ්චාත් උපාධිධාරීන් සහ කාර්ය මණ්ඩලය සඳහා අධ්‍යයන සහ වෘත්තීය ඉල්ලීම්වලට අදාළ ප්‍රායෝගික Microsoft Office මෙවලම් පිළිබඳ උසස් මිටමේ පුහුණු ලබා දීම.
- සකස් කළ පුහුණු සහ වැඩමුළු: විශ්වවිද්‍යාලයට අනුගතවීම, මෘදු කුසලතා සංවර්ධනය, වෘත්තීය ගවේෂණය, උසස් අධ්‍යාපනය හැදෑරීම සහ මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුම්වත්භාවය වැනි විවිධ මාතෘකා ආවරණය කිරීම.

වෘත්තීය පුහුණු කිරීම ඔස්සේ පුද්ගලාරෝපිත සහාය ලබාදීම

- මනෝමිතික පරීක්ෂණ සහ වෘත්තීය සැලසුම්: සිසුන්ගේ ශක්තීන් හඳුනා ගැනීමට සහ වෘත්තීය අභිලාෂ අනුව සිය කුසලතා පෙළගැස්වීමට උපකාර කිරීම පිණිස ඇගයීම් සහ සකස් කළ සැලසුම් මගින් පුද්ගලාරෝපිත මඟ පෙන්වීමක් ලබා දීම.
- ජීව දත්ත සමාලොචන සහ ආදර්ශ සම්මුඛ පරීක්ෂණ: විශේෂඥ ප්‍රතිපෝෂණ සහ පුහුණු අවස්ථා මගින් සාර්ථක රැකියා අයදුම් අවස්ථා සහ සම්මුඛ පරීක්ෂණ සඳහා සිසුන් සූදානම් කිරීම.
- ඉලක්කගත ඉගෙනුම් මාර්ගෝපදේශය: සිසුන්ට සිය අධ්‍යයන වරණයන් සිය වෘත්තීය ඉලක්ක සමඟ සම්බන්ධ කිරීමට උපකාර කිරීම.

ව්‍යවසායකත්ව අභිරුචිය වර්ධනය කිරීම

ව්‍යවසායකත්ව සහ උපදේශන වැඩසටහන්: අභිලාෂකාමී ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර ආරම්භ කිරීමට සහ එම ව්‍යාපාර දියුණුවට පත්වීමට උපකාර කිරීම සඳහා සම්පත්, මගපෙන්වීම සහ උපදේශනය ලබා දීම.

සිසුන් අවස්ථා සමඟ සම්බන්ධ කිරීම

- We Lead Career Fiesta: කර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සමඟ අන්තර් ක්‍රියා සඳහා පහසුකම් සැලසීම සහ රැකියා/සීමාවාසික හැකියාවන් ගවේෂණය කිරීමට අවකාශ සලසමින් "We Lead Career Fiesta" නමින් විශ්වවිද්‍යාලයේ විශාලත ම වෘත්තීය ප්‍රදර්ශනය සංවිධානය කිරීම.

- ක්‍රියාකාරී ශිෂ්‍ය සහායක වැඩසටහන (WSAP): විශ්වවිද්‍යාලය තුළ මූල්‍ය ආධාර සහ අගනා සේවා පළපුරුද්දක් ලබා දීම යන කාරණා ඒකාබද්ධ වූ කෙටි කාලීන වැටුප් සහිත සේවා ස්ථානගත කිරීම් පිරිනැමීම.

ප්‍රජාව සමඟ සම්බන්ධ වීම

විශ්වවිද්‍යාලය විසින් ප්‍රජා වැඩසටහන් පැවැත්වීම: සමාජ වගකීම් සහ නායකත්ව කුසලතා පෝෂණය කරමින් ප්‍රජා සහභාගීත්ව ක්‍රියාකාරකම් ඔස්සේ සමාජ යහපැවැත්ම සඳහා දායක වීමට සිසුන් සවිබල ගැන්වීම.

1.4.5 කාර්ය මණ්ඩල හඳුනා ගැනීම සහ මානව සම්පත් සංවර්ධනය

1.4.5.1 කාර්ය මණ්ඩලය පිළිබඳ සංඛ්‍යාලේඛන


අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන කාර්ය මණ්ඩලය

කාර්ය මණ්ඩල කාණ්ඩය	වැටුප් පරිමාව	අනුමත කාර්ය මණ්ඩලය	පවත්නා කාර්ය මණ්ඩලය					
			ස්ථිර			තාවකාලික		
			පුරුෂ	ස්ත්‍රී	එකතුව	පුරුෂ	ස්ත්‍රී	එකතුව
අධ්‍යයන කාර්ය මණ්ඩලය	U-AC 3 to U-AC 5	1144	439	405	844	2	-	2
	U-AC 1 to U-AC 2	468	-	-	-	136	331	467
පුස්තකාල කාර්ය මණ්ඩලය	U-AC 5	1	1	-	1	-	-	-
	U-AC 4	1	-	2	2	-	-	-
	U-AC 3	17	6	7	13	-	-	-
පරිපාලන කාර්ය මණ්ඩලය	U-EX 3	1	1		1	-	-	-
	U-EX 2	15	3	11	14	-	-	-
	U-EX 1	22	2	13	15	-	-	-
මූල්‍ය කාර්ය මණ්ඩලය	U-EX 3	2	1		1	-	-	-
	U-EX 2	15	8	4	12	-	-	-
	U-EX 1	14	1	6	7	-	-	-
අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	U-EX 3	-	-	-	-	-	-	-
	U-EX 2	9	5	2	7	-	-	-
	U-EX 1	4	7	-	7	-	-	1
වෛද්‍ය නිලධාරීන්	U-MO 2	1	-	-	-	-	-	-
	U-MO 1	5	1	1	2	-	5	7
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	U-AS 2	32	14	28	42	-	-	-
	U-AS 1	56	5	5	10	-	-	-
තාක්ෂණික කාර්ය මණ්ඩලය	U-EX 2	-	-	-	-	-	-	-
	U-EX 1	-	7	7	14	-	-	-
	U-MN 4	2	34	44	78	-	-	-
	U-MN 3	-	8	-	8	-	-	-
	U-MN 2	7	3	-	3	-	-	-
	U-MN 1	-	2	-	2	-	-	-
ලිපිකරු සහ අනුබද්ධ කාර්ය මණ්ඩලය	U-MT 1	461	168	102	270	-	8	8
	U-MN 4	5	34	67	101	-	-	-
	U-MN 3	34	18	8	26	-	-	-
	U-MN 2	13	6	2	8	-	-	-
	U-MN 1	515	129	262	391	-	-	-
ප්‍රාථමික කාර්ය මණ්ඩලය	U-PL 3	242	306	17	323	-	-	-
	U-PL 2	244	128	16	144	-	-	-
	U-PL 1	962	592	86	678	-	-	-
වෙනත්		1	-	-	-	-	-	-
එකතුව		**4293**	**1929**	**1095**	**3024**	**138**	**331**	**469**

සේවක වර්ගීකරණය

සේවා කාණ්ඩය	වැටුප් කේතය	ස්ථිර		එකතුව
		පුරුෂ	ස්ත්‍රී	
ජ්‍යෙෂ්ඨ මට්ටම				
මහාචාර්යවරුන්/ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්/ පුස්තකාලයාධිපති	U-AC 5	169	97	265
සහකාර මහාචාර්යවරුන්/ නියෝජ්‍ය පුස්තකාලයාධිපති	U-AC 4	4	3	7
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති/ සහකාර පුස්තකාලයාධිපති	U-AC 3	273	314	587
ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරීන්	U-EX 3	2	-	2
මධ්‍යම මට්ටමේ විධායක නිලධාරීන්	U-EX 2(a)	16	17	33
මධ්‍යම මට්ටමේ විධායක නිලධාරීන්	U-EX 2			
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U-MO 2	-	-	-
වෛද්‍ය නිලධාරීන්	U-MO 1	1	1	2
තෘතීයික මට්ටම				
අධ්‍යයන සහාය - 1 කාණ්ඩය	U-AS 2	14	28	42
කනිෂ්ඨ විධායක/ කළමනාකරුවන්	U-EX 1	17	26	43
අධ්‍යයන සහාය - 2 කාණ්ඩය	U-AS 1	5	5	10
ද්විතියික මට්ටම				
මාණ්ඩලික සහකාර/අධීක්ෂණිය සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U-MN 4	68	111	179
ආශ්‍රිත නිලධාරීන් - 1 කාණ්ඩය	U-MN 3	26	8	34
ආශ්‍රිත නිලධාරීන් - 2 කාණ්ඩය	U-MN 2	9	2	11
කළමනාකරණ සහකාර - තාක්ෂණික	U-MT 1	168	102	270
කළමනාකරණ සහකාර-තාක්ෂණික නොවන	U-MN 1	131	262	393
ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - පූර්ණ	PL-3	306	17	323
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	PL-2	128	16	144
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	PL-1	592	86	678
එකතුව		**1929**	**1095**	**3024**

විවිධ කාණ්ඩ නවයක් යටතේ විශ්වවිද්‍යාලයට කාර්ය මණ්ඩල සාමාජිකයන් 3024ක් සිටින අතර එයින් මුළු කාර්ය මණ්ඩලයෙන් 38%කින් සමන්විත විශාලතම කාණ්ඩය වන්නේ ප්‍රාථමික කාර්ය මණ්ඩලයයි. තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ ලිපිකරු සහ අනුබද්ධ කාර්ය මණ්ඩලය (29%) ඊළඟ විශාලතම කාණ්ඩය වේ. මෙම ප්‍රමාණ භාවිත කර විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංයුතිය පිළිබඳ දළ විශ්ලේෂණයක් සැපයිය හැකිය.



අනුමත සේවක සංඛ්‍යාව සහ වර්තමාන අධ්‍යයන කාර්ය මණ්ඩලය (ආචාර්ය මණ්ඩලය පමණි).

කාර්ය මණ්ඩලය	වැටුප් පරිමාණය	අනුමත සේවක සංඛ්‍යාව	ස්ථිර			තාවකාලික		
			පිරිමි	ගැහැණු	එකතුව	පිරිමි	ගැහැණු	එකතුව
මහාචාර්ය ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5 (I)	76	13	5	18	-	-	-
ප්‍රධාන මහාචාර්ය	U-AC 5 (II)		13	10	23	-	-	-
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	U-AC 5 (I)		28	9	37	-	-	-
මහාචාර්ය	U-AC 5 (II)		114	73	187	-	-	-
සහාය මහාචාර්ය	U-AC 4		4	1	5	-	-	-
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය	U-AC 3(I)	1060	52	44	96	-	-	-
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	U-AC 3(II)		146	125	271	2	-	2
කථිකාචාර්ය	U-AC 3(III)		10	19	29	-	-	-
කථිකාචාර්ය (ආධුනික)	U-AC 3(IV)		59	119	178	-	-	-
ලේඛකාධිකාරී (වෛද්‍ය)	U-AC 3	8	-	-	-	-	-	-
විකිරණ ආරක්ෂණ නිලධාරී	U-AC 3(IV)		-	-	-	-	-	-
තාවකාලික කථිකාචාර්ය/තාවකාලික සහකාර කථිකාචාර්ය	U-AC 2 (fixed)	468	-	-	-	37	88	125
තාවකාලික පර්යේෂණ සහකාර	U-AC 2/ U-AC 1 (fix		-	-	-	1	11	12
තාවකාලික නිදර්ශක	U-AC 1 (fixed)		-	-	-	51	148	199
තාවකාලික උපදේශක	U-AC 1 (fixed)		-	-	-	45	84	129
තාවකාලික නිබන්ධක	U-AC 1 (fixed)		-	-	-	-	-	-
එකතුව		**1612**	**439**	**405**	**844***	**136**	**331**	**467**

* විශ්වවිද්‍යාලය සතුව අධ්‍යයන කාර්ය මණ්ඩලය හා අධ්‍යයන නොවන කාර්ය මණ්ඩල ඇතුළු ව ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 860ක් ඇත. විශ්වවිද්‍යාලයේ ඉගෙනුම් කටයුතුවල නිරත නොවන කාර්ය මණ්ඩලය අතර පුස්තකාලය කාර්ය මණ්ඩල සාමාජිකයන් 16 දෙනෙකු සිටින අතර, ඔවුහු අධ්‍යයන ප්‍රජාවට සහාය වීම සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරති.

අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය

පීඨය/ අධ්‍යයනාංශය	ස්ථිර කාර්ය මණ්ඩලය		
	ස්ත්‍රී	පුරුෂ	එකතුව
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	1	-	**1**
ශාස්ත්‍ර පීඨය	1	19	**20**
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	-	2	**2**
ඉංජිනේරු පීඨය	-	3	**3**
වෛද්‍ය පීඨය	-	1	**1**
විද්‍යා පීඨය	2	-	**2**
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය (CDCE)	-	1	**1**
වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය	1	1	**2**
පරිගණක මධ්‍යස්ථානය - ඉංජිනේරු	2	1	**3**
පුස්තකාලය	3	-	**3**
ශාරීරික අධ්‍යාපන අංශය	3	2	**5**
මූල්‍ය පරිපාලන අංශය	1	1	**2**
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය	5	2	**7**
එකතුව	19	33	**52**

රැකියා ස්ථානය අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය

පීඨය/අධ්‍යයනාංශය/ මධ්‍යස්ථානය	පරිපාලන කාර්යය මණ්ඩලය	මූල්‍ය කාර්ය මණ්ඩලය	අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	තාක්ෂණික කාර්ය මණ්ඩලය	ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි කාර්ය මණ්ඩලය	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	එකතුව
කෘෂි විද්‍යා පීඨය	1	1	-	35	21	53	111
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	1	1	-	20	17	26	65
ශාස්ත්‍ර පීඨය	2	1	-	12	37	32	84
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	1	1	-	73	28	48	151

රැකියා ස්ථානය අනුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය වගුව හා සම්බන්ධ වේ.

පීඨය/අධ්‍යයනාංශය/ මධ්‍යස්ථානය	පරිපාලන කාර්යය මණ්ඩලය	මූල්‍ය කාර්ය මණ්ඩලය	අනෙකුත් විධායක කාර්ය මණ්ඩලය	තාක්ෂණික කාර්ය මණ්ඩලය	ලිපිකරු සහ අනුබද්ධ ශ්‍රේණි කාර්ය මණ්ඩලය	ප්‍රාථමික කාර්ය මණ්ඩලය	එකතුව
ඉංජිනේරු පීඨය	1	1	2	48	23	112	187
කළමනාකරණ පීඨය	1	1	-	-	12	9	23
වෛද්‍ය පීඨය	1	1	-	75	42	78	197
විද්‍යා පීඨය	1	1	-	38	22	58	120
පශු වෛද්‍ය විද්‍යා පීඨය	-	1	1	24	17	32	75
තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය	-	-	-	-	1	-	1
ව්‍යාත්තීය මාර්ගෝපදේශ ඒකකය	-	-	-	1	2	2	5
පුස්තකාලය	2	-	-	3	47	23	75
ශාරීරික අධ්‍යාපන අංශය	-	-	1	-	3	24	28
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානය	1	1	-		21	5	28
සනාතන මන්දිරය	15	-	4	1	129	122	271
සෞඛ්‍ය මධ්‍යස්ථානය	-	-	2	15	2	38	57
ආරක්ෂක සේවා	-	-	1	-	12	82	95
නඩත්තු අංශය	-	-	2	14	7	179	202
උද්‍යාන අලංකරණ අංශය	1	-	1	4	1	81	88
ප්‍රවාහන අංශය	-	-	-	-	-	67	67
සාමාන්‍ය පරිපාලනය	-	-	-	1	15	9	27
දොඩංගොල්ල ව්‍යාප්ති මධ්‍යස්ථානය	-	-	1	3	2	30	36
මහඉලුප්පල්ලම ඉගැන්වීම් ඒකකය	-	-	-	2	1	9	12
පශු සම්පත් ක්ෂේත්‍රය S-උඩපේරාදෙණිය	-	-	1	3	-	17	21
මූල්‍ය පරිපාලනය	-	10	-	3	64	9	86
එකතුව	**30**	**20**	**14**	**375**	**526**	**1148**	**2112**

කාර්ය මණ්ඩල සංවර්ධනය

පසුගිය වසරේ දී විශ්වවිද්‍යාලය සිය කාර්ය මණ්ඩල ධාරිතාව ඉහළ නැංවීමෙහිලා කැපී පෙනෙන දියුණුවක් ලබා ඇත. එහි ස්ථාපිත ශ්‍රම බලකාය සමඟ ඒකාබද්ධ ව විශ්වවිද්‍යාලය සිය මෙහෙයුම් කාර්යරාමුව ශක්තිමත් කිරීම සඳහා උපායමාර්ගික ව කාර්ය මණ්ඩල සාමාජිකයන් 254 දෙනෙකු පත් කර ඇත. දැඩි ජාතික තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් ඔස්සේ සිදු කරන ලද මෙම පත්වීම් පෞද්ගලික අංශයෙන් ලබාගෙන ඇත. මෙම පත්වීම් අතර සනීපාරක්ෂක කම්කරුවන් 124ක්, පෞද්ගලික ආරක්ෂක නිලධාරීන් 120ක් සහ නඩත්තු අංශය ශක්තිමත් කිරීම සඳහා නම් පත්කරන ලද ගලි කම්කරුවන් 10 දෙනෙකු වේ. ප්‍රදේශීය ප්‍රජාව සමඟ ක්‍රියාකාරී ව සම්බන්ධ වෙමින් මෙම පත්වීම් ඔස්සේ රැකියා මාර්ග පිරිනැමීමට හැකිවීම පිළිබඳ විශ්වවිද්‍යාලය ආඩම්බරයට පත්වේ.

වැඩිදියුණු කළ ස්වයං තිරසාර භාවය සඳහා මානව සම්පත් වර්ධනය කිරීම

විශ්වවිද්‍යාල සංයුක්ත කළමනාකරණ අංශය (CMD) පීඨ, අංශ සහ මධ්‍යස්ථාන සඳහා අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් කාර්ය මණ්ඩල සාමාජිකයන් 67 දෙනෙකු පත් කරමින් ඉතා කාර්යශීලී පියවර ගෙන ඇත. මෙම උපායමාර්ගික ක්‍රියාමාර්ගය විශ්වවිද්‍යාලයේ මූල්‍ය හා සම්බන්ධ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා පමණක් නොව අතිරේක රැකියා අවස්ථා උත්පාදනය කිරීමට ද උපකාරී වෙමින් පුළුල් සමාජ ආර්ථික පරිසර පද්ධතියට දායකත්වය සපයයි.

කාර්ය මණ්ඩල කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	2023		2022		2021	
		ප්‍රමාණය	%	ප්‍රමාණය	%	ප්‍රමාණය	%
අධ්‍යයන කාර්ය මණ්ඩලය	1163	860	73.9	900	77.3	908	78.0
අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය	88	52	59.1	58	65.9	60	68.2
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	2574	2112	82.1	2209	85.8	2249	87.3
එකතුව	**3825**	**3024**	**79.0**	**3167**	**82.7**	**3217**	**84.0**

මෙම වගුවේ සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් 1163ක් ලැයිස්තුගත කර ඇති අතර ඉන් පීඨවලට අනුයුක්ත සේවක සංඛ්‍යාව 1142ක්, උපකුලපති කාර්යාලයේ 2ක් සහ පුස්තකාලය කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව 19ක් වේ.

1.4.5.2 විශිෂ්ටත්වය ඇගයීම සහ සම්මාන පිරිනැමීම

- **කාර්ය මණ්ඩල කාර්ය සාධන සම්මාන**

පූර්වයෙන් තීරණය කරන ලද නිර්ණායක මත පදනම් ව අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ 27 දෙනෙක් 2023 ජනවාරි 1 වන දින සම්මාන ලබා ගත්හ. මෙම සම්මාන මගින් තාක්ෂණික සහ අනුබද්ධ, කළමනාකරණ සහකාර සහ අනුබද්ධ සහ ප්‍රාථමික ශ්‍රේණි යන කාණ්ඩ තුළ ඉහළ ම කාර්ය සාධනයක් පෙන්නුම් කරන්නන් පිළිගැනීමට ලක් විය. සෑම අංශයක ම හොඳ ම කාර්ය සාධනයක් පෙන්නුම් කළ සේවකයාට සහතික පත්‍රයක් සමඟ මුදල් ත්‍යාගයක් හිමි වූ අතර අනෙක් අයට විශිෂ්ටතා සහතික ප්‍රදානය කෙරිණි. මෙම වැඩසටහන මගින් සුවිශේෂී පුද්ගල දායකත්වයන් ඇගයුමට ලක් කෙරෙන අතර, අඛණ්ඩ ව කැපවීමෙන් කටයුතු කිරීම සඳහා ඔවුන් දිරිමත් කෙරේ.

- **දීර්ඝකාලීන සේවා ඇගයුම් සම්මාන උළෙල**

2023 ජූලි 01 වැනි දින විශ්වවිද්‍යාලීය විවෘත දිනයට සමගාමී ව සේවක සේවිකාවන් 101 දෙනෙකුගේ දීර්ඝකාලීන සේවය අගයමින් ඊට උපහාර පිදීමේ උත්සවයක් පැවැත්විණි. විශ්වවිද්‍යාලය මගින් සේවාවන් සඳහා ඔවුන්ගේ කැපවීම සහ පක්ෂපාතිත්වය පහත පරිදි හඳුනාගෙන ඇත.

- වසර 40ක කාලයක් පුරා සේවය ලබා දීම වෙනුවෙන් සේවකයන් 5 දෙනෙකු ඇගයීමට ලක් විය
- වසර 35ක සේවා කාලයක් සපිරීම වෙනුවෙන් සේවකයන් 36 දෙනෙකු ඇගයීමට ලක් විය.
- සේවකයන් 24 දෙනෙකු වසර 30ක සේවා කාලයක් සපිරීම වෙනුවෙන් සම්මානයට පාත්‍ර විය.
- වසර 25ක සේවා කාලයක් සේවය ලබාදීම වෙනුවෙන් සේවකයන් 36 දෙනෙකු ඇගයීමට ලක් විය.

මෙම උත්සවය මගින් විශ්වවිද්‍යාලයේ ගමන් මඟ හැඩගස්වා හා සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා දිගුකාලීන ව සේවා නියුක්තිකයන් විසින් දක්වන ලද අගනා දායකත්වය ඇගයීම සඳහා විශ්වවිද්‍යාලය විසින් ගනු ලැබූ අනගි පියවර සනිටුහන් කරයි.

මීට අමතර ව විශ්වවිද්‍යාලය එහි පීඨ සාමාජිකයන්ගේ ජයග්‍රහණ සාඩම්බරයෙන් සමරන්නට විය.

- **වර්ණ ප්‍රදාන උළෙල - 2022**

අන්තර් විශ්වවිද්‍යාල, ජාතික සහ ජාත්‍යන්තර තරඟවල දී විශිෂ්ට දස්කම් දක්වන දක්ෂයන් ඇගයීම පිණිස 2022 වර්ෂය සඳහා වර්ණ ප්‍රදානෝත්සවය 2023 ජුනි 17 වන දින පවත්වන ලදි. තරඟ ඉසව්වල දී දක්වන ලද සුවිශේෂී දස්කම් අගයවනු වස් මෙම උත්සවයේ දී ක්‍රීඩකයන් 148 දෙනෙකු සහ ක්‍රීඩිකාවන් 58 දෙනෙකු සඳහා උපහාර පිරිනැමුණු අතර, ක්‍රීඩකයන් 118 දෙනෙකු සහ ක්‍රීඩිකාවන් 62 දෙනෙකු විසින් අර්ධ වර්ණ හිමිකර ගන්නා ලදි.

- **මහාචාර්ය එම්.ඩී ළමාවංශ මහතා FRCS ගෞරව සම්මානයෙන් පිදුම් ලැබීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එම්.ඩී ළමාවංශ මහතා ශල්‍යකර්ම සහ වෛද්‍ය අධ්‍යාපනය වෙනුවෙන් දක්වන ලද සුවිශේෂී දායකත්වය වෙනුවෙන් ග්ලාස්ගෝහි රාජකීය වෛද්‍යවරුන්ගේ සහ ශල්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ FRCS ගෞරව සම්මානයකින් පිදුම් ලැබීය. මෙම ගෞරව සම්මානය 2023 සැප්තැම්බර් 5 වන දින එක්සත් රාජධානියේ ස්කොට්ලන්තයේ ග්ලාස්ගෝ විශ්වවිද්‍යාලයේ දී ඔහු වෙත පිරිනමන ලදි.

- **උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ විශිෂ්ටතා සම්මාන**

ගෞරවනීය පීඨ සාමාජිකයන් වන මහාචාර්ය දීප්ති යකන්දාවල සහ ආචාර්ය නදීෂ් එම්. අදස්සූරිය පිළිවෙළින් ජීවිත විද්‍යා සහ ඉංජිනේරු, ගෘහ නිර්මාණ ශිල්පය සහ තාක්ෂණ යන ක්ෂේත්‍රවල දක්වන ලද විශිෂ්ට දායකත්වය වෙනුවෙන් උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ විශිෂ්ටතා සම්මානයෙන් පිදුම් ලැබූහ. ශ්‍රී ලංකා රාජ්‍ය විශ්වවිද්‍යාල පද්ධතිය මත ඔවුන්ගේ සුවිශේෂී බලපෑම රාජ්‍ය විශ්වවිද්‍යාල සහ ආයතනවල

උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුව විසින් පිරිනමනු ලබන මෙම සම්මාන මගින් පිළිගැනීමට ලක් කර ඇත.

- **විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන**

2019 සහ 2020 ප්‍රකාශන වර්ෂයේ සිදුකරන ලද විද්‍යාත්මක පර්යේෂණ සඳහා විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් කිහිප දෙනෙකු ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබීය. ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව විසින් 2023 නොවැම්බර් 21 වන දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පරිශ්‍රයෙහි සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ ප්‍රදර්ශන මධ්‍යස්ථානයේ පැවති උත්සවයක දී ඔවුන්ගේ මෙම දායකත්වය ඇගයුමට ලක් කරන ලදි.

- **මහාචාර්ය බුද්ධි මාරඹේ මහතාට යාවජීව ජයග්‍රහණ සම්මානය පිරිනැමීම**

කෘෂි විද්‍යා පීඨයේ බෝග විද්‍යා අංශයේ මහාචාර්ය බුද්ධි මාරඹේ මහතා "වල් පැළෑටි" විද්‍යා ක්ෂේත්‍රයට කළ සුවිශේෂී දායකත්වය අගයනු වස් ජාත්‍යන්තර වල් පැළෑටි පිළිබඳ විද්‍යා සංගමය (IWSS) විසින් සුවිශේෂී " යාවජීව ජයග්‍රහණ සම්මානය" පිරිනමන ලදි. මෙම සම්මාන ප්‍රදානෝත්සවය 2022 දෙසැම්බර් 8 වන දින තායිලන්තයේ බැංකොක් නුවර පැවති 08 වැනි ජාත්‍යන්තර "වල් පැළ" විද්‍යා සම්මේලනයේ සමාප්ති සැසියේ දී පවත්වන ලදි.

- **මහාචාර්ය උපුල් බී දිසානායක මහතාට ඕඩර් ඔෆ් රයිසින් සන් සම්මානය පිරිනැමීම**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති සහ විශ්වවිද්‍යාල පරිපාලන මණ්ඩලයේ සභාපති මහාචාර්ය උපුල් දිසානායක මහතාට ජපාන රජය විසින් Order of the Rising Sun- Gold Rays with Neck Ribbon යන සම්මානය පිරිනමන ලදි. ජපානය සහ ශ්‍රී ලංකාව අතර අධ්‍යයන හුවමාරුව සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම සඳහා ඔහු කළ දායකත්වය වෙනුවෙන් මෙහි දී ඔහු ඇගයීමට ලක් විය.

අධ්‍යයන කාර්ය මණ්ඩල විශිෂ්ටත්වය වෙනුවෙන් 2023දී ලැබුණු සම්මාන

පීඨය	සම්මානයේ නම	ජාතික/ ජාත්‍යන්තර	සම්මානය පිළිබඳ විස්තරය	සම්මානලාභියාගේ නම
පර්යේෂණ				
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	මහාචාර්ය ලක්ෂ්මන් සමරනායක පර්යේෂණ විශිෂ්ටතා සම්මානය - 2023	ජාතික	මෙම සම්මානය පිරිනමනු ලබන්නේ පර්යේෂණ සඳහා ක්‍රියාකාරී ව කටයුතු කරන සහ ඉහළ ම ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ සිදු කර ඇති පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ය.	මහාචාර්ය බී.එස්.එම්.එස්. සිරිවර්ධන
	Tier 4 පර්යේෂණ සම්මානය		වි.වි.ප්‍ර.කොා. 05/2018 චක්‍රලේඛයෙහි දක්වා ඇති පාරදෘෂ්‍ය පර්යේෂණ කාර්ය සාධන යෝජනා ක්‍රමය මත පදනම් ව පිරිනමනු ලැබේ.	
ඉංජිනේරු	හොඳ ම උපාධි අපේක්ෂක බලශක්ති පර්යේෂණ ව්‍යාපෘතිය		මෙම සම්මානය බලශක්තියට අදාළ හොඳ ම උපාධි අපේක්ෂක ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය (SLEMA) විසින් පිරිනමන ලදි.	පිසිඳු දනුෂ බද්දේගම මහතා
	IEEE ඉලෙක්ට්‍රොනික නිර්මාණ තරගය 2023		IEEE ඉලෙක්ට්‍රොනික නිර්මාණ තරගයේ ජයග්‍රාහකයන් 2023	විමුක්ති අශාන් මහතා, සුපුන් දසනායක මහතා, දර්ශ උදයන්ද මහතා, තරිඳු කාවිංග මහතා
	ශ්‍රීමත් මෝක්ෂගුණ්ඩම් විස්වේස්වරය සම්මානය	ජාත්‍යන්තර	2023දී සිවිල් ඉංජිනේරුවන්ගේ ආයතනය (ICE - UK) සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද සුවිශේෂී විදේශීය පත්‍රිකා	එස්.කේ. නවරත්නරාජා
කළමනාකරණ	පර්යේෂණ විශිෂ්ටතා සම්මානය	ජාතික	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කාණ්ඩය යටතේ පීඨයේ 2023 වසරේ පර්යේෂණ ක්‍රියාකාරකම්වල විශිෂ්ටතාව	මහාචාර්ය එස්. කොඩිතුවක්කු
වෛද්‍ය	හොඳ ම වේගවත් වාර්තාව සඳහා සම්මානය	ජාත්‍යන්තර	කායික විද්‍යාව පිළිබඳ ඇමරිකානු සඟරාව - හෘදය සහ සංසරණ කායික විද්‍යාව පිළිබඳ හොඳ ම වේගවත් වාර්තාව 2023 APS සමුළුවේ දී ප්‍රදානය කරන ලදි.	ආචාර්ය දම්සර නන්දදේව

අධ්‍යයන කාර්ය මණ්ඩල විශිෂ්ටත්වය වෙනුවෙන් 2023දී ලැබුණු සම්මාන වගුව හා සම්බන්ධ වේ.

පීඨය	සම්මානයේ නම	ජාතික/ ජාත්‍යන්තර	සම්මානය පිළිබඳ විස්තරය	සම්මානලාභියාගේ නම
වෛද්‍ය	හොඳ ම සඟරා ප්‍රකාශනය	ජාතික	හොඳ ම සඟරා ප්‍රකාශනය 2022 ලංකා වෛද්‍ය විද්‍යාලය විසින් ප්‍රදානය කරන ලදි. පත්‍රිකාව: උග්‍ර කාබනික පොස්පේට් පළිබෝධනාශක විෂ වීමෙන් මාස 6කට පසු අවධානයට සම්බන්ධ මොළයේ ක්‍රියාකාරිත්වයේ වෙනස්වීම්: අනාගතය පිළිබඳ පසු විපරම් අධ්‍යයනයක්. ඝායනික විෂ විද්‍යාව. 2022; 60(5):576-584.	මහාචාර්ය ඩබ්ලිව්.ඩී.එම්.ටී.එල් දසනායක
	ප්‍රථම ස්ථානය		වාචික ඉදිරිපත් කිරීම්	මහාචාර්ය සී.එන්.ආර්.ඒ. අලස් මහාචාර්ය ජේ.ජී.එස් රණසිංහ ආචාර්ය ඒ.ඩබ්ලිව්.ඩී.ටී. අඹගස්පිටිය
	ප්‍රකාශනය පිණිස විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන - 2019/2020	ජාතික	ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRC) විසින් වාර්ෂික ව ඉහළ ම SCImago ජර්නල් ශ්‍රේණිගත කිරීම් (SJR) සහිත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද හොඳ ම පර්යේෂණ පත්‍රිකා 100 ඇගයීම සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කරනු ලබයි.	මහාචාර්ය ඩබ්ලිව්.එම්.ඩී.ආර් ඉද්දවෙල මහාචාර්ය ඩබ්ලිව්.ඩී.එස්.ජේ වික්‍රමසිංහ
විද්‍යා	වඩාත් ම සූවිශේෂී ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා	ජාතික	උපකුලපතිවරුන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ කමිටුවේ විශිෂ්ටතා සම්මානය	මහාචාර්ය ඩී.එම්.ඩී යකන්දාවල
	කීර්තිමත් කාන්තා විද්‍යාඥ සම්මානය	ජාත්‍යන්තර	ජීව විද්‍යා ක්ෂේත්‍රයේ විද්‍යාත්මක දැනුමේ වර්ධනය	මහාචාර්ය ජී.ඒ.ඩී පෙරේරා
	නායයෑම් පිළිබඳ පර්යේෂණ විශිෂ්ටතා මධ්‍යස්ථානය		ආචාර්ය ජගත් ගුණතිලක ප්‍රමුඛ භූ විද්‍යා අධ්‍යයනාංශයේ ඉංජිනේරු භූ විද්‍යා පර්යේෂණ කණ්ඩායම 2023 නොවැම්බර් 14 සිට 17 දක්වා ඉතාලියේ ෆ්ලොරන්ස්හි පැවති 16 වැනි ලෝක නායයෑම් සමුළුවේ දී නායයෑම් පර්යේෂණ සඳහා විශිෂ්ටතා මධ්‍යස්ථානයේ පිළිගැනීමට පාත්‍ර විය.	ආචාර්ය ජගත් ගුණතිලක
	ලෝක විද්‍යා ඇකඩමියේ (TWAS) සාමාජික		මහාචාර්ය රෝහණ චන්ද්‍රජිත් මහතා, පෘථිවිය, දේශගුණය සහ පරිසර විද්‍යා කාණ්ඩය යටතේ TWASහි සාමාජිකයෙකු ලෙස තේරී පත්වී ඇත. නිල වශයෙන් සාමාජිකත්වය 2024 ජනවාරි 1 වන දින ආරම්භ වේ.	මහාචාර්ය රෝහණ චන්ද්‍රජිත්
	ප්‍රකාශනය පිණිස විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන - 2019/2020	ජාතික	ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRC) විසින් වාර්ෂික ව ඉහළ ම SCImago ජර්නල් ශ්‍රේණිගත කිරීම් (SJR) සහිත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද හොඳ ම පර්යේෂණ පත්‍රිකා 100 ඇගයීම සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කරනු ලබයි.	මහාචාර්ය අතුල සේනාරත්න ආචාර්ය පී.එල්. ධර්මප්‍රිය
	සම්පූර්ණ කිරීම පිළිබඳ සහතික කිරීම		"ශ්‍රී ලංකාවේ වයඹ වෙරළ තීරයේ ස්වාභාවික රතු පස් ආර්ථික තැන්පතුවක් ලෙස භාවිත කිරීම" යන ව්‍යාපෘතියේ කටයුතු කළ පර්යේෂණ කණ්ඩායමට ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම සහ ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් මෙය පිරිනමනු ලැබේ.	වෛද්‍ය නදීෂා කෝරලේගෙදර
	SUSRED සම්මාන 2020/2021		SUSRED (පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා ආධාරක යෝජනා ක්‍රමය) යනු පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි (දර්ශනපති සහ දර්ශනශූරී) අධීක්ෂකවරුන් ජාතියට කරන සේවය අගයමින් ලබා දෙන ජාතික විද්‍යා පදනම විසින් ප්‍රදානය කරනු ලබන සම්මානයකි.	ආචාර්ය ජේ.එම්.එස්.ජේ. මැණිකේ
	ප්‍රකාශනය පිණිස විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන - 2019/2020		ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRC) විසින් වාර්ෂික ව ඉහළ ම SCImago ජර්නල් ශ්‍රේණිගත කිරීම් (SJR) සහිත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද හොඳ ම පර්යේෂණ පත්‍රිකා 100 ඇගයීම සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කරනු ලබයි.	මහාචාර්ය ටී.එම්.ඩබ්ලිව්.ජේ. බණ්ඩාර
පශු වෛද්‍ය විද්‍යා සහ සත්ත්ව විද්‍යා	සත්ත්ව සෞඛ්‍යය පිළිබඳ ම පර්යේෂණ පත්‍රිකාව - ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ විද්‍යාත්මක සැසි	ජාතික	ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයේ විද්‍යාත්මක සැසි මගින් පිරිනමන සත්ව සෞඛ්‍යය පිළිබඳ හොඳම පර්යේෂණ පත්‍රිකාව	ආචාර්ය එන්.එම්.ටී. අනුපමා

අධ්‍යයන කාර්ය මණ්ඩල විශිෂ්ටත්වය වෙනුවෙන් 2023දී ලැබුණු සම්මාන වගුව හා සම්බන්ධ වේ.

පීඨය	සම්මානයේ නම	ජාතික/ ජාත්‍යන්තර	සම්මානය පිළිබඳ විස්තරය	සම්මානලාභියාගේ නම
පශු වෛද්‍ය විද්‍යා සහ සත්ත්ව විද්‍යා	ප්‍රකාශනය පිණිස විද්‍යාත්මක පර්යේෂණ සඳහා ජනාධිපති සම්මාන - 2019/2020	ජාතික	ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව (NRC) විසින් වාර්ෂිකව ඉහළම SCImago ජර්නල් ශ්‍රේණිගත කිරීම් (SJR) සහිත සඟරාවල ප්‍රකාශයට පත් කරන ලද හොඳම පර්යේෂණ පත්‍රිකා 100 ඇගයීම් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කරනු ලබයි.	ආචාර්ය එච්.එම්.ටී.කේ. කරුණාරත්න
ජාතික/ප්‍රජා ව්‍යාපෘති සහ දායකත්ව				
සම සෞඛ්‍ය විද්‍යා	iRuFARS 2023	ජාතික	රුහුණු විශ්වවිද්‍යාලයේ පැවති මෙම ජාත්‍යන්තර සමුළුවට සහයෝගය ලබාදීම වෙනුවෙන් පිළිගැනීමක් ලෙස මෙය පිරිනමන ලදි.	මහාචාර්ය එම්.එච්.එෆ්. සකීනා
පශු වෛද්‍ය විද්‍යා සහ සත්ත්ව විද්‍යා	ග්ලෝබල් ඉම්පැක්ට් සම්මානය	ජාත්‍යන්තර		එස්. මයුරන් මහතා
	ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගීතා ව්‍යාපෘතිය RAS 5096		ප්‍රදානය (වටිනාකම යුරෝ 1,881,255)	මහාචාර්ය බී.ආර්. ප්‍රනාන්දු
	යුරෝපා සංගමයේ අරමුදල් සහිත BESPA ආහාර ව්‍යාපෘතිය යටතේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන සංවිධානයේ සහාය		ප්‍රදානය (වටිනාකම රු. 7,000,000)	මහාචාර්ය බී.ආර්. ප්‍රනාන්දු
වෙනත්				
සම සෞඛ්‍ය විද්‍යා	SUSRED සම්මානය (පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා ආධාරක යෝජනා ක්‍රමය)	ජාතික	ජාතික විද්‍යා පදනමේ මෙම සම්මානය පශ්චාත් උපාධි පර්යේෂණ උපාධි අධීක්ෂකවරුන්ගේ සේවය අගය කිරීම සඳහා ඔවුන් වෙත පිරිනමනු ලබයි.	ආචාර්ය එන්.ආර්. අමරසිංහ
කළමනාකරණ	ඉගැන්වීමේ විශිෂ්ටතා සම්මානය		2023දී පීඨයේ ඉගැන්වීමේ කටයුතුවල විශිෂ්ටත්වය සඳහා	මහාචාර්ය එස්. කොඩිතුවක්කු
	ඉගැන්වීමේ විශිෂ්ටතා සම්මානය		2023දී පීඨයේ ඉගැන්වීමේ කටයුතුවල විශිෂ්ටත්වය සඳහා	එම්.වී.ආර්.යූ.කේ.බී. ආරියරත්න මහතා

1.4.5.3 වෘත්තීය සංවර්ධනය

පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය - දේශීය සහ විදේශීය

අධ්‍යයනාංශය/ අංශය/ඒකකය	කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම	තනතුර	පශ්චාත් උපාධි	අරමුදල් මූලාශ්‍රය	පාඨමාලාවේ කාලසීමාව	රට
සම සෞඛ්‍ය විද්‍යා පීඨය						
ඖෂධවේද	ජේ.එස්. මධුෂානි මෙණෙවිය	කථිකාචාර්ය (ආධුනික)	විද්‍යාපති උපාධිය	පොදු රාජ්‍ය මණ්ඩලය	වර්ෂ 1	එක්සත් රාජධානිය
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය						
මූලික විද්‍යාවන්	ආචාර්ය ඩී.ඩබ්ලිව්.වී.එන්. දිසානායක	කථිකාචාර්ය	වෛද්‍ය විද්‍යාපති උපාධිය		වර්ෂ 4	ශ්‍රී ලංකාව
ප්‍රතිස්ථාපන දන්ත වෛද්‍ය විද්‍යාව	ආචාර්ය එන්.එස්. නරසිංහ	කථිකාචාර්ය	වෛද්‍ය විද්‍යාපති උපාධිය	ස්වයං අරමුදල් සම්පාදනය	වර්ෂ 4	ශ්‍රී ලංකාව
මුඛ සහ හනුක වෛද්‍ය විද්‍යාව	ආචාර්ය ආර්.එම්.එස්.එච්.බී. මැදවෙල	කථිකාචාර්ය (ආධුනික)	මුඛ සහ හනුක වෛද්‍ය පිළිබඳ වෛද්‍ය විද්‍යාපති පුහුණුව	වි.වි.ප්‍ර.කොා. සභාව	වර්ෂ 2	එක්සත් රාජධානිය
	ආචාර්ය ආර්.ඒ. චන්ද්‍රසිරි			වි.වි.ප්‍ර.කොා. සභාව	වර්ෂ 5	ශ්‍රී ලංකාව
කෘතිම දන්ත වෛද්‍ය විද්‍යාව	ආචාර්ය ආර්.එම්.එස්.ජී.කේ. රස්නායක	කථිකාචාර්ය	වෛද්‍ය විද්‍යාපති - පශ්චාත් දේශීය පුහුණුව	වි.වි.ප්‍ර.කොා. සභාව	වර්ෂ 1	ශ්‍රී ලංකාව

පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය - දේශීය සහ විදේශීය වගුව හා සම්බන්ධ වේ.

අධ්‍යයනාංශය/ අංශය/ඒකකය	කාර්ය මණ්ඩල සාමාජිකයාගේ නම	තනතුර	පශ්චාත් උපාධි	අරමුදල් මූලාශ්‍රය	පාඨමාලාවේ කාලසීමාව	රට
කෘතිම දන්ත වෛද්‍ය විද්‍යාව	ආචාර්ය ඒ.ඒ.ඒ.කේ. විමලරත්න	කථිකාචාර්ය (ආධුනික)	වෛද්‍ය විද්‍යාපති විදේශ පුහුණුව	වි.වි.ප්‍ර.කොා. සභාව	වර්ෂ 1	ඔස්ට්‍රේලියාව
මුඛ වෛද්‍ය විද්‍යාව සහ පරිදන්ත විද්‍යාව	ආචාර්ය පී.එම්. පීරිස්		වෛද්‍ය විද්‍යාපති උපාධිය		වර්ෂ 1	ශ්‍රී ලංකාව
	ආචාර්ය බී.එම්.සී.ඒ. බණ්ඩාරනායක		වෛද්‍ය විද්‍යාපති විදේශ පුහුණුව		වර්ෂ 1 1/2	ඔස්ට්‍රේලියාව
ඉංජිනේරු පීඨය						
ඉංජිනේරු කළමනාකරණය	අයි.ඩබ්.එන්. බණ්ඩාරනායක	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	දර්ශනගුරු	වි.වි.ප්‍ර.කොා. සභාව	වර්ෂ 3	ඔස්ට්‍රේලියාව / ශ්‍රී ලංකාව
කළමනාකරණ පීඨය						
කළමනාකරණ අධ්‍යයන	ආර්.එම්.සී කුමාරි මහත්මිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය	දර්ශනගුරු		වර්ෂ 3	ශ්‍රී ලංකාව
	ඩී.අයි.පේ. සමරනායක		දර්ශනගුරු		වර්ෂ 4	එක්සත් රාජධානිය
වෛද්‍ය විද්‍යා පීඨය						
පරපෝෂිත විද්‍යාව	ආචාර්ය එස්.ඩී. ලෙනදොර	කථිකාචාර්ය	වෛද්‍ය ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	ස්වයං අරමුදල් සම්පාදනය	මාස 14	ශ්‍රී ලංකාව
නිර්විඳ්දන විද්‍යාව සහ දැඩි සත්කාර	මහාචාර්ය සමන් නානායක්කාර	මහාචාර්ය	ඉතිහාසය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ස්වයං අරමුදල් සම්පාදනය	වර්ෂ 1	ශ්‍රී ලංකාව
අධිකරණ වෛද්‍ය විද්‍යාව	ආචාර්ය ඊ.එම්.කේ.බී. ඒකනායක	කථිකාචාර්ය (ආධුනික)	අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ වෛද්‍ය විද්‍යාපති උපාධිය		වර්ෂ 5	ශ්‍රී ලංකාව
විද්‍යා පීඨය						
අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය	එස්.අයි. කරුණාරත්න මෙණෙවිය	කථිකාචාර්ය (ආධුනික)	දර්ශනගුරු (අධ්‍යයන කටයුතු සිදු කරමින් පවතී)	මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ශිෂ්‍යත්වය	වර්ෂ 4.5	ඕස්ට්‍රේලියාව
සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව	පී.ටී. වීරසිංහ මහතා		දර්ශනගුරු	ස්වයං අරමුදල් සම්පාදනය	වර්ෂ 3	ඕස්ට්‍රේලියාව / ශ්‍රී ලංකාව
සංඛ්‍යානය සහ පරිගණක විද්‍යාව	බී.ආර්.පී.එම් බස්නායක මෙණෙවිය	කථිකාචාර්ය (ආධුනික)	දර්ශනපති	ස්වයං අරමුදල් සම්පාදනය	වර්ෂ 3	ශ්‍රී ලංකාව
පශු වෛද්‍ය විද්‍යා සහ සත්ත්ව විද්‍යා පීඨය						
පශු වෛද්‍ය ව්‍යාධිවේදය	ආචාර්ය පී.ජී.ඒ.එස්. පල්කුඹුර	කථිකාචාර්ය (ආධුනික)	දර්ශනගුරු	ස්වයං අරමුදල් සම්පාදනය	වර්ෂ 5	කැනඩාව
පුස්තකාලය						
ප්‍රධාන පුස්තකාලය	එස්.ඒ.ජීවන් මහතා	සහකාර පුස්තකාලයාධිපති	පුස්තකාල සහ තොරතුරු විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	විශ්වවිද්‍යාලය සහ ස්වයං මූල්‍ය සම්පාදනය	වර්ෂ 3	ශ්‍රී ලංකාව
ප්‍රධාන පුස්තකාලය	එච්.එම්. ඉසුරු හේරත්	සහකාර පුස්තකාලයාධිපති	MSSC	විශ්වවිද්‍යාල අරමුදල්	වර්ෂ 2	ශ්‍රී ලංකාව
පුස්තකාලය ජාලය	එල්.සී. විතානගේ මහත්මිය	සහකාර ලේඛකාධිකාරී (පුස්තකාලය සේවා	MSSC	විශ්වවිද්‍යාල අරමුදල්	වර්ෂ 2	ශ්‍රී ලංකාව
වෙනත්						
අභ්‍යන්තර විගණන අංශය	ඒ.ජී.එෆ්. ෆස්නා මහත්මිය	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක	ව්‍යෝහාරික විගණනය සහ ගිණුම්කරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය	ස්වයං මූල්‍ය සම්පාදනය	වර්ෂ 1	එක්සත් රාජධානිය

කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ වෘත්තීය සංවර්ධන වැඩසටහන්

1999 මාර්තු මස ආරම්භ කරන ලද විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) විසින් විශ්වවිද්‍යාලයේ සියලු ම අංශ මගින් කාර්ය මණ්ඩල සංවර්ධන කටයුතු සිදු කරමින් සහ අනෙකුත් අධ්‍යාපන ආයතන වෙත ද සිය සේවා ව්‍යාප්ත කරමින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලැබේ.

සහතික පත්‍ර පාඨමාලා

- මධ්‍ය වෘත්තීය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් ඉලක්ක කර ගනිමින් විශ්වවිද්‍යාලවල නායකත්වය සහ කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලා දෙකක් පෙබරවාරි සහ අගෝස්තු මාසවල දී පවත්වන ලදි.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියමයන්ට අනුකූලවන පරිදි උසස් අධ්‍යාපනයේ ඉගැන්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (23 වැනි වැඩසටහන) පෙබරවාරි සිට ජුනි දක්වා ආධුනික අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පවත්වන ලදි.

ධාරිතා සංවර්ධන වැඩසටහන්

- **ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයන් සහ නවකවදය වැළැක්වීමේ සහ සුබසාධන කමිටු සාමාජිකයන්:** මොවුන් සඳහා එක්දින හඳුන්වා දීමේ වැඩසටහන් සහ කුඩා කණ්ඩායම් සඳහා ඉගැන්වීම් සැසි පවත්වන ලදි.
- **කළමනාකරණ සහකාර නිලධාරීන්:** මොවුන් සඳහා 6 වන ධාරිතාව සංවර්ධන වැඩසටහන ජනවාරි මාසයේ දී පවත්වන ලදි.
- **තාක්ෂණික නිලධාරීන්:** තාක්ෂණික නිලධාරීන් වෙනස් කිරීමේ ක්‍රියාකාරී නියෝජිතයන් ලෙස බලගැන්වීම සඳහා දින හතක වැඩසටහනක් පවත්වන ලදි.
- **රසායනාගාර සහායකයන්:** රසායනාගාර සහායකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා වැඩසටහනක් පවත්වන ලදි.
- **පාසල් ගුරුවරුන්:** පරිපූර්ණ ඉගෙනුම් සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් පාසල් ගුරුවරුන් සඳහා වැඩසටහනක් පවත්වන ලදි.

වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

- CN-ePortfolio වැඩමුළුව: අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර CN-ePortfolio ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩමුළු ආරම්භ කරන ලදි.
- උපදේශන වැඩසටහන: සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා උපදේශන වැඩසටහන් පවත්වන ලදි.
- මූලික හුරුකිරීමේ වැඩසටහන: අලුතින් බඳවා ගත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මූලික හුරුකිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදි.
- හරිත ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන: හරිත ප්‍රසම්පාදනය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීමට තිරසාර භාවය පිළිබඳ කමිටුව සමඟ සහයෝගයෙන් කටයුතු කරන ලදි.

1.4.5.4 උසස්වීම් සහ පත්වීම්

නායකත්වය ශක්තිමත් කිරීම: 2023 දී සිදු කරන ලද ප්‍රධාන පත්වීම්

2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලය අධ්‍යයන ශක්‍යතා, පරිපාලන කාර්යක්ෂමතාව සහ පුරෝගාමී පර්යේෂණ කාර්යයන් සඳහා එහි කැපවීම ශක්තිමත් කරමින් සම්මානනීය වෘත්තිකයන් වැදගත් නායකත්ව කාර්යභාරයන් ඉටු කිරීම සඳහා සම්බන්ධකර ගත්තේ ය.

ආයතනය ඉහළ මට්ටමකට රැගෙන යාමට සිය ප්‍රවීණත්වයේ දායකත්වය ලබාදෙමින් සහ දැක්මට අනුගත වෙමින් පහත සඳහන් කීර්තිමත් පුද්ගලයන් විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තනතුරුවල රාජකාරී භාරගෙන ඇත.

පත්වීම්

- මහාචාර්ය ආර්.එච් කුරුප්පුගේ මහතා කළමනාකරණ පීඨයේ 4 වැනි පීඨාධිපතිවරයා ලෙස 2023 අගෝස්තු 18 වැනි දින සිය ධුර කාලය ආරම්භ කළේ ය.

- ආචාර්ය චන්දන ජයවර්ධන මහතා විසින් 2023 ජූලි 11 දින සිට මානව සම්පත් සංවර්ධන ඒකකයේ අධ්‍යක්ෂවරයාගේ ධූරයේ රාජකාරී භාරගන්නා ලදි.
- ආචාර්ය ජේ.එම්.යූ.යූ.කේ ජයසිංහ මහතා 2023 අප්‍රේල් 18 සිට තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ලෙස මූලිකත්වය ගෙන කටයුතු කරයි.
- ආචාර්ය ඩබ්ලිව්.ඩී චන්ද්‍රසේන 2023 සැප්තැම්බර් 7 සිට කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරයි.

සංගමයට පත්වීම්

ඉංජිනේරු පීඨයේ සිවිල් ඉංජිනේරු අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රංජිත් දිසානායක මහතා 2023 ඔක්තෝම්බර් සිට බලපැවැත්වෙන පරිදි එහි සංගමයේ නව සභාපතිවරයා ලෙස පත් කර ඇති බව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) නිවේදනය කර ඇත.

1.4.5.5 වගවීම සහ අවංකභාවය ශක්තිමත් කිරීම

- **බැඳුම්කර වගකීම් කළමනාකරණය කිරීම:** උල්ලංඝනය අවම කිරීම සහ අය කර ගැනීම් සිදු කිරීම (බැඳුම්කර කඩකරන්නන් 64ක්, පියවීම් 19ක්, රුපියල් 75,754,744.54ක අය කර ගැනීම් සිදු කිරීම, රුපියල් 314,866.18 අයකර ගැනීමට මඟ පාදමින් දර්ශනශූරී උපාධි තුනක් සම්පූර්ණ කිරීම, එහි ප්‍රතිඵලයක් ලෙස සක්‍රීය උල්ලංඝනය කරන්නන් සංඛ්‍යාව 42ක් වීම.


- **බඳවා ගැනීම් විධිමත් කිරීම:** පීඨයේ කෙටි ලැයිස්තුගත කිරීමේ කටයුතු සඳහා මාර්ගගත ප්‍රවේශය භාවිත කිරීම.

අධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සහ උසස්කිරීම්

පීඨය	බඳවාගැනීම්		උසස්වීම්	
	තනතුර	කාර්යමණ්ඩලය	තනතුර	කාර්යමණ්ඩලය
කෘෂි විද්‍යා පීඨය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II කථිකාචාර්ය (ආධුනික)	1 5	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	1
සම සෞඛ්‍ය විද්‍යා පීඨය	කථිකාචාර්ය (ආධුනික)	6	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	2 6
ශාස්ත්‍ර පීඨය	කථිකාචාර්ය (ආධුනික)	3	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	1 7
දන්ත වෛද්‍ය විද්‍යා පීඨය	-	-	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II කථිකාචාර්ය	2 2 2
ඉංජිනේරු පීඨය	කථිකාචාර්ය (ආධුනික)	3	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මහාචාර්ය සහාය මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	1 5 1 1
කළමනාකරණ පීඨය	කථිකාචාර්ය (ආධුනික)	4	මහාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II	1 4
වෛද්‍ය පීඨය	කථිකාචාර්ය (ආධුනික)	4	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය මහාචාර්ය	1 7
විද්‍යා පීඨය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II කථිකාචාර්ය (ආධුනික)	1 1 4	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I	3
පශු වෛද්‍ය විද්‍යා	කථිකාචාර්ය (ආධුනික)	3	මහාචාර්ය (ප්‍රධාන) මහාචාර්ය	1 1
එකතුව		**35**		**46**

නව බඳවා ගැනීම් - අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය

වර්ෂය	අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව	අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව	එකතුව
2023	35	-	35
2022	44	09	53
2021	62	15	77
2020	40	30	70
2019	43	45	88
2018	39	133	172
2017	48	79	127
2016	43	53	96
2015	61	75	136
2014	52	77	129
2013	59	148	207



2023 දෙසැම්බර් 31 දිනට බඳවා ගැනීම්, විශ්‍රාම ගැනීම්, ඉල්ලා අස්වීම් සහ මියගිය කාර්ය මණ්ඩලය පිළිබඳ සාරාංශය

	අධ්‍යයන කාර්ය මණ්ඩලයය	අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය	එකතුව
බඳවා ගැනීම්	35	-	-	35
විශ්‍රාම ගැනීම්	19	-	68	87
ඉල්ලා අස්වීම්	36	6	32	74
මියයාම්	03	-	01	04

1.4.5.6 මානව සම්පත් සංවර්ධනය

මානව සම්පත් සංවර්ධන ඒකකය ස්ථාපිත කිරීම

2023 පෙබරවාරි 25 වැනි දින පැවති පාලක සභාවේ 525 වැනි රැස්වීමේ අනුමැතිය මත මානව සම්පත් සංවර්ධන ඒකකය (මා.ස.සං.ඒ.) පිහිටුවන ලදී. විශ්වවිද්‍යාලයේ සමස්ත මානව සම්පත් අංශයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම මානව සම්පත් සංවර්ධන ඒකකය සතු වේ. විශ්වවිද්‍යාලයේ සේවක අවශ්‍යතා වරින් වර සමාලෝචනය කිරීම, වාර්ෂික සේවක අවශ්‍යතා සඳහා අනුමැතිය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වීම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ වී පුහුණු වැඩසටහන් පැවැත්වීම, කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම, අනෙකුත් මානව සම්පත් කළමනාකරණ කාර්යයන් සඳහා පහසුකම් සැලසීම/ ක්‍රියාත්මක කිරීම (පෙරහුරු වැඩසටහන්, ත්‍යාග කළමනාකරණය, සේවක සබඳතා, සේවක සෞඛ්‍යය සහ ආරක්ෂාව යනාදිය) යන විශේෂිත කාර්යයන් එයට ඇතුළත් වේ. මානව සම්පත් සංවර්ධන ඒකකයේ ආරම්භක අධ්‍යක්ෂවරයා 2023 ජූලි මාසයේ දී පත් කරන ලදී.

2023දී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සහ වැඩසටහන්

- **සේවක පුහුණුව සහ සංවර්ධනය**: අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ රැකියා තෘප්තිය සහ කාර්යය ජීවිතයේ ගුණාත්මක භාවය වැඩිදියුණු කිරීම සඳහා සමීක්ෂණයක් පවත්වන ලදී. සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම් ව 2024දී පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබේ.

- **නව අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පෙරහුරු වැඩසටහන**: අලුතින් පත් කරන ලද අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා පෙරහුරු වැඩසටහනක් 2023 ඔක්තෝම්බර් මාසයේ දී ආරම්භ කරන ලදී. සහභාගිවන්නන්ගේ ප්‍රතිපෝෂණ මත පදනම් ව දෙවන සැසියක් නොවැම්බර් මාසයේ දී පැවැත්විණි.

- **විශ්‍රාම යන අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා දැනුම්වත් කිරීමේ සැසියක්**: විශ්‍රාම යාමට නියමිත අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 2023 නොවැම්බර් මාසයේ දී දැනුවත් කිරීමේ සැසියක් ආරම්භ කරන ලදී. මෙම සැසිවාරයේ දී පූර්ව විශ්‍රාම සහ විශ්‍රාම ප්‍රතිලාභ පිළිබඳව සහභාගිවන්නන් දැනුවත් කළ අතර ඔවුන්ගෙන් යෝජනා ලබාගන්නා ලදී.

- **පර්යේෂණ ප්‍රතිලාභ පිරිනමන්නේ කෙසේ ද යන්න පිළිබඳ සැසිය**: විධායක නිලධාරීන් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් පර්යේෂණ සඳහා දිරිමත් කිරීම සඳහා 2023 දෙසැම්බර් මාසයේ දී සැසියක් පවත්වන ලදි. මෙම සැසිය 2024දී මාසික ව පවත්වනු ලැබේ.

- **අධ්‍යයන ආයතනික කටයුතු විධිමත් කිරීම**: අධ්‍යයන ආයතන අංශයේ කටයුතු විධිමත් කිරීම සඳහා එහි නිලධාරීන් සමඟ රැස්වීම් පවත්වන ලදි. අංශයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දත්ත සමුදායක්/පද්ධතියක් සංවර්ධනය කිරීමට කටයුතු කෙරේ.

- **අනධ්‍යයන ආයතනික කාර්යයන් විධිමත් කිරීම**: දැනුම හුවමාරු කිරීමේ වැදගත්කම අනධ්‍යයන ආයතන අංශයේ නිලධාරීන් සමඟ පැවති රැස්වීම්වල දී අවධාරණය කෙරිණි. සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි එකොළහක් අවසන් කරන ලද අතර, අංශයේ කාර්යයන් විධිමත් කිරීම සඳහා මාර්ගගත පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා සම්පත් දායකයෙකු හඳුනා ගන්නා ලදි.

1.4.5.7 2023 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ යහපැවැත්ම ආරක්ෂා කිරීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීතිමය යහපැවැත්ම ආරක්ෂා කිරීම සහ සුමට මෙහෙයුම් සහතික කිරීම සඳහා නීති සහ ප්‍රලේඛන අංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. නීතිමය අනුකූලතාව තහවුරු කිරීම සහ අභියෝග ඵලදායී ලෙස විසඳීම සම්බන්ධයෙන් දක්වන කැපවීම පෙන්නුම් කරමින් මෙම අංශය 2023 වර්ෂයේ දී සක්‍රීය ව විවිධ පරාසයන් රැසක කාරණා සම්බන්ධයෙන් කටයුතු කළේය.

- **අධිකරණයේ දී විශ්වවිද්‍යාලය ආරක්ෂා කිරීම**

    - නීතිමය ආරවුල්වල දී විශ්වවිද්‍යාල තත්ත්වය සුරක්ෂිත කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය සහ දිස්ත්‍රික් උසාවි ඇතළු විවිධ මට්ටම් මගින් උසාවි නඩු 91ක් සාර්ථක ලෙස මෙහෙයවන ලදි.
    - උරුම හා සම්බන්ධ ගැටලු විසඳීමේ කාර්යක්ෂමතාව පෙන්නුම් කරමින් පැරණි බැඳුම්කර උල්ලංඝන සිදුවීම් 68ක් විසඳන ලදි.

    - හිඟ මුදල් ආපසු අයකර ගැනීම සහ නීතිමය බැඳීම් බලාත්මක කිරීම සඳහා විවිධ උසාවිවල නීති කෘත්‍ය 16ක් ආරම්භ කර ඇත.

- **අභ්‍යන්තර විශ්වසනීයත්වය පවත්වා ගැනීම**

    - අභ්‍යන්තර ගැටලු විසඳීමට සහ සාධාරණ පිළිවෙත් තහවුරු කිරීමට මූලික පරීක්ෂණ 40ක් සහ විධිමත් පරීක්ෂණ 15ක් පවත්වන ලදි.

    - ආරක්ෂිත සහ ගෞරව සම්ප්‍රයුක්ත විශ්වවිද්‍යාල පරිසරයක් සහතික කරමින් ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් හිංසනය සහ ලිංගික ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ කමිටුව (SGBVC) විමර්ශන 5ක් සම්බන්ධීකරණය කරන ලදි.

    - සේවක දුක් ගැනවිලි හා සම්බන්ධ ගැටලු විසඳීමට සහ ධනාත්මක සේවා ස්ථාන සංස්කෘතියක් නිර්මාණය කිරීම සඳහා දුක් ගැනවිලි කමිටු රැස්වීම් 9ක් පැවැත්වීම සඳහා පහසුකම් සැලසීම.

- **පාරදෘෂ්‍යභාවය සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම**

    - තොරතුරු සම්බන්ධයෙන් විනිවිදභාවය තහවුරු කිරීම සහ මහජන ප්‍රවේශය සඳහා පහසුකම් සලසමින් තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ පනත යටතේ ඉදිරිපත් කරන ලද අයදුම්පත් සහ අභියාචනාවලට ප්‍රතිචාර දැක්වීම.

    - ප්‍රතිපත්ති සම්පාදනයේ දී සහ පරීක්ෂණවල දී නීතිමය අනුකූලතාව සහතික කරමින් උපකුලපතිවරයා විසින් පත් කරන ලද විවිධ විශ්වවිද්‍යාල කමිටු සඳහා විශේෂඥ දැනුමින් දායකත්වය ලබා දීම.

    - අභ්‍යන්තර තත්ත්ව සහතිකකරණ ඒකකය (IQAU) විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්තිවල නෛතික භාවය සහ අධ්‍යයන ප්‍රමිතීන් ආරක්ෂා කරමින් ඒවා සමාලෝචනය කිරීම.

විශ්වවිද්‍යාල නීති ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය

ක්‍රියාකාරකම	සිද්ධීන් සංඛ්‍යාව
මූලික පරීක්ෂණ	40
විධිමත් පරීක්ෂණ	15
ලිංගික සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසන පිළිබඳ විමර්ශන	5
දුක් ගැනවිලි කමිටු රැස්වීම්	9
උසාවි නඩු සම්බන්ධයෙන් කටයුතු කිරීම	91
බැඳුම්කර උල්ලංඝන ගැටලු විසඳීම	68
නීතිමය ක්‍රියාමාර්ග ගැනීම	16
අවබෝධතා ගිවිසුම්/ගිවිසුම් සමාලෝචනය කිරීම	101
නඩු අවසන් කිරීම	9
නඩු වාසිදායක ලෙස අවසන් කිරීම	8

1.4.6 සෞඛ්‍ය සහ යහපැවැත්ම සඳහා පවත්වන ලද වැඩසටහන්

1.4.6.1 සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ජංගම සායනය

සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ හෙදවේද අධ්‍යයනාංශය විසින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකමක් ලෙස "සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ජංගම සායනය" නමින් ජංගම සායන සේවාවක් ආරම්භ කරන ලදි. එමගින් සේවා ස්ථානවල වැඩ කරන වෘත්තිකයන් සඳහා තම සේවා ස්ථානයේ දී ම විවිධ සෞඛ්‍ය සේවා සැපයීම සිදු කරනු ලබයි. මෙම සායනයේ ප්‍රධාන අරමුණු වන්නේ තෝරාගත් බෝ නොවන රෝග කිහිපයක් සම්බන්ධයෙන් වැඩ කරන වැඩිහිටියන් පරීක්ෂා කිරීම සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ඔවුනට ලබා දීමයි. මෙහි පළමු සායනය 2023 ජනවාරි 26 වැනි දින මහනුවර DFCC බැංකු පරිශ්‍රයේ දී සාර්ථක ව පවත්වන ලදි.

1.4.6.2 විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල සිසුන්, විශ්වවිද්‍යාල සේවකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ඇතුලු එහි විවිධ ප්‍රජාවට පුළුල් සෞඛ්‍ය සේවා සැපයීමට කැපවී කටයුතු කරයි.

විශ්වවිද්‍යාල සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් 2023 වර්ෂයේ සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

බෝ නොවන රෝග පිළිබඳ පරීක්ෂා කිරීමේ වැඩසටහන: 2023 වර්ෂයේ දී සෞඛ්‍ය මධ්‍යස්ථානය විසින් වයස අවුරුදු 35ට වැඩි කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා බෝ නොවන රෝග සඳහා පරීක්ෂණ වැඩසටහනක් පවත්වන ලදි. රෝග විනිශ්චය කරන ලද රෝගීන් සඳහා අවශ්‍ය සියලුම පරීක්ෂණ නොමිලේ සිදු කරමින් වසරේ දී සේවකයන් 593ක් පමණ පරීක්ෂාවට ලක් කරන ලදි. කාර්ය මණ්ඩලය අතර නිදන්ගත සෞඛ්‍ය තත්ත්ව හඳුනාගෙන ඒවා කළමනාකරණය කිරීම සහ ඔවුන්ගේ යහපැවැත්ම සහ දීර්ඝායුෂ ප්‍රවර්ධනය කිරීම මෙම වැඩසටහනේ අරමුණ විය.

වෛද්‍ය සායනය: 2023 වර්ෂයේ දී රෝග විනිශ්චය කරන ලද රෝගීන් සඳහා අඛණ්ඩ සෞඛ්‍ය සේවා සැපයීම පිණිස වෛද්‍ය සායනයක් ස්ථාපිත කරන ලදි. මෙම වැඩසටහන මගින් පුද්ගලයන්ට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර සහ සහාය ලබා දීම සිදු කරයි. විශ්වවිද්‍යාල සේවකයන් සඳහා වෛද්‍ය පරීක්ෂණ සහ උපදේශන ලබා දෙමින් මෙම සායනය මසකට වරක් ක්‍රියාත්මක කරන ලදි.


උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය: 2022 වර්ෂයේ දී පිහිටුවන ලද උපදේශන ඒකකය මගින් පැය 24 පුරා සිසුන් සහ කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා මනෝවිද්‍යාත්මක සහාය සහ පසු විපරම් වැඩසටහන් ඇතුළු ව උපදේශන සේවා සැපයීම සිදු කරන ලදි. වසරේ දී විශ්වවිද්‍යාලයට අනුයුක්ත සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා සේවා සැපයීම් අවස්ථා 2011ක් වාර්තා කරන ලදි. මෙම වැඩසටහන මගින් විශ්වවිද්‍යාල ප්‍රජාවගේ මානසික සෞඛ්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන අතර, ඔවුන් අතර චිත්තවේගීය යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලබයි.


සෞඛ්‍ය අධ්‍යාපන වැඩමුළු: 2023 වර්ෂයේ දී ආහාර සහ නිවාසවල සනීපාරක්ෂාව, ප්‍රථමාධාර සහ මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුම්වත් කිරීම වැනි මාතෘකා ඔස්සේ කාර්ය මණ්ඩල සාමාජිකයන් දැනුවත් කරමින් විවිධ සෞඛ්‍ය අධ්‍යාපන වැඩමුළු පීඨ සහ අධ්‍යයනාංශ මට්ටමින් පවත්වන ලදි. සෞඛ්‍ය හා සම්බන්ධ ගැටලු පිළිබඳ

සිය දැනුවත්භාවය වැඩි දියුණු කරගනිමින් සහ සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් ප්‍රවර්ධනය කරමින් මෙම වැඩමුළු සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයෝ සැලකිය යුතු සංඛ්‍යාවක් සහභාගී වූහ.

- **වගා සංග්‍රාමය:** කොවිඩ්-19 වසංගත කාලය අතරතුර මානසික සෞඛ්‍යය පවත්වා ගැනීම අරමුණු කරගෙන ඇරඹී වගා සංග්‍රාමය වැඩසටහන 2023 දී අඛණ්ඩ ව ක්‍රියාත්මක විය. කොම්පෝස්ට් නිෂ්පාදනය, කාබනික ද්‍රව්‍ය සංවර්ධනය සහ රුක් රෝපණය වැනි ක්‍රියාකාරකම් මෙහි දී සිදු කරන ලදි. මෙම ක්‍රියාකාරකම මගින් සෞඛ්‍යය ප්‍රවර්ධනය කරනවා පමණක් නොව කාර්ය මණ්ඩල සාමාජිකයන් අතර ප්‍රජාව සහ යහපැවැත්ම පිළිබඳ හැඟීමක් ද ජනිත කරයි.

- **දැනුම්වත් කිරීමේ වැඩසටහන්:** සෞඛ්‍ය මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය සඳහා මානසික රෝග විනිශ්චය, හදිසි අවස්ථා කළමනාකරණය සහ අවදානම් කළමනාකරණය වැනි මාතෘකා පිළිබඳ විවිධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 2023 වසර පුරාවට පවත්වන ලදි. මෙම වැඩසටහන් මගින් විවිධ තත්ත්වයන්හි දී ඵලදායී ලෙස කටයුතු කිරීමට සහ විශ්වවිද්‍යාල ප්‍රජාවගේ සමස්ත යහපැවැත්ම උදෙසා දායක වීමට අවශ්‍ය දැනුම හා කුසලතාවන්ගෙන් කාර්ය මණ්ඩල සාමාජිකයන් සන්නද්ධ කිරීම සිදු වී ඇත.





1.4.6.3 උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය

විශ්වවිද්‍යාලයේ උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය අපගේ සුවිශේෂී කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් වැදගත් මෙහෙයක් ඉටුකරයි. ක්‍රියාකාරී වැඩසටහන් මාලාවක් ඔස්සේ, මානසික සෞඛ්‍ය පිළිබඳ දැනුම්වත් කිරීම සහ සහාය ලබා දීම සඳහා හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය ප්‍රයත්න දරා ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ මනෝවිද්‍යාත්මක අවශ්‍යතා සපුරාලීම සඳහා කැප වූ උපදේශන සහ මනෝවිද්‍යාත්මක උපකාරක ඒකකය 2022 අගෝස්තු මාසයේ දී ආරම්භ කරන ලදි. ආරම්භයේ සිට ම මෙම ඒකකය අත්‍යාවශ්‍ය මානසික සෞඛ්‍ය සහාය සේවා සපයමින් සිසුන් 1128 දෙනෙකු සඳහා සේවය ලබාදී ඇත.

මෙම ඒකකය විසින් ඉටුකරන ලද කාර්යයන්ගේ විශේෂ අවස්ථා කිහිපයක් මෙසේ දක්වමු:

දැනුම්වත් කිරීමේ වැඩසටහන්: 2023 වසර පුරාවට උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය විසින් ආතතිය, කාංසාව, මානසික අවපීඩනය සහ මානසික යහපැවැත්ම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් රාශියක් පවත්වන ලදි. මෙම වැඩසටහන් පීඨ, නේවාසික ශාලාවල දී සහ නවක සිසුන් සඳහා දිශානති වැඩසටහන් පැවැති ස්ථාන ඇතුලු විවිධ ස්ථානවල පවත්වන ලදි. මීට අමතර ව, උපදේශකයින්, ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය උපදේශකයින් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා උපදේශනය, ධාරිතා වර්ධනය සහ සිසුන් හඳුනා ගැනීම සහ උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය වෙත යොමු කිරීම පිළිබඳ වැඩමුළු සංවිධානය කරන ලදි.

තොරතුරු හුවමාරුව: දැනුම සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය විසින් මනෝවිද්‍යාත්මක ගැටලු පිළිබඳ මාර්ගෝපදේශ, අත්පොත්, ප්‍රචාරක පත්‍රිකා සහ අධ්‍යාපනික වීඩියෝ විශ්වවිද්‍යාල සිසුන් අතර සහ පවතින උපකාරක සේවා අතර බෙදා හරින ලදි. මෙම ද්‍රව්‍ය සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර දැනුම්වත්භාවය වැඩි කිරීම සහ උපකාර සොයා යාම පිළිබඳ හැසිරීම් ප්‍රවර්ධනය කිරීම අරමුණු කර ගෙන බෙදා හරිනු ලැබ ඇත.

ප්‍රධාන ජයග්‍රහණ: 2023 වර්ෂයේ දී උපදේශන සහ මනෝවිද්‍යාත්මක ආධාරක ඒකකය සිසුන් 72කට අධික සංඛ්‍යාවක සියදිවි නසාගැනීමේ උත්සාහයන් වැළැක්වීමට කටයුතු කිරීම මගින් දැඩි අවදානම් තත්ත්වයන් සඳහා සාර්ථක ව මැදිහත් විය. මෙම ඒකකය මානසික සෞඛ්‍යය සම්බන්ධයෙන් ස්වයං-ඇගයීමේ මෙවලම් ද හඳුන්වා දුන් අතර අවශ්‍යතා ඇති සිසුන් අධීක්ෂණය කිරීම පිණිස සහ ඔවුන්ට සහාය වීම සඳහා එක් එක් පීඨය සඳහා ඉහළ අවදානම් තත්ත්වවල සිටින සිසුන් ඇතුළත් ශිෂ්‍ය ලේඛනයක් ස්ථාපිත කරන ලදි.

අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් පිහිටුවීම: පූර්ණ සුවය නොලැබූ සිසුන්ට පහසුකම් සැලසීම සඳහා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ දී අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් පිහිටුවීම විශ්වවිද්‍යාලය ලැබූ සැලකිය යුතු ජයග්‍රහණයක් විය. මෙම පහසුකම මගින් අඛණ්ඩ සහාය අවශ්‍ය සිසුන් සඳහා තාවකාලික නිවාස, උපදේශන සේවා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සපයයි.

1.4.6.4 අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය

විශ්වවිද්‍යාල පද්ධතියේ වෘත්තීය සමිති විසින් කරන ලද ඉල්ලීමකට අනුව සේවකයන් සඳහා අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමැතිය ලබා දී ඇත. පාලක සභාවේ 483 වැනි රැස්වීමේ දී අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම තහවුරු කර එයට අනුමැතිය ලබාදෙන ලදි. 2023 වර්ෂය වන විට මෙම යෝජනා ක්‍රමයට සාමාජිකයන් 2092ක් ලියාපදිංචි වී ඇති අතර එම වසරේ දී නව සාමාජිකයන් 61 දෙනෙකු එක් විය.

2023දී ප්‍රධාන විශේෂ අවස්ථා

- **සාමාජිකත්වය:** සාමාජිකයන් 2092ක් ලියාපදිංචි කර ඇත. නව සාමාජිකයන් 61 දෙනෙකු සම්බන්ධ විය.
- **2023දී ඉදිරිපත් කළ ප්‍රතිලාභ ඉල්ලීම් ගණන:** 387
- **දත්ත සමුදාය සංවර්ධනය:** රක්ෂණ ආශ්‍රිත ක්‍රියාවලීන් කළමනාකරණය කිරීමේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කරමින් අග්‍රහාර රක්ෂණ ගෙවීම් පද්ධතිය සඳහා දත්ත සමුදායක් සකස් කර ඇත.

1.4.6.5 ශාරීරික අධ්‍යාපනය

සිසුන්ගේ කායික හා මානසික යහපැවැත්ම වැඩි දියුණු කිරීමට ප්‍රයත්න දරණ ශාරීරික අධ්‍යාපන අංශය විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පිළිබඳ පාලන අධිකාරිය ලෙස ක්‍රියා කරයි. එය ජීවිත කාලය පුරාම බලපාන ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා සහාය වේ. අධ්‍යයනාංශයේ මූලික කාර්යභාරයට උපාධි අපේක්ෂකයන් සඳහා අභ්‍යන්තර ක්‍රීඩා සහ විනෝදාත්මක ඉසව් සංවිධානය කිරීම සහ එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, බාහිර ආයතන විසින් සංවිධානය කරනු ලබන තරගකාරී ක්‍රීඩා සඳහා සහභාගීවීමට පහසුකම් සැලසීම සහ ක්‍රීඩා ප්‍රවර්ධනය, සහ වරින් වර ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ වැඩමුළු සහ දේශන පැවැත්වීම යන කටයුතු ඇතුළත් වේ.

අධ්‍යයන සංවර්ධනය

අඛණ්ඩ අධ්‍යාපනය සහ වෘත්තීය සංවර්ධනය

- **ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව:** ශාරීරික අධ්‍යාපන අංශය විසින් වෛද්‍ය පීඨය සමඟ එක් ව ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යා පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථක ව පවත්වාගෙන යන ලදි. නව කණ්ඩායම 2022 ඔක්තෝබර් 22 දින ඔවුන්ගේ පාඨමාලා ආරම්භ කළේය.

- **වෙනත් වැඩසටහන් සඳහා සහාය දැක්වීම:** මෙම අංශය අධ්‍යාපනඥයන්ගේ සහ පුහුණුකරුවන්ගේ වෘත්තීය සංවර්ධනයට දායක වෙමින් වසර පුරා දේශන සහ ප්‍රායෝගික සැසි පවත්වමින් අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන සහ ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා සක්‍රීය ව සහාය දැක්වීය.

නව උපාධි වැඩසටහන

ශාරීරික අධ්‍යාපනය සඳහා අන්තර්විෂයක ප්‍රවේශයක් පිළිබිඹු කරමින් බහුවිධ පීඨ මගින් සහයෝගයෙන් යුතු ව ක්‍රීඩා සහ අභ්‍යාස විද්‍යා පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධි වැඩසටහනක් මේ වන විට සකස් වෙමින් පවතී.

ජාත්‍යන්තර සහ ජාතික නියෝජනය

- **ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා සම්මේලනයේ ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙල:** චීනයේ පැවති ජාත්‍යන්තර විශ්වවිද්‍යාල ක්‍රීඩා සම්මේලනය මගින් සංවිධානය කරන ලෝක විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලේ දී ශිෂ්‍යයෙක් පිහිනුම් (පිරිමි) ඉසව්ව සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කළේ ය.
- **ජාතික කාන්තා බේස්බෝල් කණ්ඩායම:** හොංකොං හි පැවති III ආසියා බේස්බෝල් සංගමයේ කාන්තා බේස්බෝල් කුසලානයට තරග කරමින් ශිෂ්‍යාවක් ජාතික කාන්තා බේස්බෝල් කණ්ඩායමට එක් වූවාය.
- **ක්‍රියාකාරී ජාතික සහභාගීත්වය:** රන් කුසලාන සහ රිදී කුසලාන පාපන්දු තරගාවලිය, ජාතික මලල ක්‍රීඩා ශූරතා, මධ්‍යම මට්ටමේ බොක්සිං තරගාවලිය, II කොටසේ ක්‍රිකට් තරගාවලිය, මධ්‍යම පළාත් නවක මල්ලවපොර තරගාවලිය, සහ නවකයන්ගේ ජාතික බර ඉසිලීමේ තරගාවලිය ඇතුලු ජාතික තරගාවලි රාශියකට විශ්වවිද්‍යාලය සහභාගී විය.

විශ්වවිද්‍යාල තරග: 14 වන ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා තරග: විශ්වවිද්‍යාලය චෙස් (කාන්තා), කැරම් (කාන්තා) සහ හොකී (පිරිමි) ශූරතා දිනාගනිමින් 2023 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ක්‍රීඩා තරගාවලියෙහි විශිෂ්ට ප්‍රතිඵල අත්කර ගත්තේ ය. සමස්තයක් වශයෙන්, විශ්වවිද්‍යාලය කාන්තා සහ පිරිමි යන දෙඅංශයෙන් ම 5 වන ස්ථානයට පත් විය.

ශිෂ්‍ය ක්‍රීඩා සහ පිළිගැනීම

- **ටෙනිස් පිටියේ ආධිපත්‍යය:** විශ්වවිද්‍යාල ටෙනිස් කණ්ඩායම් ඒරියෝ ස්පෝට් ටෙනිස් තරගාවලියේ (පිරිමි කේවල, පිරිමි යුගල, මිශ්‍ර යුගල) සහ මහවැලි රීච් ටෙනිස් තරගාවලිය (පිරිමි සහ කාන්තා යුගල, කේවල අනුශූරතාවය) ජයග්‍රහණය කරන ලදි.

- **මේසපන්දු ජයග්‍රහණ:** ඩීඑස්ආර් අයිලප්පෙරුම අනුස්මරණ මධ්‍යම පළාත් විවෘත ශ්‍රේණිගත කිරීමේ මේසපන්දු ශූරතාවලියේ විවෘත කාන්තා කේවල සහ විවෘත පිරිමි කේවල ඉසව්වල ජයග්‍රහණ ලබා ගැනීම.

- **කරාතේ පදක්කම්:** ජාතික ක්‍රීඩා උළෙලේ දී පිරිමි ක්‍රීඩකයෙක් තනි පුද්ගල සහ කණ්ඩායම් කරාතේ ඉසව් වලින් ලෝකඩ පදක්කම් දෙකක් ලබා ගත් අතර, කුමිතේ ඉසව්වෙන් ක්‍රීඩිකාවන් ලෝකඩ පදක්කමක් දිනාගත්තාය.
- **කැරම් ජයග්‍රහණ:** ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ කාන්තා යුගල ඉසව්වේ රිදී පදක්කම දිනා ගැනීම.

- **වර්ණ ප්‍රදානෝත්සවය:** විවිධ තරගවල දී දැක් වූ විශිෂ්ට ජයග්‍රහණ ඇගයීමට ලක් කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 148 දෙනෙකුට පූර්ණ වර්ණ හිමි වූ අතර 118 දෙනෙකුට අර්ධ වර්ණ හිමි විය.

ශිෂ්‍ය සුවතාවය ප්‍රවර්ධනය කිරීම

නවකයන් සඳහා සුවතා වැඩසටහන: ශාරීරික ක්‍රියාකාරකම්වල යෙදීමට, දක්ෂතා හඳුනා ගැනීමට සහ විශ්වවිද්‍යාල ක්‍රීඩා කණ්ඩායම් සඳහා බඳවා ගැනීමට නවක සිසුන් දිරිමත් කිරීමේ වැඩසටහනක් ශාරීරික අධ්‍යාපන අංශය විසින් පවත්වන ලදි.

අධ්‍යාපනික ක්‍රියාකාරකම්

- **ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා පුහුණුව:** පුහුණු වැඩසටහන් පැවැත්වීම, පුහුණු කටයුතු දිරිමත් කිරීම සහ යෝග්‍යතා වැඩසටහන් පැවැත්වීම.
- **සම්මානිත නොවන විෂයයන්:** උපාධි අපේක්ෂකයන් සඳහා ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපනයට අදාළ සම්මානිත නොවන විෂයයන් හඳුන්වාදීම ගවේෂණය කිරීම.

1.4.6.6 ශිෂ්‍ය සුබසාධනය

පේරාදෙණිය විශ්වවිද්‍යාලය තම ශිෂ්‍ය ප්‍රජාවගේ මූල්‍යමය සහ සමාජීය යහපැවැත්ම සහතික කිරීම උදෙසා කැප වී කටයුතු කරයි. 2023 වර්ෂයේ දී ශිෂ්‍ය සුබසාධනය ඉලක්ක කරගත් ක්‍රියාකාරකම් සහ වැඩසටහන් කිහිපයක් සාර්ථක ව ක්‍රියාත්මක කරන ලද අතර, එමගින් සිසුන්ට සහාය දැක්වීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කැපවීම පිළිබිඹු විය.

මූල්‍යමය ආධාර

මහපොළ සහ ශිෂ්‍යාධාර: සිසුන් 7,278 දෙනෙකු මහපොළ ශිෂ්‍යත්ව සහ සිසුන් 819 දෙනෙකු ශිෂ්‍යාධාර ප්‍රතිලාභ ලබා ගත් අතර මෙ මගින් මූල්‍ය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ කැපවීම පෙන්නුම් කරයි.

ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර: වරප්‍රසාද නොලත් සහ සුදුසුකම් ලත් සිසුන් සඳහා විවිධ ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර පිරිනමනු ලැබේ.

- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරී ශිෂ්‍ය ආධාර වැඩසටහන: මුල දී සිසුන් 55-70 දෙනෙකුට එමගින් සහාය ලබා දුන් අතර, පසුව එය සිසුන් 45-60 දක්වා ව්‍යාප්ත විය.
- රාජිත කාරියවසම් ශිෂ්‍යත්වය: මෙහි මාසික දීමනාව වැඩි කළ අතර අතිරේක සිසුන් 15 දෙනෙකු දක්වා පුළුල් කර ඇත.
- ටෙනිසන් සහ විනීතා ශිෂ්‍යත්වය: මෙමගින් සිසුන් 10 දෙනෙකුට සහ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් 3 දෙනෙකුට මසකට රුපියල් 10,1000ක් පිරිනමනු ලබයි.
- Mosvold Martinus පදනමේ ශිෂ්‍යත්වය: අඩු වරප්‍රසාද ලත් සිසුන් 75 දෙනෙකු සඳහා 2023 නොවැම්බර් සිට 2024 මාර්තු දක්වා මාසික ව 10,000ක් පිරිනමන ලදි.
- ලෙස්ලි ගුණවර්ධන ශිෂ්‍යත්වය: මෙමගින් රුපියල් මිලියන 200ක මුළු තැන්පතුවක් සහිත ව පීඨ 8ක සිසුන් 42 දෙනෙකුට ප්‍රතිලාභ ලබා දෙන ලදි.
- පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ නවසීලන්ත ශාඛාවේ අනුග්‍රහය: මෙ මගින් සිසුන් 33 දෙනෙකු සඳහා මාස හයකට මසකට 3,000ක් බැගින් ලබා දෙන ලදි.
- විශ්වවිද්‍යාල ශිෂ්‍යත්වය: මෙමගින් පළමු වසරේ සිසුන් 150 දෙනෙකුට මහපොළ ශිෂ්‍යත්වය ලැබෙන තුරු මසකට රුපියල් 3,000ක ආධාරයක් පිරිනමන ලදි.

උපකාරක පරිසරයක් නිර්මාණය කිරීම

- ශිෂ්‍ය සංගමය සහ සමිති: සියලුම පීඨ තම ශිෂ්‍ය සංගම් තෝරා පත් කර ගත් අතර, ශිෂ්‍ය ක්‍රියාකාරකම් වර්ධනය කරමින් සංගම් සහ සමාජ 102ක් ලියාපදිංචි කරන ලදි.
- සැලකිය යුතු අන්දමේ බඳවා ගැනීම්: ක්‍රියාකාරී ශිෂ්‍ය ආධාර වැඩසටහන මගින් සිසුන් 133 දෙනෙකුට (97ක් ඉංජිනේරු නොවන සහ 36ක් ඉංජිනේරු) අර්ධකාලීන රැකියා ලබා දෙන ලදි.

වෙනත් ශිෂ්‍ය සුබසාධන වැඩසටහන්

- සිසුන්ගේ ප්‍රවාහන පහසුකම් සඳහා සහනදායී වාර ප්‍රවේශපත්‍ර ලබා දීම.
- භාවිත කරන ලද ලැප්ටොප් පරිගණක සිසුන්ට බෙදා හැරීමට පහසුකම් සැලසීම
- විශ්වවිද්‍යාල වැඩසටහන්වලට සහභාගී වීම ඉහළ නැංවීම
- සිසුන් සහ පරිපාලනය අතර විශ්වාසය තහවුරු කිරීම.

1.4.6.7 ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය

විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය එහි ශිෂ්‍ය ප්‍රජාවගේ සමස්ත යහපැවැත්ම සහ සාර්ථකත්වය සහතික කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මාර්ගෝපදේශයන්ට අනුකූල ව පිහිටුවන ලද ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය මූලික කාණ්ඩ හයක් ඔස්සේ ක්‍රියා කරයි:

- විනෝදාත්මක සහ ක්‍රීඩා පහසුකම් ඇතුළු ව පහසුකම් සහ සේවා
- රෝග නිවාරණ සෞඛ්‍ය සේවා
- සමාජ, සංස්කෘතික, නිර්මාණාත්මක සහ සෞන්දර්යාත්මක කටයුතු සඳහා පහසුකම්
- මානසික සෞඛ්‍ය සහාය සහ උපදේශන සේවා ඇතුළත් සිසුන්ගේ යහපැවැත්ම සහතික කිරීම
- සිසුන්ගේ ගැටලු විසඳීම සඳහා දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ උපදේශන ක්‍රමවේද
- ආරක්ෂිත සහ හිතකර ඉගෙනුම් පරිසරයක් පවත්වා ගැනීම සඳහා ආරක්ෂක සහ විනය පියවර

2023 වර්ෂයේ ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතියේ ක්‍රියාකාරකම්

2023 වසර පුරාවට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ආධාර සේවා සහ සුබසාධන පද්ධතිය සිසුන්ට උපකාර කිරීමේ බහුවිධ කාර්යභාරය ඉටුකිරීමේ අරමුණින් විවිධ මූල ක්‍රියාකාරකම් සහ වැඩසටහන් දියත් කරන ලදි. එසේ සිදු කරන ලද ඇතැම් ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

නවාතැන් පහසුකම් වැඩි දියුණු කිරීම: නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය කිරීම සහ ගෘහ භාණ්ඩ සැපයීම, නව නේවාසික පහසුකම් සඳහා සැලසුම් ආරම්භ කිරීම සහ සිසුන් සඳහා දැරිය හැකි මට්ටමේ නවාතැන් විකල්පයන් ලබාදීමට අඛණ්ඩ ව කටයුතු කිරීම.

ආපනශාලා සේවා: ආපනශාලාවල මිල සංශෝධන කිරීම සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, සිසුන් සඳහා දැරිය හැකි අත්‍යවශ්‍ය ආහාර ඇසුරුම් සැපයුම සහතික කිරීම සහ ආපනශාලා හිමියන්ට අවශ්‍ය සහාය ලබා දීම.

සෞඛ්‍ය සහ උපදේශන සේවා: එන්නත් සහ හදිසි ප්‍රතිකාර ඇතුළු ව විස්තීර්ණ වෛද්‍ය සේවා සැපයීම, මනෝවිද්‍යාත්මක සහාය සහ උපදේශනය සඳහා උපදේශන සහ මනෝවිද්‍යාත්මක උපකාරක ඒකකය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සහ අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් පිහිටුවීම.

මූල්‍ය ආධාර සහ ශිෂ්‍යත්ව: විවිධ මූල්‍ය ආධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ශිෂ්‍යත්ව පිරිනැමීම, අයදුම් කිරීමේ ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ විවිධ පසුබිම්වල සිසුන්ට උපකාර කිරීම සඳහා බාහිර ශිෂ්‍යත්ව ලබා ගැනීම.

ශිෂ්‍ය සමාජ සහ සංවිධාන: පරිපූර්ණ ශිෂ්‍ය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ අධ්‍යයන ආතතිය සමනය කිරීම සඳහා සංස්කෘතික, ක්‍රීඩා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍ය සමාජ සහ සංවිධානවල ක්‍රියාකාරී සහභාගීත්වය දිරිමත් කිරීම.

ශාරීරික අධ්‍යාපන අංශය: සිසුන් අතර ශාරීරික යෝග්‍යතාව සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර් විශ්වවිද්‍යාල ශූරතා සංවිධානය කිරීම, බාහිර පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ කායවර්ධන ව්‍යායාම ශාලාව සහ පිහිනුම් තටාක පහසුකම් සඳහා පවතින ප්‍රවේශ වේලාවන් දීර්ඝ කිරීම.

1.4.7 මූල්‍ය සහ ගිණුම්කරණය

නිසැකයෙන් ම ආර්ථික දුෂ්කරතා විශ්වවිද්‍යාල ක්‍රියාකාරකම්වල සැම අංශයක් කෙරෙහි ම බලපා ඇත. වියදම් සහ නාස්තිය අවම කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ ද මූල්‍ය අභියෝග තවදුරටත් තීව්‍ර කරමින් විශ්වවිද්‍යාලයට ගාස්තු හා මිල වැඩිවීම්වලට මුහුණදීමට සිදු වී තිබේ. එසේ වුව ද, ශිෂ්‍ය සුබසාධනය, ක්‍රීඩා පහසුකම් වැඩි දියුණු කිරීම, නේවාසිකාගාර ප්‍රතිසංස්කරණය, ආපනශාලා පහසුකම් වැඩි දියුණු කිරීම සහ ශිෂ්‍යත්ව ලබා දීම සඳහා අපගේ කැපවීම අපි තරයේ අඛණ්ඩ ව පවත්වාගෙන ගියෙමු.

ආදායම

ආදායම් වර්ගය	2023 රු.
හුවමාරු නොවන ගනුදෙණුවලින් මුළු ආදායම - ජංගම	9,021,339,827.50
හුවමාරු ගනුදෙණුවලින් මුළු ආදායම - ජංගම	687,371,655.09
මුළු ආදායම-ජංගම	**9,708,711,482.59**
මුළු ආදායම-ප්‍රාග්ධන	**1,111,871,157.52**
මුළු ආදායම	**10,820,582,640.11**

වියදම

වියදම් වර්ගය	2023 රු.
මුළු වියදම් (ප්‍රාග්ධන ස්වභාවයේ නොවන)	9,558,972,511.32
මුළු මෙහෙයුම් නොවන වියදම්	1,604,156,417.32
මුළු වියදම්	**11,163,128,928.64**

2023 වර්ෂයේ එක් සිසුවෙකු සඳහා වන පිරිවැය පහත වගුවේ සාරාංශ කර දැක්වේ.

මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය - එක් ශිෂ්‍යයෙකු සඳහා මෙහෙයුම් වියදම්

වර්ෂය	ශිෂ්‍යයන් සංඛ්‍යාව	ක්ෂයවීම් සහිත ව එක් ශිෂ්‍යයෙකු සඳහා වන පිරිවැය රු.	ක්ෂයවීම් රහිත ව එක් ශිෂ්‍යයෙකු සඳහා වන පිරිවැය රු.	එක් ශිෂ්‍යයෙකු සඳහා පුනරාවර්තන ප්‍රදානය රු.
2023	14181	789,695	676,215	564,162
2022	13731	742,977	664,791	567,329
2021	12265	754,952	674,678	614,024
2020	11280	876,716	767,947	653,546
2019	10951	939,547	837,555	632,523
2018	12756	609,450	531,352	419,686

පීඨය	ශිෂ්‍ය සංඛ්‍යාව	එක් සිසුවෙකු සඳහා පිරිවැය (ක්ෂයවීම් සහිත මෙහෙයුම් වියදම්)	එකතුව (ක්ෂයවීම් සහිත මෙහෙයුම් වියදම්)	එක් සිසුවෙකු සඳහා පිරිවැය (ක්ෂයවීම් රහිත මෙහෙයුම් වියදම්)	එකතුව (ක්ෂයවීම් රහිත මෙහෙයුම් වියදම්)
කෘෂි විද්‍යා	1465	919,086.84	1,346,462,215.65	805,966.72	1,180,741,240.31
සම සෞඛ්‍ය	843	798,729.20	673,328,713.61	685,609.08	577,968,452.72
ශාස්ත්‍ර	4557	595,147.30	2,712,086,237.16	482,027.18	2,196,597,851.74
දන්ත වෛද්‍ය	502	1,405,315.75	705,468,506.42	1,292,195.63	648,682,206.33
ඉංජිනේරු	1796	874,449.63	1,570,511,536.05	761,329.51	1,367,347,801.09
කළමනාකරණ	681	668,933.82	455,543,930.30	555,813.70	378,509,128.79
වෛද්‍ය	1372	1,046,941.85	1,436,404,216.54	933,821.73	1,281,203,412.33
විද්‍යා	2513	668,167.54	1,679,105,036.63	555,047.42	1,394,834,175.85
පශු වෛද්‍ය විද්‍යා	452	1,111,204.94	502,264,631.48	998,084.82	451,134,337.38

අරමුදල් වෙන් කිරීම, භාවිතය සහ කළමනාකරණය

2023 වර්ෂය සඳහා රජයේ ප්‍රදානය ලෙස විශ්වවිද්‍යාලයට ලැබුණු ප්‍රතිපාදන රුපියල් මිලියන 8500ක් වූ අතර එම වර්ෂය සඳහා ලැබුණු මුළු රාජ්‍ය ප්‍රදාන ප්‍රයෝජනයට ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය.

ප්‍රාග්ධන ආයෝජන

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට එහි භෞතික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් ලැබී ඇත. අධ්‍යයන වැඩසටහන් පුළුල් කිරීමට සමගාමී ව වර්ෂයේ දී ඇරඹි නව ඉදිකිරීම් ව්‍යාපෘති සහ දැනට ක්‍රියාත්මක ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත වගු මගින් දැක්වේ.

2023 වර්ෂය සඳහා මුළු ප්‍රාග්ධන ආයෝජනය පහත පරිදි වේ.

ඉදිකිරීම් සඳහා රුපියල් මිලියන 287.4යි
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රුපියල් මිලියන 91.4යි
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1.2යි
පර්යේෂණ දිරිගැන්වීම සඳහා රුපියල් මිලියන 64.9යි
ස්ථාවර වත්කම් සඳහා රුපියල් මිලියන 328.4යි

අතිරේක මූල්‍ය ක්‍රියාකාරකම්

පවත්නා විශ්වවිද්‍යාල නිල නිවාසවල තක්සේරුව

විශ්වවිද්‍යාල නිල නිවාස සඳහා කුලී ගාස්තු සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී (COPE) මතු වූ කාරණාවලට ප්‍රතිචාර වශයෙන් විශ්වවිද්‍යාලය තක්සේරු දෙපාර්තමේන්තුව සමඟ එක්ව පුළුල් ඇගයීම් ක්‍රියාදාමයක් ආරම්භ කළේ ය. 2023 වසර වන විට වෙළඳපල මිලගණන් සමඟ ගැළපෙන පරිදි සාධාරණ සහ යෝග්‍ය කුලී ගාස්තු අයකිරීම තහවුරුකර ගැනීම අරමුණු කරගනිමින් තක්සේරු කිරීමේ ක්‍රියාවලියෙන් 50%ක් සම්පූර්ණ කර ඇත.

විශ්වවිද්‍යාල ආගන්තුක නිවාස කළමනාකරණය සහ පීඨ සමාජ කළමනාකරණය බාහිර සේවා මගින් ලබා ගැනීම

විශ්වවිද්‍යාල පරිපාලනය විසින් තිරසාර කළමනාකරණ පිළිවෙත්වල වැදගත්කම හඳුනා ගනිමින් විශ්වවිද්‍යාල ආගන්තුක නිවාස සහ පීඨ සමාජයේ කළමනාකාරීත්වය බාහිරින් ලබා දීමට තීරණය කර ඇත. මෙම වගකීම බාර ගැනීම සඳහා බාහිර පාර්ශ්වයන්ගෙන් අභිප්‍රාය ප්‍රකාශ කිරීම් ඉල්ලුම් කර ඇත. මෙම ප්‍රයත්නයේ මූලික පරමාර්ථය ආගන්තුක නිවාස මෙහෙයුම්වලින් ආදායම් උත්පාදනය වැඩි දියුණු කර එමගින් මෙම පහසුකම්වල මූල්‍ය තිරසාරභාවයට දායක වීමයි.

බාහිර පාර්ශ්වයන්ගෙන් පිරිසිදු කිරීමේ සේවා ලබා ගැනීම නතර කිරීම

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (කෝප් කමිටුවේ) නියෝග අනුව 2023 දෙසැම්බර් 31 සිට ක්‍රියාත්මක වන පරිදි විශ්වවිද්‍යාලය පෞද්ගලික පාර්ශ්වවලින් පිරිසිදු කිරීමේ සේවා ලබා ගැනීම නවතා දමා ඇත. ඉන් අනතුරු ව විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය යොදා ගනිමින් අභ්‍යන්තර ව සාමාන්‍ය පිරිසිදු කිරීමේ සේවා පවත්වාගෙන යාමට විශ්වවිද්‍යාලය තීරණය කර ඇත. මෙම තීරණය සපයනු ලබන සේවාවන්හි ගුණාත්මකභාවය පවත්වා ගනිමින් මෙහෙයුම් පිරිවැය ප්‍රශස්ත කිරීමට දරන ප්‍රයත්නයන් හා අනුකූල වේ.

1.4.8 යටිතල පහසුකම් සංවර්ධනය සහ නව ස්ථාපිත කිරීම්

- **නව ස්ථාපිත කිරීම්**

  - **මානව සම්පත් සංවර්ධන ඒකකය (HRDU)**

2023 වර්ෂයේ ජූලි මස ආරම්භ කරන ලද මානව සම්පත් සංවර්ධන ඒකකය ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාල පද්ධතියේ ස්ථාපිත වූ එවැනි පළමු ආයතනය බවට සනිටුහන් වන අතර, එය මානව සම්පත් කළමනාකරණ සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මධ්‍යම පරිපාලනයේ උපාය මාර්ගික ඒකකයක් ලෙස කටයුතු කරයි.

  - **වෛද්‍ය ප්‍රතිරූපණ මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීම**

වෛද්‍ය ප්‍රතිරූපණ මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීමේ උත්සවය 2023 ජනවාරි 5 වැනි දින පැවැත්විණි. විවිධ පීඨවල අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධ කර ගනිමින් ප්‍රශස්ත රෝගී සත්කාර සේවාවක් සහිතව අති නවීන X-ray පහසුකම් එමගින් ලබා දෙයි.

  - **කෘෂි විද්‍යා පීඨයේ වාහන නඩත්තු මධ්‍යස්ථානය**

කෘෂි විද්‍යා පීඨයට සහාය වීම සඳහා වාහන නඩත්තු මධ්‍යස්ථානයක් පිහිටුවීමට කටයුතු සිදුකෙරෙමින් පවතී.

  - **ඉලෙක්ට්‍රොනික වැඩහල පුළුල් කිරීම**

ඉලෙක්ට්‍රොනික වැඩහල විශ්වවිද්‍යාලයේ ඉලෙක්ට්‍රොනික අලුත්වැඩියා සහ සේවා මධ්‍යස්ථානය ලෙස සේවය කිරීම සඳහා පුළුල් කරනු ලැබේ.

  - **ඉන්දියානු කෝනර් ඒකකය විවෘත කිරීමේ උත්සවය**

ප්‍රධාන පුස්තකාලයේ ඉන්දියානු කෝනර් ඒකකය 2023 දෙසැම්බර් 7වන දින විවෘත කරන ලදි.

  - **පේරා සමරුඵලක වෙළඳසැල විවෘත කිරීම**

පේරා සමරුඵලක අලෙවිසැල විවෘත කිරීමේ උත්සවය 2023 පෙබරවාරි 23වන දින පේරාදෙණිය ආදි ශිෂ්‍ය සංගමයේ ගැටඹේ පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සංකල්ප වෙළඳ පරිශ්‍රයේ දී පැවැත්විණි.

  - **අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් පිහිටුවීම**

සෞඛ්‍ය මධ්‍යස්ථානය තුළ අතරමැදි සත්කාර මධ්‍යස්ථානයක් පිහිටුවීම 2023 වර්ෂයේ දී ලද සැලකිය යුතු ජයග්‍රහණයක් විය. 2023 අප්‍රේල් 20 වන දින ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය අඛණ්ඩ ව සහාය අවශ්‍ය සිසුන් සඳහා තාවකාලික නිවාස, උපදේශන සේවා සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් සපයයි.

- **පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මායිම් යළි විවෘත කිරීම**

කෝප් කමිටුවෙහි (පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාව) උපදෙස් අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මායිම් නැවත විවෘත කිරීම ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සහයෝගිතාවයෙන් 2023දී අවසන් කරන ලදි. විශ්වවිද්‍යාල ඉඩම්වල තිරසාර කළමනාකරණය සඳහා අදාළ වන සවිස්තරාත්මක සිතියමක් ඔවුන් භාර දී ඇත.

- **පවත්නා විශ්වවිද්‍යාල නිල නිවාස තක්සේරු කිරීම**

නිල නිවාසවල පදිංචි සේවකයන්ගෙන් දැනට අයකරනු ලබන කුලී ගාස්තු සාපේක්ෂ ව අඩු අගයක් වන බව කෝප් කමිටුවේ දී (පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාව) අවධානයට ලක් විය. එබැවින් විශ්වවිද්‍යාල නිල නිවාස තක්සේරු දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව නැවත තක්සේරු කිරීමට උපදෙස් දෙන ලදි. 2023 වර්ෂයේ දී තක්සේරු කිරීමේ කටයුතුවලින් 50% සම්පූර්ණ කරන ලදි.

- **විශ්වවිද්‍යාලයේ ජාල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ආරම්භ කිරීම**

සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ අධ්‍යයන කටයුතු දියුණු කිරීමට උපකාරී වන යටිතල පහසුකම් පුළුල් කිරීමට විශ්වවිද්‍යාලය පියවර ගෙන ඇත. 2023 වර්ෂයේ දී පිරිවැය රුපියල් මිලියන 65ක් වූ ජාලකරණ ව්‍යාපෘති අටක් ආරම්භ කර ඇත. එම ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

කොන්ත්‍රාත්තුවේ නම	පිරිනැමූ මුදල (වැට් බද්ද රහිත ව) රු.
සනාතන සභා ගොඩනැගිල්ල සහ උපකුලපති නිල නිවාසය සඳහා Wi-Fi පහසුකම සැපයීම	7,911,245.87
භූ දර්ශන අංශයට අන්තර්ජාල සම්බන්ධතාව ලබා දීම	98,500.00
ආරක්ෂක අංශය සඳහා ජාල පහසුකම් වැඩිදියුණු කිරීම	992,350.00
කෘෂි විද්‍යා පීඨයේ බෝග විද්‍යා අධ්‍යයනාංශයේ ජාලකරණ කටයුතු	5,800,252.44
කෘෂි විද්‍යා ආර්ථික හා ව්‍යාපාර කළමනාකරණ අධ්‍යයනාංශ ගොඩනැගිල්ලට ජාල පද්ධතිය ස්ථාපනය කිරීම	5,054,737.25
සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	11,608,397.00
කළමනාකරණ පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	2,446,126.00
පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම	31,519,201.00

- **යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති**

ව්‍යාපෘති අවසන් කිරීම්

- භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ පුළුල්කිරීම් සැලසුම් කිරීම සහ ඉදිකිරීම (වටිනාකම: රු. 87,590,000.00)
- වෛද්‍ය පීඨයේ සර්වර් කාමරය වැඩි දියුණු කිරීම (වටිනාකම: රු. 8,136,540.00)
- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ පුළුල්කිරීමේ ඉතිරි කටයුතු (වටිනාකම: රු. 8,136,540.00)

ප්‍රදානය කරන ලද ව්‍යාපෘති

පහත දැක්වෙන වැදගත් ව්‍යාපෘති හයක් සඳහා කොන්ත්‍රාත්තු 2023 වර්ෂයේ දී ප්‍රදානය කරන ලදි.

- සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ පුළුල්කිරීමේ ඉතිරි කටයුතු
- වෛද්‍ය පීඨයේ පූර්ව සායනික ගොඩනැගිල්ලේ වහළය ප්‍රතිසංස්කරණය කිරීම
- සම සෞඛ්‍ය විද්‍යා ප්‍රධාන ගොඩනැඟිල්ල පුළුල් කිරීම
- ගොවිපල සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නව ශ්‍රවණාගාරය සඳහා දැව පීඨිකාව ඉදිකිරීම
- මහඉලුප්පල්ලම උපමණ්ඩපයේ ජල ටැංකි කුළුණ ඉදිකිරීම
- වෛද්‍ය පීඨයේ සර්වර් කාමරය වැඩිදියුණු කිරීම

1.4.9 ප්‍රජා සහභාගීත්ව සහ පරිසර වැඩසටහන්

විවෘත දිනය සහ සමාරම්භක දින සැමරුම්

පේරාදෙණිය විශ්වවිද්‍යාලය සිය 80 වැනි සංවත්සරය 2023 ජූලි 1 වැනි දින සාර්ථක විවෘත දිනයක් සමගින් සමරන ලදි. මෙම අවස්ථාවට විශාල පිරිසක් සහභාගී වූ අතර ඔවුන්ට විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන්, පහසුකම් සහ ශිෂ්‍ය ජීවිතය පිළිබඳ අවබෝධයක් මෙහි දී ලබා දෙන ලදි. මාර්ගෝපදේශ සංචාර, ප්‍රදර්ශන, සංස්කෘතික ප්‍රසංග සහ සම්මාන ප්‍රදානෝත්සවයන් විශ්වවිද්‍යාලයේ පොහොසත් උරුමය ප්‍රකට කළ අතර සහ විශිෂ්ටත්වය සඳහා වූ එහි කැපවීම ඉස්මතු කළේ ය.

විසල් මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සහයෝගීතාව පවත්වා ගැනීම

විසල් මහනුවර නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා විශ්වවිද්‍යාලය නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සමඟ එක්ව ක්‍රියා කිරීම මගින් මහනුවර නගරය පුළුල් කිරීම හා සංවර්ධනය කිරීම සඳහා දායක වීමට අපට හැකි වී තිබේ. ප්‍රජා සහභාගීත්වය සහ ප්‍රදේශීය සංවර්ධනය සඳහා අපගේ කැපවීම පිළිබිඹු කරමින් විශ්වවිද්‍යාලය විසින් අපේක්ෂා කරන ලද ඇතැම් පුළුල් කිරීමේ ව්‍යාපෘති නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම්වලට ඇතුළත් කර ඇත.

මාගේ දේශය අවදි කරනු මැන ශිෂ්‍ය සාහිත්‍ය උළෙල - 2023

පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම් සාහිත්‍ය අනුකමිටුව විසින් 2023 ජූලි 21 සිට සැප්තැම්බර් 23 දක්වා 28 වැනි "මාගේ දේශය අවදි කරනු මැන" ශිෂ්‍ය සාහිත්‍ය උළෙල සංවිධානය කරන ලදි. මෙම උත්සවයේ දී විවිධ තරග, වැඩමුළු සහ සංස්කෘතික උත්සව ඔස්සේ සිසුන්ගේ නිර්මාණාත්මක කුසලතා ප්‍රදර්ශනය කරන ලද අතර කලාත්මක ප්‍රකාශනය පෝෂණය කිරීමෙහිලා විශ්වවිද්‍යාලයේ කැපවීම තවදුරටත් ශක්තිමත් කරන ලදි.

සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනය සහ බෞද්ධ භික්ෂූන් වහන්සේ 80 නමක් උදෙසා දානමය පිංකමක් පැවැත්වීම

විශ්වවිද්‍යාල බෞද්ධ සංගමය, බහු සංස්කෘතික විශ්වවිද්‍යාල ප්‍රජාව සමඟ සහයෝගයෙන් යුතුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 80 වැනි සංවත්සරය 2023 ජනවාරි 13 සහ 14 යන දිනවල සමරන ලදි. ගරුතර සංඝරත්නය විසින් සිදු කරන ලද සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනාවෙන් අනතුරු ව භික්ෂූන් වහන්සේ 80 නමක් උදෙසා දානමය පිංකමක් පැවැත්වීම ද මෙම අවස්ථාවට ඇතුළත් විය. විශ්වවිද්‍යාල ප්‍රභූවරුන්, පරිපාලන හා අධ්‍යයන කාර්ය මණ්ඩලය, සිසුන්, ආදි ශිෂ්‍යයන් සහ සුභ පතන්නන් මෙම අවස්ථාවට සහභාගී විය.



"පේරාදෙණියේ තිරසාරත්වය" වෙබ් අඩවිය දියත් කිරීම

අප විශ්වවිද්‍යාලයේ නව පරිච්ඡේදයක ආරම්භය සනිටුහන් කරමින් විශ්වවිද්‍යාලය විසින් එහි සමාරම්භක තිරසාර වෙබ් අඩවිය වන "පේරාදෙණියේ තිරසාරත්වය" නැමැති වෙබ් අඩවිය දියත් කරන ලදි. එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුරූප වන පරිදි සංවර්ධනය කර ඇති මෙම වෙබ් අඩවිය සිසුන්, පීඨය, කාර්ය මණ්ඩලය සහ පුළුල් ප්‍රජාව සඳහා විසල් සම්පතක් ලෙස සේවය කරයි. විශ්වවිද්‍යාලයේ ධනාත්මක වෙනසක් ඇති කිරීමට සහ නවෝත්පාදනයන් පෝෂණය කිරීමට අපගේ කැපවීම යළිත් තහවුරු කරමින් එය තිරසාර අනාගතයක් කරා පිය නඟන අපගේ ගමනේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරයි.

ස්ථාපිත දහන යන්ත්‍රය මගින් සන අපද්‍රව්‍ය දහනය කිරීමේ ක්‍රියාවලිය

දහන යන්ත්‍රය ස්ථාපනය කිරීමෙන් අනතුරු ව සන අපද්‍රව්‍ය නිසි යාන්ත්‍රණයක් මගින් බැහැර කිරීමේ අභියෝගය පේරාදෙණිය විශ්වවිද්‍යාලය ජය ගත්තේ ය. සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් මාසික ව එකතු වන සාමාන්‍ය කසළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 25,000ක් පමණ වන අතර එයට සියලු වර්ගවල අපද්‍රව්‍ය ඇතුළත් වේ. සෞඛ්‍ය මධ්‍යස්ථානය මගින් අපද්‍රව්‍ය වර්ග කිහිපයක් ප්‍රතිචක්‍රීකරණය කරන අතර ඇතැම් අපද්‍රව්‍ය බාහිර පාර්ශ්වවලට අලෙවි කෙරේ. ඉතිරි අපද්‍රව්‍ය (සායනික අපද්‍රව්‍ය, සනීපාරක්ෂක අපද්‍රව්‍ය, ප්ලාස්ටික්, ලන්ච් ෂීට්, ෂොපින් බෑග්, ආහාර දවටන) ආදිය) බැහැර කිරීම අභියෝගයක් වූ අතර මේ වන විට එම අපද්‍රව්‍ය සියල්ල පරිසර හිතකාමී ලෙස දහනය කරනු ඇත.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහවැලි ගං ඉවුර සංරක්ෂණ වැඩසටහන

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ එක්ව විශ්වවිද්‍යාලය විසින් උණ ගස් රෝපණය කිරීමේ වැඩසටහනක් 2023 ජනවාරි 20 වන දින ආරම්භ කරන ලදි. මහවැලි ගං ඉවුරු සහ එහි පරිසර පද්ධතිය සංරක්ෂණය කිරීම මෙම වැඩසටහනේ අරමුණයි. මෙහි සමාරම්භක පැළ සිටුවීමේ අවස්ථාවට විශ්වවිද්‍යාල නිලධාරීන්, පීඨ සාමාජිකයන්, සිසුන් සහ සරසවි මැදුර ශාලාවේ ප්‍රදේශවාසීහු එක්ව සිටියහ.

රීග්‍රීන් හන්තාන

මෙහි දෙවන අදියර කොමර්ෂල් බැංකුවේ හවුල්කාරිත්වයෙන් ආරම්භ කෙරේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් කොමර්ෂල් බැංකුව සහ ශ්‍රී ලංකා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් මෙහෙයවන හන්තාන නැවත වන වගා ව්‍යාපෘතියේ දෙවන අදියර ඉහළ හන්තාන පරිසර ප්‍රතිසංස්කරණ භූමියේ දී ආරම්භ විය. වසර දෙකක කාලයක දී කොමර්ෂල් බැංකුව සැලකිය යුතු ආයෝජනයක් කිරීමට පොරොන්දුවක් ලබාදුන් අතර ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය සුරැකීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

ප්‍රදේශීය පාසල් අතර පරිසරය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

ජපානයේ ටෝකියෝහි සේක්‍රඩ් හාර්ට් විශ්වවිද්‍යාලය සහ පේරාදෙණිය විශ්වවිද්‍යාලය අතර සහයෝගීතා වැඩසටහනක් මගින් මහනුවර දංගොල්ල ප්‍රදේශයේ පාසල්වල පරිසරය පිළිබඳ දැනුම්වත්භාවය ඇතිකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුණු කරයි. ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (ජයිකා) විසින් අරමුදල් සපයනු ලබන මෙම වැඩසටහන මගින් පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා හරිත තරුණ ආකෘතියක් ස්ථාපිත කිරීමට උත්සාහ කරයි.

75 වන නිදහස් දිනය සැමරීම සඳහා රුක් රෝපණය කිරීම

75 වැනි නිදහස් දිනය සහ විශ්වවිද්‍යාලයේ 80 වැනි සංවත්සරය සමරනු වස් විශ්වවිද්‍යාල භූමියෙහි ගම්පොළ සහ ගලහ මාර්ගයන්හි පැළ අසූවක් රෝපණය කරන ලදි. ඉංජිනේරු පීඨයේ පැවති මෙම අවස්ථාවට විශ්වවිද්‍යාල නිලධාරීන්, පීඨ සාමාජිකයන් සහ භූ දර්ශන අංශයේ කාර්ය මණ්ඩලය සහභාගී වී ඇත.

පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය, පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය ලෙස නැවත නම් කිරීම

පැවරී ඇති පුළුල් වූ කාර්යභාරය පිළිබිඹු කරමින් සහ පාරිසරික කළමනාකරණය සහ තිරසාර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය 2022 නොවැම්බර් මාසයේ දී පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය ලෙස නැවත නම් කරන ලදි. ඵලදායි පාරිසරික කළමනාකරණ පද්ධතියක් ක්‍රියාවට නැංවීම සඳහා විශ්වවිද්‍යාලයට සහාය වෙමින් විවිධ පාරිසරික ගැටලු සම්බන්ධයෙන් විශේෂඥ දැනුම සහ උපදේශන සැපයීම සඳහා වර්තමානයේ දී පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය

විශ්වවිද්‍යාලයේ පාරිසරික තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය (CES) 1992 වර්ෂයේ එය පිහිටුවීමේ සිට පාරිසරික භාරකාරත්වය සහ ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ කාර්යයන්හිලා පෙරමුණ ගෙන කටයුතු කරයි. බහුවිධ ප්‍රවේශ මගින් හදිසි පාරිසරික ගැටලු විසඳීමට කැපවී සිටින පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය තිරසාර භාවිතයන් වැඩි දියුණු කිරීම සහ පරිසර සංරක්ෂණය පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා විශ්වවිද්‍යාලයේ සහ ඉන් ඔබ්බට වූ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරයි.

පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය මගින් පවත්වන ලද ප්‍රජා සහභාගීත්ව සහ තිරසාර වැඩසටහන්

- ප්‍රජාවගේ පාරිසරික පවිත්‍රතා ක්‍රියාකාරකම් සඳහා දායක වීමට භූගෝලීය සංගමයේ සහ උද්භිද විද්‍යා සංගමයේ සිසුන් සම්බන්ධ කර ගනිමින් මහනුවර මහනගර සභාව විසින් සංවිධානය කරන ලද මහනුවර නගරය පිරිසිදු කිරීමේ දින වැඩසටහන සඳහා විශ්වවිද්‍යාලය සහභාගී කරවීමට පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය විසින් පහසුකම් සලසන ලදි.

- විශ්වවිද්‍යාල පරිශ්‍රයෙන් ඔබ්බට පාරිසරික තිරසාරභාවයේ වැදගත්කම අවධාරණය කරමින් මහනුවර මහ නගර සභාවේ ව්‍යාපාරිකයන් ඇතුලු ප්‍රජා සාමාජිකයන් සඳහා විධිමත් අපද්‍රව්‍ය බැහැර කිරීමේ පිළිවෙත් පිළිබඳව පුහුණු සැසි සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි.
- වෙත පාරිසරික භාරකාරත්වය පිළිබඳ හැඟීම් පෝෂණය කිරීම අරමුණු කරගෙන, ජල සම්පත් කෙරෙහි දේශගුණික විපර්යාසවල බලපෑම, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ වායු දූෂණය පිළිබඳ වැනි කාරණා පිළිබඳ සාකච්ඡා සම්මන්ත්‍රණ සහ බාහිර ක්‍රියාකාරකම් සංවිධානය කරන ලදි.

- පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය විසින් විශ්වවිද්‍යාල ප්‍රජාව ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේ දී තිරසාර භාවිතයන් අනුගමනය කිරීමට දිරිගන්වමින් සහ පාරිසරික අවධානය පිළිබඳ ආකල්ප ඔවුන් මත පෝෂණය කරමින් ලෝක පරිසර දින සැමරුම් වැඩසටහනේ දී පාරිසරික තිරසාර ප්‍රතිඥාවක් හඳුන්වා දෙන ලදි.

- ප්‍රදේශීය පාසල් හා එක්ව පාසැල් ළමුන් සඳහා දේශගුණික විපර්යාස සහ ජෛව විවිධත්වය පිළිබඳ අන්තර් පාසල් පාරිසරික දැනුම්වත් කිරීමේ තරගය සහ පුහුණු වැඩමුළු ඇතුලු සහයෝගීතා වැඩසටහන් පවත්වන ලද අතර පාරිසරික සංරක්ෂණය වෙනුවෙන් පෙනී සිටින තරුණ පරම්පරාවන් දැනුම්වත් කිරීම සහ සවිබල ගැන්වීම අරමුණු කර මෙම වැඩසටහන් පවත්වා ඇත.

- පාරිසරික තිරසාරභාවය සඳහා වූ මධ්‍යස්ථානය මගින් පරිසර පද්ධති සේවා වැඩි දියුණු කිරීම සහ ජෛව විවිධත්ව සංරක්ෂණය ප්‍රවර්ධනය කිරීම සඳහා හන්තාන පාරිසරික ආරක්ෂිත ප්‍රදේශයේ විනාශ වූ ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් "ග්‍රීන් හන්තාන" ව්‍යාපෘතිය විද්‍යා පීඨය සහ කොමර්ෂල් බැංකුව සමඟ එක්ව ආරම්භ කරන ලදි.

1.4.10 උපාය මාර්ගික සැලසුම් සහ ඇගයීම්

- **උපායමාර්ගික සැලැස්ම 2022-2026**

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2022-2026 උපාය මාර්ගික සැලැස්ම මගින් ප්‍රධාන ඉලක්ක හයක් යටතේ විශ්වවිද්‍යාලයේ අනාගත දිශානතිය කෙරෙහි අවධානය යොමු කරන ලද අරමුණු සහ ක්‍රියාකාරකම් ඉදිරිපත් කෙරේ. 2022-2026 කාලපරිච්ඡේදය සඳහා විශ්වවිද්‍යාල උපායමාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා උපකුලපතිවරයා විසින් කමිටුවක් පත් කරන ලද අතර, 2022.07.30 දින පැවති පාලක සභාවේ 518 වන රැස්වීමේ දී 2022-2026 උපායමාර්ගික සැලැස්ම අනුමත කර ඇත.

- **ක්‍රියාකාරී සැලැස්ම - 2022**

2021.12.14 දිනැති අංක 01/2021 දරන මුදල් චක්‍රලේඛ ලිපිය ප්‍රකාර ව 2023 විශ්වවිද්‍යාල ක්‍රියාකාරී සැලැස්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා පාලක සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර, 2022.12.30 දින පැවති පාලක සභාවේ 523 වැනි රැස්වීමේ දී එය තහවුරු කර ඇත.

- **සියවස් සංවර්ධන සැලැස්ම (UoP-2042) - අනාගතය සඳහා දැක්මක්**

පුළුල් ශත සංවත්සර සංවර්ධන සැලැස්මක් සංවර්ධනය කරමින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය 2042දී සිය ශත සංවත්සරය සැමරීම සඳහා ඉතා සැලකිය යුතු පියවර ගනිමින් සිටී. මෙම සැලැස්ම අනාගත වර්ධනය සහ විශිෂ්ටත්වය සඳහා දිගු කාලීන උපාය මාර්ග ගෙනහැර දක්වමින් විශ්වවිද්‍යාලයේ පවතින උපායමාර්ගික සැලැස්මට අනුපූරකයක් ලෙස යොදා ගැනීම අරමුණු කරයි.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශත සංවත්සර සංවර්ධන සැලැස්ම 2042 වර්ෂයේ දී විශ්වවිද්‍යාලයේ සමස්ත දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නිර්මාණය කරන ලද "සංකල්ප ව්‍යාපෘති" සම්මිශ්‍රණයක් ලෙස ඉදිරිපත් කර ඇති අතර එය විශ්වවිද්‍යාල ප්‍රජාවේ සාමාජිකයන් සමඟ කරන ලද පුළුල් සාකච්ඡාවක ප්‍රතිඵලයකි.

සීමිත රාජ්‍ය අරමුදල් සම්පාදනයක් මධ්‍යයේ අදාළ අභියෝගවලට මුහුණ දෙමින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍යමය වශයෙන් සහ වෙනත් ආකාරයකින් සහයෝගය දැක්වීමට හවුල්කාරිත්වයන් මගින් ජාතික හා ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ට ආරාධනා කරමින් ශත සංවත්සර සංවර්ධන සැලැස්ම කෝපි මේසයක් මත තබන පොතකට සමාන පොත් ආකෘතියකින් ඉදිරිපත් කෙරේ.

ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳ සලකා රජය විසින් ශත සංවත්සර සංවර්ධන සැලැස්ම ආරම්භ කිරීම සඳහා මූලික ආයෝජනයක් ලෙස 2024 අයවැයෙන් රුපියල් මිලියන 500ක් ලබා දී ඇත.

ශත සංවත්සර සංවර්ධන සැලැස්ම ක්‍රියාවට නැංවීමත් සමඟ පේරාදෙණිය විශ්වවිද්‍යාලය තිරසාර උසස් අධ්‍යාපන පද්ධතියක් පෝෂණය කරමින් තිරසාර සංවර්ධනය සඳහා වූ 2030 න්‍යාය පත්‍රයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කැපවී කටයුතු කරයි.

අරමුදල් ලබා දීම සඳහා ශත සංවත්සර සංවර්ධන සැලැස්මෙහි දක්වන ලද සංකල්ප ව්‍යාපෘතිය සංවර්ධන හවුල්කරුවන් මගින් පිළිගැනීමෙන් පසු පේරාදෙණිය විශ්වවිද්‍යාලය ව්‍යාපෘති සංරචකවල ඵලදායී හා කාර්යක්ෂම සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා පරිත්‍යාගශීලියා සමඟ සාකච්ඡා කර විස්තරාත්මක ව්‍යාපෘති සැලසුම්, අයිතමගත අයවැය, වාණිජ ශක්‍යතා සහ ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සංවර්ධනය කරනු ඇත.

ජාලකරණය සහ සබඳතා ගොඩ නැගීම ඔස්සේ මේ සඳහා සංවර්ධන හවුල්කරුවන්ගෙන් සහාය ලබාගැනීම පිණිස පේරාදෙණිය විශ්වවිද්‍යාලය එහි කීර්තිමත් ආදි ශිෂ්‍යයන්ගේ සහාය ද අපේක්ෂා කරයි.

2023 වර්ෂයේ දී සිදු කරන ලද ප්‍රධාන ක්‍රියා

උපායමාර්ගික සැලසුම්කරණය සහ සංවර්ධනය: 2022 ජනවාරි මාසයේ දී පාලක සභාව විසින් විෂයමාලා සංවර්ධන ප්‍රතිපත්ති සකස් කිරීමේ අවශ්‍යතාව හඳුනා ගත් අතර රජය ඒ සඳහා සිය සහයෝගය ලබා දීමට පොරොන්දු විය.

කමිටු පිහිටුවීම: විෂයමාලා සංවර්ධන ප්‍රතිපත්ති සඳහා යෝජනා කෙටුම්පත් කිරීම පිණිස තේමාත්මක කමිටු පහක් ස්ථාපිත කරන ලදි. ඒ සෑම කමිටුවක් ම විද්වතුන්ගෙන් සමන්විත වන අතර කණ්ඩායම් නායකයෙකු විසින් මෙහෙයවන ලදි.

පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය: සැලැස්මට ඇතුළත් කිරීම සඳහා සලකා බැලීම පිණිස ලිඛිත යෝජනා ඉදිරිපත් කරන ලෙස අභ්‍යන්තර කාර්ය මණ්ඩලය, මාණ්ඩලික සංගම් සහ ශිෂ්‍ය සංගම්වලට ආරාධනා කරන ලදි.

කොෆි ටේබල් වර්ගයේ පොත: එක් එක් තේමා ඉලක්ක යටතේ යෝජිත ව්‍යාපෘති ප්‍රදර්ශනය කෙරෙන අංග සම්පූර්ණ පොත් පිංචක් කෙටුම්පත් කර 2024 ජනවාරි මාසයේ අනුමැතිය සඳහා පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

මූලික ආයෝජන: විෂයමාලා සංවර්ධන ප්‍රතිපත්තිවල වැදගත්කම හඳුනා ගනිමින් රජය විසින් මූලික ආයෝජනයක් ලෙස 2024 අයවැයෙන් මිලියන 500ක් වෙන්කරන ලදි.

ව්‍යාපෘති සංවර්ධනය: උසස් බලධාරීන්ගේ අනුමැතියට යටත් ව 2024දී ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තුගත අයවැය සහිත සවිස්තරාත්මක ව්‍යාපෘති යෝජනා විශ්වවිද්‍යාලයේ ඉඩම් ගොඩනැඟිලි හා නඩත්තු කමිටුව විසින් නිර්දේශ කරන ලදි.

තේමාත්මක ක්ෂේත්‍ර

විෂයමාලා සංවර්ධන ප්‍රතිපත්තිවල තේමාත්මක ක්ෂේත්‍ර පහ මගින් විශ්වවිද්‍යාල සංවර්ධනයේ පහත සඳහන් ක්ෂේත්‍ර ද ඇතුලුව විවිධ අංශ කෙරෙහි අවධානය යොමු කරයි.

- පර්යේෂණ ප්‍රදාන, කර්මාන්ත හවුල්කාරිත්ව සහ මානව හිතවාදීන්ගේ පරිත්‍යාග වැනි රාජ්‍ය නොවන අරමුදල් මූලාශ්‍රය ඔස්සේ ස්වාධීන විශ්වවිද්‍යාලයක් (කණ්ඩායම් නායක: මහාචාර්ය ඕ.ජී. දයාරත්න)

- උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ අවස්ථා වැඩි දියුණු කරන අතර ම පර්යේෂණ සහ ඉගැන්වීම් පාඨමාලා සඳහා පහසුකම් පුළුල් කරන පශ්චාත් උපාධි පර්යේෂණ විශ්වවිද්‍යාලයක් (කණ්ඩායම් නායක: මහාචාර්ය අතුල ඒකනායක)

- කාර්ය මණ්ඩලය වෙත සුදුසුකම් ලත් පිරිස් ආකර්ෂණය කර ගැනීම සඳහා හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීම (කණ්ඩායම් නායක: මහාචාර්ය බී.එම්.එච්.එස්.කේ. බන්නැහැක)

- එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ණ කැපවීමෙන් කටයුතු කරන සුහුරු සහ හරිත විශ්වවිද්‍යාලය (කණ්ඩායම් නායක: මහාචාර්ය රොෂාන් රගෙල්)

- නේවාසික පරමාදර්ශය සාක්ෂාත් කර ගැනීම (කණ්ඩායම් නායක: මහාචාර්ය ජයලත් එදිරිසිංහ)

	යෝජිත ව්‍යාපෘතිය	මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.මිලි)	විශ්වවිද්‍යාල සංවර්ධන ව්‍යාපෘතියෙන් ලද ප්‍රතිපාදන - 2024 අයවැය (රු. මිලියන)	වෙනත් අරමුදල් ලැබීම
1	හරිත විශ්වවිද්‍යාලය: සූර්ය බලශක්ති උත්පාදන ඒකක ස්ථාපනය කිරීම (අදියර 1) අදියර 1: ඉංජිනේරු පීඨය සහ ගෘහස්ථ ක්‍රීඩාගාරය. අදියර 2: වෙනත් ගොඩනැගිලිවල වහලවල් සහ ඉංජිනේරු පීඨයේ වහලවල් ප්‍රතිසංස්කරණය කිරීම (රුපියල් මිලියන 280ක් බැංකු ණයකින් ආවරණය කිරීමට හෝ ඉන්දියානු රජයෙන් ඉල්ලා සිටීමට).	480	200	බැංකු ණය/ ඉන්දියානු රජයෙන් ගැළපෙන ප්‍රදානයකින් රුපියල් මිලියන 280
2	ඩිජිටල් පරිවර්තනය (අදියර II): සියලුම විශ්වවිද්‍යාල ගොඩනැගිලි සම්බන්ධ කිරීම සඳහා ෆයිබර් ඔප්ටික් කේබල් යෙදීම. (ස්වයං-ජනනය කරන ලද අරමුදල් භාවිත කරමින් පළමු අදියර ආරම්භ කර ඇත.) ශාස්ත්‍ර පීඨයේ ජාල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.	131	100	උත්පාදිත ආදායමෙන් රුපියල් මිලියන 31
3	ජාත්‍යන්තර සිසුන් සඳහා පහසුකම් ස්ථාපිත කිරීම: ලේඩි හිල් තානායම ජාත්‍යන්තර ශිෂ්‍ය නේවාසිකාගාරයක් බවට පරිවර්තනය කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කිරීම	170	50	2023 වසරේ විශ්වවිද්‍යාලයේ උත්පාදිත ආදායමින් රුපියල් මිලියන 100
4	පර්යේෂණ පහසුකම් පුළුල් කිරීම: අධිතාක්ෂණික රසායනාගාර සේවා මධ්‍යස්ථානයක් සමඟ බහුවිෂයක පර්යේෂණ මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.	181	100	2024 වසරේ විශ්වවිද්‍යාල/ පීඨය ජනනය කරන ලද ආදායමෙන් රුපියල් මිලියන 81
5	ශිෂ්‍ය සුබසාධනය වැඩි දියුණු කිරීම: ශිෂ්‍ය ආපනශාලා 08 නවීකරණය කිරීම	52	50	විශ්වවිද්‍යාල පුනරුත්ථාපනය සඳහා ශ්‍රී ලංකා රජයේ අයවැය-2024න් ලද ප්‍රතිපාදනවලින් රුපියල් මිලියන 2

විෂයමාලා සංවර්ධන ප්‍රතිපත්ති මගින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි දිගුකාලීන දැක්ම සාක්ෂාත් කරගැනීම සඳහා වන කැපවීම සහ එය ශ්‍රී ලංකාවේ සහ ඉන් ඔබ්බෙහි ප්‍රමුඛ පෙළේ විශ්වවිද්‍යාලයක් බවට පත්වීම සඳහා සිදු කරන කැපවීම පිළිබිඹු කරයි. විශ්වවිද්‍යාලය ඉදිරි පරම්පරාවන් සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් ලෙස පවතින බවට වග බලා ගනිමින් එය අනාගත වර්ධනය සහ සංවර්ධනය සඳහා මාර්ග සිතියමක් ලෙස පවතී.

1.4.11 පීඨ සහ පශ්චාත් උපාධි ආයතනවල පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන පිළිබඳ විශ්ලේෂණය

විශ්වවිද්‍යාලය විසින් සියලුම පීඨවල සහ උපාධි ආයතනවලට අදාළ ව ඒවායේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා, සහ තර්ජන පිළිබඳ විශ්ලේෂණයක් සිදු කර ඇත. එම සාරාංශය පහත සඳහන් පරිදි වේ. විශ්වවිද්‍යාලය එහි පවතින දුර්වලතා මැඩලීමට සහ බාහිර තර්ජන උපක්‍රමශීලී ව මැඩපැවැත්වීමට බොහෝ ශක්තීන් අනාවරණය කරගෙන ඇත. මෙම කරුණු මනාව විශ්ලේෂණය කොට ඇත. දුර්වලතා සහ තර්ජන ජය ගැනීමට සහ අවස්ථාවන්ගෙන් නිසි ප්‍රයෝජන ගැනීම සඳහා උපාය මාර්ග සැලසුම් කර ඇත.

ශක්තීන්	දුර්වලතා	අවස්ථා	තර්ජන
• කාලයක් මුළුල්ලේ ඵලදායීබව පසක්කළ පරිපාලන කළමනාකරණ පද්ධතියක් සහිත මනා සම්පත් සහිත, හොඳින් ව්‍යුහගත සහ ප්‍රගතිශීලී රාජ්‍ය විශ්වවිද්‍යාලයක්. • ජාත්‍යන්තර පිළිගැනීමක් ඇති දක්ෂ හා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් සහ පීඨ නවයක් සහ පශ්චාත් උපාධි ආයතන හතරක් සහිත බහුවිෂයක විශ්වවිද්‍යාලයක්. • ජාතික සහ ජාත්‍යන්තර අවශ්‍යතා සපුරාලන මනා ව්‍යුහගත විෂයමාලා සහිත විවිධ පරාසයක උපාධි සහ පශ්චාත් උපාධි අධ්‍යයන වැඩසටහන්. • කාලයක් පුරා ඵලදායීබව ඔප්පු කරන ලද විෂයමාලා අනුමත කිරීමේ ක්‍රියාවලිය මගින් නවීන මූලධර්ම සහ විෂයමාලා සඳහා ප්‍රවේශ ඇතුළත් කිරීම සහතික කරයි. • වැටුප්, නඩත්තු සහ ඇතැම් ප්‍රාග්ධන කටයුතු සඳහා රාජ්‍ය අරමුදල් ලබා දීම. • බහු සංස්කෘතික සහ බහු භාෂා ඉගෙනුම් සහ ජීවන වාතාවරණයක් සහිත රටේ පැරණිත ම විශ්වවිද්‍යාලය ලෙසට පවතින උරුමය සහ ජාත්‍යන්තර/දේශීය කීර්තිය. • ඉඩම් තිබීම හේතුවෙන් ඉගෙනීම, පර්යේෂණ සහ භෞතික ව්‍යාප්තිය සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් පැවතීම. • මනාලෙස ස්ථාපිත අධ්‍යයන උපදේශන පද්ධතිය, සෞඛ්‍ය සේවා පද්ධතිය, සහ ශිෂ්‍ය උපදේශන සහ සුපරීක්ෂණ ක්‍රමය. • පර්යේෂණ ප්‍රදාන සහ සහයෝගිතා ලබා ගැනීම සඳහා ලෝක ශ්‍රේණිගත විශේෂඥයන් සහ සැලකිය යුතු භෞතික සම්පත් තිබීම. • සමාජයේ ඉහළ තනතුරුවල සිටින දේශීය හා ජාත්‍යන්තර ව පිළිගත් ආදි ශිෂ්‍යයන් සහිත මනා ලෙස සහාය දක්වන ආදි ශිෂ්‍ය සංගමයක් තිබීම.	• නවාතැන් ඇතුළු ව ඇතැම් ආයතන සඳහා ප්‍රමාණවත් භෞතික පහසුකම්, සම්පත් සහ මූල්‍ය පහසුකම් නොමැතිවීම. • සීමිත උත්පාදිත අරමුදල් පැවතීම සහ රාජ්‍ය අරමුදල් මත ඉහළ යැපීම. • වැඩිදුර පුහුණුව, සංවර්ධනය සහ ජාත්‍යන්තර නිරාවරණ සහ පර්යේෂණ අත්දැකීම් අවශ්‍ය සැලකිය යුතු තරුණ සාමාජික සාමාජිකාවන් සංඛ්‍යාවක් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සිටීම. • කාර්ය මණ්ඩලය සඳහා නිසි කාර්ය සාධන ඇගයුම් පද්ධතියක් නොමැති වීම සහ යහපත් කාර්ය සාධනයක් සඳහා දිරි දීමනා ලබා දීම පිණිස සම්මාන/ඇගයුම් පද්ධතියක් නොමැති වීම. • පවතින වැඩසටහන්, සම්පත් සහ විශේෂඥ දැනුම පිළිබඳ ප්‍රමාණවත් ප්‍රචාරණයක් නොමැති වීම. • ප්‍රමාණවත් විද්‍යුත් ඉගෙනුම් පහසුකම් සහ Wi-Fi පහසුකම් නොමැතිවීම, ඉගෙනුම් කළමනාකරණ පද්ධතියේ භාවිතය සීමිත වීම, සහ මිශ්‍ර/මාර්ගගත ඉගෙනුම් ක්‍රියාකාරකම් සීමිත වීම. • සිසුන් බහුතරයකට ඉංග්‍රීසි වැඩ කරන භාෂාවක් ලෙස භාවිත කිරීමට ඇති නොහැකියාව. • සීමිත ඩිජිටල්කරණය, ඩිජිටල් ලේඛනාගාර, සහ ස්වයංක්‍රියකරණය. • නව විෂයමාලා සංවර්ධනය සඳහා ප්‍රමාණවත් පරීක්ෂණ/සේවා නියුක්තතා අධ්‍යයනයන් නොමැතිවීම සහ සොයාගැනීම් ඒකාබද්ධ නොකිරීම. • විදේශීය සිසුන් / විද්වතුන් / පර්යේෂකයන් සඳහා ප්‍රමාණවත් සහාය සහ පහසුකම් නොමැති වීම, විදේශීය සිසුන් ආකර්ෂණය කර ගැනීම සඳහා හොඳ වැඩසටහනක් නොමැති වීම.	• ව්‍යවසායක අවස්ථා ආකර්ෂනය කර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ උපාය මාර්ගික පිහිටීම • පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සුදුසුකම් (පේරාදෙණිය සන්නාමය) සඳහා ඉහළ පිළිගැනීමක් හිමිව තිබීම • විශ්වවිද්‍යාලයේ ඇතැම් විෂයන් පිළිබඳ උපාධිධාරීන් සඳහා ඇති ඉල්ලුම වැඩි වීම • ගාස්තු අය කරන වැඩසටහන් සහ සේවා සඳහා ඉල්ලුම වැඩි වීම • ඇතැම් අංශවල උසස් තත්ත්වයේ උසස් අධ්‍යාපනය සඳහා ඉල්ලුම වැඩි වීම • පශ්චාත් කොවිඩ් මාර්ගගත යුගය සහ සබැඳි සහ දූරස්ථ ඉගෙනීම සඳහා ඉල්ලුම වැඩි වීම • අධ්‍යාපනයට මුදල් යෙදවීමට දෙමාපියන්/ශිෂ්‍යයන් සූදානම්ව සිටින කාල පරිච්ඡේදයක් • පර්යේෂණ / අධ්‍යයන වැඩසටහන් / නවෝත්පාදන / පුහුණු අවස්ථා / හුවමාරු වැඩසටහන් සඳහා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගිතා ගොඩනගාගැනීම සඳහා පිළිගත් විදේශීය ආයතනවල පවතින උද්යෝගය • සමාජ-ආර්ථික කටයුතු සඳහා කාන්තාවන්ගේ වැඩි සහභාගිත්වය • රටේ සේවා අංශයේ වර්ධනය (පූර්ව කොවිඩ්) සහ අධ්‍යාපනයේ සහ නව නිපැයුම්වල අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා දේශීය කර්මාන්ත සමඟ සහයෝගිතා ගොඩනගාගැනීමට හැකියාවක් පැවතීම.	• උසස් අධ්‍යාපනය සඳහා ලබා දෙන රාජ්‍ය අරමුදල් ප්‍රමාණය අඩු කිරීම • ප්‍රෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන සහ නව රාජ්‍ය විශ්වවිද්‍යාල ව්‍යාප්ත වීම • ඇතැම් විෂයන් හදාරන උපාධිධාරීන් සඳහා පවතින ඉල්ලුම අඩු වීම • පරිපාලන අවශ්‍යතා සඳහා සහාය වීම සඳහා වසර 45ක් පැරණි විශ්වවිද්‍යාල පනතේ සීමා • විශ්වවිද්‍යාලයෙන් පිටත වඩා හොඳ අවස්ථා/පැකේජ/වැටුප් පැවතීම හේතුවෙන් සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ රඳවා ගැනීම දුෂ්කර වීම. • දුර්වල ආර්ථික වර්ධනය, ඉහළ උද්ධමනය, දරිද්‍රතාව සහ සිසුන්ට උපකාර කිරීමට දෙමාපියන්ගේ නොහැකියාව සමඟ රටේ පවතින සීමාකාරී ආර්ථික තත්ත්වය • බාහිර දේශපාලන නොසන්සුන්තා/දේශපාලන බලපෑම් හේතුවෙන් ශිෂ්‍ය ප්‍රජාවට සහ විශ්වවිද්‍යාලයේ දී ගනු ලබන තීරණවලට බාධා එල්ලවීම • ඉහළ යන විරැකියාව සහ උපාධිධාරීන්ගේ ඌන රැකියා; උපාධිධාරීන් නොවන අය රැකියා සඳහා බඳවා ගැනීම සහ පුහුණු කිරීම; අඩු දැනුමක් සහිතව වුවද ප්‍රායෝගික තාක්ෂණික කුසලතා සඳහා ඉල්ලුම වැඩි වීම • තොරතුරු තාක්ෂණ/දත්ත/මාර්ගගත සේවා භාවිතයට අදාළ අධික පිරිවැය • රාජ්‍ය විශ්වවිද්‍යාල/අධ්‍යයන වැඩසටහන් සම්බන්ධයෙන්, විශේෂයෙන් ම තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර ඍණාත්මක මහජන මතයක් වර්ධනය වීම.

1.4.12 අවදානම් තක්සේරු කිරීම සහ අවම කිරීමේ උපාය මාර්ග

අවදානම	විස්තරය	අවම කිරීමේ ක්‍රියාමාර්ග	මූලාශ්‍රය
මෙහෙයුම්වලට සිදු වන බාධා			
විදුලිය බිඳවැටීම්, ජල සැපයුමේ බාධා	අධ්‍යයන කටයුතු සහ සේවාවලට බාධා පැමිණේ.	විදුලි පද්ධති, විදුලි ජනක යන්ත්‍ර නිතිපතා පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම, මධ්‍යගත බලශක්ති උත්පාදනය සහ අඛණ්ඩ බල සැපයුම් පද්ධති සඳහා ආයෝජනය කිරීම, භූගත මට්ටමේ ගබඩා ටැංකි සහ පොම්ප ස්ථාපිත කිරීම, යල් පැන ගිය පයිප්ප ප්‍රතිස්ථාපනය කිරීම, ජල සංරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක කිරීම.	පොදු
රසායනාගාර ආශ්‍රිත ආසාදන, අතුරු ආසාදන අවදානම	කාර්ය මණ්ඩලය, සිසුන් සහ මහජන සෞඛ්‍යයට තර්ජන එල්ල වේ.	ජෛව ආරක්ෂණ කැබිනෙට්ටු භාවිත කිරීම, ද්‍රව්‍ය විෂබීජහරණය කිරීම, අංග සම්පූර්ණ ආරක්ෂණ පුහුණුව ලබා දීම, ප්‍රොටෝකෝල නිතිපතා තක්සේරු කිරීම සහ යාවත්කාලීන කිරීම, ආසාදන පාලන ප්‍රොටෝකෝල ශක්තිමත් කිරීම, ශික්ෂණ රෝහල් සමඟ සම්බන්ධව කටයුතු කිරීම, දේපළ පිරියත සහ උපකරණ සැපයීම, හස්ත සනීපාරක්ෂාව සහ ආරක්ෂිත එන්නත් පිළිවෙත් දිරිමත් කිරීම.	පොදු, වි.ප.උ.ආ, ත.ස.ම, වෘ.මා.ඒ.
යල් පැන ගිය ගිනි ආරක්ෂණ පද්ධති, ගිනිගැනීම්, ගොඩනැගිලි අබලන් වීම	පෞද්ගලික ආරක්ෂාව සහ දේපළ සඳහා අවදානම් ඇති වේ.	පද්ධති යාවත්කාලීන කිරීම (නැවත පිරවීම, නව ස්ථාපනය), ගිනි ගැනීම් අවස්ථා සම්බන්ධයෙන් පෙරපුහුණු සහ ඉවත් කිරීමේ පුහුණුව පැවැත්වීම, උපකරණ නිසි නඩත්තු කිරීම සහ පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් වග බලා ගැනීම, කාර්ය මණ්ඩලය පුහුණු කිරීම, නිසි ලෙස සන්නද්ධ කිරීම, වාතාශ්‍ර සහ හදිසි පොට්‍රොකෝල ස්ථාපිත කිරීම, හදිසි පොට්‍රොකෝල ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.	පොදු, ජා.ස.කා.
හදිසි පද්ධති ඇනහිටීම්	මෙහෙයුම්වලට බාධා ඇති වේ.	අතිරේක ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, නිතිපතා නඩත්තු කිරීම් සිදු කිරීම, ආපදා ප්‍රතිසාධන සැලසුම් යෙදීම, විශ්වාසනීය උපස්ථ පද්ධති සඳහා ආයෝජනය කිරීම.	තො.තා.ම.
මූල්‍ය			
සීමිත අරමුදල් (යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම්, ආරක්ෂක පියවරයන්), පර්යේෂණ අරමුදල් නොමැතිකම, කර්මාන්ත කටයුතුවල නියැලීම සඳහා මූල්‍ය බාධා පැවැතීම	මූලික කාර්යයන් සහ උපාය මාර්ගික ඉලක්ක වලට බාධා පැමිණීම	ප්‍රදාන සහ හවුල්කාරිත්වයන් සෙවීම, අරමුදල් රැස්කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සම්පත් වෙන් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දීම, පිරිවැය ඵලදායී විසඳුම් සෙවීම, පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම, අරමුදල් පිළිබඳ දැනුම්වත් කිරීමේ සැසි පැවැත්වීම, යෝජනා ලිවීම පිළිබඳ පර්යේෂකයන් පුහුණු කිරීම, විකල්ප අරමුදල් සෙවීම, බාහිර අරමුදල් සෙවීම.	පොදු, වෘ.මා.ඒ., තො.තා.ම.,, වි.ප.ස
දක්ෂතා අවදානම			
පුද්ගලයින් මත අධික ලෙස රඳා පැවතීම, වෘත්තීය ආරක්ෂණ පිළිබඳ ගැටලු	අවදානම සහ සිදුවිය හැකි හානිය වැඩි වීම	කාර්ය මණ්ඩලය සඳහා අමතර පුහුණුවීම්, අනුප්‍රාප්තික සැලසුම් ක්‍රියාත්මක කිරීම, ලියකියවිලි සහ දැනුම් ගබඩා පවත්වාගෙන යාම, අවශ්‍ය ආරක්ෂක උපකරණ සහ පුහුණුව ලබා දීම, ආරක්ෂක ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම සහ නීතිමය අවශ්‍යතා පිළිපැදීම, නිතිපතා විගණන සහ පරීක්ෂණ පැවැත්වීම.	තො.තා.ම. පොදු, ජා.ස.කා.
උපාය මාර්ගික අවදානම්			
නීතිමය හෝ නියාමන අවශ්‍යතාවල වෙනස්කම්, වේගවත් තාක්ෂණික දියුණුව	මෙහෙයුම් සහ අවශ්‍ය අනුවර්තන සඳහා බලපෑම් ඇති වීම	අඛණ්ඩ අනුකූලතා විගණන පැවැත්වීම, වෙනස්කම් පිළිබඳ ව දැනුම්වත් ව සිටීම, නීති උපදෙස් ලබා ගැනීම, නිතිපතා තාක්ෂණික ඇගයීම් සිදු කිරීම, වැඩි දියුණු කිරීම් සඳහා අයවැය වෙන් කිරීම, කර්මාන්ත හවුල්කරුවන් සමඟ සහයෝගිතා ගොඩනගා ගැනීම.	තො.තා.ම.
අසම්පූර්ණ බහුවිෂයක පර්යේෂණ ව්‍යාපෘති	පර්යේෂණ ඉලක්ක සහ උපාය මාර්ගික අරමුණු කෙරෙහි බලපෑම් ඇති වීම	ව්‍යාපෘති අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම, ප්‍රතිපෝෂණ සැපයීම සහ අවශ්‍යවේනම් ව්‍යාපෘති සැලසුම් සංශෝධනය කිරීම.	වි.ප.ස
කීර්තිය			
රසායනාගාර ආශ්‍රිත ආසාදන, වෙනත් ආසාදන අවදානම්, යල් පැන ගිය ගිනි ආරක්ෂණ පද්ධති, ගිනිගැනීම් ඇතිවීම, ගොඩනැගිලි අබලන් වීම	මහජන මතය හා විශ්වාසය පළුදු වීම	"මෙහෙයුම් වලට බාධා කිරීම්" කාණ්ඩය යටතේ සඳහන් අවම කිරීමේ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම.	පොදු, වි.ප.උ.ආ, ත.ස.ම, වෘ.මා.ඒ, ජා.ස.කා.
තාක්ෂණික අවදානම			
සයිබර් ආරක්ෂණ තර්ජන, වේගවත් තාක්ෂණික දියුණුව, හදිසි පද්ධති ඇණහිටීම්	මෙහෙයුම්වලට බාධා එල්ලවීම, දත්ත පිළිබඳ ගැටලු ඇති වීම සහ ප්‍රගතියට බාධා එල්ලවීම	ශක්තිමත් ප්‍රොටෝකෝල ක්‍රියාත්මක කිරීම, නිත්‍ය විගණන පැවැත්වීම, සේවකයන් පුහුණු කිරීම, නවතම ආරක්ෂක තාක්ෂණයන් ක්‍රියාත්මක කිරීම, නිතිපතා තාක්ෂණ ඇගයීම් සිදු කිරීම, වැඩි දියුණු කිරීම් සඳහා අයවැය වෙන් කිරීම, කර්මාන්ත හවුල්කරුවන් සමඟ සහයෝගිතා ගොඩනගා ගැනීම, අතිරික්ත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම, නිතිපතා නඩත්තු කටයුතු කිරීම, ආපදා ප්‍රතිසාධන සැලසුම් සකස් කිරීම, විශ්වාසනීය උපස්ථ පද්ධති සඳහා ආයෝජනය කිරීම	තො.තා.ම.

1.5 ප්‍රධාන බාධක

විශ්වවිද්‍යාලය 2023 වර්ෂයේ දී අධ්‍යයන සහ කාර්ය මණ්ඩල ගැටලුවල සිට යටිතල පහසුකම් සහ පරිපාලන බාධා දක්වා විවිධ අභියෝගවලට මුහුණ දුන්නේ ය. මෙම අඩුපාඩු සපුරාලීමට කටයුතු කළ නමුදු බොහෝ රාජ්‍ය රෙගුලාසි, අරමුදල් සීමා කිරීම් සහ නිලධාරිවාදී බාධක වැනි බාහිර සාධක හේතුවෙන් බොහෝ කාරණා තවදුරටත් එලෙස ම පැවතුණි. මෙම අභියෝග ජය ගැනීමට සහ විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සහ සාර්ථකත්වය තවදුරටත් වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරී ක්‍රියාමාර්ග ගැනීම සහ අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ඉතා වැදගත් වේ.

මෙම වාර්තාව 2023 සඳහා විශ්වවිද්‍යාලය විසින් වාර්තා කරන ලද වඩාත් ම සැලකිය යුතු බාධාවන් ඒවායේ බලපෑම සහ ව්‍යාප්තිය සැලකිල්ලට ගනිමින් ප්‍රමුඛ ව ඉදිරිපත් කරයි.

- **අරමුදල් සීමා**

  මූල්‍ය සම්පත් සීමිත වීම වර්ධනය, සම්පත් අත්පත් කර ගැනීම, ඩිජිටල්කරණය සහ කාර්ය මණ්ඩල බඳවා ගැනීම්වලට දැඩි ලෙස බාධා ඇති කළ අතර එය සියලුම මෙහෙයුම්වලට පාහේ බලපෑවේය. ආර්ථික අර්බුදය සහ රජයේ සීමා පැනවීම් නිසා නව ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට බාධාවන් සිදු විය.

- **රජයේ සීමා**

  නිලධාරිවාදී ක්‍රියාවලීන්, බඳවා ගැනීම් සහ ඉදිකිරීම් සීමා කිරීම් සහ ප්‍රතිපත්තිමය සීමා විවිධ අංශ ඔස්සේ ව්‍යාපෘති, සම්පත් අත්පත් කර ගැනීම සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව සැලකිය යුතු ලෙස ප්‍රමාද වීමට හේතු විය. මේ සම්බන්ධයෙන් වන විශේෂිත උදාහරණ අතර අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම්, ඉදිකිරීම් ව්‍යාපෘති සහ ගරු ආරාධිත මහාචාර්ය පත්වීම් ප්‍රමාදවීම් දැක්විය හැකිය.

- **මානව සම්පත් සීමා**

  අධ්‍යාපනික සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟය අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට සහ කාර්යක්ෂමතාවයට බලපෑම් එල්ල කරමින් සේවා සැපයීම, පර්යේෂණ සහ පරිපාලන කටයුතු අඩාල වීමට හේතු විය. රජය විසින් පනවන ලද සීමා බඳවා ගැනීම් නතර කිරීමට සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඉල්ලා අස්වීම් සඳහා හේතු විය.

- **තත්ත්ව සහතිකකරණයේ ප්‍රමාද වීම**

  වැඩසටහන් සමාලෝචන සහ විෂයමාලා සංශෝධන වැනි තත්ත්ව සහතික කිරීමේ ප්‍රමිතීන් ක්‍රියාත්මක කිරීමේ දී සැලකිය යුතු ප්‍රමාදයක් හෝ මන්දගාමී ප්‍රගතියක් දක්නට ලැබුණු අතර එ මගින් අධ්‍යයන කටයුතුවල වර්ධනයට සහ වැඩි දියුණු කිරීමට බාධා එල්ල විය.

- **කාර්යස්ථාන ඉඩකඩ සහ උපකරණ ප්‍රමාණවත් නොවීම**

  යල් පැන ගිය උපකරණ සහ වැදගත් සේවා ස්ථානවල ප්‍රමාණවත් නොවන ඉඩකඩ කාර්යක්ෂම ක්‍රියාකාරීත්වයට සහ සේවා සැපයීමට බාධා ඇති කරයි.

- **අභ්‍යන්තර විගණනයේ සීමිත විෂය පථය**

  වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ගැටලු ඇති කරමින් කාර්ය මණ්ඩල සම්පත් ප්‍රමාණවත් නොවීම අභ්‍යන්තර විගණනයන්හි විෂය පථය සහ ඵලදායිතාවය සීමා කිරීමට හේතු වේ. අතිරේක කාර්ය මණ්ඩලය ලබාදීමක් නොමැතිව අතිරේක ආයතනවල කටයුතු ආවරණය කිරීමෙන් වැඩ කටයුතු ප්‍රමාණය වැඩි වීම මෙම සීමාවීම්වලට මූලික කාරණය විය.

- **ශිෂ්‍ය නවාතැන් සම්බන්ධයෙන් පැවති අභියෝග**

  නඩත්තු ප්‍රමාදයන්, මෘදුකාංග ක්‍රියාත්මක කිරීමේ ගැටලු සහ නව නේවාසිකාගාර ඉදිකිරීමේ මන්දගාමී ප්‍රගතිය සිසුන්ට අපහසුතාවන් ඇතිවීමට සහ ඔවුන්ගේ ජීවන අත්දැකීමට බලපෑම් එල්ලවීමට හේතු විය හැකි නමුත් අනෙකුත් ගැටලුවලට සාපේක්ෂ ව එය තරමක අඩු බලපෑමක් විය හැකිය.

- **තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති අනුමැතිය ප්‍රමාද වීම**

  තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති අනුමත කිරීම් ප්‍රමාද වීම තාක්ෂණික දියුණුවට බාධාවක් විය හැකි අතර, අනෙකුත් වැදගත් සම්පත් හෝ කාර්ය මණ්ඩල සීමාවලට සාපේක්ෂ ව ඒවායේ බලපෑම අඩු විය හැකිය.

1.6 අනාගත සැලසුම්

උපායමාර්ගික සැලසුම් සහ දැක්ම

- අධ්‍යයන සංවර්ධනය, ප්‍රජා සහභාගීත්වය, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තරකරණය, තත්ත්ව සහතිකය, පීඨ සහ කාර්ය මණ්ඩල සංවර්ධනය, ශිෂ්‍ය සහාය සහ මහජන සම්බන්ධතා වැනි ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරමින් 2022-2026 උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල සංවර්ධනය සඳහා වන දිගුකාලීන උපාය මාර්ග පිළිබඳව අවධාරණය කරමින් සියවස් සංවර්ධන සැලැස්ම (CDP)-UoP-2042 සහ එහි තේමාත්මක ක්ෂේත්‍ර පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම.

අධ්‍යයන සංවර්ධනය

- කර්මාන්ත ප්‍රවණතා සහ සමකාලීන ඉල්ලීම් සමඟ ගැළපෙන පරිදි විෂයමාලාව වැඩි දියුණු කිරීම.
- සමාජ අභියෝග සම්බන්ධයෙන් කටයුතු කළ හැකිවන පරිදි අන්තර්විෂයක පර්යේෂණ සහ සහයෝගීතාව ශක්තිමත් කිරීම.
- අධ්‍යයන විශිෂ්ටත්වය පවත්වා ගැනීම සඳහා පීඨ සහ කාර්ය මණ්ඩල වෘත්තීය සංවර්ධනය දිරිමත් කිරීම.

ප්‍රජා සහභාගීත්වය

- ප්‍රාදේශීය ප්‍රජා අවශ්‍යතා සපුරාලීම සහ මහජන සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම පිණිස බාහිර ප්‍රජා සත්කාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ප්‍රවේශයට සහ සමාජ වගකීම් ඉටුකිරීම පහසු කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

යටිතල පහසුකම් සහ තාක්ෂණය

- උසස් අධ්‍යයනයට පහසුකම් සැලසීම පිණිස විශේෂිත රසායනාගාර සහ පර්යේෂණ මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.
- නවීන ඉගැන්වීම් ක්‍රමවේදවලට සහාය වීම පිණිස ඩිජිටල් යටිතල පහසුකම් සහ විද්‍යුත් ඉගෙනුම් පහසුකම් වැඩි දියුණු කිරීම.

ජාත්‍යන්තරකරණය

- ගෝලීය ඉදිරි දර්ශන සහ බහු සංස්කෘතික ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම සඳහා ශිෂ්‍ය සහ කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන් පුළුල් කිරීම.
- පර්යේෂණ සබඳතා සහ අවස්ථා පුළුල් කිරීම සඳහා ජාත්‍යන්තර ආයතන සමඟ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීම.

තත්ත්ව සහතිකකරණය සහ ප්‍රතීතනය

- ජාතික තත්ත්ව සහතික රාමු සමඟ ගැළපෙන පරිදි උපාධි වැඩසටහන් සහ පරිපාලන ක්‍රියා පටිපාටි සකස් කිරීම.
- අධ්‍යයන විශිෂ්ටත්වය සහ පිළිගැනීම සහතික කිරීම සඳහා විශේෂිත වැඩසටහන් ප්‍රතීතනය කිරීම.

පීඨ සහ කාර්ය මණ්ඩල සංවර්ධනය

- වෘත්තීය සංවර්ධනයට සහ ප්‍රගමනයට සහාය වීම සඳහා උපදේශන වැඩසටහන් සහ වැඩමුළු ක්‍රියාත්මක කිරීම.
- පර්යේෂණ මත පදනම් වූ නවෝත්පාදන සහ අන්තර්විෂයක සහයෝගීතා සංස්කෘතියක් පෝෂණය කිරීම.

ශිෂ්‍ය සහාය සහ සහභාගීත්වය

- සිසුන්ට පර්යේෂණ ව්‍යාපෘති සඳහා සහභාගී වී ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීම සඳහා අවස්ථාව සලසා දීම.
- උපදේශනය, වෘත්තීය මාර්ගෝපදේශනය සහ විෂය බාහිර ක්‍රියාකාරකම් ඇතුළු ව ශිෂ්‍ය සේවා වැඩි දියුණු කිරීම.

මහජන සම්බන්ධතා සහ දෘශ්‍යතාව

- පීඨ ජයග්‍රහණ සහ වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ මාධ්‍ය අවකාශ සහ ජාල සබඳතා භාවිත කිරීම.
- පර්යේෂණ නිමැවුම් සහ දායකත්වයන් ප්‍රදර්ශනය කිරීම සඳහා සම්මන්ත්‍රණ, සමුළු සහ ප්‍රකාශන වැඩසටහන් සංවිධානය කිරීම.

ඵලදායී සම්බන්ධීකරණ යාන්ත්‍රණය

- අපේක්ෂිත ප්‍රතිඵල කාර්යක්ෂම ව බෙදා හැරීම පිණිස සියලුම ඒකක, අංශ සහ මධ්‍යස්ථාන සමඟ ඵලදායී සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

2021- 2023 දක්වා විශ්වවිද්‍යාලයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

	2021	2022	2023
පොදු			
පීඨ සංඛ්‍යාව	9	9	9
පශ්චාත් උපාධි ආයතන සංඛ්‍යාව	4	4	4
අධ්‍යයනාංශ සංඛ්‍යාව	83	86	86
විශ්වවිද්‍යාලයේ භූමි ප්‍රමාණය	774 Hectares	774 Hectares	775.25 Hectares
	1912.6 Acres	1912.6 Acres	1915.6 Acres
ශිෂ්‍යයන්			
උපාධි අපේක්ෂක ශිෂ්‍යයන්			
වාර්ෂික බඳවා ගැනීම	3231	3275	3302
පළමු වසර සඳහා නව ඇතුළත් වීම්	3444	3439	3123
මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	12265	13731	14181
උපාධිධාරී නිමැවුම	2555	2194	2724
පශ්චාත් උපාධි ශිෂ්‍යයන්			
නව ඇතුළත් කිරීම්	2080	2207	1233
මුළු සිසුන්	9891	10646	10140
පශ්චාත් උපාධි නිමැවුම	1152	1043	1149
දර්ශනශූරී/ශාස්ත්‍රපති පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව	310	294	271
දර්ශනපති පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව	1085	1006	983
බාහිර පාඨමාලා සඳහා ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව	8379	8019	7661
කාර්ය මණ්ඩලය			
මුළු ස්ථිර කාර්ය මණ්ඩලය	3217	3167	3024
අධ්‍යයන කාර්ය මණ්ඩලය	908	900	860
අධ්‍යයන සහාය කාර්ය මණ්ඩලය	60	58	52
විධායක කාර්ය මණ්ඩලය	69	69	66
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	2180	2140	2112
ආචාර්ය උපාධිය සහිත අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව	496	499	470
ශාස්ත්‍රපති, දර්ශනපති, දර්ශනශූරී උපාධි හදාරන අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව	159	76	22
	රු. (මිලි)	රු. (මිලි)	රු. (මිලි)
වාර්ෂික ප්‍රතිපාදන			
පුනරාවර්තන	7,760.79	8,007.83	7975.00
ප්‍රාග්ධනය	982.50	238.5	525.00
මුළු වෙන් කිරීම	8,743.29	8,246.33	8500.00
ජංගම වත්කම්	3,395.35	3,598.74	4075.86
ජංගම නොවන වත්කම්	24,212.28	28,883.55	28425.03
මුළු වත්කම්	27,607.63	32,482.29	32500.88
පර්යේෂණ ආධාර ලැබීම්	363.05	492.34	47.42
ශිෂ්‍යාධාර ශිෂ්‍යත්වලාභීන්	2312	2150	809
මහපොළ ශිෂ්‍යත්වලාභීන්	5120	5731	7278
මුළු ඒක ශිෂ්‍ය පිරිවැය	0.76	0.74	0.79
වෙනත්			
විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම			
ටයිම්ස් උසස් අධ්‍යාපන	#01(401-500)	#01(401-500)	#01(501-600)
නේවාසිකාගාරවල සම්පූර්ණ ධාරිතාව	8075	8355	8609

2. පීඨ සහ පශ්චාත් උපාධි ආයතන

2.1 කෘෂි විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය කේ.ඒ.එස්.එස්. කොඩිතුවක්කු විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

කෘෂි විද්‍යා පීඨය වනාහි කෘෂිකාර්මික උසස් අධ්‍යාපනය සඳහා ආසියානු කලාපයේ පවත්නා විශිෂ්ටතා මධ්‍යස්ථානයකි. වර්තමානයේ, පීඨය විසින් කෘෂිකාර්මික තාක්ෂණය සහ කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය, සහ සත්ත්ව විද්‍යාව සහ ධීවර කටයුතු පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය නම් වූ සිව් අවුරුදු කාල සීමාවක දී සම්පූර්ණ කරන උපාධි වැඩසටහන් තුනක් පවත්වනු ලබයි.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- සැලසුම් කරන ලද අධ්‍යයන කටයුතු සම්පූර්ණ කරන ලදි.
- සත්ත්ව විද්‍යා අධ්‍යයනාංශයේ දියමන්ති ජුබිලි (DJ) ශ්‍රවණාගාරය සහ වෘත්තාකාර ශ්‍රවණාගාරය උත්සවාකාරයෙන් විවෘත කර භාවිතය සඳහා ලබා දී ඇති අතර, දියමන්ති ජුබිලි ශ්‍රවණාගාරයේ ආලෝකකරණ සහ ශබ්ද පද්ධතිය ස්ථාපිත කරන ලදි.
- දීප ව්‍යාප්ත ප්‍රශ්න විචාරාත්මක තරග, අණුක ජීව විද්‍යාව සහ ප්‍රතිසංයෝජක ඩීඑන්ඒ තාක්ෂණය පිළිබඳ ගුරුවරුන් සහ ශිෂ්‍ය පුහුණු වැඩසටහන්, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ එහි යාවජීව හවුල්කරුවන්ට උපහාර දැක්වීම සඳහා කොළඹ දී Gala Event නමින් වැඩසටහනක් පවත්වන ලදි.
- 10 වැනි ජාත්‍යන්තර සමුළුව - AGRICO 2023 පැවැත්වීම සඳහා ජාත්‍යන්තර දැනුම කළමනාකරණ ආයතනය (TIIKM) සමඟ එක්ව කටයුතු කරන ලදි.

ප්‍රධාන ජයග්‍රහණ

- ඉලිනොයිස්හි උර්බානා-චැම්පේන් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම සහ බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ ජර්මනියේ සහ දකුණු කොරියාවේ ජාත්‍යන්තර ආයතන සමඟ අභිප්‍රාය ලිපි අත්සන් කිරීම.

- අධ්‍යයන, ක්‍රීඩා සහ විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා සම්මාන සහ ශූරතා දිනා ගනිමින් සිසුන් විසින් විවිධ දේශීය හා ජාත්‍යන්තර තරගවල දී විශිෂ්ට දස්කම් දක්වන ලදි.

- පීඨයේ ආදි සිසුන්ගේ අනුග්‍රහය ඇතිව විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රථම වරට සිසුන් විසින් කළමනාකරණය කරන ලද අවන්හල වන "ද කියොක්ස්" අවන්හල ආරම්භ කරන ලදි.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	1465
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	-
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථීර	106
	තාවකාලික	65
	බාහිර	15
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		111

බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		03
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		-
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:14
ලැබූ සම්මාන	ජාතික	28
	ජාත්‍යන්තර	-
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		65

පර්යේෂණ නිමැවුම	
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන	176
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන	326

මූල්‍ය	රු.
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්	1,346,462,215.65
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය	919,086.84
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්	1,180,741,240.31
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය	805,966.72

2.2 සම සෞඛ්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති මහාචාර්ය එම්.ඩී.එම්.එල්.ඩී.කේ. යටවර විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

2007 වර්ෂයේ සිට, සම සෞඛ්‍ය විද්‍යා පීඨය (FAHS) හෙද, වෛද්‍ය රසායනාගාර විද්‍යාව, ඖෂධවේදය, විකිරණවේදය සහ විකිරණ චිකිත්සාව පිළිබඳ සිව් අවුරුදු විද්‍යාවේදී ගෞරව උපාධි පාඨමාලා පැවැත්වීම ඔස්සේ අනාගත වෘත්තිකයන් සවිබල ගන්වන සෞඛ්‍ය සේවා අධ්‍යාපනයේ ප්‍රමුඛ බලවේගයක් ලෙස ක්‍රියා කරයි. විශේෂිත දෙපාර්තමේන්තු හයකින් සමන්විත මෙම පීඨය ලොව පුරා සිය විශේෂඥ දැනුමින් සේවය ලබා දෙන ආදි ශිෂ්‍යයින් 1681 කට අධික සංඛ්‍යාවක් සමඟ සම්බන්ධ වී සිය සිසුන් දැනුමින් පෝෂණය කිරීම සහ සංවර්ධනය කිරීම සිදු කරයි. ජාතික සහ ජාත්‍යන්තර රෝහල් සමඟ සහයෝගීතාවයෙන් යුතු ව භෞත චිකිත්සාව, වෛද්‍ය විද්‍යාගාර සහ X-කිරණ රූපකරණය වැනි සේවාවන් හරහා ප්‍රායෝගික පුහුණුවට ප්‍රමුඛතාව ලබා දෙමින් මෙම පීඨය සිය උපාධිධාරීන් ලොව පුරා සෞඛ්‍ය සේවා පද්ධති කෙරෙහි ක්ෂණික බලපෑමක් ඇති කිරීමට සමත් සන්නද්ධ පිරිසක් බවට පත් කරයි.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- ඖෂධ විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන සඳහා අනුමැතිය ලබාගැනීම.
- හෙදවේදය පිළිබඳ විද්‍යාපති උපාධි වැඩසටහන ආරම්භ කිරීම
- අධ්‍යයනාංශ විශේෂිත වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- 2019/2020 සහ 2020/2021 කණ්ඩායමේ හෙද ප්‍රතිඥා දීමේ උත්සවය පැවැත්වීම.
- ලෝක විකිරණවේද දින සැමරුම් පැවැත්වීම.
- වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු සහ විවිධ ශිෂ්‍ය කේන්ද්‍රීය වැඩසටහන් සංවිධානය කිරීම.
- ජංගම සායන සේවාව ක්‍රියාත්මක කිරීම, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ පාසල් සිසුන් සඳහා පුහුණුව ලබා දීම සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා භෞත චිකිත්සක පරීක්ෂණ පැවැත්වීම.

ප්‍රධාන ජයග්‍රහණ

- විකිරණ විද්‍යා තාක්ෂණවේදීන් විසින් ලබා ගන්නා ලද ආචාර්ය උපාධි ජයග්‍රහණ සහ ඔවුන් විසින් වෛද්‍ය ප්‍රතිරූපණ ක්ෂේත්‍රයට දක්වන දායකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා විකිරණ විද්‍යා තාක්ෂණවේදීන්ගේ සංගමය විසින් ඔවුන් පිළිගැනීමට ලක් කෙරුණි.
- මහාචාර්ය එච්.ඩී.ඩබ්ලිව්.ටී. දමයන්ති (හෙද) සහ විවිධ අංශවල පීඨ සාමාජිකයින් 8 දෙනෙකු මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය සහ කථිකාචාර්ය යන තනතුරුවලට උසස් කරන ලදි.
- ආචාර්ය ජයතිලක සහ ආචාර්ය වීරකෝන් "විද්‍යාත්මක වාර්තා" හි පර්යේෂණ ප්‍රකාශන පළ කරන ලද අතර ආචාර්ය තිසේරා විසින් බහුවිෂයීක පර්යේෂණ ප්‍රදානයක් හිමි කර ගන්නා ලදි. ආචාර්ය බෝවත්ත විසින් පර්යේෂණ ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන දිනා ගන්නා ලදි.
- ජපානයේ ටෝකියෝ මෙට්‍රොපොලිටන් විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා වාර්ෂික උපාධිධාරීන් බඳවා ගැනීම ද සම්පූර්ණ කරන ලදි.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	843
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	64
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	64
	තාවකාලික	28
	බාහිර	45
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		65
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		06
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		03
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:13
ලැබූ සම්මාන	ජාතික	-
	ජාත්‍යන්තර	01
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		01
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		04
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		56
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		38
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		673,328,713.61
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය		798,729.20
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		577,968,452.72
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය		685,609.08

2.3 ශාස්ත්‍ර පීඨය

(පීඨාධිපති, ආචාර්ය ඊ.එම්.පී.සී.එස්. ඒකනායක විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨය 1952 දී ආරම්භ කරන ලදි. ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ දේශීය හා විදේශීය ආයතන රැසක අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා සහභාගී වෙති. ආර්ථික විද්‍යාව, අධ්‍යාපනය, භූගෝල විද්‍යාව, සමාජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, දර්ශනය සහ මනෝවිද්‍යාව, සහ පාලි සහ බෞද්ධ අධ්‍යයන යන අධ්‍යයනාංශ මගින් අනෙකුත් සේවාවන්ද ඇතුළු ව විවිධ රාජ්‍ය ආයතන සඳහා විශේෂඥ දැනුම සහ උපදේශන සේවා සැපයීම සිදු කෙරේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- 2022/2023 ශිෂ්‍ය කණ්ඩායම ඇතුළත් කර ගන්නා ලදි.
- මෑත කාලීන ව පවත්වන ලද සහ ඉදිරියට පැවැත්වීමට නියමිත, වැඩසටහන්, පාඨමාලා අන්තර්ගතය සහ සංයෝජන සමගින් අධ්‍යයනාංශ වෙබ් අඩවි කාලානුරූප ව යාවත්කාලීන කරන ලදි.
- අදාළ මෘදුකාංග සමඟ පරිගණක රසායනාගාර පහසුකම් වැඩි දියුණු කරන ලද අතර තොරතුරු තාක්ෂණ විද්‍යාගාර ප්‍රතිසංස්කරණය කර වැඩි දියුණු කරන ලදි.
- ඉංග්‍රීසි භාෂාව සහ සාහිත්‍යය පිළිබඳ බාහිර ප්‍රජා පාදක පාඨමාලා හඳුන්වා දීම.
- සියලුම අධ්‍යයනාංශ සහ පීඨයේ පොදු ස්ථානවල ස්ථානීය ජාල පද්ධති සහ වයි-ෆයි ජාල පද්ධති ශක්තිමත් කිරීම.
- ඉගැන්වීම්-ඉගෙනුම් ක්‍රියාවලියේ සඵලතාව වැඩි දියුණු කිරීම සඳහා මූඩ්ල් (Moodle), සහ ඉගෙනුම් කළමනාකරණ පද්ධතිවල වැඩි දියුණු කරන ලද විශේෂාංග භාවිත කිරීම.

ප්‍රධාන ජයග්‍රහණ

- තොරතුරු තාක්ෂණ අධ්‍යයනාංශය සහ දූරස්ථ සංවේද රසායනාගාරය ස්ථාපිත කිරීම.
- ශාස්ත්‍ර පීඨය විසින් සංවිධානය කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 ජාත්‍යන්තර පර්යේෂණ සැසිය, 2023 සැප්තැම්බර් 21 දින සාර්ථක ව පැවැත්වීම.
- Artos Deli Uni Foods ආපන ශාලාව විවෘත කිරීම
- 2023 නොවැම්බර් 15 දින භූගෝල විද්‍යා ප්‍රදර්ශනය පැවැත්වීම.
- මධ්‍යම සංස්කෘතික අරමුදල හරහා සීමාවාසික සම්බන්ධීකරණ ඒකකය, ශාස්ත්‍ර පීඨයේ ස්වේච්ඡා සේවා සහ ප්‍රජා සත්කාරක (CIVCO) ඒකකය සහ නාමල් උයන අතර අවබෝධතා ගිවිසුමකට එළඹීමට ඇරයුම් කිරීම.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	4557
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	-
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	179
	තාවකාලික	113
	බාහිර	92
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		84
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		24
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		-
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:25
ලැබූ සම්මාන	ජාතික	04
	ජාත්‍යන්තර	01
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		03
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		06
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		-
සමුළුවල දී සිදුකරන ලද ඉදිරිපත් කිරීම් ගණන		-
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		2,712,086,237.16
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය		595,147.30
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		2,196,597,851.74
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය		482,027.18

2.4 දන්ත වෛද්‍ය විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ඒ.එම්. ආටිගල විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

දන්ත වෛද්‍ය විද්‍යා පීඨය සහ එහි දන්ත (ශික්ෂණ) රෝහල කලාපයේ දන්ත වෛද්‍ය අධ්‍යාපනය, පර්යේෂණ සහ සෞඛ්‍ය සේවා සඳහා බහුවිධ කාර්යභාරයක් ඉටු කරයි. පීඨය විසින් වසර පහක දන්ත ශල්‍ය වෛද්‍ය උපාධි වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබයි.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- තුන්වන කණ්ඩායම වශයෙන් බඳවා ගැනීම්වල 48% ක වැඩිවීමක් සහිත 2021/2022 ශිෂ්‍ය කණ්ඩායම (සිසුන් 119) ඇතුළත් ගන්නා ලද අතර ඒ සමඟ වැඩසටහනේ මුළු සිසුන් සංඛ්‍යාව 582ක් විය.
- සිසුන් සඳහා ශිෂ්‍යත්ව 63ක් පිරිනැමීම සහ අවශ්‍යතා ඇති සිසුන් සඳහා ආහාර සහන වැඩසටහනක් පැවැත්වීම (100කට වැඩි සිසුන් පිරිසක් සඳහා).
- විෂයමාලා සංශෝධන ක්‍රියාකාරකම් සිදු කරන ලද අතර එයට අඛණ්ඩ ප්‍රතිපෝෂණ සමීක්ෂණ, පාර්ශ්වකරුවන්ගේ රැස්වීමක් සහ අදාළ වැඩමුළු කිහිපයක් ඇතුළත් විය.
- දන්ත වෛද්‍ය සිසුන් සඳහා අධ්‍යයන උපදේශනය ආරම්භ කරන ලදි.
- දේශීය හා විදේශීය සම්පත් දායකයින් විසින් පර්යේෂණ සහ ප්‍රකාශන, කෘත්‍රිම බුද්ධිය, දන්ත අධ්‍යාපනය සහ විෂයමාලා ප්‍රතිසංස්කරණ ඇතුළු විවිධ අංශ පිළිබඳ ව වැඩමුළු 11ක් පවත්වන ලදි.
- තුන්වන උපාධි අපේක්ෂක පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම.
- දන්ත වෛද්‍ය පීඨයේ සහ රෝහල් සංකීර්ණයේ, ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය විසින් ප්‍රදානය කරන ලද පහසුකම පිළිබඳව 25 වැනි සංවත්සරය සැමරීම.
- විශ්වවිද්‍යාල විවෘත දිනයට සමගාමී ව පීඨ විවෘත දිනය සංවිධානය කිරීම.

ප්‍රධාන ජයග්‍රහණ

- මහාචාර්ය ලක්ෂ්මන් සමරනායක මුල් වෘත්තීය පර්යේෂණ විශිෂ්ටතා සම්මානය ස්ථාපිත කිරීම.
- ජපාන රජය විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති මහාචාර්ය උපුල් බී. දිසානායක වෙත The Order of the Rising Sun-Gold Rays with Neck Ribbon Award සම්මානය පිරිනැමීම.
- ඉන්දියාවේ සහ මැලේසියාවේ අවබෝධතා ගිවිසුම් තුනකට එළඹීම.
- ඉන්දියාවේ සවීතා දන්ත වෛද්‍ය විද්‍යාලය සමඟ ශිෂ්‍ය කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන, ඉන්දියාවේ සහ මෙරට වෘත්තීය ආයතන සමඟ සම්බන්ධ වී ජාත්‍යන්තර සම්මන්ත්‍රණ පැවැත්වීම.
- අභාවප්‍රාප්ත දයාම්බිගායි මහින්ද මහත්මියගේ අවසන් කැමැත්තෙන් රුපියල් මිලියන 17ක ප්‍රදානයක් දන්ත වෛද්‍ය පීඨය වෙත පිරිනැමීම.
- 2023 වර්ෂයේ දී දන්ත වෛද්‍ය විද්‍යා පීඨයෙහි ශාස්ත්‍රඥයින් විසින් වෘත්තීය සංගම්වල සහ විද්‍යා ආයතනවල දේශන හතරක් පවත්වනු ලැබීම.
- ජාත්‍යන්තර ප්‍රකාශකයින් සමඟ පෙළපොත් පරිච්ඡේද සම්පාදනය කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය ලබා දීම.
- ජාත්‍යන්තර දන්ත වෛද්‍ය ශිෂ්‍ය සංගමයේ මාර්ගගත සම්මන්ත්‍රණය සඳහා දන්ත වෛද්‍ය සිසුන්ගේ සහභාගීත්වය.
- ළමා දන්ත වෛද්‍ය අංශය සඳහා රොටරි ප්‍රදානයක් ලෙස ඉන්හෙලේෂන් සෙඩේෂන් ඒකකයක් ලබා ගැනීම.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	502
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	6
	විදේශීය	1
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	60
	තාවකාලික	7
	බාහිර	4
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		151

බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		1
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		2
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:8
ලැබූ සම්මාන	ජාතික	4
	ජාත්‍යන්තර	1
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		5

පර්යේෂණ නිමැවුම	
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන	55
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන	46

මූල්‍ය	රු.
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්	705,468,506.42
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය	1,405,315.75
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්	648,682,206.33
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය	1,292,195.63

2.5 ඉංජිනේරු පීඨය

(පීඨාධිපති, ආචාර්ය ඩී.එම්.යූ.අයි. දිසානායක විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

වර්ෂ 1950 දී ආරම්භ කරන ලද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය වනාහි ශ්‍රී ලංකාවේ පළමු වැනි ඉංජිනේරු පීඨය යි. වර්තමානයේ දී ඉංජිනේරු පීඨය විසින් රසායනික සහ ක්‍රියාවලි, සිවිල්, පරිගණක, විදුලි හා ඉලෙක්ට්‍රොනික, නිෂ්පාදන සහ කාර්මික සහ යාන්ත්‍රික යන ක්ෂේත්‍ර හයක් සඳහා ඉංජිනේරු විද්‍යාවේදී ගෞරව උපාධිය පිරිනමනු ලබන අතර ඒ සියලු උපාධි ජාත්‍යන්තර ඉංජිනේරු සන්ධාන ආයතනයේ ප්‍රතීතනය සහිත ව ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL) විසින් ප්‍රතීතනය කර ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- 2023 දෙසැම්බර් මාසයේ දී විශේෂීකරණ වැඩසටහන් හය ම ඇතුළත් ප්‍රධාන විෂයමාලා සංශෝධනයක් සඳහා සනාතන සභාවේ අනුමැතිය ලබා ගැනීම.
- විදේශ අරමුදල් මඟින් ක්‍රියාත්මක ACOVID-TEAL2 ඇතුළු ප්‍රධාන පර්යේෂණ ව්‍යාපෘති හතරක් සම්පූර්ණ කිරීම.
- විශේෂ උපාධි වැඩසටහන් තුනක් සඳහා ජාත්‍යන්තර ඉංජිනේරු සන්ධානයේ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ ප්‍රතීතනය ලබා ගැනීම සම්බන්ධ කටයුතු සම්පූර්ණ කිරීම.
- 2023 මැයි මාසයේ දී සිසුන් 430කට ආසන්න ඉංජිනේරු 16 කණ්ඩායම උපාධි ප්‍රදානය කිරීම සහ 2023 දෙසැම්බර් මාසයේ දී ඉංජිනේරු 17 කණ්ඩායම සඳහා අධ්‍යයන වැඩසටහන අවසන් කිරීම.
- 2020/21 වසර සඳහා සිසුන්බඳවා ගැනීම සහ සිසුන් 60 කට පමණ ශිෂ්‍යත්ව ලබා දීම.
- දෙපාර්තමේන්තු අවශ්‍යතා අනුව ඉංජිනේරු 20 කණ්ඩායමේ සිට ඉදිරි කණ්ඩායම් සඳහා සති 24ක අඛණ්ඩ කාර්මික පුහුණුවක් ලබා දීමේ වැඩසටහන සඳහා පහසුකම් සැලසීම.

ප්‍රධාන ජයග්‍රහණ

- පීඨ සාමාජිකයින් 16 දෙනෙකුට සිය පර්යේෂණ කටයුතු කිරීම සඳහා ජනාධිපති හෝ ඒ හා සමාන ප්‍රදාන හිමි විය.
- පීඨ සාමාජිකයින් දෙදෙනෙකු ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය විසින් පළමු 2% විද්‍යාඥයින් ලෙස පිළිගනු ලැබූ අතර තවත් සාමාජිකයින් හතර දෙනෙකු කීර්තිමත් ජාත්‍යන්තර සම්මාන ලබා ඇත.
- දේශීය හා විදේශීය ආයතන සමඟ නව අවබෝධතා ගිවිසුම් නවයක් අත්සන් කරන ලද අතර දැනට පවතින අවබෝධතා ගිවිසුම් පහක් අලුත් කරන ලදි.
- සිසුහු කිහිප දෙනෙක් ජාත්‍යන්තර හා දේශීය ක්‍රීඩා සහ වෙනත් ඒ ආශ්‍රිත තරග සඳහා සහභාගී වී ජයග්‍රහණ ලබා ගත්හ.
- E/22හි මීළඟ සිසුන් බඳවා ගැනීමේ සිට නව විෂය මාලාව ක්‍රියාත්මක කිරීමට නියමිත ය.
- ඉංජිනේරු නිර්මාණ මධ්‍යස්ථානය (EDC) විසින් ජාතික මට්ටමේ ව්‍යාපෘති කිහිපයක් ඇතුළු ව උපදේශන, පරීක්ෂණ සහ වැඩමුළු 49ක් පවත්වා විශ්වවිද්‍යාලයට මිලියන 80ක් උපයා දෙන ලදි.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	1797
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	2103
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	114
	තාවකාලික	81
	බාහිර	25
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		187
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		-
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		12
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:16
ලැබූ සම්මාන	ජාතික	16
	ජාත්‍යන්තර	4
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		15
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		149
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		75
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		1,570,511,536.05
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය		874,449.63
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		1,367,347,801.09
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය		761,329.51

2.6 කළමනාකරණ පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ආර්.එච්.කුරුප්පුගේ විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අලුතින් ම එකතු වූ පීඨය වනුයේ කළමනාකරණ පීඨය යි. කළමනාකරණ පීඨය මගින් රටේ සහ ලෝකයේ කාර්මික සංවර්ධනයට ගැළපෙන පරිදි නව උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් හඳුන්වා දී ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහනේ විෂය මාලාව සංශෝධනය කිරීම ආරම්භ කරන ලදි.
- ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහන සහ මූල්‍යය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන ඇත.
- සැපයුම් දාම කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී ගෞරව උපාධි වැඩසටහන සඳහා සනාතන සභා අනුමැතිය ලබා ගන්නා ලදි.
- නවකයින් සඳහා පෙරහුරු වැඩසටහනක්, ශාස්ත්‍රීය උපදේශන වැඩසටහනක්, කර්මාන්ත උපදේශන වැඩසටහනක් සහ සම සභායක ඉගෙනුම් වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි.
- විශ්වවිද්‍යාල පර්යේෂණ සභාව සමඟ සහයෝගීතාවයෙන් යුතු ව එහි තෙවන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය "අර්බුදවල දී ව්‍යාපාරවල ඔරොත්තු දීමේ හැකියාව" යන තේමාව යටතේ පවත්වන ලදි.
- "කළමනාකරණ උපාධි අපේක්ෂක සීමාවාසික සහ පර්යේෂණ සම්මන්ත්‍රණය - 2023" සංවිධානය කරන ලදි.
- පීඨයේ 5S සංකල්පය ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රධාන ජයග්‍රහණ

- CIPM සීමාසහිත යුනිලීවර් ශ්‍රී ලංකා සමාගම, කොළඹ කොටස් වෙළෙඳපොළ සහ EMJAY ඉන්ටර්නැෂනල් පෞද්ගලික සමාගම අතර අවබෝධතා ගිවිසුම් හතරක් අත්සන් කරන ලදි.
- ඉහළ ම මට්ටමේ ප්‍රතිඵල ලබා ගනිමින් පීඨයේ සහ අධ්‍යයනාංශවල AHEAD ව්‍යාපෘති නිමකරන ලදි.
- පීඨය සහ අධ්‍යයනාංශ මගින් ශිෂ්‍ය ප්‍රජාව සහ කාර්ය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් කාර්ය ලිපි පිළිබඳ වැඩසටහන් මාලාවක් සහ වැඩමුළු 40ක් පවත්වන ලදි.
- විවිධ පාර්ශ්වකරුවන් සඳහා ප්‍රජා සත්කාරක වැඩසටහන් 20ක් පවත්වන ලදි.
- කාර්ය මණ්ඩල සාමාජිකයෝ ජාත්‍යන්තර සහ ජාතික සම්මන්ත්‍රණවල සභාපතිවරුන් සහ මණ්ඩල සාමාජිකයින් ලෙස කටයුතු කළහ.
- 4000 මට්ටමේ උපාධි අපේක්ෂිකාවක වන යශෝදරා ජයරත්න මෙනවිය නවසීලන්තයේ AIESEC හි අලෙවිකරණ කමිටු අධ්‍යක්ෂවරිය ලෙස තේරී පත් ව ඇත.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	681
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	149
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	47
	තාවකාලික	10
	බාහිර	07
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		23
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		05
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		06
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1ඊ 14
ලැබූ සම්මාන	ජාතික	03
	ජාත්‍යන්තර	-
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		03
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		15
සමූළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		45
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		455,543,930.300
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය		668,933.82
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		378,509,128.79
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය		555,813.70

2.7 වෛද්‍ය පීඨය

(පීඨාධිපති, මහාචාර්ය එම්.වී.ජී. පින්ටෝ විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

වර්ෂ 1967 දී ආරම්භ කරන ලද වෛද්‍ය පීඨය, ශ්‍රී ලංකාවේ වෛද්‍ය උපාධි අපේක්ෂකයින් පුහුණු කරන ප්‍රමුඛතම ආයතනයක් වන අතර, විද්‍යාත්මකව පුහුණුව ලත් සමාජ වගකීම් සහිත දයානුකම්පිත වෛද්‍ය වෘත්තිකයින් රටට බිහි කිරීමට මෙම පීඨය කැපවීමෙන් කටයුතු කරයි. රටට සෞඛ්‍ය සේවා සැපයීමට සහ පර්යේෂණ කටයුතු සඳහා මෙමඟින් දායකත්වය ලබා දෙයි. වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සඳහා පරිපූර්ණ අධ්‍යයන වැඩසටහනක් ලබා දීම සහ වෛද්‍ය ක්ෂේත්‍රයේ උසස් පර්යේෂණ පැවැත්වීම සඳහා මෙම පීඨය අධ්‍යයන අංශ 18 කින්, ඒකක 3 කින් සහ මධ්‍යස්ථාන 5 කින් සමන්විත ව ක්‍රියාත්මක වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- පීඨය විසින් 2022 සහ 2023 කාලය තුළ ප්‍රධාන විෂයමාලා සංශෝධන කටයුතු ආරම්භ කරන ලදි.
- 2023 වර්ෂයේ දී ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ප්‍රතීතනය ලබා ගන්නා ලදි.
- විදේශීය සහයෝගීතාකරුවන් අතර හවුල්කාරිත්වය ශක්තිමත් කිරීම.
- PeMSARC 2023 වාර්ෂික පර්යේෂණ සමුළුව ආරම්භ කරන ලදි.
- ජපානයේ නිගාටා විශ්වවිද්‍යාලය සමග පවත්වන ලද ශිෂ්‍ය හුවමාරු වැඩසටහනට සිසුන් නව දෙනෙකු සහභාගී විය.
- තෝරාගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම.
- සිසුන් සඳහා නව ශිෂ්‍යත්ව ආරම්භ කිරීම.
- දැනට සිටින සිසුන් සඳහා උපාධි සම්පූර්ණ කිරීමට සහ පසුබෑම් ඉවත් කිරීමට කටයුතු කිරීම.
- විෂය බාහිර ක්‍රියාකාරකම් සඳහා ශිෂ්‍ය සහභාගීත්වය වැඩි කිරීම.
- වැඩමුළු, සම්මන්ත්‍රණ සහ ප්‍රජා සත්කාර ක්‍රියාකාරකම් පැවැත්වීම.

ප්‍රධාන ජයග්‍රහණ

- සිසුන් අන්තර් පීඨ, අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාව, මනෝචිකිත්සාව, විකිරණවේදය පිළිබඳ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්වලින් සහ අන්තර් පීඨ අධිකරණ වෛද්‍ය සහ වෙනත් අංශ පිළිබඳ තරගවලින් පළමුවන ස්ථානය ලබා ගැනීමට සමත් විය.
- පාඨමාලාව වසර පහකින් අවසන් කිරීමට සමත් විය.
- ප්‍රථම ස්ථානද දිනාගනිමින් ශිෂ්‍ය පර්යේෂණ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ඉදිරිපත් කිරීම සිදු විය.
- සිසුන් විසින් KSM" PeMSAA UK වශයෙන් වූ පර්යේෂණ සම්මාන දිනාගන්නා ලදි.
- පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් නව දෙනෙකුට ජනාධිපති සම්මාන හිමි විය.
- අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු මහාචාර්යවරුන් ලෙස උසස් කරන ලදි.
- විෂයමාලාව සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිර්දේශ හඳුන්වා දෙන ලදි.
- ශිෂ්‍ය අධ්‍යයන අවකාශ පුළුල් කරන ලදි.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	1327
	විදේශීය	45
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	42
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථීර	123
	තාවකාලික	28
	බාහිර	66
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		197
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		01
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		02
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:11
ලැබූ සම්මාන	ජාතික	09
	ජාත්‍යන්තර	01
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		03
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		95
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		109

මූල්‍ය	**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්	1,436,404,216.54
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය	1,046,941.85
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්	1,281,203,412.33
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය	933,821.73

2.8 විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය ආර්.ජී.එස්.සී. රාජපක්ෂ විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

විද්‍යා පීඨය වනාහි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විශාලතම අධ්‍යයන ආයතනයකි. මෙම පීඨය මගින් සිසුන්ට ස්වභාවික හා ආගණක විද්‍යාවන් පිළිබඳ ව ඉගෙනීමේ සහ ගවේෂණාත්මක අධ්‍යයන චාරිකාවක් පිරිනැමීම සිදුකෙරේ. විද්‍යා පීඨය අධ්‍යයනාංශ නවයකින් සහ ඒකක දෙකකින් සමන්විත වේ. පීඨය වාර්ෂික ව සිසුන් 500කට අධික සංඛ්‍යාවක් ඇතුළත් කර ගන්නා අතර සිව් අවුරුදු උපාධි වැඩසටහන් කිහිපයක් පවත්වනු ලබයි.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- ඕස්ට්‍රේලියාවේ ෆෙඩරේෂන් විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා "නිවර්තන ජෛව විවිධත්වය සහ සංරක්ෂණය" පිළිබඳ කෙටි පාඨමාලාවක් පවත්වනු ලැබිණි.
- චාමර්ස් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ සහ ගොතන්බර්ග් විශ්වවිද්‍යාලයේ සහයෝගීතාකරුවන්, 40 වසරක පර්යේෂණ සහයෝගීතාව සැමරීම සඳහා ක්‍රියාකාරකම් කිහිපයකට සහභාගී විය.
- වන ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති දෙකක් අවසන් කරන ලදි.
- සිසුන් සඳහා කර්මාන්ත දිනය 2023 සහ "හඩල් වැඩමුළුව" සාර්ථක ව පවත්වන ලදි.

ප්‍රධාන ජයග්‍රහණ

- විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හය දෙනෙක් 2019-2020 සඳහා ජනාධිපති පර්යේෂණ සම්මානය ප්‍රදානය කෙරිණි.
- ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය සඳහා විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් හතර දෙනෙකු තේරී පත් වී ඇත.
- විශේෂයෙන් - පෘථිවිය, දේශගුණය සහ පාරිසරික විද්‍යාව ආදි වශයෙන් වූ අයිතම 6 යටතේ එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ලෝක විද්‍යා ඇකඩමියෙහි සාමාජිකයෙකු ලෙස තේරී පත් වී ඇත.
- විද්‍යා ක්ෂේත්‍රයේ පර්යේෂණවල විශිෂ්ටත්වය ඇගයීම සඳහා ක්ෂේත්‍ර IV යටතේ 2022 දී වඩාත් ම විශිෂ්ට ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා : "CVCD විශිෂ්ටතා සම්මාන සඳහා ජීවිත විද්‍යාව" සඳහා "මහාචාර්ය ලක්ෂ්මන් සමරනායක සම්මානය 2023" සහ "ප්‍රකට කාන්තා විද්‍යාඥ සම්මානය 2023" පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් වෙත ප්‍රදානය කර ඇත.
- අභ්‍යවකාශ පර්යේෂණ හා සංවර්ධන ප්‍රදාන පිළිබඳ ආසියානු කාර්යාලය විසින් ජාත්‍යන්තර පර්යේෂණ ප්‍රදානයක් පිරිනමන ලදි.
- පීඨයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් සමපදස්ත සමාලෝචිත සඟරාවල පර්යේෂණ ලිපි 162ක් ප්‍රකාශයට පත් කරන ලදි.
- විද්‍යා පීඨයේ සිසුන් සඳහා "හොඳ ම උපාධි භෞතික විද්‍යා පර්යේෂණ ව්‍යාපෘති සම්මානය - 2022" පිරිනමන ලද අතර ඔවුන් විසින් වර්සිටි බැට්ල්ස් අන්තර්-පීඨ ප්‍රශ්න විචාරාත්මක තරගයේ ජයග්‍රහණය ලබාගන්නා ලදි.
- විද්‍යාවේදී සහ විද්‍යාවේදී ගෞරව වැඩසටහන් සමාලෝචනය "A" ශ්‍රේණි ලබාගනිමින් සම්පූර්ණ කරන ලදි.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	2513
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	-
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	109
	තාවකාලික	106
	බාහිර	81
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		120
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		18
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		-
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:23
ලැබූ සම්මාන	ජාතික	13
	ජාත්‍යන්තර	1
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		31
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		127
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		159
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		1,679,105,036.63
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය		668,167.54
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		1,394,834,175.85
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය		555,047.42

2.9 පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය

(පීඨාධිපති, මහාචාර්ය පී.ජී.ඒ. පුෂ්පකුමාර විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය පශු වෛද්‍යවරුන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක ව පවතින එක ම උසස් අධ්‍යාපන ආයතනය වේ. 2020 වර්ෂයේ දී අලුතින් ක්‍රියාත්මක කරන ලද විෂය මාලාවක් මඟින් පශු වෛද්‍ය විද්‍යාවේදී උපාධි (BVSc) වැඩසටහන පුළුල් පස් අවුරුදු පාඨමාලාවක් ලෙස ව්‍යාප්ත කරන ලදි. සෑම කණ්ඩායමක් සඳහා ම වාර්ෂික සිසුන් බඳවාගැනීමේ ප්‍රමාණය දැනට 110ක් ලෙස පවතී.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- මධ්‍ය-වෘත්තීය ශාස්ත්‍රඥයින් සඳහා සායනික පුහුණුව ලබා දීම පිණිස එක්සත් ජනපදයේ උර්බානා-චැම්පේන් ඉලිනොයිස් විශ්වවිද්‍යාලය සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.
- අධ්‍යයන වැඩසටහන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා නව විෂයමාලාව සඳහා සුළු සංශෝධන යෝජනා කරන ලදි.
- වාහකයින් මඟින් බෝවන සත්ත්ව විශේෂ අවබෝධ කර ගැනීම සඳහා ප්‍රවේණික ප්‍රවේශයන් පිළිබඳ තෙදින ජාත්‍යන්තර වැඩමුළුවක් ඒකාබද්ධ පර්යේෂණ සහ ආදර්ශන මධ්‍යස්ථානයේ දී පවත්වන ලදි.
- අනවශ්‍ය අභිජනනය වැළැක්වීම සඳහා සුනඛයන් සහ බළලුන් වඳ භාවයට පත් කිරීම පිණිස වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි.
- පශු වෛද්‍ය අධිකරණ වෛද්‍ය ව්‍යාධි විද්‍යාව සම්බන්ධ ව කටයුතු කිරීම සඳහා සංසදයක් පිහිටුවන ලදි.
- පශු වෛද්‍ය ආදි ශිෂ්‍යයන් විසින් එක් ව්‍යාපෘතියකට රුපියල් මිලියන 0.5ක් බැගින් වූ ව්‍යාපෘති දෙකකට සහාය ලබා දෙන ලදි.

ප්‍රධාන ජයග්‍රහණ

- එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ජනාධිපති සම්මානයෙන් පිදුම් ලැබීය.
- ජාත්‍යන්තර පරමාණුක බලශක්ති නියෝජිතායතනයෙන් (IAEA) කොන්ත්‍රාත් පර්යේෂණ ව්‍යාපෘති දෙකක් සහ තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘතියක් සාර්ථක ව හිමිකර ගැනීම.
- එක්සත් රාජධානියේ ඕෂන් කන්ට්‍රි සහයෝගිතා වැඩසටහනේ සහාය හරහා දර්ශනපති උපාධි ව්‍යාපෘති හතරක් සඳහා සම්පූර්ණ අරමුදල් ලබා ගැනීම.

පීඨයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව	දේශීය	452
	විදේශීය	-
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	185
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	42
	තාවකාලික	29
	බාහිර	15
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		75
බුද්ධිමය ප්‍රාග්ධනය		
පිරිනමන උපාධි අපේක්ෂක වැඩසටහන් ගණන		01
පිරිනමන පශ්චාත් උපාධි වැඩසටහන් ගණන		03
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:11
ලැබූ සම්මාන	ජාතික	01
	ජාත්‍යන්තර	-
2023 දී හඳුන්වා දුන් නව පාඨමාලා		-
2023 දී ලද පර්යේෂණ ප්‍රදාන		08
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		49
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		36
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		502,264,631.48
ක්ෂයවීම් සහිත ඒක ශිෂ්‍ය පිරිවැය		1,111,204.94
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		451,134,337.38
ක්ෂයවීම් රහිත ඒක ශිෂ්‍ය පිරිවැය		998,084.82

2.10 කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ, මහාචාර්ය සී.එම්.බී. දෙමටවැව විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

1979 වර්ෂයේ දී අංක 9 දරන ආඥාපනත මඟින් ස්ථාපිත කරන ලද කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පශ්චාත් උපාධි අධ්‍යාපනයේ පුරෝගාමියා බවට පත් විය. පුහුණු කෘෂිකාර්මික විද්‍යාඥයින් සඳහා පවතින ජාතියේ අවශ්‍යතාව සපුරාලීමේ අරමුණින් යුතු ව, දශක හතරකට වැඩි කාලයක් පුරා කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය විශිෂ්ටත්වයේ කලාපීය මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- ජාත්‍යන්තර සහභාගීත්වය ලබා ගනිමින් සහ තරුණ විද්‍යාඥයින් සඳහා වේදිකාවක් නිර්මාණය කරමින් 35 වැනි වාර්ෂික සමුළුව පවත්වන ලදි. පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ කර්මාන්ත සම්බන්ධ කර ගනිමින් සමුළුවට පෙර වැඩමුළු හතරක් පවත්වන ලදි.
- ඉතා ඉහළ H දර්ශකයක් සහිත කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි නිල සඟරාව වන නිවර්තන කෘෂි විද්‍යා පර්යේෂණ සඟරාවේ 35 වැනි වෙළුම නොමිලේ පවත්නා මාර්ගගත විවෘත ප්‍රවේශ උපාය මාර්ගය හරහා විදේශීය විද්වතුන්ගේ වැඩි සහභාගීත්වයක් සහිත ව ප්‍රකාශයට පත් කරන ලදි.
- පර්යේෂණ පහසුකම් අරමුදල (RFF) සහ පර්යේෂණ ප්‍රකාශන පහසුකම් අරමුදල (RPFF) යටතේ සිසුන්ට පර්යේෂණ ප්‍රදාන පහක් පිරිනමන ලදි.
- පර්යේෂණ ප්‍රදාන පහක් ප්‍රදානය කරන ලද අතර කැනඩා ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ සහයෝගීතා පර්යේෂණ ආරම්භ කර විද්‍යාපති සහ දර්ශනශූරී සිසුන්ට ශිෂ්‍යත්ව පිරිනැමීමට කටයුතු කරන ලදි.
- තිරසාර ජල කළමනාකරණය සඳහා CAPNET සමඟ සම්බන්ධතා ගොඩනගා ගන්නා ලදි.
- කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ශිෂ්‍යයෙකු විසින් තේ සැකසුම් තාක්ෂණය සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගන්නා ලදි.

ප්‍රධාන ජයග්‍රහණ

- ඕස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ත තාක්ෂණ විශ්වවිද්‍යාලය සමඟ පැවති ඒකාබද්ධ ආචාර්ය උපාධි වැඩසටහනේ ඉදිරිපත් කිරීම් සිදු කිරීම සඳහා සම්බන්ධ වූ දර්ශනශූරී උපාධි සිසුන් තිදෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පූර්ණ අරමුදල් සැපයීම සිදු කරන ලදි.
- 2019 සිට අඛණ්ඩ ව වසර හතරක් සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබා ගැනීමට හැකි විය.
- ස්වයං ව උත්පාදනය කරන ලද අරමුදල් උපයෝගී කර ගනිමින්, භාණ්ඩාගාරයෙන් කිසිදු අයවැය ප්‍රතිපාදනයක් නොමැති ව ආයතනය සාර්ථක ව පවත්වාගෙන යාමට හැකි විය.
- ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ Elsevier BV ලැයිස්තුවට අනුව ජීව සාමාජිකයින් දෙදෙනෙකු ලොව හොඳ ම විද්‍යාඥයින් 2% අතරට ශ්‍රේණිගත කර ඇත.

ආයතනයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	2178
	විදේශීය	01
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	-
	බාහිර	360
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		39
බුද්ධිමය ප්‍රාග්ධනය		
අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව		11
පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව	පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා	02
	ශාස්ත්‍රපති පාඨමාලා	30
	විද්‍යාපති පාඨමාලා	30
	සියලුම විෂයයන් පිළිබඳ දර්ශනපති පාඨමාලා	01
	සියලුම විෂයයන් පිළිබඳ දර්ශනශූරී පාඨමාලා	01
	ව්‍යාපාර පරිපාලනවේදී ඩිප්ලෝමා පාඨමාලා	01
ගුරු-ශිෂ්‍ය අනුපාතය		1:6
ලැබූ සම්මාන	ජාතික	15
	ජාත්‍යන්තර	05
ආරම්භ කරන ලද නව පාඨමාලා		01
ලැබූ පර්යේෂණ ප්‍රදාන		02
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		49
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		40
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		144,208,577.00
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		118,527,411.00

2.11 මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එස්.ජේ.එස්. ද මෙල් විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා ක්ෂේත්‍රවල උසස් අධ්‍යාපනය, පුහුණුව ලබාදීම සහ පර්යේෂණ වැඩි දියුණු කිරීම අරමුණු කොට ගෙන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 A වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්පාදනය කරන ලද ආඥාපනතකට අනුව 2014 වසරේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIHS) පිහිටුවන ලදි. මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යාවල අධ්‍යාපනය, පර්යේෂණ සහ නිර්මාණාත්මක චින්තනයේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම සහ සමාජය කෙරෙහි සිය යුතුකම පිළිබඳ හැඟීමකින් යුතු ව සබුද්ධික හා ස්වාධීන චින්තනය තුළින් දැනුමේ ප්‍රගමනයට කැප වී සිටින විද්වතුන්, පර්යේෂකයන් සහ වෘත්තිකයන් බිහි කිරීම මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුණ වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- 2023 දෙසැම්බර් මාසයේ දී පර්යේෂණ සමුළුව පවත්වන ලදි. ප්‍රධාන වශයෙන් ආයතනයේ පශ්චාත් උපාධි සිසුන්ගේ පත්‍රිකා 72ක් එහි දී පිළිගනු ලැබූ අතර සිසුන් විසින් එම පත්‍රිකා සමුළුවේ දී ඉදිරිපත් කරන ලදි.
- පර්යේෂණ නිමැවුම අනුව බලන කල දර්ශනපති සිසුන් 14ක් සහ දර්ශනශූරී සිසුන් 7ක් සිය පාඨමාලා සම්පූර්ණ කර ඇත.
- උපාධි පාඨමාලා කිහිපයකට අදාළ විෂයමාලා සංශෝධන කටයුතු සාර්ථක ව සිදු කරන ලදි.
- ආයතනය විදේශීය විශ්වවිද්‍යාල/ආයතන සහ පළාත් පාලන ආයතන සමග සිය සහයෝගීතාව අඛණ්ඩ ව පවත්වාගෙන ගිය අතර මෙයට;
  - අග්නිදිග නෝර්වේ විශ්වවිද්‍යාලය සමග මානව හිමිකම් සහ බහු සංස්කෘතිකවාදයට අදාළ ව කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය සංචලනය.
  - කෙටි කාලීන සහතිකපත්‍ර පාඨමාලා පැවැත්වීම, ඉගැන්වීම සඳහා උපකරණ මිල දී ගැනීම, ජාතික සමුළුවක් සම-සංවිධානය කිරීම සහ බෙල්ජියමේ Vrije විශ්වවිද්‍යාලය විසින් මෙහෙයවනු ලබන ව්‍යාපෘතියක ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩල සහභාගීත්වය සහ තවත් විශ්වවිද්‍යාල හයක් සම්බන්ධ කිරීම.
  - කැනඩා රජය සහ ශ්‍රී ලංකා රජය අතර ඒකාබද්ධ වැඩසටහනක් වන NLEAP ව්‍යාපෘතිය යටතේ ජාතික භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පර්යේෂණ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ පර්යේෂණ සොයාගැනීම් ව්‍යාප්ත කිරීම මහජන කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කිරීම.
  - යුනිසෙෆ් සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර ඒකාබද්ධ ප්‍රයත්නයක් වන ප්‍රාථමික අධ්‍යාපනයේ බහු මට්ටමේ ඉගැන්වීම් (MLT) ප්‍රවේශය මත ධාරිතා වර්ධනය සහ විෂයමාලා සංවර්ධනය, යනාදි කරුණු ඇතුළත් විය.

ප්‍රධාන ජයග්‍රහණ

- අභ්‍යන්තර තත්ත්ව සහතික කිරීමේ ඒකකය එහි අවධානය (IQAC) මෙහෙයුම් ආයතනික සමාලෝචනය (2023) සහ ඉදිරි පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචන (2024-2028) සඳහා සූදානම් වීම කෙරෙහි යොමු කරන ලදි.
- සාමාන්‍ය පරිපාලන මෙහෙයුම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා කොන්ත්‍රාත් පදනම මත අතිරේක සේවක සංඛ්‍යාව බඳවා ගැනීම සම්පූර්ණ කරන ලදි.

ආයතනයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය			
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය		3278
	විදේශීය		73
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර		180
	බාහිර		
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව			
බුද්ධිමය ප්‍රාග්ධනය			
අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව			05
පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව	පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා		22
	ශාස්ත්‍රපති පාඨමාලා		27
	දර්ශනපති	මානව ශාස්ත්‍ර සහ සමාජීය විද්‍යා ක්ෂේත්‍රයේ සියලුම විෂයයන්	
	දර්ශනශූරී		
ගුරු-ශිෂ්‍ය අනුපාතය			
ලැබූ සම්මාන	ජාතික		
	ජාත්‍යන්තර		
ආරම්භ කරන ලද නව පාඨමාලා			
ලැබූ පර්යේෂණ ප්‍රදාන			
පර්යේෂණ නිමැවුම			
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන			72
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන			-
මූල්‍ය			**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්			114,228,900,73
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්			102,794,709,47

2.12 වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එස්.බී. ධර්මරත්න විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 A (1) වගන්තිය යටතේ 2019 සැප්තැම්බර් 9 වැනි දින ආරම්භ කරන ලද අතර එය 2019 අංක 2141/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ආයතනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ආයතනයකි. වර්තමානයේ ආයතනය විසින් ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MSc.ESS) සහ මහජන සෞඛ්‍යය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) යන උපාධි වැඩසටහන් දෙකක් පවත්වාගෙන යනු ලබයි.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2023 අප්‍රේල් මාසයේ දී ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති (MSc.ESS) සහ මහජන සෞඛ්‍යය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) උපාධි වැඩසටහන් සඳහා පළමු සිසුන් කණ්ඩායම ඇතුළත් කර ගන්නා ලදී.

- නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ පර්යේෂණ මධ්‍යස්ථානය සමග සහයෝගයෙන් යුතු ව 2023 අගෝස්තු මාසයේ දී නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.

ප්‍රධාන ජයග්‍රහණ

- ව්‍යායාම සහ ක්‍රීඩා විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (MSc.ESS) සහ මහජන සෞඛ්‍ය පිළිබඳ ශාස්ත්‍රපති (MPH) උපාධිය යන උපාධි දෙකක වැඩසටහන් ආරම්භ කරමින් වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2023 වර්ෂයේ දී සිය අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලදී.

- කාර්යමණ්ඩල සහ ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ නව උපාධි වැඩසටහන් ආරම්භ කිරීම සම්බන්ධයෙන් ස්ටැන්ෆර්ඩ් විශ්වවිද්‍යාලය සමග සාකච්ඡා ආරම්භ කරන ලදී.

ආයතනයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	58
	විදේශීය	-
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	-
	බාහිර	30
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		2
බුද්ධිමය ප්‍රාග්ධනය		
අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව		04
පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව	පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා	-
	ශාස්ත්‍රපති	02
	දර්ශනපති	-
	දර්ශනශූරී	-
ගුරු-ශිෂ්‍ය අනුපාතය		
ලැබූ සම්මාන	ජාතික	-
	ජාත්‍යන්තර	-
ආරම්භ කරන ලද නව පාඨමාලා		02
ලැබූ පර්යේෂණ ප්‍රදාන		-
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		-
සමුළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		-
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		20,406,440
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		20,042,427

2.13 විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(අධ්‍යක්ෂ, මහාචාර්ය එච්.එම්.ටී.ජී.ඒ. පිටවල විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

විද්‍යා පශ්චාත් උපාධි ආයතනය පශ්චාත් උපාධි වැඩසටහන් සහ විද්‍යාත්මක පර්යේෂණ හරහා විද්‍යාව, තාක්ෂණය සහ සමාජයේ දියුණුව අරබයා කටයුතු කරයි. එමඟින් විද්‍යාවේ සියලු ම අංශවල අන්තර්විෂයීක පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ ආවරණය කිරීම සිදුවේ. වසර ගණනාවක් පුරාවට විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි විවිධ විශ්වවිද්‍යාලවල සිසුන්ගේ සහභාගීත්වයෙන් යුතු ව අධ්‍යයන මණ්ඩල 11ක් යටතේ පශ්චාත් උපාධි වැඩසටහන් කිහිපයක් පවත්වමින් සාර්ථක ව ව්‍යාප්ත වී ඇත. විද්‍යා පශ්චාත් උපාධි ආයතනය අඛණ්ඩ ව විද්‍යා ක්ෂේත්‍රවල නායකයින් සංවර්ධනය කිරීම සිදු කරන අතර ජාතික හා ජාත්‍යන්තර ගැටලුවලට විසඳුම් සෙවීම කෙරෙහි අවධානය යොමු කරමින් එහි පර්යේෂණ සිදුකිරීම තුළින් සමාජයේ අභිවෘද්ධිය සඳහා ද දායක වේ.

ප්‍රධාන ක්‍රියාකාරකම් සහ පවත්වන ලද වැඩසටහන්

- නව වැඩසටහන් සඳහා විෂයමාලා පුළුල් ලෙස සංවර්ධනය කිරීම සිදු කළ අතර පවතින වැඩසටහන් සහ විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අත්පොත සඳහා වඩාත් දියුණු සංශෝධන සිදු කරන ලදි.
- 2023 වර්ෂයේ දී විවිධ ශාස්ත්‍රපති /විද්‍යාපති වැඩසටහන් සඳහා සිසුන් ඇතුළත් කර ගන්නා ලද අතර දර්ශනපති සහ දර්ශනශූරී උපාධි වැඩසටහන් සඳහා සිසුන් 60කට අධික ප්‍රමාණයක් ලියාපදිංචි කරන ලදි.
- 2024 දී පූර්ණ ලෙස ඒකාබද්ධ කිරීම සඳහා සැලසුම් කර ඇති මෙහෙයුම් ක්‍රියාවලීන් විධිමත් කිරීම සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ක්‍රියාත්මක කිරීමට කටයුතු සූදානම් කරන ලදි.
- විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය (RECON-2023) ඇතුළු ව ජාතික හා ජාත්‍යන්තර වෙබිනාර්, වැඩමුළු, කෙටි පාඨමාලා සහ සම්මන්ත්‍රණ රාශියක් සංවිධානය කිරීම සහ සත්කාරකත්වය ලබා දීම සිදු කරන ලදි.
- ලොව පුරා කීර්තිමත් පර්යේෂණ ආයතන සමග සම්බන්ධ වී සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදි.

ප්‍රධාන ජයග්‍රහණ

- පාරිසරික ගැටලු පිළිබඳ ජාත්‍යන්තර සඟරාව (IJEI) ආරම්භ කරන ලදි.
- ගෝලීය අධ්‍යයන සහයෝගීතාව පෝෂණය කරමින් විශේෂයෙන් චීන සිසුන්ට දැනුම ලබා දීම අරමුණු කොටගෙන ශාස්ත්‍රපති වැඩසටහනක් සාර්ථක ව ආරම්භ කරන ලදි.
- පර්යේෂණ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සහ ක්ෂේත්‍රයට දායකත්වය සැපයීම ඉලක්ක කරගනිමින් ජෛව විවිධත්ව පර්යේෂණ විශිෂ්ටතා ඒකකයක් ස්ථාපිත කිරීම.
- පර්යේෂණ හැකියාවන් වැඩි දියුණු කරමින් උසස් රසායනාගාර පිහිටුවීම සඳහා අති නවීන උපකරණ ලබා ගැනීම.
- 2022 වසර සඳහා තත්ත්වාගණනය කළ විගණන මතයක් ලැබීම.
- විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ උත්පාදිත අරමුදල් හරහා අරමුදල් සපයන ලද නව පර්යේෂණ ප්‍රදාන එකොළහක් සහ ව්‍යාප්ති ප්‍රදාන දහයක් පිරිනැමීම.

ආයතනයේ ප්‍රධාන සංඛ්‍යාලේඛන

මානව ප්‍රාග්ධනය		
පශ්චාත් උපාධි සිසුන් සංඛ්‍යාව	දේශීය	1973
	විදේශීය	29
අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව	ස්ථිර	233
	බාහිර	
අනධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව		27
බුද්ධිමය ප්‍රාග්ධනය		
අධ්‍යයන මණ්ඩල සංඛ්‍යාව		11
පිරිනමනු ලබන පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව	පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා	1
	ශාස්ත්‍රපති	28
	දර්ශනපති	11
	දර්ශනශූරී	11
ගුරු-ශිෂ්‍ය අනුපාතය		
ලැබූ සම්මාන	ජාතික	
	ජාත්‍යන්තර	
ආරම්භ කරන ලද නව පාඨමාලා		
ලැබූ පර්යේෂණ ප්‍රදාන		
පර්යේෂණ නිමැවුම		
සමපදස්ත-සමාලෝචිත සඟරාවල පළ කරන ලද පර්යේෂණ ප්‍රකාශන ගණන		63
සමූළුවල දී සිදු කරන ලද ඉදිරිපත් කිරීම් ගණන		186
මූල්‍ය		**රු.**
ක්ෂයවීම් සහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		184,359,095
ක්ෂයවීම් රහිත සම්පූර්ණ මෙහෙයුම් වියදම්		135,611,875

3. මූල්‍ය කාර්ය සාධනය

(මූල්‍යාධිකාරී, ඒ.එම්.එන්.බී අරම්පත් මහතා විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලන අංශය විශ්වවිද්‍යාලයේ මූල්‍ය මෙහෙයුම් කළමනාකරණයේ විශිෂ්ටත්වය පවත්වා ගෙන යාම සඳහා අඛණ්ඩ ව කැපවීමෙන් කටයුතු කරයි. අපගේ අංශය මුදල් කළමනාකරණය, මූල්‍ය සැලසුම්කරණය සහ අයවැයකරණය, භාණ්ඩාගාර කළමනාකරණය, මූල්‍ය වාර්තාකරණය, ව්‍යවස්ථාපිත සබඳතා සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ඇතුළු පුළුල් පරාසයක මූල්‍ය කළමනාකරණ කාර්යයන් රැසක් ආවරණය කරයි. පෙර වසරවල ගොඩනඟන ලද ශක්තිමත් පදනම මත හිඳ මෙම වාර්තාව මඟින් 2023 වසරේ අපගේ කාර්ය සාධනය ගෙනහැර දැක්වීම සිදුකෙරේ.

මෙහෙයුම් ව්‍යුහය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කළමනාකරණය කාර්යක්ෂම ව පවත්වා ගෙන යාමට වග බලා ගැනීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය පරිපාලන අංශය සකස් වී ඇත. පූර්ණ කාලීන නිලධාරියෙකු වන මූල්‍යාධිකාරී විසින් මෙහෙයවනු ලබන මෙම අංශයට පුළුල් පරාසයක් පුරා විහිදී යන මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරී ඇත. මෙම අංශය විසින් පීඨ සඳහා සේවය සපයන මධ්‍යම උප අංශ දොළහක (12) සහ ශාඛා දහයක (10) මෙන් ම සහ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන මධ්‍යස්ථානයේ ද මූල්‍ය මෙහෙයුම් අධීක්ෂණය කරනු ලබයි. මෙම කණ්ඩායම් අනෙකුත් වගකීම් අතර මුදල්, අයවැයකරණය, භාණ්ඩාගාර, මූල්‍ය වාර්තාකරණය, ව්‍යවස්ථාපිත සබඳතා සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් කළමනාකරණය කිරීම සඳහා සහයෝගීතාවෙන් යුතු ව ක්‍රියා කරයි.

2023 වර්ෂයේ දී මුහුණදීමට සිදු වූ අභියෝග සහ ලැබුණු අවස්ථාවන් මධ්‍යයේ වුව ද සමස්ත විශ්වවිද්‍යාලයේ මූල්‍ය කටයුතු ආවරණය කරන නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරු, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරු, සහකාර මූල්‍යාධිකාරීවරු සහ යටත් කාර්ය මණ්ඩලය වන පොත් තබන්නන් සහ කළමනාකරණ සහකාරවරුන්ගෙන් සමන්විත අපගේ කැප වූ කණ්ඩායම සියලු පාර්ශ්වකරුවන් වෙත සුවිශේෂී සේවාවක් සහ සහයෝගයක් ලබා දී ඇත.

ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය

2022 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද SAP Business One ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය අපගේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කරමින් 2023 වර්ෂයේ දී තවදුරටත් පරිණත වී ඇත. අපගේ මූල්‍ය සහ මෙහෙයුම් ක්‍රියාවලීන් කළමනාකරණය කිරීම සඳහා බාධා රහිත ව අවකාශ සලසමින් මෙම පද්ධතිය වර්තමානය වන විට විශ්වවිද්‍යාලය තුළ තිබෙන සියලු ම පීඨ, අධ්‍යයනාංශ, ශාඛා, ඒකක සහ මධ්‍යස්ථාන සම්පූර්ණයෙන් ම ඒකාබද්ධ කර ඇත. මාර්ගගත ගෙවීම්, ජංගම ප්‍රවේශ්‍යතාව සහ තීරණ ගැනීම සඳහා උසස් විශ්ලේෂණය වැනි ක්ෂේත්‍රවල අපගේ හැකියාවන් පුළුල් කිරීම සඳහා නව මොඩියුල සහ ක්‍රියාකාරකම් මෙම වසරේ දී හඳුන්වා දෙන ලදි. මෙම වැඩි දියුණු කිරීම් කඩදාසි භාවිතය අවම කිරීම, මූල්‍ය ක්‍රියාකාරකම් ස්වයංක්‍රීය කිරීම සහ විශ්වවිද්‍යාලය පුරා මෙහෙයුම් ක්‍රියාවලීන් ප්‍රමිතිකරණය කිරීම යන අපගේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා සැලකිය යුතු ලෙස දායක වී ඇත.

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ දළ විශ්ලේෂණය

ආදායම් වර්ධනය

2023 වර්ෂයේ දී, අපගේ උපායමාර්ගික ප්‍රයත්නයන්වල සඵලතාව සහ අපගේ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියේ ශක්තිමත් කාර්ය සාධනය පිළිබිඹු කරමින් අපගේ ආදායම් මාර්ගවල සුවිශේෂී වර්ධනයක් අපි නිරීක්ෂණය කළෙමු. රජයේ ප්‍රදාන සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් කාර්යක්ෂම ව කළමනාකරණය කිරීම සහ අපගේ ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීම හේතුවෙන් අපගේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් වී ඇත. නව්‍ය පර්යේෂණ ක්‍රියාකාරකම්, ජාත්‍යන්තර සහයෝගීතා සහ වැඩි දියුණු කළ සම්පත් කළමනාකරණය මඟින් මෙහෙයවනු ලබන අනෙකුත් ආදායම්වල වර්ධනයක් අපි අඛණ්ඩ ව නිරීක්ෂණය කළෙමු.

වියදම් කළමනාකරණය

2023 වසරේ අපගේ වියදම් අපගේ උපායමාර්ගික ප්‍රමුඛතා සහ මූල්‍ය සැලසුම් අරමුණු සමඟ අනුකූල වන පරිදි ඉතා සුපරීක්ෂාකාරී ව කළමනාකරණය කර ඇත. ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය සහ අනෙකුත් ක්‍රියාමාර්ග හරහා මෙහෙයුම් කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම, නොයෙකුත් අංශ හරහා සැලකිය යුතු පිරිවැයක් ඉතිරි කර ගැනීමට හේතු වී ඇත. අධ්‍යයන විශිෂ්ටත්වය, පර්යේෂණ නවෝත්පාදන සහ ශිෂ්‍ය සුබසාධනය වැනි උපායමාර්ගික ව වැදගත්කමක් ඇති ක්ෂේත්‍ර සඳහා සම්පත් වඩාත් ඵලදායී ලෙස වෙන් කිරීමට මෙමගින් අපට අවකාශ සැලසී ඇත.

අගය එකතු කිරීම සහ මූල්‍ය තත්ත්වය

අපගේ මූල්‍ය ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් විශ්වවිද්‍යාලයට අගය එකතු කිරීම අතින් 2023 වසරේ දී ධනාත්මක ප්‍රවණතාවක් පෙන්නුම් කර ඇත. උපායමාර්ගික ආයෝජන සහ වත්කම් ප්‍රශස්තකරණය සමඟ සහ සම්බන්ධ ව අපගේ මෙහෙයුම් වියදම් ප්‍රවේශමෙන් කළමනාකරණය කිරීම ශක්තිමත් මූල්‍ය තත්ත්වයක් ඇති වීම සඳහා හේතු වී ඇත. ප්‍රමුඛ අධ්‍යාපන ආයතනයක් ලෙස අපගේ ස්ථාවරය පවත්වා ගැනීම සඳහා ඉතා තීරණාත්මක සාධක වන යටිතල පහසුකම්, තාක්ෂණය සහ අධ්‍යයන සම්පත් සඳහා සිදු කෙරෙන ආයෝජන මනා ව පිළිබිඹු කරමින් විශ්වවිද්‍යාලයේ මුළු වත්කම් වර්ධනය වී ඇත.

මූල්‍ය තත්ත්වය (සුවිශේෂිතා)

විශ්වවිද්‍යාලයේ මුළු වත්කම් ප්‍රමාණය රු. බිලියන 32.5ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය වෙමින් 2023 වසරේ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් විය. අඛණ්ඩ ව සිදු වෙමින් පවතින යටිතල පහසුකම් වර්ධනය සහ විශ්වවිද්‍යාලයේ භෞතික හා අධ්‍යයන සම්පත්වල වැඩි දියුණු කිරීම් පිළිබිඹු කරමින් දේපළ, පිරියත සහ උපකරණවල ආයෝජනයන් සිදු කිරීම වත්කම්වල මෙම වර්ධනයට හේතු විය.

මුළු ජංගම නොවන වත්කම්

විශේෂයෙන් ම දේපළ, පිරියත සහ උපකරණවල, කෙරෙමින් පවතින කාර්යයන්වල, සහ සීමිත අරමුදල්වල වර්ධනයක් පෙන්නුම් කරමින් ජංගම නොවන වත්කම්වල කැපී පෙනෙන වැඩිවීමක් දක්නට ලැබුණි. මෙම වර්ධනය මගින් විශ්වවිද්‍යාලය සිය දිගුකාලීන උපායමාර්ගික අරමුණු සාක්ශාත් කර ගැනීමට සහාය වෙමින් එහි යටිතල පහසුකම් සහ අධ්‍යයන පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා දක්වන අඛණ්ඩ කැපවීම පිළිබිඹු වේ.

ජංගම වත්කම්වල සංයුතිය

2023 වර්ෂයේ ජංගම වත්කම්වල සංයුතියට මුදල් සහ මුදල් සමාන දෑ, ආයෝජන, අත්තිකාරම්, විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු දේ සහ ගබඩා භාණ්ඩ ඇතුළත් විය. ජංගම වත්කම්වල විවිධත්වය තුළින් විශ්වවිද්‍යාලය විසින් එහි ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම සහ මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ගනු ලැබූ උපායමාර්ගික ප්‍රවේශය අවධාරණය කෙරේ.

ජංගම වත්කම් සහ ජංගම වගකීම්

2023 වර්ෂයේ දී ජංගම වගකීම් සඳහා ජංගම වත්කම්වල අනුපාතය මගින් විශ්වවිද්‍යාලයේ ශක්තිමත් ද්‍රවශීලතා තත්ත්වය මැනවින් පෙන්නුම් කළ අතර එමගින් එහි කෙටි කාලීන වගකීම් පහසු ලෙස ඉටු කිරීමට හැකියාව ලැබී ඇති බව අනාවරණය විය. මෙම අනුපාතය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ශක්‍යතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව පෙන්නුම් කරන තීරණාත්මක දර්ශකයකි.

ඒක ශිෂ්‍ය පිරිවැය

විවිධ සම්පත් අවශ්‍යතා සහ අධ්‍යයන ප්‍රමුඛතා පිළිබිඹු කරමින් 2023 වර්ෂයේ දී එක් සිසුවෙකු සඳහා වන පිරිවැය එක් එක් පීඨ අනුව වෙනස් විය. සිසුන් සම්බන්ධයෙන් වන මෙම ආයෝජනය සිසුන්ට සිය සාර්ථකත්වය ළඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් සහ අවස්ථාවන්ට ප්‍රවේශ වීම සහතික කරමින් උසස් තත්ත්වයේ අධ්‍යාපනය සහ සහාය ලබා දීම පිණිස විශ්වවිද්‍යාලයේ කැපවීම පෙන්නුම් කරයි.

4. විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

(විගණන සහ කළමනාකරණ කමිටුවේ සභාපතිනිය, ඒ.ඒ.ටී.කේ. අධිකාරි මිය විසින් වාර්තා කරන ලද පරිදි).

හැඳින්වීම

රාජ්‍ය ව්‍යවසාය සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තියට අනුව, විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් 3 දෙනෙකුගෙන් හෝ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් 1/3 කින් සමන්විත විය යුතු අතර මූල්‍ය කළමනාකරණය පිළිබඳ දැනුම සහ සුදුසුකම්, සහිත එවැනි සාමාජිකයෙකු විගණන කමිටුවේ සභාපති ලෙස පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ මණ්ඩලය භාණ්ඩාගාර නියෝජිතයෙකුගෙන් සමන්විත වන සැම අවස්ථාවක ම එවැනි සාමාජිකයෙකු විගණන කමිටුවට පත් කළ යුතු අතර, කෝප් කමිටුවේ උපදෙස් පරිදි භාණ්ඩාගාරයේ නියෝජිතයා සභාපතිවරයා ලෙස පත් කළ යුතු ය.

2023 වර්ෂයේ දී, යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ, කළමනාකරණ විගණන දෙපාර්තමේනතු චක්‍රලේඛවල දක්වා ඇති විෂය පථය අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පහක් (05) පවත්වා එහි රාජකාරි ඉටු කරන ලද අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලන පද්ධති ශක්තිමත් කිරීම සහ පරිපාලන හා මූල්‍ය ක්‍රියා පටිපාටි වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරන ලදි.

ප්‍රගතිය

විගණන සහ කළමනාකරණ කමිටුව විසින් සමාලෝචිත වර්ෂය තුළ අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කිරීමට සහ නීති රීතිවලට අනුකූල ව කටයුතු කිරීමට මඟ පාදන ලද නිර්දේශ, උපදෙස් සහ යෝජනා රාශියක් ඉදිරිපත් කර ඇත. අඛණ්ඩ ව නවවැනි වසරටත් පේරාදෙණිය විශ්වවිද්‍යාලය විසින් 2022 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ව විගණකාධිපතිවරයාගෙන් තත්ත්වාගණනය කළ විගණන මතයක් ලබා ගන්නා ලදි.

අභ්‍යන්තර විගණන අංශය

විගණන හා කළමනාකරණ කමිටුවේ මඟපෙන්වීම යටතේ අභ්‍යන්තර විගණන අංශය විසින් සිදු කරන ලද වැදගත් කරුණු සහ කාර්යයන් පහත පරිදි සාරාංශ කළ හැකි ය.

- 2023 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණන හා කළමනාකරණ කමිටුව විසින් අනුමත කරන ලද වැඩසටහන් 17කින් විගණන වැඩසටහන් 15ක් ආවරණය කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාලන පද්ධති වැඩි දියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම් මත පදනම් ව අභ්‍යන්තර විගණන වාර්තා 54ක් නිකුත් කරමින් නිර්දේශ 300කට අධික ප්‍රමාණයක් ඉදිරිපත් කර ඇත.
- ප්‍රාග්ධන ව්‍යාපෘති, පුනරුත්ථාපනය, ප්‍රාග්ධන වත්කම් වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම් වැනි කොන්ත්‍රාත් කටයුතු පිළිබඳ ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් විගණනයක් සිදු කරන ලදි.
- ප්‍රධාන පුස්තකාලයේ සහ පීඨවල පුස්තකාලවල පුස්තකාල පොත් සත්‍යාපනය කිරීමේ පද්ධති සහ අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදුකරන ලද අතර සිසුන් සඳහා දායාද අරමුදල් ප්‍රදානය කිරීම සහ උපයෝගී කිරීම සිදු කරන ලදි.
- පුහුණු වැඩසටහන්, පර්යේෂණ මෙහෙයුම් සහ ස්වයං මූල්‍ය-උත්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ විශේෂ විගණනය සිදු කරන ලදි.
- තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය, මානව හිමිකම් මධ්‍යස්ථානය, භූ දර්ශන අංශය සහ පාරිසරික අධ්‍යයන මධ්‍යස්ථානය සහ සෞඛ්‍ය මධ්‍යස්ථානය යන මධ්‍යස්ථානවල මෙහෙයුම් පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.
- සායනික ලොකර් මිල දී ගැනීම පිළිබඳ ප්‍රසම්පාදන විගණනයක් පවත්වා ඒ සම්බන්ධයෙන් සිදු වූ පාඩු වාර්තා කරන ලදි.
- ගෙවීම් වවුචර සහ වාර්ෂික අයවැය සමාලෝචනය කිරීම සහ විගණනය කිරීම.
- ස්වයං මූල්‍ය පශ්චාත් උපාධි වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති/මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සහ තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු තාක්ෂණ විගණනයක් පැවැත්වීම.
- විද්‍යා සහ සම සෞඛ්‍ය විද්‍යා පීඨයට අදාළ පර්යේෂණ ප්‍රදාන පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.
- පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨයට අදාළ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්, වෙනත් අරමුදල් සහ පර්යේෂණ ප්‍රදාන භාවිතය පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරන ලදි.
- විශ්වවිද්‍යාල සිසුන්ට පශ්චාත් උපාධි හැදෑරීම සඳහා සහෘද ශිෂ්‍යත්ව හෝ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමේ දී අත්සන් කළ යුතු බැඳුම්කර සහ ගිවිසුමේ නිදර්ශක ඉදිරිපත් කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධතිය

විධිමත් කිරීම සඳහා කළමනාකරණ ලිපි නිකුත් කිරීම සිදුකරන ලදි.

- විගණකාධිපතිවරයාගේ විගණන විමසුම් සහ වාර්තාවල පෙන්වා දෙන ලද දෝෂ සහ අඩුපාඩු සම්බන්ධයෙන් පියවර ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නිලධාරීන්ට සහ අභ්‍යන්තර විගණකවරුන්ට උපදෙස් දෙන ලදි.

- විගණන විමසුම් සහ ඒවායේ පසු විපරම් ක්‍රියා පිළිබඳ ව යොමු කරන ලද පිළිතුරු අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම.

- මානව සම්පත් සංවර්ධනය, සේවකයින්ගේ පැමිණීම, දන්ත වෛද්‍ය පීඨයේ ගබඩා භාණ්ඩ සහ තොග සත්‍යාපනය, කොන්ත්‍රාත් පරිපාලනය, ආදායම, වියදම්, ආයෝජන, ප්‍රසම්පාදන, වැටුප් කළමනාකරණය, මූල්‍ය කළමනාකරණය කාර්ය මණ්ඩල නිල නිවාස කළමනාකරණය, බඳවා ගැනීම්, උසස්වීම්, විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම (වි.අ.අරමුදල නිදහස් කිරීම), බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝණය කිරීම, පාරිසරික කළමනාකරණය (භූමි අලංකරණය), මුදල් කළමනාකරණය යනාදිය පිළිබඳ පද්ධති සහ අභ්‍යන්තර පාලන වැඩි දියුණු කිරීම සඳහා සමාලෝචනය, ඇගයීම් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- මීට අමතර ව, අභ්‍යන්තර විගණන අංශය මගින් නියැදි විගණන ශිල්පීය ක්‍රම, පාලන පරීක්ෂණ, සාරභූත විශ්ලේෂණ ක්‍රියා පටිපාටි සහ සවිස්තරාත්මක සාරාංශ ක්‍රියාපටිපාටි භාවිත කරමින් එහි වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම ආවරණය කර ඇත.

- අභ්‍යන්තර විගණන අංශය විසින් 2023 වර්ෂය සඳහා පහත සාරාංශගත කර ඇති පරිදි අනිවාර්ය සාමාන්‍ය පූර්ව විගණන ක්‍රියාකාරකම් සිදු කර ඇත.

2023 වර්ෂය තුළ පූර්ව විගණන කටයුතුවලින් රුපියල් 1,071,888.86ක් විශ්වවිද්‍යාලය සඳහා ඉතිරි කර ගන්නා ලදි.

ජාතික විගණන කාර්යාලයේ විගණන විමසුම්

විගණකාධිපතිවරයාගෙන් ලැබුණු විගණන විමසුම්වලට පිළිතුරු ලබා දෙන ලද අතර විශ්වවිද්‍යාල අභ්‍යන්තර පාලන පද්ධතිය වැඩිදියුණු කිරීම මඟින් ඊට ප්‍රතිචාර දක්වා ඇත.

පූර්ව විගණන කටයුතු (ලිපිගොනු සංඛ්‍යාව)	එකතුව
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (ස්ථිර)	169
විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (තාවකාලික)	368
විශ්‍රාම පාරිතෝෂිකය	160
විශ්‍රාම වැටුප්	46
බැඳුම්කර සහ ගිවිසුම්	70
ඉදිකිරීම් කොන්ත්‍රාත්තු ගෙවීම	40
නිඟ වැටුප්	37
මුළු එකතුව	**890**

පසුගිය වසර හතර සම්බන්ධයෙන් පහත සඳහන් විස්තර පෙන්විය හැකි ය.

වර්ෂය	විගණන විමසුම් සංඛ්‍යාව	පිළිතුරු ලබාදුන් විගණන විමසුම් සංඛ්‍යාව	පිළිතුරු නොදුන්/ පිළිතුරු දිය යුතු විගණන විමසුම් සංඛ්‍යාව
2020	26	26	-
2021	27	27	-
2022	39	39	-
2023	35	26	09*

* පිළිතුරු සකස් කරමින් පවතී.

5. තිරසාරභාවය පිළිබඳ අනාගත ප්‍රක්ෂේපණ වාර්තාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පාරිසරික තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානයේ (CES) වෙබ් අඩවියේ (https://ces.pdn.ac.lk/Home.html) දක්වා ඇති ක්‍රියාකාරකම්වලින් දිරිමත් වෙමින්, සිය 2023 තිරසාර වාර්තාව ආඩම්බරයෙන් යුතු ව ඉදිරිපත් කරයි. පාරිසරික වගකීම, සමාජ බලපෑම සහ ආර්ථික ශක්‍යතාව ඇතුළත් වඩාත් තිරසාර අනාගතයක් උදාකරලීම සඳහා වන අපගේ අචල කැපවීම මෙම වාර්තාවෙන් මනා ලෙස පැහැදිලි වේ.

විශ්වවිද්‍යාලයේ තිරසාර වෙබ් අඩවිය

පාරිසරික තිරසාරත්වය සඳහා වූ මධ්‍යස්ථානය සම්පත් සැපයීම, තොරතුරු සහ ව්‍යාපෘති පිළිබඳ යාවත්කාලීන කිරීම්, පර්යේෂණ සහ ප්‍රජා සහභාගීත්ව කටයුතු වැනි තිරසාරත්වය සම්බන්ධ ක්‍රියාකාරකම් හා සම්බන්ධ ඉතා අගනා කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියා කරයි. එමඟින් සිසුන්, පීඨය, කාර්ය මණ්ඩලය සහ පුළුල් ප්‍රජාව අතර තිරසාර භාවිතයන් සඳහා දැනුම බෙදාගැනීම, සහයෝගීතාව ඇති කිරීම සහ උපදේශනය ආදී ක්‍රියාකාරකම් සිදු කෙරේ.

ජල සංරක්ෂණය

- දැනුම්වත් කිරීම: වගකීමෙන් යුතු ව ජලය භාවිතය ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම: ජල පරිභෝජනය අඩු කරමින් අඩු ප්‍රවාහයක් සහිත සවි කිරීම් සහ උපකරණ ස්ථාපනය කිරීම.
- භූමි අලංකරණ පිළිවෙත්: වාරිමාර්ග අවශ්‍යතා අවම කරමින් ජල-කාර්යක්ෂමතාව සහතික කරන භූමි අලංකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.

ප්‍රවාහන

- තිරසාර ගමනාගමනය: යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් සහ දිරිගැන්වීම් හරහා පා පැදි පැදීම, ඇවිදීම සහ තනි තනි වාහන වෙනුවට එක් වාහනයක් භාවිත කිරීම ආදි ක්‍රම දිරිමත් කිරීම.
- පොදු ප්‍රවාහනය: සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා වට්ටම් සහිත පොදු ප්‍රවාහන වාර ප්‍රවේශපත්‍ර ලබා දීම.
- දැනුම්වත් කිරීමේ ව්‍යාපාර: ඉලක්කගත වැඩසටහන් හරහා තිරසාර ගමනාගමන තේරීම් ප්‍රවර්ධනය කිරීම.

බලශක්ති කාර්යක්ෂමතාව

- වැඩි දියුණු කිරීම: බලශක්ති කාර්යක්ෂම මාදිලි සඳහා වැඩි දියුණු කළ ආලෝකකරණ උපාංග සහ උපකරණ භාවිත කිරීම.
- සුහුරු පාලනය: බලශක්ති භාවිතය ප්‍රශස්ත කිරීම සඳහා චලන සංවේදක සහ ස්මාර්ට් පාලන පද්ධති භාවිත කිරීම.
- පුනර්ජනනීය බලශක්තිය: පොසිල ඉන්ධන මත යැපීම අවම කරමින් සූර්ය පැනල වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් සඳහා ආයෝජනය කිරීම.
- බලශක්ති විගණන: අබණ්ඩ ව බලශක්ති විගණන සිදු කර සොයාගැනීම් මත පදනම් ව කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරීම.

තිරසාර ප්‍රසම්පාදනය

- වගකීම් සහිත ව ප්‍රසම්පාදනය කිරීම: පාරිසරික බලපෑම අවම කරමින් දේශීය සහ තිරසාර සැපයුම්කරුවන් ප්‍රමුඛතා අනුව පෙළ ගැස්වීම.
- ප්‍රතිචක්‍රීකරණය කරන ලද සහ පරිසර හිතකාමී නිෂ්පාදන: හැකි සෑම විට ම ප්‍රතිචක්‍රීකරණය කළ, ප්‍රතිචක්‍රීකරණය කළ හැකි සහ පරිසර හිතකාමී නිෂ්පාදන මිල දී ගැනීම.
- ඇසුරුම් අවම කිරීම: ප්‍රසම්පාදන හා සම්බන්ධ ඇසුරුම්කරණය සහ අපතේ යාම් අවම කිරීම.
- සදාචාරාත්මක ප්‍රසම්පාදනය: වගකීම් සහිත ශ්‍රම තත්ත්වය සහතික කරමින් සදාචාරාත්මක ප්‍රසම්පාදන භාවිතයන් ක්‍රියාත්මක කිරීම.

අපද්‍රව්‍ය අවම කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම

- පුළුල් කරන ලද වැඩසටහන්: කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන පුළුල් කිරීම.
- ආහාර අපතේ යාම අවම කිරීම: ආපනශාලා සහ භෝජන ශාලා තුළ ආහාර අපතේ යාම අවම කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- කඩදාසි සහ විද්‍යුත් අපද්‍රව්‍ය: කඩදාසි අපද්‍රව්‍ය අවම කිරීමට සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය වගකීමෙන් යුතු ව කළමනාකරණය කිරීමට වැඩසටහන් දියත් කිරීම.
- වගකීමෙන් යුතු අපද්‍රව්‍ය බැහැර කිරීම: දැනුම්වත් කිරීමේ ව්‍යාපාර සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම් හරහා සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර

වගකීම් සහගත අපද්‍රව්‍ය බැහැර කිරීමේ පිළිවෙත් දිරිමත් කිරීම.

- දේශීය හවුල්කාරිත්වය: වගකීම් සහිත ප්‍රතිචක්‍රීකරණය සහ අපද්‍රව්‍ය පිරිසැකසීම සඳහා දේශීය අපද්‍රව්‍ය කළමනාකරණ සමාගම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

ප්‍රජා සහභාගීත්වය

- ප්‍රාදේශීය වැඩසටහන් සහ වැඩමුළු: ප්‍රාදේශීය ප්‍රජාවගේ දැනුම්වත්භාවය සහ සහභාගීත්වය ප්‍රවර්ධනය කරමින් ඔවුන් සඳහා තිරසාර තේමාත්මක වැඩසටහන් සහ වැඩමුළු සංවිධානය කිරීම.

- දේශීය හවුල්කාරිත්වය: තිරසාර පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රජා අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාදේශීය සංවිධාන සමග එක් ව කටයුතු කිරීම.

- අධ්‍යාපනික සම්පත්: විවිධ ප්‍රජා කණ්ඩායම් සඳහා අධ්‍යාපනික සම්පත් ලබා දීම සහ තිරසාරභාවය පිළිබඳ පුහුණුව ලබා දීම.

- සහයෝගීතාව සහ ධනාත්මක බලපෑම වර්ධනය කරමින් ප්‍රජා-පාදක තිරසාර සංවර්ධන ව්‍යාපෘති සඳහා සහයෝගය ලබා දීම.

පීඨ විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- කෘෂි විද්‍යා පීඨය: සම්පත් කාර්යක්ෂමතාව සහ ආර්ථික තිරසාරත්වය ප්‍රවර්ධනය කරමින් ඒකාබද්ධ ගොවිපල මෙහෙයුම් සඳහා පුද්ගලික සමාගම් සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා එහි ප්‍රතිඵලයක් ලෙස ජල පරිභෝජනය 20%කින් අඩු කිරීමට හැකි වීම.

- සම සෞඛ්‍ය විද්‍යා පීඨය: රෝගීන්ට 30%කට වඩා වැඩි ප්‍රමාණයකට සේවය කරමින් සහ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සඳහා ප්‍රවේශය වැඩි දියුණු කරමින් දිවිනැගුම ගොඩනැගිල්ලේ භෞත චිකිත්සක සේවා කටයුතු පුළුල් කිරීම.

- දන්ත වෛද්‍ය විද්‍යා පීඨය: කඩදාසි පරිභෝජනය 15%කින් අඩු කරමින් සහ වගකිවයුතු සම්පත් කළමනාකරණය ප්‍රවර්ධනය කරමින් කඩදාසි භාවිතය රහිත ක්‍රමවේද සහ තිරසාර භාවිතය හඳුන්වා දීම.

- කළමනාකරණ පීඨය: සේවා ස්ථාන සංවිධාන කටයුතු සහ කාර්යක්ෂමතාව වර්ධනය කරමින් සහ ඵලදායිතාවයේ 10%ක වැඩිවීමකට මඟ පාදමින් 5S සංකල්පය ක්‍රියාවට නැංවීම.

- වෛද්‍ය පීඨය: මූල්‍ය තිරසාරභාවය ඉහළ නංවමින් සහ අගනා ඉගෙනුම් අත්දැකීම් ලබා දෙමින් තෝරාගත් ශිෂ්‍ය වැඩසටහන වැඩි දියුණු කිරීම සහ ආදායම් උත්පාදන කටයුතු ආරම්භ කිරීම.

තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය

- බලශක්ති පරිභෝජනය 12%කින් පමණ අඩු කරමින් බලශක්ති-කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම් සහ දත්ත මධ්‍යස්ථාන ප්‍රශස්තකරණය ඇතුළු හරිත තොරතුරු තාක්ෂණ වැඩසටහන් ආරම්භ කිරීම.

- සම්පත් භාවිතය ප්‍රශස්ත කරමින් සහ සහයෝගීතා නවෝත්පාදන ප්‍රවර්ධනය කරමින් සම්පත් සහ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම සඳහා බාහිර ආයතන සමග හවුල්කාරිත්ව ගොඩනඟා ගැනීම.

පර්යේෂණ

- කෘෂිකාර්මික, අපද්‍රව්‍ය කළමනාකරණය සහ පුනර්ජනනීය බලශක්තිය යන ක්ෂේත්‍රවලට අදාළ ව තිරසාර විසඳුම් කෙරෙහි අවධානය යොමු කරමින් වැදගත් ක්ෂේත්‍රවල දියුණුවට දායක වෙමින් බහුවිෂයීක පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීම.

අපද්‍රව්‍ය කළමනාකරණය

- 2025 වන විට අපද්‍රව්‍යවලින් තොර විශ්වවිද්‍යාලයක් ඉලක්ක කර ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදන සහ ප්‍රතිචක්‍රීකරණ වැඩසටහන් පුළුල් කිරීම.

6.

වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය 2023

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

ව්‍යවස්ථාපිත වාර්තාව

01. පොදු කරුණු

1.1 විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 106 (1) සහ 107 (ආ) වගන්ති ප්‍රකාර ව සහ පසුකාලීන සංශෝධන අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (6) වගන්තිය ප්‍රකාර ව සකස් කර ඉදිරිපත් කර ඇත.

1.2 රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ අංක: PE/168/4/2003 හා 2003.10.15 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූල ව, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIA), විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIS), මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIHS) සහ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIMS) මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කර නොමැත. මෙම ආයතන හතර විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතන ලෙස ස්ථාපිත කර ඇති නමුත් වෙන වෙන ම සංස්ථාගත කර ඇත. එබැවින් ඒවා වෙන ම ආයතන ලෙස සැලකේ.

1.3 අන් ආකාරයකින් ප්‍රකාශ කළහොත් මිස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPAS) අනුකූල ව සකස් කර ඉදිරිපත් කර ඇති අතර පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම (GAAP) සහ ප්‍රතිපත්ති අනුකූල වන සේ අනුගමනය කර ඇත.

02. මූල්‍ය සුවිශේෂීතා

2.1 රජයේ අරමුදල්

2.1.1 පුනරාවර්තන ප්‍රදාන ලැබීම්

විස්තරය	2023 වෙන් කිරීම් රු.	2023 රු.	2022 රු.
පුනරාවර්තන	7,975,000,000	7,975,000,000	7,790,000,000
මහපොළ ශිෂ්‍යත්ව	-	329,613,500	171,966,000
ශිෂ්‍යාධාර	-	58,714,400	45,868,000
එකතුව	**7,975,000,000**	**8,363,327,900**	**8,007,834,000**

2.1.2 ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් (ශ්‍රී ලංකා රජයෙන්)

විස්තරය	2023 වෙන් කිරීම් රු.	2023 රු.	2022 රු.
ගොඩනැගිලි ඉදිකිරීම්	257,800,000	257,800,000	110,000,000
උපකරණ, පොත්පත් සහ වාර සඟරා	125,000,000	125,000,000	60,000,000
ස්ථාවර වත්කම් පුනරුත්ථාපනය සහ නඩත්තුව	67,200,000	67,200,000	65,000,000
මානව ප්‍රාග්ධන සංවර්ධනය ප්‍රදාන	19,000,000	19,000,000	-
පර්යේෂණ සඳහා ප්‍රාග්ධන ප්‍රදාන	56,000,000	56,000,000	-
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන			3,500,000
අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රදාන	-	-	-
AHEAD ව්‍යාපෘති ප්‍රදාන	-	-	-
එකතුව	**525,000,000**	**525,000,000**	**238,500,000**

2.2 මෙහෙයුම් අතිරික්තය/(හිඟය)

2022 වර්ෂයේ ශුද්ධ අතිරික්තය වූ රු. 77,582,289.23ට සාපේක්ෂ ව 2023 වර්ෂයේ ශුද්ධ හිඟය රු. 342,546,288.53ක් විය. මූල්‍ය නොවන ගනුදෙනු ගැළපීමෙන් පසු විශ්වවිද්‍යාලයේ ශුද්ධ මෙහෙයුම් ප්‍රතිඵලය පහත පරිදි වේ.

විස්තරය	2023 රු.	2022 රු.
ශුද්ධ අතිරික්තය/ (හිඟය)	(342,546,288,.53)	(77,582,289.23)
මූල්‍ය නොවන ගනුදෙනු		
එකතු කළා - අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය කිරීම සඳහා දීමනා	1,604,156,417.32	1,073,565,004.25
පාරිතෝෂික ප්‍රතිපාදන	441,051,267.20	236,989,334.13
සංකල්ප වියදම් සඳහා ගැළපීමෙන් පසු ශුද්ධ මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	**1,702,661,395.99**	**1,232,972,049.15**

2.3 සේවකයින් සඳහා ලබා දෙන ලද ණය

විශ්වවිද්‍යාල සේවකයින්ට විවිධ ණය වර්ග හතරක් (ආපදා ණය, පරිගණක ණය, කාර්ය මණ්ඩල ණය සහ වාහන ණය) ලබා දෙන අතර එම ණය වසර හයක කාලයක් තුළ අයකර ගනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 70 ප්‍රකාර මාස 12ක් පුරා වසරක් ඇතුළත අය කර ගත යුතු ණය ශේෂවල පොළිය සහ වසරක් ඇතුළත මාස 10ක් තුළ අය කර ගත යුතු ණය ප්‍රාග්ධනය ජංගම වත්කම් ලෙස දැක්වෙන අතර ඉතිරිය ජංගම නොවන වත්කම් ලෙස දැක්වේ.

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලින් විශ්වවිද්‍යාල සේවකයන්ට ලබා දෙන ණය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පරිපාලනය කරනු ලබන අතර එම නිසා එය විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරනු නොලැබේ.

2.4 බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝණය කරන්නන්ගෙන් අය කර ගැනීම්

බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝණය කරන්නන්ගෙන් 2022 වර්ෂයේ දී අය කර ගන්නා ලද රු. 57,548,452.70 ක මුදලට සාපේක්ෂ ව රු. 115,326,086.64ක මුදලක් 2023 වර්ෂයේ දී අය කර ගැනීමට විශ්වවිද්‍යාලයට හැකි විය. 2023 දෙසැම්බර් 31 දිනට බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝණය කරන්නන්ගෙන් ලැබිය යුතු මුදල් සහ වගකීම් ශේෂයන් පහත දැක්වේ.

විස්තරය	2023 රු.	2022 රු.
ජනවාරි 1 වැනි දිනට ලැබිය යුතු ශේෂය	240,944,708.51	132,924,047.80
වර්ෂය තුළ එකතු කිරීම්/ගැළපීම්	196,027,883.85	165,569,113.41
වසර තුළ අය කිරීම්	(115,326,086.64)	(57,548,452.70)
දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	**321,646,505.72**	**240,944,708.51**

2.5 ශිෂ්‍යත්ව අරමුදල්

දේශීය හා විදේශීය පුද්ගලයින් සහ ආයතනික පරිත්‍යාගශීලීන් විසින් පිරිනමනු ලබන සෑම ශිෂ්‍යත්වයක් සඳහා ම විශ්වවිද්‍යාලය වෙන ම ශිෂ්‍යත්ව අරමුදල් පවත්වා ගෙන යයි. එවැනි අරමුදල්වල ආයෝජනවලින් ලැබෙන පොළී ආදායම ශිෂ්‍යත්ව කමිටුව විසින් අනුමත කරන ලද නිර්ණායකවලට අනුව ශිෂ්‍යත්ව ගෙවීම සඳහා යොදා ගැනීම සිදුවේ.

2.6 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ ලෙස අර්ථ දැක්වෙනුයේ අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ ඉහළ ද්‍රවශීලතාවකින් යුත් පහසුවෙන් දන්නා මුදල් ප්‍රමාණයට පරිවර්තනය කළ හැකි හා වටිනාකම වෙනස් වීමේ සුළු අවදානමක් පමණක් ඇති කෙටි කාලීන ආයෝජන වේ.

දෙසැම්බර් 31 දිනට සාරාංශගත බැංකු ගිණුම් ශේෂයන් පහත පරිදි වේ.

ගිණුම් වර්ගය	2023 රු.	2022 රු.
ඉතුරුම් ගිණුම්	139,333,759.32	2,307,879.42
ජංගම ගිණුම් - පර්යේෂණ	377,534,829.81	128,226,109.50
- පුනරාවර්තන	18,762,135.01	178,456,154.85
- ප්‍රාග්ධන	1,435,172.18	64,596,085.29
නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්	119,033,556.50	212,246,461.03
එකතුව	**656,099,452.82**	**585,832,690.09**

03. ගබඩා භාණ්ඩ

විශ්වවිද්‍යාලය විසින් එක් එක් පීඨය, අධ්‍යයනාංශය, මධ්‍යස්ථානය, ඒකකය සහ විශ්වවිද්‍යාල අංශ සඳහා පත් කරන ලද ස්වාධීන සමීක්ෂණ මණ්ඩල මගින් 2023 දෙසැම්බර් 31 දිනට ගබඩා භාණ්ඩවල භෞතික සත්‍යාපනය සිදු කරන ලදි. සත්‍යාපනය කරන ලද ශේෂයන් 2023 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ගළපා ඇත.

04. දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය වීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ අංක 649 සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි විධිවිධානවලට අනුකූල ව දේපළ, පිරියත සහ උපකරණ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත. පොත් සහ වාර සඟරා, ගොඩනැගිලි, පිරියත යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවිකුරු, උපාධි කබා, ඉගැන්වීම් උපකරණ සහ කාර්යාලයීය උපකරණ හැර දේපළ, පිරියත සහ උපකරණවල සියලු ම කාණ්ඩ 2023 ජනවාරි 01 වන දිනට ප්‍රත්‍යාගණනය කරන ලද අතර චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතවලට අනුව ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණයන් සඳහා ක්ෂයවීම් සඳහා

ප්‍රතිපාදන ලබා දෙනු ලැබේ.

05. ජීව විද්‍යාත්මක වත්කම්

පශු වෛද්‍ය හා සත්ත්ව විද්‍යා පීඨය සහ කෘෂි විද්‍යා පීඨය මඟින් ක්‍රියාත්මක වන දොඩම්ගොල්ල ගොවිපළේ, මාවලවත්ත ගොවිපළේ සහ උඩ පේරාදෙණිය ගොවිපළේ පවත්වාගෙන යනු ලබන පශු සම්පත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 18 හි ප්‍රතිපාදන අනුව මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ අගය කර දක්වා ඇත.

06. පාරිතෝෂික ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික පනතේ විධිවිධාන ප්‍රකාර විශ්වවිද්‍යාල සේවකයින්ගේ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. සේවක කාණ්ඩ අනුව 2023 දෙසැම්බර් 31 වැනි දිනට ලබා දෙන ලද පාරිතෝෂික ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.

සේවක කාණ්ඩය	2023 රු.	2022 රු.
අධ්‍යයන	1,696,178,911	1,589,683,252
අනධ්‍යයන	882,809,129	824,156,972
එකතුව	**2,578,988,040**	**2,413,840,224**

07. අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 හි දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාලය විසින් ගොනු කරන ලද සහ විශ්වවිද්‍යාලයට එරෙහි ව ගොනු කරන ලද නීතිමය නඩු හේතුවෙන් පැන නගින අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් මූල්‍ය ප්‍රකාශනවල උපලේඛන තුළ අනාවරණය කර ඇත.

08. ඒක ශිෂ්‍ය පිරිවැය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය සහ පසුගිය වසර 6 සමග සැසඳීම් පහත දක්වා ඇත.

වසර	වසර සිසුන් සංඛ්‍යාව	ක්ෂයවීම් සහිත ව සිසුවෙකු සඳහා පිරිවැය රු.	ක්ෂයවීම් රහිත ව සිසුවෙකු සඳහා පිරිවැය රු.	එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන ප්‍රදාන රු.
2023	14136	789.695	676,215	564,162
2022	13731	742,977	664,791	567,329
2021	12265	754,952	674,678	614,024
2020	11280	876,716	767,947	653,546
2019	10951	939,547	837,555	632,523
2018	12756	609,450	531,352	419,686

09. පූර්ව කාලපරිච්ඡේදය තුළ සිදු ව ඇති දෝෂ

2022 වර්ෂයට අදාළ පූර්ව කාලපරිච්ඡේද දෝෂ 2023 වර්ෂයේ දී හඳුනාගෙන ඇති අතර ඉදිරිපත් කරන ලද පූර්ව කාලසීමාවට අදාළ වත්කම්, වගකීම් සහ ශුද්ධ වත්කම්/හිමිකම්වල ආරම්භක ශේෂවල සංසන්දනාත්මක සංඛ්‍යා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03ට අනුකූල ව නැවත සටහන් කිරීමෙන් නිවැරදි කර ඇත.

10. පොදු කරුණු

සමාලෝචිත වර්ෂය සඳහා වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආයතනික සැලැස්මේ හඳුනාගෙන ඇති ඉලක්ක සහ අරමුණු සාක්ෂාත් කර ගැනීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය කටයුතු කර ඇත. මෙරට පුරෝගාමී විශ්වවිද්‍යාලයක් ලෙස උසස් අධ්‍යාපනය, පර්යේෂණ සහ නවෝත්පාදන යන ක්ෂේත්‍රවල සමාජ වගකීම් ඉටු කිරීමට පේරාදෙණිය විශ්වවිද්‍යාලය සමත් වී ඇත.

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2023 රු.	2022 රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	1	656,099,452.82	585,832,690.09
ආයෝජන - දායාද අරමුදල්		334,329,446.47	300,632,401.08
ආයෝජනය - සීමිත අරමුදල්		2,036,763,301.92	1,700,972,660.31
විවිධ ණය ගැතියන් සහ ලැබිය යුතු	2	255,779,600.52	286,507,698.08
වෙනත් ආයතනවලින් අය විය යුතු මුදල්	3	2,859,874.56	2,637,691.35
අත්තිකාරම්	4	66,936,368.47	113,684,184.77
ඉන්ධන තැන්පතු	5	1,739,950.00	1,639,950.00
කාර්ය මණ්ඩලය සඳහා ණය	6	71,145,753.34	62,309,619.58
ඉන්වෙන්ටරි	7	327,786,242.96	302,154,294.04
පූර්ව ගෙවීම්		770,792.09	1,427,294.08
බැඳුම්කර උල්ලංඝණය කරන්නන්ගෙන් ලැබිය යුතු	8	321,646,505.72	240,944,708.51
		4,075,857,288.87	**3,598,743,191.89**
ජංගම නොවන වත්කම්			
කාර්ය මණ්ඩලය සඳහා ණය	6	179,240,885.82	161,319,028.59
ජීව විද්‍යාත්මක වත්කම්	9	35,355,070.00	23,994,710.00
දේපළ පිරියත සහ උපකරණ - ස්පෘශ්‍ය	10	26,417,960,158.46	26,317,937,181.89
දේපළ පිරියත සහ උපකරණ - අස්පෘශ්‍ය	10	22,002,162.59	23,768,148.86
කෙරෙමින් පවතින වැඩ	11	1,770,466,834.03	2,356,535,532.69
		28,425,025,110.90	**28,883,554,602.03**
මුළු වත්කම්		**32,500,882,399.77**	**32,482,297,793.92**
හිමිකම් සහ වගකීම්			
ජංගම වගකීම්			
විවිධ තැන්පතු	12	6,840,869.52	6,083,798.02
විවිධ ගෙවිය යුතු මුදල් සහ පූර්ව ලැබීම්	13	238,069,207.21	267,553,733.96
උපචිත වියදම්	14	149,043,596.75	219,832,514.95
		393,953,673.48	**493,470,046.93**
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ප්‍රතිපාදන		2,578,988,040.95	2,413,840,224.00
		2,578,988,040.95	**2,413,840,224.00**
මුළු වගකීම්		**2,972,941,714.43**	**2,907,310,270.93**
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		**29,527,940,685.34**	**29,574,987,522.99**
හිමිකම්			
ප්‍රාග්ධන ප්‍රදාන - වියදම් නොකළ	15	30,136,797.17	64,596,085.29
සමුච්චිත අරමුදල්-ප්‍රාග්ධන		9,487,462,693.48	9,975,334,131.81
සමුච්චිත අතිරික්තය/(හිඟය)		5,670,733,927.90	5,473,630,988.21
		15,188,333,418.55	**15,513,561,205.31**
සංචිත සහ සීමිත අරමුදල්			
බැඳුම්කර සහ ගිවිසුම් උල්ලංඝණය කිරීම් සම්බන්ධ අරමුදල		929,400,741.92	747,751,823.80
දායාද අරමුදල්		380,078,182.74	310,249,847.91
පර්යේෂණ ප්‍රදාන		292,285,497.84	396,408,814.73
විවිධ ව්‍යාපෘති		180,132,900.24	152,531,091.46
විලම්බිත ආදායම - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්		458,458,874.99	394,725,182.78
වෙනත් අරමුදල්		283,305,650.64	243,814,138.58
ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය		11,815,945,418.42	11,815,945,418.42
		14,339,607,266.79	**14,061,426,317.68**
මුළු ශුද්ධ වත්කම්/හිමිකම්		**29,527,940,685.34**	**29,574,987,522.99**

මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 මුදල් පනතේ නියමයන්ට අනුකූල වන බවට අපි සහතික කරමු.

AMNB ARAMPATH
BURSAR

The members of the governing council is responsible for the preparation and presentation of these financial statements.

PROF. TERENCE MADHUJITH
VICE- CHANCELLOR (Acting)

EMGMB EKENAYAKE
REGISTRAR (Acting)

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන	2023 රු.	2022 රු.
ආදායම			
ජංගම			
හුවමාරු නොවන ගනුදෙණුවලින් ලැබෙන ආදායම - ජංගම			
රජයේ ප්‍රදාන - පුනරාවර්තන		7,975,000,000.00	7,790,000,000.00
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන - පුනරාවර්තන ස්වභාවයේ		10,193,171.52	101,080,536.47
රජයේ ප්‍රදාන - මානව ප්‍රාග්ධන සංවර්ධන- පුනරාවර්තන ස්වභාවයේ		1,194,050.76	720,770.00
ප්‍රදාන - ශිෂ්‍යාධාර		58,714,400.00	45,868,000.00
ප්‍රදාන - මහපොළ		329,613,500.00	171,966,000.00
අභ්‍යන්තර ව ජනනය කරන ලද ආදායම	16	423,989.00	636,097.44
පර්යේෂණ ප්‍රදාන, ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වෙනත් අයුරින් ලැබෙන ආදායම		646,200,716.22	738,745,959.69
රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග ක්‍රමක්ෂය කිරීම		-	-
හුවමාරු නොවන ගනුදෙණුවලින් මුළු ආදායම - ජංගම		**9,021,339,827.50**	**8,849,017,363.60**
හුවමාරු ගනුදෙණුවලින් ලැබෙන ආදායම - ජංගම			
පොළී ආදායම		368,340,461.84	231,610,676.53
අභ්‍යන්තර ව ජනනය කරන ලද ආදායම	16	319,031,193.25	422,732,716.86
හුවමාරු මුළු ආදායම - ජංගම		**687,371,655.09**	**654,343,393.39**
මුළු ආදායම-ජංගම		**9,708,711,482.59**	**9,503,360,756.99**
ප්‍රාග්ධන			
හුවමාරු නොවන ගනුදෙණුවලින් ලැබෙන ආදායම - ප්‍රාග්ධන			
ප්‍රාග්ධන හුවමාරුව		697,089,578.56	338,883,477.00
ත්‍යාග, පරිත්‍යාග, දේශීය සහ විදේශීය භාණ්ඩ වර්ග		352,872,653.52	352,255,504.73
පර්යේෂණ ප්‍රදානවලින් ලැබුණු වත්කම්		61,908,925.44	-
මුළු ආදායම - ප්‍රාග්ධන		**1,111,871,157.52**	**691,138,981.73**
මුළු ආදායම		**10,820,582,640.11**	**10,194,499,738.72**
වියදම්			
ජංගම			
පුද්ගල පඩිනඩි		7,303,409,340.42	7,217,472,020.75
ගමන් වියදම්		6,690,585.55	12,110,520.10
සැපයුම්		217,617,072.77	249,146,753.27
නඩත්තු වියදම්		102,341,855.72	41,399,450.42
කොන්ත්‍රාත් සේවා		657,679,620.47	433,956,675.83
සිසුන් සඳහා මූල්‍යාධාර		388,329,500.00	45,868,000.00
වෙනත් පුනරාවර්තන වියදම්		882,904,536.39	1,198,563,603.33
මුළු වියදම් (ප්‍රාග්ධන නොවන ස්වභාවයේ)		**9,558,972,511.32**	**9,198,517,023.70**
ප්‍රාග්ධන			
ක්ෂය වීම්		1,599,124,027.49	1,070,978,881.86
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම්		5,032,389.83	2,586,122.39
මුළු මෙහෙයුම් නොවන වියදම්		**1,604,156,417.32**	**1,073,565,004.25**
මුළු වියදම්		**11,163,128,928.64**	**10,272,082,027.95**
වර්ෂයේ අතිරික්තය/(හිඟය)		**(342,546,288.53)**	**(77,582,289.23)**
කාල සීමාව සඳහා ජංගම අතිරික්තය/(හිඟය)		**149,738,971.27**	**304,843,733.29**
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය)		**(492,285,259.80)**	**(382,426,022.52)**
		(342,546,288.53)	**(77,582,289.23)**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

විස්තරය	සමුච්චිත අතිරික්තය/ (හිඟය) රු.	ප්‍රත්‍යාගණන සංචිතය රු.	වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන රු.	වෙනත් සංචිත සහ සීමිත අරමුදල් රු.	සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය රු.	එකතුව රු.
2021 ජනවාරි 01 දිනට ශේෂය	**5,473,630,988.13**	**11,815,945,418.42**	**64,596,085.29**	**2,245,480,899.26**	**9,975,334,131.81**	**29,574,987,522.91**
පසුගිය වසරේ ගැළපීම	5,229,940.13					5,229,940.13
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	5,478,860,928.26	11,815,945,418.42	64,596,085.29	2,245,480,899.26	9,975,334,131.81	29,580,217,463.04
2022 ජනවාරි 01 දිනට ශේෂය	**5,478,860,928.26**	**11,815,945,418.42**	**64,596,085.29**	**2,245,480,899.26**	**9,975,334,131.81**	**29,580,217,463.04**
පසුගිය වසරේ ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග						
පූර්ව වර්ෂයේ ගැළපීම						
ප්‍රාග්ධන අතිරික්තය - පසුගිය වසර						
2022 ජනවාරි 01 වැනි දිනට ගැළපුම් කළ ශේෂය	**5,478,860,928.26**	**11,815,945,418.42**	**64,596,085.29**	**2,245,480,899.26**	**9,975,334,131.81**	**29,580,217,463.04**
වියදම් නොකළ ප්‍රතිපාදන වියදම් ගිණුමට මාරු කිරීම			(34,459,288.12)			(34,459,288.12)
අරමුදල්/ ප්‍රාග්ධන ප්‍රදානවල ශුද්ධ සංචලනය				278,180,949.11		278,180,949.11
පූර්ව වර්ෂයේ ගැළපීම්	28,715,754.52				4,413,821.47	33,129,575.99
විදේශ මුදල් ගනුදෙණුවලින් ලාභ/(පාඩු) - RFC	13,418,273.85					13,418,273.85
කාල සීමාව සඳහා ජංගම අතිරික්තය/(හිඟය).	149,738,971.27					149,738,971.27
කාල සීමාව සඳහා ප්‍රාග්ධන අතිරික්තය/(හිඟය).					(492,285,259.80)	(492,285,259.80)
2023 දෙසැම්බර් 31 දිනට ශේෂය	**5,670,733,927.90**	**11,815,945,418.42**	**30,136,797.17**	**2,523,661,848.37**	**9,487,462,693.48**	**29,527,940,685.34**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය		
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්තය/හිඟය	(342,546,288.53)	(77,582,289.23)
මුදල් නොවන සංචලන/ගැළපීම්		
අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීම සහ ක්‍රමක්ෂය කිරීම	1,604,156,417.32	1,073,565,004.25
පාරිතෝෂික ප්‍රතිපාදන	441,051,267.20	236,989,334.13
ආයෝජනවලින් ලද පොළී	(368,340,461.84)	(231,610,676.53)
රජයේ ප්‍රදාන සහ පරිත්‍යාග වත්කම් ක්‍රමක්ෂය කිරීම		-
පශු සම්පත් වලින් ලද ලාභය/අලාභය	(11,360,360.00)	(8,606,733.00)
විදේශ විනිමය ගනුදෙනුවලින් ලද ලාභය	13,418,273.85	(132,975,510.67)
මානව ප්‍රාග්ධන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රදාන	(1,194,050.76)	(720,770.00)
පුනරුත්ථාපනය සහ නඩත්තුව සඳහා රජයේ ප්‍රදාන	(10,193,171.52)	(101,080,536.47)
ආදායම්-ප්‍රාග්ධන ප්‍රදාන සහ පරිත්‍යාග	(1,111,871,157.52)	(691,138,981.73)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර මෙහෙයුම් අතිරික්තය/(හිඟය)	**213,120,468.20**	**66,838,840.75**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්		
අත්තිකාරම් (වැඩි වීම)/අඩු වීම	46,747,816.30	111,509,248.35
අනෙකුත් විශ්වවිද්‍යාල/ආයතනවලින් අයවිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම	(222,183.21)	(2,462,125.94)
විවිධ ණය ගැතියන්/ ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම	30,728,097.56	(190,393,359.14)
ඉන්ධන තැන්පතු (වැඩි වීම)/අඩු වීම	(100,000.00)	(175,000.00)
ඉන්වෙන්ටරි (වැඩි වීම)/අඩු වීම	(25,631,949)	(23,119,451.33)
පෙරගෙවුම් (වැඩි වීම)/අඩු වීම	656,501.99	(675,063.68)
බැඳුම්කර උල්ලංඝණය මත ලැබිය යුතු මුදල් (වැඩි වීම)/අඩු වීම	(80,701,797.21)	(108,020,660.71)
කාර්ය මණ්ඩලය සඳහා ණය (වැඩි වීම)/අඩු වීම	(26,757,990.99)	(20,947,841.17)
විවිධ තැන්පතු (වැඩි වීම)/අඩු වීම	757,071.50	1,153,564.50
විවිධ ගෙවිය යුතු (වැඩි වීම)/අඩු වීම	(29,484,526.75)	72,156,381.59
උපචිත වියදම් (වැඩි වීම)/අඩු වීම	(70,788,918.20)	64,704,803.36
කාරක ප්‍රාග්ධන වෙනස් වීමෙන් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**58,322,590.27**	**(29,430,663.42)**
පාරිතෝෂික ගෙවීම	(274,374,061.62)	(168,067,268.99)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(216,051,471.35)**	**(197,497,932.41)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් සහ අස්පෘශ්‍ය වත්කම්වලට එකතු කිරීම්	(449,986,772.79)	(160,832,377.09)
කෙරමින් පවතින කාර්යයන්ට එකතු කිරීම්	(262,995,568.26)	(275,360,991.25)
නව ආයෝජන	(2,524,338,113.84)	(2,590,441,396.34)
ආයෝජන ආපසු ගැනීම්	2,188,547,472.33	2,375,490,995.05
ආයෝජනයෙන් ලද පොළිය	403,051,689.09	81,810,651.25
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**(645,721,293.47)**	**(569,333,118.38)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ජනිත මුදල් ප්‍රවාහය		
AHEAD ව්‍යාපෘති ප්‍රදාන	118,858,578.44	-
රජයේ ප්‍රදාන - ප්‍රාග්ධන	525,000,000.00	235,000,000.00
වි.වි.ප්‍ර.කොා.ස ප්‍රදාන	10,000,000.00	3,500,000.00
අමාත්‍යාංශ ප්‍රදාන		-
බැඳුම්කර උල්ලංඝණය කිරීම හා සම්බන්ධ අරමුදල	181,648,918.12	161,837,041.45
දායාද අරමුදල	69,828,334.83	33,220,632.13
පර්යේෂණ ආධාර	(104,123,316.89)	(898,014.19)
විවිධ ව්‍යාපෘති, වෙනත් ප්‍රදාන සහ විලම්බිත ආදායම	130,827,013.05	102,638,576.31
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත ශුද්ධ මුදල් ප්‍රවාහය	**932,039,527.55**	**1,315,001,682.38**
මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම (අඩුවීම)	70,266,762.73	(231,532,815.09)
වසර ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	585,832,690.09	817,365,505.18
වසර අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	**656,099,452.82**	**585,832,690.09**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය ප්‍රකාශන
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

01. ආයතනික මූල්‍ය තොරතුරු

1.1 වාර්තාකරණ අස්තිත්වය

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පේරාදෙණියෙහි පිහිටි පේරාදෙණිය විශ්වවිද්‍යාලය, 1978 අංක 16 විශ්වවිද්‍යාල පනත සහ එයට පසුව කරන ලද සංශෝධන යටතේ පිහිටුවන ලද පූර්ණ වශයෙන් රජයට අයත් උසස් අධ්‍යාපන ආයතනයකි. ශිෂ්‍ය ප්‍රජාව, අරමුදල් වෙන් කිරීම, පීඨ සංඛ්‍යාව සහ සේවකයන් සංඛ්‍යාව යනාදී වශයෙන් ගත් කල එය ශ්‍රී ලංකාවේ විශාලතම විශ්වවිද්‍යාලය වේ.

1.2 නිකුත් කිරීම සඳහා බලය පවරන දිනය

2024 පෙබරවාරි 24 වන දින පැවති විශ්වවිද්‍යාල පාලක සභාවේ 539 වන රැස්වීමේ දී විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දී ඇත.

1.3 වාර්තාකරණ කාල සීමාව

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාලපරිච්ඡේදය 2023 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වේ.

1.4 මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය ප්‍රකාශන, 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධනය ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, අයවැයගත හා තථ්‍ය අගයන් සැසඳීමේ ප්‍රකාශය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පැහැදිලි කිරීමේ සටහන්වලින් සමන්විත වේ.

2. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSAS) අනුකූල ව සහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට (GAAP) අනුකූල ව මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත්, සාධාරණ ඉදිරිපත් කිරීමක් සහතික කිරීම සඳහා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති නොමැති අවස්ථාවන්හි දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අනුගමනය කර ඇත.

2.2 මිනුම් කිරීමේ පදනම

සාධාරණ අගය මත මිනුම් කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ හැර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය මත පිළියෙල කර ඇත.

2.3 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලින් (SLR) ඉදිරිපත් කර ඇත.

2.4 ප්‍රමාණවත් බව හා රාශීකරණය

සමාන අයිතමවල සැම වැදගත් පන්තියක් ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙන ම ඉදිරිපත් කර ඇත. අසමාන ස්වභාවයේ හෝ ක්‍රියාකාරීත්වයක් ඇති අයිතම සැලකිය යුතු තරමේ නො වේ නම් මිස වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරනු ලැබේ. ගනුදෙනු හෝ වෙනත් සිදුවීම් විශාල සංඛ්‍යාවක් සැකසීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඒවායේ ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය අනුව පන්තිවලට එකතු කරනු ලැබේ.

2.5 හිලව් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලින් නියම කරනු ලැබ හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් හා වගකීම්, ආදායම සහ වියදම් එකිනෙක හිලව් කර නොමැත.

2.6 අඛණ්ඩ පැවැත්ම

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් විශ්වවිද්‍යාලය අඛණ්ඩ ව පවත්වාගෙන යාමේ හැකියාව පවතින බවට තක්සේරු කරනු ලැබ ඇති අතර අපේක්ෂිත අනාගත කාලයක් සඳහා සිය මෙහෙයුම් අඛණ්ඩ ව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් විශ්වවිද්‍යාලය සතු ව ඇතැ'යි යන සාධාරණ අපේක්ෂාවක් ඇත. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගත් කල, මෙහෙයුම් ඈවර කිරීම හෝ නතර කිරීම අවශ්‍ය වන බව පාලක සභාව පුරෝකථනය නො කරයි. එබැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී විශ්වවිද්‍යාලය අඛණ්ඩ ව පැවැත්ම පිළිබඳ පදනම අනුගමනය කෙරේ.

2.7 සංසන්දනාත්මක තොරතුරු

මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කළ විට, ප්‍රායෝගික නොවන්නේ නම් මිස සංසන්දනාත්මක ප්‍රමාණය නැවත වර්ග කර ඇත. සංසන්දනාත්මක ප්‍රමාණය නැවත වර්ගීකරණය ප්‍රායෝගික නොවන විට, එම ප්‍රමාණය නැවත වර්ග කර ඇත්නම් සිදු විය යුතු ගැළපුම්වල ස්වභාවය විශ්වවිද්‍යාලය අනාවරණය කර තිබේ.

2.8 ජංගම හා ජංගම නොවන අයිතම වර්ගීකරණය

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව ජංගම/ ජංගම නොවන වර්ගීකරණය මත පදනම් ව විශ්වවිද්‍යාලය විසින් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් හා වගකීම් ඉදිරිපත් කරනු ලැබේ.

03. අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කිරීම

2023 වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී හා ඉදිරිපත් කිරීමේ දී විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇත.

3.2 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කර ඇති අතර 2022.01.01 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා ද දක්වා ඇත. සමාලෝචනයට භාජන වූ වර්ෂයෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනත් සැලකිය යුතු වෙනස්කම් සිදු වී නොමැත.

3.3 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා කළමනාකරණය, මූල්‍ය වර්ෂය අවසානයේ දී ආදායම, වියදම්, වත්කම්, වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම් අනාවරණය කිරීම කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම අවශ්‍ය වේ.

04. ආදායම් හඳුනා ගැනීම

පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන සහ පර්යේෂණ ප්‍රදාන ආදායම්, විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන, අධ්‍යයන පැවරුම් ඇතුළු ස්වයං මූල්‍යකරණ ක්‍රියාකාරකම් සහ අනෙකුත් සියලු ම ආදායම් එම ආදායම් ලැබුණු පසු හඳුනා ගෙන ඇති අතර උචිත හා ප්‍රායෝගික වන අවස්ථාවල දී ආදායම් උපචිත පදනම මත හඳුනා ගෙන තිබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීම මත පදනම් ව ප්‍රාග්ධන ප්‍රදානවලින් උත්පාදිත ආදායම ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ හඳුනා ගෙන ඇත.

05. රජයේ ප්‍රදාන

ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් සඳහා වන රජයේ ප්‍රදානයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01හි විධිවිධානවලට අනුකූල ව විශ්වවිද්‍යාලයට ලැබුණු විට පමණක් හඳුනා ගනු ලැබේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන

ගනුදෙනුවලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදාන වලින් මිල දී ගත් විට, පරිත්‍යාග කරන ලද වත්කම් යනාදිය විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ප්‍රාග්ධනය යටතේ පෙන්වා ඇත. වර්ෂය සඳහා ලැබුණු පුනරාවර්තන ප්‍රදානය විනිමය නොවන ගනුදෙනුවලින් ලැබෙන ආදායම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ජංගම ලෙස හඳුනා ගෙන ඇත. විශ්වවිද්‍යාලයට ලැබී ඇති ප්‍රාග්ධන ප්‍රදාන, වියදම් කරන ලද සහ වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම් මගින් ගිණුම්ගත කර ඇති අතර එහි බලපෑම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සෘජුව ම අන්තර්ගත කර තිබේ.

06. දේපළ, පිරියත සහ උපකරණ (PPE)

6.1 හඳුනා ගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලයට ගලා ඒමට හැකියාව තිබේ නම් සහ වත්කම්වල පිරිවැය විශ්වසනීය ව මිනුම් කළ හැකි නම් දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගනු ලැබේ.

6.2 මිනුම් කිරීමේ පදනම

වත්කමක් ලෙස පිළිගැනීමට සුදුසුකම් ලබන දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මූලික ව එහි පිරිවැයට මනිනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීම සහ ඊට පසු දරන ලද වියදම සෘජුව ම පිරිවැයට ඇතුළත් වේ. ස්වයං-සාධිත වත්කම්වල පිරිවැයට ද්‍රව්‍යවල පිරිවැය, සෘජු ශ්‍රමය, වත්කම් එහි අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියා කරන තත්ත්වයකට ගෙන ඒමට සෘජු ව ම අදාළ වන වෙනත් වියදම්, අයිතම කොටස්වලට වෙන් කර ඉවත් කිරීම සහ ඒවා තබන ස්ථාන ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා වන වියදම් ඇතුළත් වේ. අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිල දී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ.

මූලික වශයෙන් පිරිවැයට හඳුනා ගැනීමෙන් අනතුරු ව විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සමස්ත පන්තිය සඳහා ම ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කෙරේ. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය වැඩි වේ නම්, එම වැඩි වීම සෘජු ව ම ප්‍රත්‍යාගණන අතිරික්තයට බැර කරනු ලබන අතර ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් ලෙස වත්කම් පන්තියක ධාරණ අගය අඩු වුව හොත් එම මුදල අතිරික්තය හෝ හිඟය ලෙස හඳුනා ගැනේ.

තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 01 දිනට විශ්වවිද්‍යාලයට අයත් සියලු ම ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර පුස්තකාල පොත් සහ වාර සඟරා, කාර්යාල සහ වෙනත් උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා හැර අනෙකුත් වත්කම් කාණ්ඩ අභ්‍යන්තර ව පත් කරන ලද කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය කරන ලදී. ඉහත ඇගයීම්වල ප්‍රතිඵලයක් ලෙස අදාළ වෙනස් කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07ට අනුකූල ව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 649 දරන චක්‍රලේඛයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07හි විධිවිධානවලට අනුකූල ව දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ප්‍රතිපාදන වෙන් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල සියලු ම කාණ්ඩ ඊළඟ වසර ආරම්භයේ දී ප්‍රත්‍යාගණනය කර ඇති අතර චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතවලට අනුව ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණයන් මත ක්ෂය ප්‍රතිපාදන වෙන් කර ඇත. අදාළ ප්‍රත්‍යාගණන වර්ෂයෙන් පසු ව මිල දී ගන්නා ලද/ඉදි කරන ලද සියලු ම දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩයන් පිරිවැයට පෙන්වා ඇති අතර එම චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

1.3.6.3 වත්කම් හඳුනා ගැනීම නතර කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර කෙරේ. වත්කම් හඳුනා ගැනීම නතර කිරීමෙන් ඇති වන ඕනෑ ම ලාභයක් හෝ අලාභයක් වත්කම් හඳුනා ගැනීම නතර කළ වර්ෂයේ අතිරික්තය හෝ හිඟය තුළ හඳුනා ගැනේ.

1.3.6.4 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පිරිවැයට දක්වනු ලබන අතර

විශ්වවිද්‍යාලය අපේක්ෂා කරන ආකාරයට ක්‍රියාත්මක වීමට හැකියාව ඇති ස්ථානයේ හා තත්ත්වයේ පවතින විට අදාළ වත්කම් වෙත මාරු කරනු ලැබේ.

1.3.6.5 උරුම වත්කම්

පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සහ ප්‍රධාන පුස්තකාලයේ උරුම වත්කම් වෙන වෙන ම දක්වා ඇත.

1.3.6.6 දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම

පහත සඳහන් අනුපාතයන්ට අනුව ඉඩම් සඳහා ක්ෂය කිරීම් සිදු කරන අවස්ථාවන්හි දී හැර විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුගමනය කරනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 649 දරන චක්‍රලේඛය මත පදනම් ව ක්ෂය කිරීම් හා අදාළ වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

මූලික වශයෙන් පිරිවැයට හඳුනා ගැනීමෙන් අනතුරු ව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය දක්වා ම විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සමස්ත පන්තිය සඳහා ම ප්‍රත්‍යාගණන ආකෘතිය අදාළ කෙරේ. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 01 දිනට විශ්වවිද්‍යාලයට අයත් සියලු ම ඉඩම්, ගොඩනැගිලි සහ මෝටර් වාහන ප්‍රත්‍යාගණනය කරන ලද අතර පුස්තකාල පොත් සහ වාර සඟරා, කාර්යාල සහ වෙනත් උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ සහ උපාධි කබා හැර අනෙකුත් වත්කම් කාණ්ඩ අභ්‍යන්තර ව පත් කරන ලද කමිටුවක් විසින් ප්‍රත්‍යාගණනය කරන ලදි. ඉහත ඇගයීම්වල ප්‍රතිඵලයක් ලෙස අදාළ වෙනස් කිරීම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07ට අනුකූල ව විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල සිදු කර ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 649 දරන චක්‍රලේඛයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07හි විධිවිධානවලට අනුකූල ව දේපළ, පිරියත සහ උපකරණ සඳහා ක්ෂයවීම් ප්‍රතිපාදන වෙන් කර ඇත. දේපළ, පිරියත සහ උපකරණවල සියලු ම කාණ්ඩ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය දක්වා ප්‍රත්‍යාගණනය කර ඇත. චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාතවලට අනුව ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණයන් මත ක්ෂය ප්‍රතිපාදන වෙන් කර ඇත. අදාළ ප්‍රත්‍යාගණන වර්ෂයෙන් පසු ව මිල දී ගන්නා ලද/ඉදි කරන ලද සියලු ම දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩයන් පිරිවැයට පෙන්වා ඇති අතර එම චක්‍රලේඛයේ දක්වා ඇති අනුපාත යටතේ ක්ෂය ප්‍රතිපාදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති (SLPSAS) අර්ථ නිරූපණ කමිටුව විසින් 2023 වර්ෂයේ දී සපයනු ලබන මාර්ගෝපදේශයන්ට අනුකූල ව, "දේපළ, පිරියත සහ උපකරණ (PPE)" තුළ "ශූන්‍ය" අගයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට 07ට අනුකූල ව ගළපනු ලැබේ. පේරාදෙණිය විශ්වවිද්‍යාලය දේපළ, පිරියත සහ උපකරණ (PPE) සඳහා ගිණුම්කරණ ගැළපුම් මාර්ගෝපදේශය අනුගමනය කරන අතර 2023 වසරේ සිට ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7හි දක්වා ඇති පිරිවැය ආකෘතිය අනුගමනය කරයි. මෙම සටහන අපගේ දේපළ, පිරියත සහ උපකරණ කාණ්ඩය තුළ "ශූන්‍ය" අගයක් දරන ඇතැම් වත්කම්වලට ගැළපීම විස්තර කරයි.

6.3 දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ අගය ශූන්‍ය වීම

වාර්තාකරණ කාලයේ දී අපගේ දේපළ, පිරියත හා උපකරණවල ඇතැම් වත්කම්වල අවශේෂ අගය ශූන්‍ය අගයක් වන බවට හඳුනා ගෙන ඇත. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අර්ථ නිරූපණ කමිටුවේ නියෝගයට අනුව, මෙම වත්කම් පිරිවැය ආකෘතියට අනුව තක්සේරු කර ඇත. මෙම ආකෘතිය යටතේ, වත්කමක ධාරණ අගය එහි පිරිවැය අඩු කරන ලද සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත අලාභ හානිවලින් නියෝජනය වේ. ඒ අනුව, වත්කමක අවශේෂ අගය ශූන්‍ය ලෙස තීරණය කර එහි ධාරණ අගය පසු ව බින්දුවට පහත වැටේ නම් එහි ක්ෂයවීම් වටිනාකම ද ශූන්‍ය ලෙස හඳුනා ගැනේ.

මෙම ප්‍රවේශය අනුගමනය කරමින්, අපගේ මූල්‍ය ප්‍රකාශනවල එවැනි වත්කම්වල ධාරණ අගය ශූන්‍ය ලෙස පවත්වා ගෙන ගොස් ඇත. මෙම ප්‍රතිකර්මය වත්කම්වල වටිනාකම, ක්ෂයවීම් සහ හානිකරණ අලාභයන් ගණනය කිරීමෙන් පසු ව ඒවායේ ඉතිරි අගය ශූන්‍යයට සමාන වන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07හි නියමයන් සමග අනුකූල වේ. මෙම ක්‍රමය මගින් නිරවද්‍ය සහ වගකිවයුතු මූල්‍ය වාර්තාකරණය සඳහා අපගේ කැපවීම පිළිබිඹු කෙරෙන අතර විනිවිදභාවය සහ නියමිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට දක්වා ඇති අනුකූලතාව පිළිබඳ සහතික කෙරේ.

6.4 වත්කම් හඳුනා ගැනීම නතර කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතයෙන් අනාගත ආර්ථික

ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා ගැනීම නතර කෙරේ. වත්කම් හඳුනා ගැනීම නතර කිරීමෙන් ඇති වන ඕනෑ ම ලාභයක් හෝ අලාභයක් වත්කම් හඳුනා ගැනීම නතර කළ වර්ෂයේ අතිරික්තය හෝ හිඟය සඳහා හඳුනා ගැනේ.

6.5 කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ පිරිවැයට දක්වනු ලබන අතර විශ්වවිද්‍යාලය අපේක්ෂා කරන ආකාරයට ක්‍රියාත්මක වීමට හැකියාව ඇති ස්ථානයේ හා තත්ත්වයේ පවතින විට අදාළ වත්කම් වෙත මාරු කරනු ලැබේ.

6.6 උරුම වත්කම්

පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සහ ප්‍රධාන පුස්තකාලයේ උරුම වත්කම් වෙන වෙන ම දක්වා ඇත.

6.7 දේපළ, පිරියත සහ උපකරණ ක්ෂය කිරීම

පහත සඳහන් අනුපාතයන්ට අනුව ඉඩම් සඳහා ක්ෂය කිරීම් සිදු කරන අවස්ථාවන්හි දී හැර විශ්වවිද්‍යාලය විසින් දේපළ, පිරියත සහ උපකරණ සඳහා සරල මාර්ග ක්ෂය ක්‍රමය අනුගමනය කරනු ලබන අතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 649 දරන චක්‍රලේඛය මත පදනම් ව ක්ෂය කිරීම් හා අදාළ වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

වත්කම් භාවිතයට පවතින දිනයේ සිට එම වත්කම් ක්ෂය වීම ආරම්භ වන අතර ස්වයං-සාදන ලද වත්කම් සම්බන්ධයෙන් වන කල්හි එම වත්කම සම්පූර්ණ කර භාවිතයට සූදානම් වූ දිනයේ සිට ක්ෂය වීම ආරම්භ වේ. වත්කම විකිණීමට ඇති ලෙස වර්ග කරන ලද දිනය හෝ වත්කම හඳුනා ගැනීම නතර කළ දිනය යන දින දෙකෙන් පූර්වයෙන් එළැඹි දිනයේ සිට ක්ෂය වීම නතර වේ.

වත්කම් පංතිය	%
ගොඩනැගිලි	5%
පිරියත යන්ත්‍රෝපකරණ සහ මෙවලම්	10%
මෝටර් වාහන	20%
ගෘහ භාණ්ඩ සහ සවිකෘත	10%
කාර්යාල සහ වෙනත් උපකරණ	20%
විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ	20%
පුස්තකාල පොත් සහ වාර සඟරා	20%
උපාධි කබා	20%

6.8 දේපළ, පිරියත සහ උපකරණ ක්‍රමක්ෂය කිරීම

2021.12.31 දක්වා විශ්වවිද්‍යාලය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03ට අනුකූල ව පරිත්‍යාග වත්කම් ගිණුමේ බැර වටිනාකමට 10%ක් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුගමනය කරන ලදි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ ක්‍රමක්ෂය කිරීම තවදුරටත් අනුගමනය නොකරන ලදි.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07ට අනුකූල ව 2018 වර්ෂයේ සිට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂයෙන් 10%ක් ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 03හි දක්වා ඇති පරිදි ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්වල ධාරණ අගය හා ඓතිහාසික පිරිවැය අතර වෙනස මත පදනම් ව අදාළ වත්කම් පන්තිය ප්‍රත්‍යාගණනය කළ දිනෙන් පසු මිල දී ගත්/ගොඩනගන ලද වත්කම් මත හඳුනා ගෙන ඇති ප්‍රත්‍යාගණන අතිරික්තය පොදු සංචිතයට මාරු කරනු ලැබේ.

6.9 බාහිර පාර්ශ්වයන් සඳහා කුලියට ලබා දී ඇති ගොඩනැගිලි

විශ්වවිද්‍යාලය එහි ඇතැම් ගොඩනැගිලි රාජ්‍ය බැංකු, රාජ්‍ය ඖෂධ සංස්ථාව ආදී ආයතන සඳහා නාමික කුලී වටිනාකමකට කුලියට දී ඇත. මෙම දේපළ කුලී උපයා ගැනීමට හෝ ප්‍රාග්ධන වැඩිකිරීමනට තබා

නොමැති හෙයින් ආයෝජන දේපළ ලෙස වර්ග නො කෙරේ. ඒ අනුව, මෙම දේපළ ද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ, පිරියත සහ උපකරණ ලෙස වර්ග කරනු ලැබේ.

6.10 විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතනවල ඉඩම් හා ගොඩනැගිලි

විශ්වවිද්‍යාලයට අනුබද්ධ පශ්චාත් උපාධි ආයතන 03ක ගොඩනැගිලි ඉදි කර ඇති ඉඩම් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අතර මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ගොඩනැගිල්ල සඳහා ශාස්ත්‍ර පීඨයේ අරමුදල් සහ භාණ්ඩාගාර අරමුදල් යොදා ඇති බැවින් එය ද විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විශ්වවිද්‍යාලයට අයත් භූමියේ සහ ගොඩනැගිලිවල ක්‍රියාත්මක වේ.

6.11 ජීව විද්‍යාත්මක වත්කම් සහ කෘෂිකාර්මික නිෂ්පාදන

අර්ථ දැක්වීම

කෘෂිකාර්මික නිෂ්පාදන යනු ආයතනයේ ජීව විද්‍යාත්මක වත්කම්වලින් ලද අස්වනු නිෂ්පාදනයකි. ජීව විද්‍යාත්මක වත්කමක් යනු ජීවී සත්ත්වයකු හෝ ශාකයකි. ජීව විද්‍යාත්මක වත්කම් සමූහයක් යනු සමාන ජීවීන් හෝ ශාක විශේෂවල එකතුවකි. අස්වැන්න යනු ජීව විද්‍යාත්මක වත්කමකින් නිෂ්පාදන වෙන් කර ලබා ගැනීම හෝ ජීව විද්‍යාත්මක වත්කමක ජීවන ක්‍රියාවලිය නතර වීම වේ.

6.11.1 ජීව විද්‍යාත්මක වත්කම් හා කෘෂිකාර්මික නිෂ්පාදන හඳුනා ගැනීම

විශ්වවිද්‍යාලය විසින් ජීව විද්‍යාත්මක වත්කමක් හෝ කෘෂිකාර්මික නිෂ්පාදනයක් හඳුනා ගනු ලබන්නේ:

(i) අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය විසින් වත්කම පාලනය කරනු ලබන විට,

(ii) වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවය ආයතනයට ගලා ඒමට ඉඩ ඇති විට, සහ

(iii) වත්කම්වල සාධාරණ වටිනාකම හෝ පිරිවැය විශ්වසනීය ව මැනිය හැකි විට පමණි.

ජෛව විද්‍යාත්මක වත්කමක් එහි ආරම්භක හඳුනා ගැනීමේ දී සාධාරණ අගය මත මනිනු ලබන අතර සෑම වාර්තාකරණ දිනයක දී ම විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද එහි සාධාරණ වටිනාකම මත මනිනු ලැබේ. ආයතනයක ජීව විද්‍යාත්මක වත්කම්වලින් අස්වනු නෙළන කෘෂිකාර්මික නිෂ්පාදන, අස්වැන්න නෙළන අවස්ථාවේ එහි පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මනිනු ලැබේ.

6.11.2 ජීව විද්‍යාත්මක වත්කම්වල ලාභ සහ අලාභ

ජීව විද්‍යාත්මක වත්කමක් විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මත මූලික ව හඳුනා ගැනීම හේතුවෙන් හෝ ජීව විද්‍යාත්මක වත්කමක විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකමේ වෙනසක් හේතුවෙන් ඇති වන ලාභයක් හෝ අලාභයක් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18ට අනුකූල ව එය ඇති වන කාලපරිච්ඡේදය තුළ අතිරික්තයට හෝ හිඟයට ඇතුළත් කරනු ලැබේ. කෘෂිකාර්මික නිෂ්පාදනයක් විකිණීම සඳහා පිරිවැය අඩු කරන ලද සාධාරණ වටිනාකම මත මූලික ව හඳුනා ගැනීම හේතුවෙන් ඇතිවන ලාභයක් හෝ අලාභයක් එය ඇතිවන කාලපරිච්ඡේදය තුළ අතිරික්තයට හෝ හිඟයට ඇතුළත් කරනු ලැබේ.

07. අස්පෘශ්‍ය වත්කම්

7.1 හඳුනා ගැනීමේ පදනම

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා යා හැකි නම් සහ වත්කමේ පිරිවැය විශ්වසනීය ව මැනිය හැකි නම් විශ්වවිද්‍යාලය අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනී.

7.2 මිනුම් කිරීමේ පදනම

වෙන වෙන ම අත්පත් කර ගනු ලබන අස්පෘශ්‍ය වත්කම් මූලික ව පිරිවැයට හඳුනා ගනු ලබයි. මූලික හඳුනා ගැනීමෙන් පසු, අස්පෘශ්‍ය වත්කම් පිරිවැය අඩු කරන ලද ක්‍රමක්ෂය හෝ හානිකර පාඩු කිසිවක් ඇත්නම් එයට අනුව ගණනය කරනු ලැබේ.

7.3 පසු ව ඇති වූ වියදම්

නිශ්චිත වත්කමක් හා සම්බන්ධිත අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි වන විට පමණක් පශ්චාත්කාලීන ව ඇති වූ වියදම් ප්‍රාග්ධනිත කරනු ලැබේ. අනෙකුත් සියලු ම වියදම් දරන ලද වියදම් බවට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගනු ලැබේ.

7.4 ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලය, ක්‍රමක්ෂය හා හානිකරණය

නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් එහි ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආර්ථික ආයුකාලයට පිරිවැය ලියා හැරීම සඳහා සරල මාර්ග ක්‍රමය භාවිත කර ක්‍රමක්ෂය කරනු ලබන අතර සාමාන්‍යයෙන් එය මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ හඳුනා ගැනේ. නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වාර්ෂික ව හානි විය හැකි බවට ඇඟවීමක් තිබේ නම් හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ. නිශ්චිත ආයුකාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම් වසර 10ක කාලයක් පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමය, ප්‍රයෝජනවත් ආයුකාලය සහ ශේෂ අගයන් එක් එක් වාර්තාකරණ දිනයේ දී සමාලෝචනය කරනු ලබන අතර උචිත නම් ගැළපුම් කරනු ලැබේ.

08. ගබඩා භාණ්ඩ

2023 දෙසැම්බර් 31 දින වන විට විශ්වවිද්‍යාලයේ ගබඩා භාණ්ඩ භෞතික ව සත්‍යාපනය කර ඇති අතර පළමු ගැනුම්, පළමු නිකුතු පදනම (FIFO) මත පිරිවැයට තක්සේරු කර ඇත.

09. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වාර්තා කළ දින සිට මාස දොළහක් ඇතුළත ලැබිය යුතු නියමිත වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01ට අනුව ඇස්තමේන්තුගත ප්‍රමාණයට දක්වනු ලැබේ. බොල් ණය සහ අවිනිශ්චිත ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදන සලසනු නො ලැබේ.

10. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල්වලින් සහ ජංගම ගිණුම්, නේවාසික විදේශ මුදල් (RFC), ඉතිරිකිරීම් සහ කෙටිකාලීන ඇමතුම් තැන්පතු ගිණුම්වල පවතින ශේෂයන්ගෙන් සමන්විත වේ. තව ද, මුදල් හා මුදල් සමාන දෑ පිළිබඳ විස්තර ගිණුම් ප්‍රකාශයේ සටහන් අංක 1හි අනාවරණය කර ඇත.

11. ආයෝජන

බැංකු ගිණුම්වල බැරට තබා ඇති තාවකාලික අතිරික්ත අරමුදල්, විශ්වවිද්‍යාලය කාලීන තැන්පතු මත රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජනය කර ඇත. ඒ සඳහා එකතුවන පොළිය අදාළ ලෙජර ගිණුම්වලට ගළපා ඇති අතර මූල්‍ය කාර්යසාධනයේ ප්‍රකාශවල "පුනරාවර්තන/හුවමාරු" ලෙස දක්වා ඇත. එමෙන් ම, ශිෂ්‍යත්ව සඳහා ලද අරමුදල් ද රාජ්‍ය බැංකුවල කාලීන තැන්පතුවල ආයෝජනය කර ඇත.

12. වියදම් හඳුනා ගැනීම

නිශ්චිත ආදායම් අයිතම සඳහා දරන ලද පිරිවැය සහ ඉපැයීම අතර සෘජු සම්බන්ධතාවේ පදනම මත මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වියදම් හඳුනා ගනු ලැබේ. විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යාමේ දී සහ දේපළ කාර්යක්ෂම ව පවත්වා ගෙන යාමේ දී දරන ලද සියලු වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුළත් කර ඇත.

13. පර්යේෂණ ප්‍රදාන

පර්යේෂණ ප්‍රදානවල ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලය වෙන ම ලෙජර ගිණුම් පවත්වා ගෙන යයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන මත වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස පෙන්වන අතර පර්යේෂණ ප්‍රදාන ලාභ නොලබන පදනමක් මත ක්‍රියාත්මක වන බැවින් වියදමට සමාන මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ පර්යේෂණ ප්‍රදාන මත ආදායමක් ලෙස දැක්වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදානවලින් මිල දී ගත් විට, ඒවා පුනරාවර්තන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතු ය. 2022 දෙසැම්බර් 31 වන දිනට මෙම එක් එක් පර්යේෂණ ප්‍රදානවල බැරට තබා ඇති ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වා ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට මෙම තනි පුද්ගල පර්යේෂණ ප්‍රදානවල බැර කිරීමට ඇති ශේෂ මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ සංචිත සහ සීමා කළ අරමුදල් යටතේ දක්වා ඇත.

14. විලම්බිත ආදායම් ස්වයං මූල්‍ය කටයුතු

උපදේශනය, පශ්චාත් උපාධි පාඨමාලා, කෙටි පාඨමාලා, අර්ධකාලීන පාඨමාලා, බාහිර උපාධි පාඨමාලා, පැවරුම් පරීක්ෂණ, සමීක්ෂණ, කොන්ත්‍රාත් පර්යේෂණ, කොන්ත්‍රාත් පරීක්ෂණ යනාදී ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත ආදායම් සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා විශ්වවිද්‍යාලය විසින් වෙන වෙන ම ලෙජර ගිණුම් පවත්වා ගෙන යනු ලබයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කරන ලද වියදම්, සෘජු වියදම් - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් සහ වක්‍ර වියදම් - ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ලෙස වර්ග කර ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස වෙන වෙන ම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇත.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ ප්‍රාග්ධන ප්‍රදානවලින් මිල දී ගත් විට ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතු ය. මෙම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් ගිණුම්වල බැරට තබා ඇති ශේෂ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ සංචිත සහ සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

15. විවිධ ව්‍යාපෘති සහ වෙනත් ප්‍රදාන

විශ්වවිද්‍යාලය විසින් එහි ප්‍රධාන මෙහෙයුම්වලට අමතර ව මෙහෙයවනු ලබන විවිධ බාහිර අරමුදල් මූලාශ්‍රය මගින් ක්‍රියාත්මක වන ක්‍රියාකාරකම් හා ව්‍යාපෘතිවල ආදායම සහ වියදම් ගිණුම්ගත කිරීම සඳහා වෙන ම ලෙජර ගිණුම් පවත්වා ගෙන යයි. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම්, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විවිධ ව්‍යාපෘති හා වෙනත් ප්‍රදාන සඳහා වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස දක්වනු ලබන අතර ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් විශ්වවිද්‍යාලය ලාභ නොලබන පදනමක් මත ක්‍රියාත්මක කරන බැවින් වියදම් හා සමාන මුදලක් ස්වයං මූල්‍යකරණය සහ වෙනත් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායමක් ලෙස පෙන්වනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරුකිරීම්) ලද ආදායම -2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ විවිධ ව්‍යාපෘති හා වෙනත් ප්‍රදානවලින් මිල දී ගත් විට ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතු ය. මෙම ගිණුම්වල ඉතිරි ව ඇති ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

16. වෙනත් අරමුදල්

විශ්වවිද්‍යාලය එහි ප්‍රධාන ක්‍රියාකාරකම් යටතට නොගැනෙන විවිධ ක්‍රියාකාරකම් මගින් අරමුදල් උත්පාදනය කරන අතර මෙම ක්‍රියාකාරකම්වලට අදාළ ගනුදෙනු ගිණුම්ගත කිරීම සඳහා වෙන ම ලෙජර ගිණුම් පවත්වා ගෙන යනු ලැබේ. තනි ලෙජර ගිණුම් යටතේ ගිණුම්ගත කර ඇති වියදම් වෙනත් ව්‍යාපෘති සඳහා වන ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා ඇති අතර වියදම්වලට සමාන මුදලක් ස්වයං මූල්‍ය සහ වෙනත් ක්‍රියාකාරකම්වලින් ලැබෙන ආදායම ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දැක්වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව ප්‍රාග්ධන ප්‍රදාන සඳහා විකල්ප ගිණුම්කරණ ක්‍රමවේදය - ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවල වෙළුම (iii) හි ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර. 11හි සඳහන් හුවමාරු නොවන ගනුදෙනුවලින් (බදු සහ මාරු කිරීම්) ලද ආදායම - 2022.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අනුගමනය කිරීමත් සමග දේපළ, පිරියත සහ උපකරණ වෙනත් අරමුදල්වලින් මිල දී ගත් විට ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් ලද ආදායම (හුවමාරු නොවන) ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්විය යුතු ය. මෙම ගිණුම්වල ඉතිරි ව ඇති ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සංචිත හා සීමිත අරමුදල් යටතේ දක්වා ඇත.

17. විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

ගනුදෙනු සිදු වූ අවස්ථාවේ පැවති විනිමය අනුපාත අනුව සියලු ම විදේශ මුදල් ගනුදෙනු ක්‍රියාකාරී මුදල් අනුව හඳුනා ගනු ලැබේ. වාර්තා කරන දිනට නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල පවතින ශේෂ එදිනට පවතින අනුපාතයන්ට අනුව ක්‍රියාකාරී මුදල්වලින් හඳුනා ගැනේ. පූර්ව මූල්‍ය ප්‍රකාශනවල සහ

ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නේවාසික විදේශ මුදල් (RFC) ගිණුම්වල පැවති ශේෂයන් පරිවර්තනය කිරීමෙන් පැන නගින විනිමය ලාභ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ විනිමය ගනුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා ගැනේ.

18. බදු

18.1 ආදායම් බදු

පවත්නා බදු රෙගුලාසිවලට අනුව විශ්වවිද්‍යාලය සිය සාමාන්‍ය කටයුතුවලින් ජනිත ආදායම මත ආදායම් බදු ගෙවීමට බැඳියාවක් නොමැත.

18.2 එකතු කළ අගය මත බද්ද

පවත්නා බදු රෙගුලාසිවලට අනුව එකතු කළ අගය මත බදු ගෙවීමෙන් විශ්වවිද්‍යාලය නිදහස් කර ඇත.

18.3 උපයන විට ගෙවීම් බද්ද (PAYE Tax) / ඉහළ පුද්ගලික ආදායම් බද්ද (APIT)

විශ්වවිද්‍යාල වියදම්වල කොටසක් නොවන, ආදායම් බදු ගෙවීම සඳහා බැඳීමක් ඇති සේවකයන්ගේ මාසික වැටුපෙන් අඩු කරන ලද උපයන විට ගෙවීම් බදු/ APIT බද්ද විශ්වවිද්‍යාලය විසින් දැනට ප්‍රේෂණය කෙරේ. එබැවින් උපයන විට ගෙවීම් බදු ගෙවීම විශ්වවිද්‍යාලයේ ගිණුම්වල ගිණුම්ගත කර නොමැත.

19. සේවක ප්‍රතිලාභ

19.1 කෙටිකාලීන සේවක ප්‍රතිලාභ

අදාළ සේවාව සපයන බැවින් කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වියදම් කරනු ලැබේ. සේවකයා විසින් සපයන ලද අතීත සේවයේ ප්‍රතිඵලයක් ලෙස මුදල් ගෙවීමට විශ්වවිද්‍යාලයට වර්තමාන නෛතික හෝ වාස්තවික බැඳීමක් තිබේ නම් සහ වගකීම විශ්වසනීය ව තක්සේරු කළ හැකි නම් ගෙවීමට අපේක්ෂා කරන මුදල සඳහා වන වගකීම හඳුනා ගනු ලැබේ.

19.2 නිශ්චිත දායක සැලැස්ම

අදාළ ප්‍රඥප්ති අනුව විශ්වවිද්‍යාලයේ ස්ථිර සේවකයන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ (UPF) සහ සේවක භාරකාර අරමුදලේ (ETF) දායක මුදල් සඳහා සුදුසුකම් ලබන අතර තාවකාලික/ කොන්ත්‍රාත්/ පැවරුම් පදනම මත බඳවා ගන්නා ලද සේවකයෝ සේවක අර්ථසාධක අරමුදලේ (EPF) සහ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබති. අදාළ සේවාව සපයනු ලබන බැවින් නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා දායක මුදල් සම්බන්ධයෙන් වන වගකීම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ හඳුනා ගැනේ.

19.3 නිශ්චිත ප්‍රතිලාභ බැඳීම

1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූල ව, සේවකයන්ට නිශ්චිත ප්‍රතිලාභ බැඳීමක් සඳහා වගකීමක් ඇති වේ. එබඳු නිශ්චිත ප්‍රතිලාභ බැඳීම යනු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 19හි විෂය පථය යටතේ වන සේවක ප්‍රතිලාභ මත පශ්චාත් රැකියා ප්‍රතිලාභ බැඳීමකි.

19.4 නිශ්චිත ප්‍රතිලාභ වගකීම් මිනුම් කිරීම

(ඌ) අනේවාසික විදේශ මුදල් ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු. 4,104,684ක විදේශ මුදල් හුවමාරු අලාභය, රු.4,635,443 ක විදේශ මුදල් හුවමාරු ලාභයක් ලෙසට ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය හා මුදල් හා මුදල් සමානදෑ රු.8,740,127 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබුණු රු.5,975,650 ක වෛද්‍ය රසායනාගාර ආදායම විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) 2022 මැයි 05 දිනැති අංක 09/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව රු.3,695,014 ක ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණු අතර ඊට අදාල රු.923,753 ක ක්ෂය හා විදුලි ජනන යන්ත්‍රවලට අදාල රු.2,378,036 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) බැදුම්කරලාභීන් හෝ ඇපකරුවන් සොයා ගත නොහැකි ලෙස හඳුනාගෙන තිබුණු වසර 22 සිට වසර 53ක කාලයක් අයනොවී පවතින අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සේවය කළ නිළධාරීන් 64 දෙනෙකුගෙන් අයවිය යුතු රු.29,523,940 ක බැදුම්කර වටිනාකම වෙනුවෙන් අඩමාණ ණය සඳහා වෙන් කිරීමකින් තොරව තවදුරටත් ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

විශ්වවිද්‍යාලයේ 2023 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා විශ්වවිද්‍යාලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යටතේ දක්වා ඇති (අ),(ඇ),(ඉ), (ඊ) හා (උ) ඡේදයන්හි සඳහන් කරුණු හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට විශ්වවිද්‍යාලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ)	පාර්ලිමේන්තු පනත්	
i.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ආ) වගන්තිය	සමාලෝචිත වර්ෂය තුළ විද්‍යා පීඨයේ දේශකවරුන් 92 දෙනෙකු සඳහා රු.327,471,914 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණද ඔවුන් ඉටු කළ රාජකාරී තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු කිසිවක් විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.
ii.	1840 අංක 07 දරන වංචා වැළැක්වීමේ අඥා පනතේ 04 වන වගන්තිය	මිය ගිය මහාචාර්යවරියකගේ නාමිකයා නම් කරන ලද ප්‍රකාශයේ සාක්ෂිකරුවන් දෙදෙනෙකු අත්සන් නොකිරීම සහ මහාචාර්යවරියගේ අත්සන ව්‍යාජ අත්සනක් බව නිරීක්ෂණය වී තිබියදී , ඇයට හිමි රු. 3,273,535 ක සේවක අර්ථසාධක ප්‍රතිලාභයද ඇයගේ ස්වාමිපුරුෂයා වෙත ගෙවා තිබුණි.
iii.	1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතේ 09 වන වගන්තිය	මියගිය මහාචාර්යවරියකට හිමිව තිබුණු රු.2,579,064 ක් වූ සේවක පාරිතෝෂික ප්‍රතිලාභය අනිකුත් උරුමක්කරුවන් පිළිබඳ නොසළකා ඇයගේ ස්වාමි පුරුෂයා වෙත පමණක් ගෙවා තිබුණි.
iv.	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය	මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව රු.449,981,632 ක අතිරික්ත මුදලක් සමාලෝචිත වර්ෂය තුළ ආයෝජනය කර තිබුණි.
(ආ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 02/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 04 (1) හා 5 (1) ඡේද	පර්යේෂණ කළමනාකරණ කමිටුවක අනුමැතියකින් තොරව 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වූ කාලය තුළ කළමනාකරණ පීඨයේ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුට රු.4,760,275 ක පර්යේෂණ දීමනා ගෙවා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය සහ කාර්යයන්	**නිරීක්ෂණ**
(අ)	විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 4.1 හා 4.2 වගන්ති	ඉල්ලා අස්වෙන දිනට මාස 03 ක කාලයකට පෙර දැනුම්දීමකින් තොරව 2020 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ ඉල්ලා අස්වී තිබුණු ආචාර්යවරුන් 59 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.12,232,161 ක් වූ මාස 03 ක වැටුප අයකර ගැනීමකින් තොරව ඉල්ලා අස්වීම සඳහා අවස්ථාව ලබා දී තිබුණි.
(ආ)	චක්‍රලේඛ	
	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 1989 ඔක්තෝබර් 20 දිනැති අංක 408 චක්‍රලේඛයේ 05 (d) ඡේදය	වැටුප් රහිත සප්ත වාර්ෂික නිවාඩු ලබා ගත් නිළධාරීන් 03 දෙනෙකුට එම කාලයට අදාළව ගෙවා තිබුණු රු. 9,081,981 ක වැටුප් හා දීමනා සමාලෝචිත වර්ෂයේ අවසාන දින දක්වාම අය කර නොතිබුණි.
	2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛය	උසස් අධ්‍යාපන ආයතනවල අභ්‍යන්තර විභාග පවත්වා මාස 03 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු වුවද, 2017 ජනවාරි 01 දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පීඨ 03 කට අයත් දෙපාර්තමේන්තු 34 ක පවත්වා තිබුණු විභාගවල ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 04 සිට මාස 10 දක්වා කාලයක් ගතවී තිබුණි.
	2018 නොවැම්බර් 26 දිනැති අංක 15/2018 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය	යම් කාර්යය මණ්ඩල රක්ෂණ යෝජනා ක්‍රමයක සේව්‍ය දායකත්වය භාණ්ඩාගාර ප්‍රතිපාදන මඟින් වැය කල නොහැකි වුවද 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලය තුළ රු. 49,827,000 ක මුදලක් සේවක අග්‍රහාර රක්ෂණ දායකය වශයෙන් ජාතික රක්ෂණ භාරකාර අරමුදල වෙත ගෙවා තිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ගිවිසුම් ගත වටිනාකම රු.87,500,000 ක් වූ භූගෝල විද්‍යා දෙපාර්තමේන්තු ගොඩනැඟිල්ල ඉදිකිරීම් නිමකර මාස 05 ක පමණ කාලයක් ගතවී තිබුණද ගොඩනැඟිල්ල විශ්වවිද්‍යාලය වෙත භාර දී නොතිබුණු අතර ගොඩනැඟිල්ල ඉදිකිරීමට පෙර රු.4,275,000 ක් වැය කර ඉදි කරන ලද කොන්ක්‍රීට් පැති බැම්ම 2021 නොවැම්බර් මාසයේදී කඩා වැටී තිබුණි.

(ආ) 2018 ජූලි 11 වන දින රු.714,535,924 කට ජල සැපයුම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් 2020 ජූලි 10 දින වන විට අවසන් කිරීමේ පදනමට ගිවිසුම්ගතව පවරා තිබුණ ද වාර්තාවේ දින වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 52 ක් පමණක් විය. කොන්ත්‍රාත්කරු වෙත රු.420,895,652 ක් ගෙවා තිබියදී ඉදිකිරීම් අවසන් නොකර අතහැර දමා තිබුණි. ගිවිසුම්ගත කාල සීමාව තුළ කර්මාන්තය නිම නොකිරීම හේතුවෙන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය විසින් ඉතිරි කටයුතු නිම කිරීමට මුල් ඇස්තමේන්තුව ඉක්මවා රු.මිලියන 785 ක අතිරේක ඇස්තමේන්තුවක් ලබා දී තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ පුනරුත්තාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘති 52 ක් වෙනුවෙන් වැය කර තිබුණු එකතුව රු.308,330,445 කට අදාළ ව්‍යාපෘති වැඩ අවසන් නොකර අතහැර දමා තිබුණද ඊට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන එම මුදල් අය කිරීමට හෝ පොත්වලින් ලියා හැරීමට හෝ කටයුතු නොකර අඛණ්ඩව නොනිමී වැඩ යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.3 අනෙකුත් කරුණු

(අ) විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සේවය කළ මහාචාර්යවරයෙක් අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබාගත් 2019 දෙසැම්බර් 30 දින සිට 2023 අප්‍රේල් 30 දින දක්වා කාලය තුළ රාජ්‍ය ආයතන 03 කින් රු.24,129,082 ක වැටුප්, දීමනා හා වැඩ බැලීමේ වැටුප් ලබාගෙන තිබුණි. එම කාල සීමාව තුළ අධ්‍යයන, පර්යේෂණ හා ජීවන වියදම් දීමනාව වශයෙන් රු.9,639,043 ක් ආයතන දෙකකින් ලබාගෙන තිබුණි. එලෙස අධ්‍යයන නිවාඩු කාලය තුළ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයෙන් ගෙවූ වැටුප් හා දීමනා රු.6,110,066 ක් වර්ෂය අවසන් වන විටත් තවදුරටත් ප්‍රතිපූර්ණය කර ගත යුතුව පැවතුණි.

(ආ) AHEAD ව්‍යාපෘතිය යටතේ ශිෂ්‍යත්ව ප්‍රදානයන් ලබාගත් කථිකාචාර්යවරු 05 දෙනෙකු ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් එම කථිකාචාර්යවරුන්ගෙන් අයකළ යුතු මුදලින් රු.61,569,383 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අය කර නොතිබුණි.

(ඇ) AHEAD ව්‍යාපෘතිය යටතේ රු.12,577,600 ක නියමිත ප්‍රමිතියෙන් තොර ලැප්ටොප් පරිගණක 80 ක් ශාස්ත්‍ර පීඨය සඳහා මිලදී ගෙන තිබුණු අතර එම පරිගණක යන්ත්‍රවලින් 35 ක් මාස 05 සිට මාස 09 ක කාලයක් දක්වා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2017 වර්ෂයේ සිට 2023 ඔක්තෝබර් දක්වා කාලයට අදාළ රු.3,455,500 ක පර්යේෂණ 06 ක් නියමිත පරිදි සම්පූර්ණ නොකිරීම හේතුවෙන් අවලංගු කර තිබුණු අතර ඒ හේතුවෙන් එකී පර්යේෂණ ප්‍රදාන වෙනත් පර්යේෂණ සඳහා උපයෝජනය කිරීමට තිබුණු අවස්ථා අහිමි වී ගොස් තිබුණි.

(ඉ) පර්යේෂණ අරමුදල් 05 කට අදාළ රු. 1,932,972 ක් වසරකට වැඩි කාලයක් ද, අරමුදල් 14 කට අදාළ රු.15,270,168 ක් වසරක කාලයක් ද, වෙනත් අරමුදල් 02 කට අදාළව රු. 1,951,178 ක් වසරකට වඩා වැඩි කාලයක් ද ඌන උපයෝජිතව තිබුණි.

(ඊ) විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම හා සමානාත්මතාවය ආරක්ෂා කිරීමේ අරමුණින් මිලදී ගෙන තිබුණු රු.1,748,500 ක් වටිනා ටැබ් (Tab) යන්ත්‍ර 18 ක් හා පරිගණක යන්ත්‍ර 03 ක් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට වසර 02 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවතුණි.

(උ) 2010 ජුනි 23 දිනැති අංක 922 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය හා විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව විවෘත දැන්වීම් පළ කිරීමකින් තොරව හා අනුමත බඳවා ගැනීමේ පරිපාටියෙන් බැහැරව ප්‍රධාන ආරක්ෂක තනතුරට හා ප්‍රධාන විනයාරක්ෂක තනතුරට සුදුසුකම් සපුරා නොතිබුණු පුද්ගලයින් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

7.2 විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු

1	**මූල්‍ය ප්‍රකාශන**
1.1	**තත්ත්වාගණනය කළ මතය**
1.2	**තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
(අ)	පේරාදෙණිය විශ්වවිද්‍යාලය ආරම්භක ඉදිකිරීම සිදුවන අවස්ථාවේදි එනම් දැනට වසර 75කට පෙර මෙම ඉදිකිරීම්, ජල නල පද්ධති, මහා මාර්ග සහ මළ ප්‍රවාහ පද්ධති වෙනම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණු අතර එම වත්කම් විශ්වවිද්‍යාලයේ ඉදිකිරීම් ලෙස වූ වත්කම් පන්තියක් ලෙස ගිණුම් ගත කර ඇත. නමුත් වර්තමානයේ බලපැවැත්වෙන රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 18 අනුව මෙම වත්කම් හඳුනාගෙන තක්සේරු කරදෙන ලෙස රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත භාරදුන් නමුත් ඔවුන් විසින් මෙවැනි වත්කම් හඳුනාගෙන තක්සේරු කිරීම ප්‍රායෝගික ව සිදු කල නොහැකි බව දන්වා ඇත. ඒ අනුව පැරණි වත්කම් ඒ ආකාරයටම ඉදිකිරීම් ලෙස ගිණුම් ගත කරනු ලැබේ. කෙසේ වුවත් දැනට ඉදිකරමින් පවතින මළ ප්‍රවාහ පද්ධතියට අදාල ව රු 16,850,000.00 සහ ජල නල පද්ධතිය වැඩි දියුණු කිරීමට අදාල ව රු. 420,895,652.14 වටිනාකම් දරා ඇති අතර එම ව්‍යාපෘති මේ වන තෙක් වැඩ අවසන් කර නොමැති නිසා නොනිමි වැඩ ගිණුමේ ගිණුම් ගත කර ඇත. එසේම මෙම ඉදිකිරීම් වැඩ නිම වූ පසු වෙනම වත්කම් පන්තියක් ලෙස ප්‍රමිතියට අනුකූල ව ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ)	පේටන්ට් බලපත්‍ර 02ක් යටතේ වූ රු. 11,050,000ක් විශ්වවිද්‍යාලට ලැබී තිබුණු අතර එම වටිනාකම විශ්වවිද්‍යාලයේ අරමුදල් ලෙස ගිණුම්ගත කර ඇත. ඒ අනුව විශ්වවිද්‍යාලයේ අරමුදල් ලෙස ගිණුම් වලට ගෙන 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ අවසන් ගිණුම් මගින් අරමුදල් ලැබීම් ගිණුම්ගත කර ඇත. එසේම මෙම පේටන්ට් බලපත්‍ර 02ක් පමණක් නොව සියලුම විශ්වවිද්‍යාලය සතු අස්පෘශ්‍ය වත්කම් ගිණුම්ගත කරන ප්‍රමිති අංක 20 අනුව ගිණුම් වලට 2024 වර්ෂයේ සිට ගැලපීමට කටයුතු කරනු ලැබේ.
(ඇ)	බැඳුම්කර කඩකරන ලද නිලධාරීන් නිලධාරීන් 07 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.17,406,675ක ගිණුම්වල ලැබිය යුතු ආදායම ලෙස නිවැරදිව ගිණුම් වලට ගෙන ඇත. මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම්කරණ ප්‍රතිපත්ති හා හෙළිදරව් කිරීම් යටතේ එම වටිනාකම අසම්භාව්‍ය වත්කම් ලෙස හෙලිදරව් කර තිබීම ගිණුම්කරණ ප්‍රකාශන තුලින් ඉවත්කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලැබේ.
(ඈ)	බදු පදනම මත දිවි නැඟුම දෙපාර්තමේන්තුව වෙත 1987 වර්ෂයේදී පවරාදී තිබූ විශ්වවිද්‍යාලයට අයත් ගැටඹේ පර්චස් 40ක ඉඩම 1988 සිට 2017 දක්වා වසර 30ක් සඳහා ලබා දී තිබුණු අතර ඒ සඳහා වූ බදුකුලිය රු. 7,200,000ක් විය. නමුත් රාජ්‍ය ආයතන 02ක් අතර පවතින ගිවිසුමක් බැවින් ද, 1988 වර්ෂයේ සිට 2017 දක්වාම කිසිදු බදු මුදලක් දිවි නැඟුම ආයතනය විසින් විශ්වවිද්‍යාලයට ගෙවා නොතිබූ බැවින් ද, එම බදු මුදල් වසර 30ක් දක්වාම නොගෙවීම මත නිශ්චිත වශයෙන් ලැබේ යැයි උපකල්පනය කිරීමට නොහැකි වූ බැවින් ගිණුම්වල ලැබිය යුතු අදායම ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එසේ 2018 සිට 2023 දක්වා දිවි නැඟුම ආයතනය හා විශ්වවිද්‍යාලය අතර බදු ගිවිසුමක් අත්සන් කිරීම සඳහා දිවි නැඟුම ආයතනය ඉදිරිපත් නොවීම හා මෙතෙක් ගිවිසුමක් නොතිබීම හේතුවෙන් බදු කුලී ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කිරීමට හැකියාවක් නොමැත. ඒ අනුව 2018 සිට 2023 දක්වා වූ වර්ෂයන් සඳහා ගිවිසුමක් නොමැති වීම හේතුවෙන් ගිණුම්වල ආදායම ලෙස රු. 4,350,000ක් ගිණුම්ගත කිරීමට හැකියාවක් නොමැත.
(ඉ)	විදේශීය සිසුන් 16 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 48,027,480ක වටිනාකම නිවැරදි පරිදි ගිණුම්වල ගළපා ඇත. (JE 413899) දන්ත වෛද්‍ය පීඨයේ විදේශ ශිෂ්‍යන්ගෙන් සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුනු රු.1,289,205ක මුදල් අදායම් ලෙස හඳුනා ගෙන ගිණුම් වල ගැළපීමට කටයුතු කර ඇත. (JE 470691)
(ඊ)	2023 වර්ෂයේ සිට නව ගිණුම්කරණ පැකේජයේ (SAP) ගිණුම්කරණ පද්ධති හඳුන්වා දීමත් සමඟ ව්‍යාපෘති වෙන වෙනම වශයෙන් පවත්වාගෙන යන කෘෂි පීඨයේ හා පශු වෛද්‍ය පීඨ ගොවිපළවල වියදම් හා අදායම් ගිණුම්ගතව ඇත. එම ව්‍යාපෘති වල වියදම් හා අදායම් විශ්වවිද්‍යාල ආදායම් හා වියදම් වශයෙන්

	ද ගිණුම්ගත කරනු ලැබේ. 2024 වර්ෂයේ සිට අලෙවි ආදායම් සහ වියදම් විශ්වවිද්‍යාලයේ ආදායම් හා වියදම් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ වෙන වෙනම දැක්වීමට කටයුතු කරනු ලැබේ.
(උ)	පීඨ හා මධ්‍යස්ථාන මගින් ස්වයං මුල්‍ය ක්‍රියාකාරකම් වලින් වරින්වර විශ්වවිද්‍යාල අරමුදලට බැර කරනු ලබන මුදල් පර්යේෂණ ප්‍රවර්ධන අරමුදලට බැර කරනු ලැබේ. විගණනය විසින් නිරීක්ෂණය කර ඇති ස්වයං මුල්‍ය ක්‍රියාකාරකම් 43කට අදාල ව පීඨ හා මධ්‍යස්ථාන විසින් විශ්වවිද්‍යාලයට ලබාදී ඇති රු. 8,116,636 මුදල ද එම අරමුදල වෙත බැර කර ඇති අතර එම අරමුදල විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනයන්හි 'අරමුදල් 'උපලේඛනය යටතේ පෙන්නුම් කර ඇත. විගණනය විසින් නිරීක්ෂණය කර ඇති ඉතිරි ස්වයං මුල්‍ය ක්‍රියාකාරකම් 45 අවසන් වූ පසු ඒවායෙන් විශ්වවිද්‍යාල අරමුදලට ලැබිය යුතු රු. 11,235,578ක මුදල ඉහත අරමුදලට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. එතෙක් එම අරමුදල් අදාළ පීඨ හා මධ්‍යස්ථාන මගින් පවත්වාගෙන යනු ලබන එක් එක් ස්වයං මූල්‍ය ක්‍රියාකාරකමට අදාළ අරමුදල් ගිණුමෙහි රඳවා ගනී. එම සියලු 'අරමුදල්' ද විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකාශනයන්හි 'අරමුදල්' උපලේඛනය යටතේ පෙන්නුම් කර ඇත.
(ඌ)	මෙසේ විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු ලාභ හෝ අලාභ අදාල අරමුදල් ගිණුමේ නිසි ආකාරව ගිණුම් තබා ඇත. නමුත් මෙම විදේශ ව්‍යවහාර මුදල් හුවමාරු වෙන් වන ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශන වල හුදෙක් මුහුණත පමණක් පෙන්වන ගැළපීමක් වේ. එමෙන්ම මෙම දැරූ අලාභයට සමාන අගයක් හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයට නැවත ගළපන බැවින් මූල්‍ය ප්‍රකාශ වල ලාභය හෝ අලාභයට ශුද්ධ බලපෑමක් සිදු නොවේ. කෙසේ වුවද මෙම දෝෂය මේ වන විට නිවැරදි කර ඇත.
(එ)	වෛද්‍ය රසායනාගාර ආදායම රු. 5,975,656 විශ්වවිද්‍යාලයේ ආදායම් ලෙස විවිධ ආදායම් යටතේ ගිණුම්ගත කර ඇත.
(ඒ)	විගණන ඡේදයේ සඳහන් රු. 3,695,064ක වටිනාකම වූ ක්‍රීඩා භාණ්ඩ ප්‍රාග්ධන ස්වභාවයේ භාණ්ඩ නොවන බැවින් එම ක්‍රීඩා භාණ්ඩ භාවිතා කිරීමේදී අවසන් වන පුනරාවර්තන ස්වභාවයේ වියදම් යටතේ වන ක්‍රීඩා භාණ්ඩ වේ. උදාහරණ ලෙස බැට්මින්ටන් ෂැටල් කොක්, ක්‍රිකට් බෝල ආදිය දැක්විය හැක. මේවා වර්ෂයක් ඉකුත්වීමට පෙර භාවිතා කර අවසන් වන භාණ්ඩ වේ. ඒ අනුව මෙම රු. 3,695,064ක වටිනාකම් වූ භාණ්ඩ ප්‍රාග්ධන ස්වරූපයේ ක්‍රීඩා භාණ්ඩ නොවන බැවින් ඒවා පුනරාවර්තන වියදම් ලෙස සලකා ගිණුම්ගත කර ඇත. ඒ අනුව මෙම ක්‍රීඩා භාණ්ඩ සඳහා ක්ෂය ගැළපීමක් සිදු කළ නොහැක. එසේම ජනක යන්ත්‍ර සඳහා ක්ෂයවීම් 10% වන අතර එයින් Plant and Machinery යටතේ ගිණුම් ගත කර ක්ෂය කර ගිණුම්වල නිවැරදි පරිදි ගැළපීම් කර ඇත. කෙසේ වුවද 2024 වර්ෂයේ සිට ජනක යන්ත්‍ර වෙනම වත්කම් වර්ගයක් ලෙස ගිණුම් වල පෙන්වීමට ක්‍රියා කරනු ලැබේ.
(ඔ)	මෙම බැඳුම්කර වටිනාකම වාර්ෂිකව අයකර ගැනීමට සියලු කටයුතු කරනු ලබන අතර ඇපකරුවන්ගෙන් පමණක් නොව අර්ථසාධක අරමුදලින් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සාකච්ජා පවත්වන බැවින් ඉතා කෙටි කාලයක් තුළ හෝ අය කර ගන්නා අභිලාෂය පදනම් කරගෙන ජංගම වත්කම් ලෙස ගිණුම් ගත කර ඇත. කෙසේ වුවද 2024 ගිණුම් වර්ෂයේ සිට අඩමාන ණය වෙන්කිරීමක් සිදුකර ගිණුම්වල ගැලපීමට කටයුතු කරයි.
1.3	
1.4	
1.5	
2	
2.2.2	
(අ)	**<u>පනත්</u>**
i.	අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් ඉගැන්වීමේ කටයුතු, පර්යේෂණ කටයුතු සහ රටේ අභිවෘද්ධිය උදෙසා සිදුකරනු ලබන කටයුතු යන ක්‍රියාකාරකම් සඳහා දායක වේ. විශ්වවිද්‍යාලයේ අනුමත ආචාර්යවරුන් සංඛ්‍යාව 158ක් වුව ද වර්තමානයේ සේවය කරන්නේ 107ක් පමණි. තවද 2023 වර්ෂයේදී විද්‍යාපීඨය සිසුන් කණ්ඩායම් 05 සඳහා ඉගැන්වීමේ කටයුතු සිදුකළ අතර ජාත්‍යන්තර

	මට්ටමේ පර්යේෂණ සඟරාවල ආචාර්යවරු පළ කළ පර්යේෂණ වාර්තා 160ක් පල වී තිබුණි. තවද 2023දී එක් එක් ආචාර්යවරයා විසින් ඉටුකළ Workload Calculation උපකුලපතිතුමා වෙත ඉදිරිපත් කර ඇත. එබැවින් 2023 වර්ෂය තුළ විගණනය සඳහන් කරන දේශකවරුන් 92 වගකීම් ඉටු කරමින් වැටුප් ලබා ඇති බව දන්වමි.
ii.	**විමර්ශන පැවැත්වීම** අංක CPCG/KD/D/UP/2023/14 හා 2023.06.26 දිනැති රජයේ විගණන විමසුම මගින් අනාවරණය කර ඇති සිද්ධියට අදාළව 2023.08.31 දිනැතිව පැවති 533 වන විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මූලික විමර්ශනයක් කිරීම සඳහා නිලධාරිවරයෙක් පත් කරන ලදි. තවද එකී පාලක සභා තීරණය ප්‍රකාරව මෙම මියගිය මහාචාර්යවරියගේ ස්වාමිපුරුෂයා වූ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය මුල්‍යාධිකාරිවරයෙකු ලෙස සේවය කළ ජයලාල් පොන්නම්පෙරුම මහතාගේ සේවය තහනම් කරන ලදී. අදාළ විමර්ශනය සිදු කර මූලික විමර්ශන වාර්තාව 2024.01.27 දින පැවැති විශ්වවිද්‍යාල පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලද අතර, එකී විමර්ශන වාර්තාව සලකා බැලූ පාලක සභාව නැවත විමර්ශනයක් සිදු කිරීම සඳහා තීරණය කරන ලදි. ඒ අනුව නව නිලධාරිවරයෙක් පත්කර මූලික විමර්ශනය නැවත ආරම්භ කර, පවත්වාගෙන යනු ලබයි. **අධිකරණ ක්‍රියාමාර්ග** උක්ත පාලක සභා තීරණය මත විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරි විසින් මෙම නාමිකයා නම් කිරීමේ පෝරමයේ මියගිය මහාචාර්යවරියගේ අත්සන ව්‍යාජ ලෙස තබා ඇති බවට පැමිණිල්ලක් මහනුවර අපරාධ විමර්ශන ඒකකයේ 2023.06.26 දිනැතිව සිදුකරන ලදි. එකී පැමිණිල්ල ප්‍රකාරව මහනුවර අපරාධ විමර්ශන ඒකකය විසින් මහනුවර මහේස්ත්‍රාත් අධිකරණය වෙත නඩු අංක B 70068/23 යටතේ කරුණු වාර්තා කර ඇති අතර, තවදුරටත් විමර්ශන සිදු කෙරෙමින් පවතී. මේ සම්බන්ධයෙන් මහනුවර අපරාධ විමර්ශන ඒකකය විසින් රස පරීක්ෂක වාර්තාවක් ද ලබා ගෙන ඇති අතර, එය ද ගරු අධිකරණයට ඉදිරිපත් කර, ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත.
iii.	මෙම මියගිය මහාචාර්යවරියට හිමිව තිබූ සේවක පාරිතෝෂික අරමුදල් හා හිඟ වැටුප් ඇයගේ ස්වාමිපුරුෂයා වූ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය මූල්‍යාධිකාරිවරයෙකු ලෙස සේවය කළ ජයලාල් පොන්නම්පෙරුම මහතා වෙත ගෙවීමට අදාලව ද උක්ත මූලික විමර්ශනයේ දී කටයුතු කරනු ඇත. තව ද, මෙම විගණන විමසුමෙන් අනාවරණය කරන ලද සිද්ධියට අදාළව 2023.08.03 දින පැවැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී තීරණය වූ පරිදි අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කල කමිටුව උක්ත කරුණ සම්බන්ධයෙන් ද විමර්ශනයක් සිදුකල අතර එහි වාර්තාව නුදුරේ දීම විශ්වවිද්‍යාලයට ලැබීමට නියමිතව ඇත.
iv.	ස්ථාවර තැන්පතු ආයෝජනය සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන මහා භාණ්ඩාගාරය වෙත 2023 වර්ෂයේම යොමු කොට ඇත. එසේම 2024 වර්ෂය සඳහා ද පූර්ව අනුමැතිය සඳහා යොමු කර ඇත.
(ආ)	කළමනාකරණ පීඨය එහි ආචාර්ය මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන සියලුම පර්යේෂණ යෝජනා පීඨ පර්යේෂණ කමිටුව (Faculty Research Committee) මගින් අනුමත කිරීමෙන් පසුව පමණක් පර්යේෂණ දීමනා ගෙවනු ලබන බව දන්වමි.
2.2.3	
(අ)	මාස 3 ක වැටුප් අයකර ගැනීමකින් තොරව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ආචාර්යවරුන් 59 දෙනෙකුට ඉල්ලා අස්වීමට අවස්ථාව ලබා දී ඇති බව එම විගණන විමසුමෙන් පෙන්වා දී ඇති අතර එය නිවැරදි නොවන අතර එම ආචාර්යවරුන් 59 දෙනා අතරින් ආචාර්යවරුන් 29 දෙනෙකු සේවය අතහැර ගියා සේ සලකා කටයුතු කර ඇති අතර ආචාර්යවරුන් 24 දෙනෙකු ඔවුන් ඉල්ලා අස්වීමේ දී ලබා දියයුතු මාස 3ක පෙර දැනුම් දීම හෝ මාස 3ක වැටුප ගෙවීමකින් තොරව ඉල්ලා අස්වීම් ලබා දී ඇත. එසේම ආචාර්යවරුන් 04 දෙනෙකු මාස 3 ක දැනුම්දීම ලබා දී ඉල්ලා අස්වී ඇති බැවින් මාස 3 ක වැටුප අයකර ගැනීම අවශ්‍ය නොවන අතර එක් ආචාර්යවරියක් වසර 8 ක කාලය තුළදී ඇයගේ පශ්චාත් උපාධි සුදුසුකම් සපුරාලීමට නොහැකිවීම මත ඇයගේ සේවය අවසන් කිරීම මතද ඇයගෙන් මාස 3ක වැටුප අයකර ගැනීම අවශ්‍ය නොවේ. ඒ අනුව මුළු ආචාර්යවරුන් ගණන 59 වෙනුවට 58 ලෙස නිවැරදි විය යුතුය. එසේම මාස 3 ක පෙර දැනුම් දීම හෝ මාස 3ක වැටුප ගෙවීමකින් තොරව ඉල්ලා අස්වීම් ලබා දී ඇති ආචාර්යවරුන් 24

දෙනා මෙම විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට හෝ බැඳුම්කරයකට ඇතුළත් වී නොමැති බැවින් මාස 3ක වැටුප අයකර ගැනීමේ ක්‍රියාදාමය මත ඔවුන්ගේ අර්ථසාධක අරමුදල නිදහස් කිරීමේ දී මාස 3ක වැටුප අයකර ගැනීමට යටත්ව පාලක සභාවේ අනුමැතිය මත ඔවුන්ගේ ඉල්ලා අස්වීම් භාර ගැනීමට කටයුතු කර ඇත.

විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදයේ 9.2 ඡේදය අනුව සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කළ ආචාර්යවරුන්ගෙන් ඔවුන්ගේ බැඳුම්කර වටිනාකම සමඟ අයකර ගත හැකිවනුයේ මාසයක වැටුප පමණක් වන බැවින් ඉතිරි මාස 2ක වැටුප අයකරගනු ලබන්නේ ඔවුන්ගේ සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කිරීම සම්පූර්ණ බැඳුම්කර වටිනාකම ගෙවීමෙන් අනතුරුව අදාළ ආචාර්යවරයාගේ ඉල්ලීම මත ඉල්ලා අස්වීමකට පරිවර්තනය කිරීමෙන් පසු ඔහුගේ හෝ ඇයගේ අර්ථසාධක අරමුදල නිදහස් කරන අවස්ථාවේ දීය. එසේ වුවද එම ආචාර්යවරුන් 29 දෙනා අතරින් ආචාර්යවරුන් 05 දෙනෙකුගෙන් මාස 3ක වැටුප අයකරගෙන ඇති අතර ආචාර්යවරුන් 07 දෙනෙකුගෙන් එක් මාසයක වැටුප අයකරගෙන තිබේ. ඒ අනුව සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කළ ආචාර්යවරුන් 29 දෙනා අතරින් ආචාර්යවරුන් 12 දෙනෙකුගෙන් රුපියල් 1,444,065.00 මුදලක් මේ වන විට අයකර ගෙන තිබේ.
මීට පෙර ආචාර්යවරුන් ඉල්ලා අස්වීමේ දී අනුගමනය කරන ලද (ඔවුන්ගේ අර්ථසාධක අරමුදල නිදහස් කිරීමේ දී මාස 3 ක වැටුප අයකර ගැනීම) ක්‍රියා මාර්ගය වෙනුවට ඔවුන් ඉල්ලා අස්වීමේ දී ලබා දියයුතු මාස 3 ක පෙර දැනුම් දීම ලබා දී නැතිනම් හෝ මාස 3ක වැටුප ගෙවා නොමැති නම් එම මාස 3ක වැටුප ගෙවීමෙන් පසුව පාලක සභාවේ අනුමැතියට යොමු කිරීමට කටයුතු කරනු ලැබේ.

සේවය අතහැර ගියාසේ සලකා කටයුතු කර ඇති ආචාර්යවරුන් 29 දෙනා අතරින් ආචාර්යවරුන් 5 දෙනෙකු මාස 3ක වැටුප ගෙවා සම්පූර්ණයෙන් නිදහස් වී ඇත. ඉතිරි ආචාර්යවරුන් 24 දෙනා අතරින් ආචාර්යවරුන් 7 දෙනෙකුගෙන් මාසයක වැටුප අයකරගෙන ඇති අතර ඉතිරි මාස 2ක වැටුප ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර තිබේ.

ඒ අනුව මාස 3ක පෙර දැනුම් දීම හෝ මාස 3ක වැටුප ගෙවීමකින් තොරව ඉල්ලා අස්වීම් ලබා දී ඇති ආචාර්යවරුන්ගේ ඉල්ලා අස්වීම් භාර ගැනීම මත ආචාර්යවරුන් 23 දෙනාගෙන් මෙම විශ්වවිද්‍යාලයට අයකර ගතයුතු මාස 3ක වැටුප පෙර පැවති ක්‍රියාදාමය යටතේ හැකි ඉක්මනින් ඔවුන්ගේ අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වමි.

(ආ)

i.

ආචාර්යවරයාගේ නම	අය විය යුතු මුදල	අය කර ගත් මුදල	අය කර ගැනීමට ඇති මුදල	අය කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග
මහාචාර්ය එච්.එම්.ඒ. සොමිනන්ද මහතා	රු 3,847,268.51	-	රු 3,847,268.51	පාරිතෝෂික මුදලින් අඩුකර ගැනීමට කටයුතු කර ඇත.
මහාචාර්ය ආර්.පී. ඉලේපෙරුම මහතා	රු. 4,212,365.81	-	රු. 4,212,365.81	ඉලේපෙරුම මහතාගේ අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමටත් ඉතිරි මුදල ඔහුගේ උසස් වීමට අදාලව හිමිවිය යුතු වැටුප් හා දීමනා මගින් පියවා ගැනීමටත් කටයුතු කරගෙන යනු ලබයි.
මහාචාර්ය එල්.ජේ.පී.ඒ.පී. ජයසූරිය මහතා	රු 1,022,347.00	-	රු 1,022,347.00	අර්ථ සාධක අරමුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත.

(ii) Faculty of Arts

මේ සඳහා විශේෂයෙන් බලපා ඇත්තේ වෙනත් පීඨයන්ට සාපේක්ෂව සමහර විෂයන් සඳහා 1200ක පමණ සිසුන් පිරිසකගේ ප්‍රශ්නපත්‍ර ඇගයීම කිරීම මෙන්ම විවිධ වූ විෂයන් 700 කට ආසන්න ප්‍රමාණයක් දෙපාර්තමේන්තු 19ක ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අනුමත කාලසීමාවට වඩා වැඩි කාලයක් ගැනීමත්, විශේෂයෙන්ම බාහිර කථිකාචාර්යවරුන් යොදා ගනිමින් ප්‍රශ්නපත්‍ර ඇගයීම් කිරීමේදී ඔවුන්ගේ ඇගයීම් ප්‍රමාදවීම, කොරෝනා කාලසීමාවේ මාර්ගගත විභාග පැවැත්වීමේදී පැන නැගුණු ගැටලු නිසා බව දන්වා සිටිමි.

	Faculty of AHS අංක 15/2015 හා 2015 නොවැම්බර් 17 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතනික චක්‍රලේඛය ප්‍රකාරව උසස් අධ්‍යාපන ආයතන සඳහා වන අභ්‍යන්තර විභාග පවත්වා මාස 03ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතු බව දක්වා ඇති අතර සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම පවතින නිතීරීති වලට හා රෙගුලාසී වලට අනුව සිදු කරනු ලබන මෙයින් දන්වා සිටිමු. එසේ වුවද විගණන විමසුමෙන් පෙන්වා දී ඇති කාල සීමාව තුල දී මෙම ප්‍රතිඵල නිකුත් කිරීමට ප්‍රමාද වූයේ 2020 හා 2021 වර්ෂ වල ලංකාව තුළ පැවති කොවිඩ් වසංගතය හේතුවෙනි. එම කාල සීමාව තුල දී රට වරින් වර වසා දැමීම හා පිරිස් ඒකරාශි කර කටයුතු කිරීම තහනම් කර පැවති අතර එම කාල සීමාව තුල දී ද පීඨයේ කටයුතු සාමාන්‍ය පරිදි කර ගෙන යාම සඳහා පීඨයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය හැකි උපරිමයෙන් කටයුතු කරන ලදි. (මෙම කාල සීමාව තුල දී ආරක්ෂක අංශ වෙත පවා ලිපි යොමු කරමින් සිසුන්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය වැඩ මුර ක්‍රමයකට පීඨය වෙත ගෙන ඒමට පරිපාලනය කටයුතු සිදු කරන ලදි). එම කාල සීමාව තුල දී මුළු ලංකාවම වසා දැමීම නිසා අධ්‍යයන කටයුතු සාමාන්‍ය පරිදි කරගෙන යාමට නොහැකි විය. එවකට රටේ වාතාවරණය එසේ වූවත් අන්තර්ජාල පහසුකම් උපයෝගී කර ගනිමින් දේශන පවත්වා අවශ්‍ය දැනුම සිසුන් වෙත ලබා දීමට අධ්‍යයන කාර්ය මණ්ඩලය කටයුතු කරන ලදි. නමුත් පැවති බාධක හමුවේ රට වසා දැමූ කාල සීමාව තුල දී ද අධ්‍යයන හා අනධ්‍යයන කාර්යය මණ්ඩලය හැකි පමණින් රැස්වී අවශ්‍යය විභාග පැවැත් වූවද ඉන් පසු රට මාස 02-03ක පමණ කාලයක් යලි වසා දැමීම නිසා ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද විය. එමෙන් ම පීඨයේ ප්‍රදානය කරනු ලබන උපාධි පාඨමාලා වල බොහෝමයක් ප්‍රායෝගික පරීක්ෂණ/ සායනික පරීක්ෂණ දිවයිනේ බොහෝ රෝහල් වල (වැලිසර ලය රෝහල, මහනුවර ජාතික රෝහල, අංගොඩ මානසික රෝහල, කුරුණෑගල රෝහල් වල) පවත්වන බැවින් එම ප්‍රායෝගික පරීක්ෂණ/ සායනික පරීක්ෂණ රටේ පැවැති වසංගතය හේතුවෙන් නියමිත පරිදි පවත්වා ප්‍රතිඵල ලේඛන සකස් කර අවසන් කර ගැනීමට නියමිත කාල සීමාව තුල දී නොහැකි වීම ද මෙම ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීමට හේතු සාධක විය. එමෙන්ම එවකට රටේ පැවති වෛද්‍ය නීති රීති හා රෙගුලාසි වලට අනුව මෙම පිළිතුරු පත්‍ර බෙදා හැරීමට පෙර දින 14 කට වඩා වැඩි කාලයක් වෛරසය අකර්මන්‍ය වීම සඳහා ගබඩා කර තැබිය යුතුව තිබූ හෙයින් එම පිළිතුරු පත්‍ර අදාළ විභාග පරීක්ෂකවරුන් වෙත බෙදා හැරීම අපහසු වීම සහ නැවත ලකුණු කරන ලද පිළිතුරු පත්‍ර එකතු කර ගැනීම අපහසු වීමද ප්‍රතිඵල නිකුත් කිරීම ප්‍රමාද වීමට හේතු විය. විශ්වවිද්‍යාල හා රට වසා තැබීම හේතුවෙන් ප්‍රතිඵල නිකුත් කිරීමේ මණ්ඩලයේ සාමාජික අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මහත්ම මහත්මීන් එක් රැස් කර ගැනීමට නොහැකි වීම මෙයට හේතු සාධක විය.
(iii)	මෙම අග්‍රහාර රක්ෂණ ක්‍රමය සඳහා සේවය දායකත්වය භාණ්ඩාගාර ප්‍රතිපාදන මගින් වැයකර නොමැති අතර විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ආදායම් යොදා ගනිමින් සේවක සුභසාධනය සඳහා රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන අර්ධ රාජ්‍ය ආයතන සඳහා වූ රක්ෂණ ක්‍රමය සේවකයාගෙන් රු. 400ක් හා විශ්වවිද්‍යාලය විසින් රු. 600 බැගින් දායක කරගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 15/2018 ක්‍රියාත්මක කරනු ලබන බව දන්වා සිටිමි.
2.2.4 (අ)	අධික වර්ෂාව හේතුවෙන් කඩා වැටුණු මෙම බැම්ම වෙනුවෙන් කිසිදු ගෙවීම් කටයුත්තක් විශ්වවිද්‍යාලය විසින් සිදු නොකර ඇති අතර, එම බැම්ම නැවත සැලසුම් කොට අදාල කොන්ත්‍රාත්කරු ඉදිකර ඇත. මෙම ගොඩනැගිල්ල 2024.04.09 දින විශ්වවිද්‍යාලය වෙත භාරදී ඇත.
(ආ)	පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා ජාතික ජල පම්පාදන හා ජලාපවහන මණ්ඩලය සමග කැබිනට් මණ්ඩල තීරණයකට අනුව විශ්වවිද්‍යාලයේ ජල සැපයුම් පද්ධතිය නවීකරණය කිරීම සඳහා රු. 714,535,924ක මුදලකට 2018 ජුලි 11 වන දින ගිවිසුම්ගතව තිබුණි. මෙහි ව්‍යාපෘතියේ වැඩ කටයුතු කරගෙන යමින් පවතින අවස්ථාවේ දී Covid-19 වසංගතය නිසා වරින් වර රට වසා දැමීම, සේවකයන් සේවයට ගෙන්වීමේ අපහසුතා හා අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුතා වැනි හේතු නිසා අතරමඟ නැවතී තිබුණු අතර රට තුළ ඇති වූ ආර්ථික අවපාතය හේතුවෙන් කොන්ත්‍රාත් කාර්යයන්ට අවශ්‍ය අමුද්‍රව්‍යවල මිල ඉතා විශාල ලෙස වැඩි වී තිබුණි. ඒ අනුව ජල සැපයුම් මණ්ඩලය ගිවිසගත් මුදලට ව්‍යාපෘතිය අවසන් කළ නොහැකි බව දැන්විය. උක්ත කරුණු නිසා ගිවිසගත් කාලය තුළ කොන්ත්‍රාත් කාර්යය නිම කිරීමට නොහැකි වූයේ විශ්වවිද්‍යාලයට පාලනය කළ නොහැකි හේතූන් නිසාය. කෙසේ වුව ද මෙකී ව්‍යාපෘතිය කාණ්ඩ කිහිපයක් යටතේ හෝ විශ්වවිද්‍යාලයට ප්‍රාග්ධන මුදල් ලැබෙන පරිදි කොටස්වලට බෙදා නිම කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ජල සැපයුම් මණ්ඩලය සමඟ සාකච්ඡා කෙරෙමින් පවතී.

(ඇ)	විවිධ හේතූන් මත පුනරුත්ථාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘති කොන්ත්‍රාත්කරුවන් අතරමග නවතා දමා ගොස් ඇත. ව්‍යාපෘති අධීක්ෂණය කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ කමිටුවක් පත් කර ඇති අතර මෙසේ අතරමග නවතා දමා ඇති පුනරුත්ථාපන හා ප්‍රාග්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් මෙකී කමිටුව විසින් සොයා බලා නිරවුල් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.
2.3	වෙනත් කරුණු
(අ)	විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ සේවය කරන මහාචාර්ය W.P.R.P. ද සිල්වා හට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙස සේවය කිරීම සඳහා පහත සඳහන් පරිදි විශ්වවිද්‍යාල සේවයෙන් නිදහස් කර ඇත. • 2019.12.30 - 2021.11.30 - ගෙවන ලද වැටුප් සහ දීමනා ප්‍රතිපුරණය කර ගන්නා පදනම මත වැටුප් රහිතව සේවයෙන් නිදහස් කිරීම. • 2021.12.01 - 2022.12.31 - වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු මත • 01.01.2023 - 2023.04.30 ගෙවන ලද වැටුප් සහ දීමනා ප්‍රතිපුරණය කර ගන්නා පදනම මත වැටුප් රහිතව සේවයෙන් නිදහස් කිරීම. මෙහි දී 2019.12.30 සිට 2021.11.30 දක්වා සහ 2023.01.01 සිට 2023.04.30 දක්වා විශ්වවිද්‍යාලය මගින් නැවත ප්‍රතිපුරණය කරගැනීමේ පදනම් මත මහාචාර්ය W.P.R.P. ද සිල්වා හට රු. 16,406,493.30 වැටුප් සහ දීමනා ලෙස ගෙවා ඇත. එම මුදල සම්පූර්ණයෙන් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් විශ්වවිද්‍යාලය වෙත ප්‍රතිපුරණය කර ඇත. එමෙන්ම ඔබගේ විමසුමේ පෙන්වා දී ඇති කරුණට අනුව විශ්වවිද්‍යාල ආචාර්යවරයකු සඳහා සප්තවාර්ෂික නිවාඩු වැටුප් සහිතව හෝ වැටුප් රහිතව ලබාගැනීමේ හිමිකමක් පවතී. මෙහි දී වැටුප් සහිත නිවාඩුවක් ලබාදීමේ දී ඔහුට හිමි සියලුම වැටුප් සහ දීමනා ගෙවීමේ හැකියාවක් චක්‍රලේඛන ප්‍රකාරව පවතී. එම නිසා 2021.12.01 සිට 2022.12.31 දක්වා කාලය තුල ඔහුට ලබාදුන් වැටුප් සහිත සප්තවාර්ෂික නිවාඩු කාලය සඳහා ඔහුට හිමි සියලු වැටුප් සහ දීමනා විශ්වවිද්‍යාලය වෙතින් ගෙවිය යුතුය. එමෙන්ම ඔහුට හිමි වැටුප් සහ දීමනා පිළිබඳව වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට ලිඛිතව දන්වා ඇත. මෙහි දී වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය මගින් ඔහුට ගෙවිය යුතු දීමනා කුමක්ද යන්න විශ්වවිද්‍යාලයට තීරණය කල නොහැකිය.

(ආ)

අනු අංකය	ශිෂ්‍යත්වලාභී අංකය	ශිෂ්‍යත්වලාභී කතිකාචාර්යවරයාගේ නම	කඩකරන ලද බැඳුම්කර වටිනාකම රු.	2024.08.05 දිනට අය වූ මුදල රු.	අයවිය යුතු ඉතිරි මුදල රු.	විස්තරය
01	AHEAD/PhD/R1/AH/035	පී.ඒ.ඩී. පෙරේරා	15,615,343	4,384,828	11,230,515	පෙරේරා මහත්මිය විසින් බැඳුම්කර වටිනාකමෙන් රුපියල් 4,000,000.00 ක මුදලක් 2023.01.31 දින ගෙවා ඇත. ඊට අමතරව බැඳුම්කර වටිනාකම පියවීම සඳහා රුපියල් 384,828ක මුදලක් ඇයගේ පාරිතෝෂික අරමුදලින් අයකරගෙන ඇත. ඇයගේ අර්ථසාධක අරමුදල් බැඳුම්කරයට ලබාගැනීම සඳහා අර්ථසාධක අරමුදල් අයදුම්පත්‍රය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති අතර අර්ථසාධක

						අරමුදලින් රුපියල් 1,547,471.82ක මුදලක් බැඳුම්කරයට අයකර ගැනීමට කටයුතු කර ඇත. ඉතිරි හිඟ මුදල් ප්‍රමාණය ගෙවන ලෙස 2023.12.05 දිනැති විද්‍යුත් තැපැල් පණිවිඩය මගින් දැනුම් දී ඇත. ඒ අනුව පෙරේරා මහත්මිය විසින් 2024.01.11 දිනැති විද්‍යුත් පණිවිඩය මඟින් ඇයගේ විශ්‍රාම වැටුප් අරමුදලින් බැඳුම්කර වටිනාකමෙන් කොටසක් අය කරගන්නා ලෙසත් ඉතිරි හිඟ මුදල එකවර ගෙවීමට අපහසු බවත් දන්වා ඇත. එමෙන්ම ඉතිරි හිඟ මුදල වාරික වශයෙන් ගෙවීමට පහසුකම් සලසා දෙන ලෙසත් ඉල්ලා ඇත. ඒ අනුව 2024.01.29 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මූල්‍ය චක්‍රලේඛ ලිපි 01/2024 අනුව කටයුතු කරන බව දන්වා සිටිමි.
02	AHEAD/PhD/R1/AH/039	ටී.ජී.එන්.එස්. ගුණරත්න	13,585,176.35	1,534,968.00	12,050,208.35	බැඳුම්කර වටිනාකමින් කොටසක් පාරිතෝෂික අරමුදලින් හා අර්ථසාධක අරමුදලින් අඩුකර ගැනීමට කැමැත්ත සහ ඊට අදාළ අයදුම්පත් ලබා දී ඇත. ඒ අනුව පාරිතෝෂික අරමුදලින් රු.1,034,968ක මුදලක් 2024.04.19 දින බැඳුම්කරයට අයකරගෙන ඇත. පාරිතෝෂික හා අර්ථසාධක අරමුදල් ප්‍රමාණය අඩුකර ඇයට ගෙවීමට ඇති හිඟ මුදල 2024.03.20 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. ඒ

						අනුව ඇය විසින් රුපියල් 500000.00ක මුදලක් 2024.08.03 දින ගෙවා ඇති අතර ඉතිරි හිඟ මුදල ගෙවීමට වසර 03-04ක කාලයක් ලබාදෙන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව 2024.01.29 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මූල්‍ය චක්‍රලේඛ ලිපි 01/2024 අනුව කටයුතු කරන බව දන්වා සිටිමි. අර්ථසාධක අයදුම්පත්‍රයේ විද්‍යුත් අත්සන තබා ඇති බැවින් තත්‍ය අත්සන සහිත අයදුම්පතක් එවන ලෙස දැනුම් දී ඇත. ඇයගේ අර්ථසාධක අරමුදලින් අර්ථසාධක ණය මුදල අඩුකරගැනීමෙන් පසු 2022.12.31 දිනට අර්ථසාධක අරමුදල රුපියල් 1,173,259.73 වේ.
03	AHEAD/PhD/R2/MED/246	ටී.එන්. හත්තොටුව	17,912,641	640,851.75	17,271,789.25	බැඳුම්කර වටිනාකමින් කොටසක් පාරිතෝෂික අරමුදලින් හා අර්ථසාධක අරමුදලින් අඩුකර ගැනීමට කැමැත්ත සහ ඊට අදාළ අයදුම්පත් අධ්‍යයන ආයතන අංශයට ලබා දී ඇත. ඒ අනුව පාරිතෝෂික අරමුදලින් රු. 640,851.75ක මුදලක් බැඳුම්කරයට අයකරගෙන ඇත. එමෙන්ම බැඳුම්කර වටිනාකමින් කොටසක් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් පත්‍රය 2024.01.31 දින මූල්‍යාධිකාරී වෙත යවන ලදි. ඇයගේ 2022.12.31 දිනට

						අර්ථසාදක අරමුදල රුපියල් 2,368,988.67ක් වේ. ඊට අමතරව ඇය විසින් විශ්‍රාම වැටුප් අරමුදල බැඳුම්කරයට අයකර ගැනීමට කැමැත්ත ප්‍රකාශ කොට ඇත. එමෙන්ම ඉතිරි හිඟ මුදල ගෙවීමට 2024 ජූනි මස අවසානය දක්වා කාලය අවශ්‍ය බව 2024.01.31 දිනැති විද්‍යුත් පණිවිඩය මගින් සඳහන් කර ඇත. ඇය විසින් සඳහන් කර ඇති කාලපරිච්ඡේදය තුළ බැඳුම්කර වටිනාකම ගෙවීමට අපොහොසත් වී ඇති බැවින් අදාළ නිතීමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
04	AHEAD/PhD/R2/MED/191	එස්.ටී. සුදේශිකා	18,601,182	4,740,760	13,860,422.00	සුදේශිකා මහත්මිය විසින් බැඳුම්කර වටිනාකමෙන් රුපියල් 4,000,000.00ක මුදලක් 2023.08.31 දින ගෙවා ඇත. ඒ අනුව පාරිතෝෂික අරමුදලින් රු. 740,760.00ක මුදලක් 2024.04.19 දින බැඳුම්කරයට අයකරගෙන ඇත. එමෙන්ම බැඳුම්කර වටිනාකමින් කොටසක් අර්ථසාධක අරමුදලින් අයකර ගැනීම සඳහා අර්ථසාධක අරමුදල් පත්‍රය 2024.02.13 දින මුල්‍යාධිකාරී වෙත යවන ලදි. ඇයගේ 2022.12.31 දිනට අර්ථසාදක අරමුදල රුපියල් 2,368,988.67ක් වේ. ඒ අනුව ඇයගේ ඉතිරි බැඳුම්කර වටිනාකම 2024.01.29 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මූල්‍ය චක්‍රලේඛ

						ලිපි 01/24 අනුව කටයුතු කරන බවත් නැතහොත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි.
05	AHEAD/PhD/R2/ENG/TECH /252	අයි.ඩී.වයි. ඒකනායක	14,648,836	14,648,836	-	අයි.ඩී.වයි. ඒකනායක මහත්මිය 2023.07.08 දින ඇයගේ මුළු බැඳුම්කර වටිනාකම වන රුපියල් 14,648,835.64ක මුදලක් හා මසක වැටුප වන රුපියල් 61,274.64ක මුදලක් ගෙවන ලදි. ඇය විසින් මුළු බැඳුම්කර වටිනාකම හා මසක වැටුප ගෙවා ඇති බැවින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ 2023.08.06 වන දින පැවති 533 වන පාලක සභාවේ දී ඉල්ලා අස්වීම පිළිගැනීම සඳහා පාලක සභා අනුමැතියද ලබාදෙන ලදි.

(ඇ) මෙම පරිගණක AHEAD ව්‍යාපෘතිය හරහා ඇනවුම් කල පසු එම පරිගණක ශාස්ත්‍ර පීඨයට ලැබුණු අතර එම මිලදීගත් පරිගණක 80 දෙපාර්තමේන්තු අතර හා එම දෙපාර්තමේන්තු වල සිටින ආචාර්යවරු සංඛ්‍යාව වෙත ලබාදෙන ලදී.

කෙසේ නමුත් එසේ මිලදී ගත් පරිගණක කිහිපයක යතුරු පුවරුව සම්බන්ධයෙන් යම් යම් දෝෂ මතුවී තිබුණු, අතර එම පරිගණක අදාළ නියෝජිත ආයතනය විසින් නොමිලේ පිළිසකර කර දෙන ලදී. නමුත් මෙම දෝෂය පසුව විමසුමේ සඳහන් පරිදිම මිලදී ගත් පරිගණක මුලු සංඛ්‍යාවෙන් අඩක් පමණ සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් අදාළ සමාගමට යොමු කර ඇති ලිපිය මඟින් එසේ දෝෂගත පරිගණක වෙනුවට අලුත් පරිගණක ලබා දෙන ලෙස දැනුවත් කරන ලද අතර සමාගම එම පරිගණක පිළිසකර කර දීමට එකඟ වී ඇත.
මෙම පරිගණක තවමත් එහි වගකීම් කාලය තුල පවතින අතර ඒ අනුව මෙම පරිගණක එම සමාගම හරහා පිළිසකර කරගැනීමට කටයුතු කරනු ඇත. තවද අදාළ සමගම සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සඳහා විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව වෙත කරුණු ඉදිරිපත්කරමි.

(ඈ) මෙම පර්යේෂණ ප්‍රදානයන් සියල්ල අවලංගු කොට ඇති අතර අදාළ අයකරගැනීම් සඳහා ඉදිරියේදී කටයුතු කරනු ඇත.

(ඉ) විගණනය විසින් නිරීක්ෂණය කර ඇති පර්යේෂණ අරමුදල් හා අනෙකුත් අරමුදල් යටතේ යම් යම් නිශ්චිත කාර්යයන් සඳහා මුදල් වෙන් කරනු ලැබ ඇති අතර එම නිශ්චිත කාර්යයන් සඳහා හැර වෙනත් කාර්යයන් සඳහා මෙම අරමුදල් භාවිතා කළ නොහැකි වේ.

කෙසේ වුවද, අදාළ නිශ්චය කර ඇති කාර්යයන් සඳහා එම මුදල් භාවිතා කිරීමට අදාළ පර්යේෂකයන් / අරමුදල් ප්‍රතිලාභීන් ඉල්ලීම් නොකරන අවස්ථාවල දී එම අරමුදල් යටතේ ඇති ද්‍රවශීල මුදල් නිශ්කාර්යව පැවතීම වළක්වා ගැනීම හා එමගින් විශ්වවිද්‍යාලයට අමතර ආදායමක් ලබාගැනීමේ අරමුණින් යුතුව විශ්වවිද්‍යාලයේ ආයෝජන කළඹ අංශය මගින් කෙටිකාලීනව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ. ඒ අනුව නිරීක්ෂණය කර ඇති පර්යේෂණ අරමුදල් හා අනෙකුත් අරමුදල් යටතේ ඇති ද්‍රවශීල මුදල් සියල්ල කෙටිකාලීනව (මාස 1,3,6,12) ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇති බැවින්, එම මුදල් උපන උපයෝජිතව පැවතියේය යන්න පිළිගත නොහැකි වේ.

	කෙසේ වුවද, නිරීක්ෂිත පර්යේෂණ අරමුදල් / අනෙකුත් අරමුදල් නිරීක්ෂණය කර ඇති කාලසීමාවන් තුල දී අදාළ කාර්යයන් සඳහා භාවිතාකර නොමැති බව පිළිගනිමි.
(ඊ)	විශේෂ අවශ්‍යතා සම්පත් මධ්‍යස්ථානය වෙත ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවල විවිධ ආබාධ සහිත සිසුන් සඳහා අධ්‍යාපන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (IncEdu Project) යටතේ ලැබී ඇති Tab යන්ත්‍ර 35න් 17ක් විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ට භාවිතා කිරීම සඳහා නිකුත් කර ඇති අතර, අනෙක් Tab යන්ත්‍ර 18 තබා ඇත්තේ නව අධ්‍යයන වාරයේ පැමිණෙන සිසුන් සඳහාය. නව සිසුන්ගේ අධ්‍යාපන කටයුතු 2024 ඔක්තෝබර් 01 දින ආරම්භ කිමට නියමිතය. පීඨාධිපති අනුමැතිය මත විශේෂ අවශ්‍යතා සම්පත් මධ්‍යස්ථානය වෙත ලැබුණු පරිගණක යන්ත්‍ර 03න් එක් යන්ත්‍රයක් පීඨාධිපති කාර්යාලයට හා යන්ත්‍ර 02ක් ලලිත කලා අධ්‍යයන අංශයට නිකුත් කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා සිටිමි.
(උ)	ප්‍රධාන විනයාරක්ෂක තනතුරට අදාළ බඳවා ගැනීමේ පටිපාටියට අනුව පිළිගත් විශ්වවිද්‍යාල උපාධියක් සමඟ ශ්‍රී ලංකා පොලීසියේ සහකාර පොලිස් අධිකාරි තනතුර හෝ ඊට ඉහළ තනතුරක රාජකාරි කර තිබීම හෝ එම තනතුරට සමාන ත්‍රිවිධ හමුදා තනතුරක සේවය කිරීම හෝ නියෝජ්‍ය විනය ආරක්ෂක තනතුරේ වසර 05 ට නො අඩු සේවා කාලයක් සහිත අයෙකු වීම යන සුදුසුකම් සපුරා තිබිය යුතුය. විශ්වවිද්‍යාලය විසින් 2004.11.04 දිනැතිව කරන ලද විමසීමට පිළිතුරු වශයෙන් 2004 දෙසැම්බර් 07 දිනැතිව අතිරේක ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය විසින් පිළිතුරු ලිපියක් යොමු කරමින් පොලිස් හා සන්නද්ධ හමුදා නිළධාරීන්ගේ රාජකාරි කටයුතු වල ස්වභාවය වෙනස් බැවින් එම නිලයන් සංසන්දනය කළ නොහැකි බවත් යුධ හමුදා කපිතාන්වරයෙකුගේ නිලය හෝ ඊට ඉහළ නිලයක් දරන සන්නද්ධ හමුදා නිළධාරියෙකු ප්‍රධාන ආරක්ෂක තනතුර සඳහා සලකා බැලීම සුදුසු බවත් දන්වා ඇත. ඒ අනුව ප්‍රධාන විනයාරක්ෂක තනතුර සඳහා එවකට පැවති බඳවාගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලැබූ අයදුම්කරුවා තෝරාගෙන ඇත. කෙසේ වුව ද එකී සම්මුඛ පරීක්ෂණය හා සම්බන්ධ ලිපිගොනුව මේ වන විට අස්ථානගත වී ඇති අතර එය සොයා ගැනීම සඳහා කටයුතු කෙරෙමින් පවතී.

මහාචාර්ය ඩබ්ලිව්.එම්. ටී. මධුජිත්
උපකුලපති
පේරාදෙණිය විශ්වවිද්‍යාලය

අගෝස්තු 2024